# 2025 ඔක්තෝබර් මස 07 වන දින පෙරවරු 9.30 ට
# මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද
# මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |

| | | | |
|---|---|---|---|
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 48. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 49. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 50. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 51. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. තිලිනි නෙත්සරණී මෙනවිය |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්.කේ.ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2025.10.07 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2025.09.09 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2025.09.09 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ අන්තර්ගත වෙන කරුණු තියෙනවා අපි කතා කරපු දේවල් හැබැයි හැමදාම අපි මේ සභාවේ උගුර ලේ රස වෙනකම් කෑගහනවා, ඔබතුමාලා එක්ක තර්ක කරනවා. එක සභාගත වෙනවා හැබැයි ඊට පස්සේ මොකද වෙන්නේ කියන එක අපි දන්නේ නැහැ. දැන් හොඳම උදාහරණය තමයි සෞඛ්‍ය කමිටුවේදී මන්ත්‍රීවරුයෙකු හැටියට මා විසින් විශාල හෙළිදරව් රැසක් කලා කේ ඇන් කේ එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් ඒ ආයතනය සම්බන්ධයෙන් මේකේ නිලධාරියෙක් එකතු වෙලා කරපු වංචාව සම්බන්ධයෙන් හෙළිදරව් කළා. ඊට අමතරව බේල් පටි ගැනීම සම්බන්ධයෙන් මා විසින් හෙළිදරව්වක් කලා එතකොට අපේ සුදේශ් ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා පිළිතුරක් දුන්නා ඒ සම්බන්ධයෙන් අනිවාර්යෙන්ම කටයුතු කරනවා කියලත් මෙහි සඳහන් වෙලා තියෙනවා. අපි ඔබතුමාගෙන් අහන්න කැමතියි මේවා ඊට පස්සේ හමස් පෙට්ටියට යනවද, මෙවට මොකද්ද වෙන්නේ ඒ නිසා කරුණාකරලා අපි සභාවේ යම්කිසි කරුණක් මතු කරාට පස්සේ ඒ කරුණ සම්බන්ධයෙන් ඔබතුමාලා ගත්ත ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් අපිව දැනුවත් කරන්න. සභා වාර්තාවට පමණක් සීමා වෙනවද මේ සම්බන්ධයෙන් ඒ අවශ්‍ය කටයුතු කෙරෙනවද කියන එක පිළිබඳව කරුණාකරලා අපිව දැන්වත් කරන්න කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මම හිතන්නේ අද මේ මොහොතේ සභා වාර්තාව සම්මත කර ගැනීම කියන කාරනයෙදී එම වාර්තාවේ තියෙන දොස්, වැරදි නිවැරදි කර ගැනීම් තමයි අවස්ථාව. එහෙම නැතුව මේ අවස්ථාව ප්‍රශ්න වලට උත්තර ලබා දෙන අවස්ථාව නෙමෙයි. ඔබතුමා දීර්ඝ අත්දැකීම් තියෙන මන්ත්‍රීවරයෙක් විදිහට සභා වාර්තාව සම්මත කර ගැනීමේදී මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු තමන්ගේ ප්‍රකාශන වල ගැටළු තිබෙනවනම් එවා නිවැරදි කර ගැනීමට දීපු අවස්ථාවක් තමයි මේ.

**<u>මහා නගර සභා මන්ත්‍රි - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මටයි ඔබතුමාටයි දෙන්නටම තියෙනවා අත්දැකීම් හැබැයි මේ සභා වාර්තාවෙන් පැනනඟින ප්‍රශ්න මොනවා හරි තියෙනවනම් ප්‍රශ්න කරන්න වෙන අයිතමයක් නැහැනේ අපිට. එතකොට සභා වාර්තාවෙන් පැනනඟින ප්‍රශ්නයක් තිබුනොත් එහෙම මේ වෙලාවේ තමයි සාකච්ඡා කරන්න ඕන. අපි එහෙම කරලා තියෙනවා, ඉතින් ඒ නිසා සභා වාර්තාවෙන් පැනනඟින ගැටළු සම්බන්ධයෙන් මොනවාහරි තියෙනවනම් මන්ත්‍රීවරයෙකුට අහන්න තියෙන

එකම අවස්ථාව මේක. වෙන කිසිම අයිතමයක් නැහැ මේක අහන්න. ඒ නිසා කරුණාකරලා අපිට මේකට පිළිතුරක් දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ අවස්ථාව පිළිතුරු ලබා දීමේ අවස්ථාව නොවන බව තමයි මා සිටින ස්ථාවරය ඔබ මතු කරලා තියෙන ප්‍රශ්න වලට පරීක්ෂණ කටයුතු වෙමින් පවතිනවා. එවා හරියට කිසිම අඩුවකින් තොරව සිදුවෙනවා. පළවෙනි වර තමයි සභාවක නිලධාරියෙකුට සභාව දාලා යන්න වෙච්ච. ක්‍රියාමාර්ග වල කිසිම අඩුවක් නැහැ. ඒ වැරදි කරපු හැම කෙනාටම අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා. හැබැයි ඔබ දන්නවා නිශ්චිත මොහොතේ සභා වාර්තාව සම්මත කර ගැනීම. ඔබතුමාට අවස්ථාව දෙන්නම් ඒ අවස්ථාව ලබා ගන්න න්‍යාය පත්‍රයේ තැන් ගණනාවක් තියෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මට වඩා ඔබට අත්දැකීම් තියෙනවා ඒ නිසා මම පිළිගන්නවා. අපිට ඒ තැන කියන්න එතකොට අපි කතා කරන්නම්.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, න්‍යාය පත්‍රයේ හදාගන්න පුළුවන් තැන් තියෙයි.

**මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා**

ගරු නගරාධිපතිතුමනි, සභා වාර්තාවේ 3(26) මගේ ප්‍රකාශය 10 වෙනි පිටුව අඟුලාන පොදු ජන විද්‍යාලය කියලා තමයි මේකේ සඳහන් වෙන්නේ කරුණාවෙන් ඉල්ලනවා පොදුජය විද්‍යාලය කියලා නිවැරදි කරන්න කියලා ඉල්ලනවා, තව එහි ගරු විදුහල්පතිවරිය විශාල සටහන් ගෙනියනවා කියලා තමයි මේ වාර්තාවේ සඳහන් වෙන්නේ, කරුණාකරලා එක විශාල සටනක් ගෙනියනවා කියලා නිවැරදි කරන්න කියලා ඉල්ලනවා.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, මට පොඩි ටෙක්නිකල් ප්‍රශ්නයක් තියෙනවා අපි ඉංග්‍රීසියෙන් වචනයක් කිවුවහම එක එක ඉංග්‍රීසියෙන් ටයිප් කරන්නේ නැද්ද කියලා දැන ගන්න අවශ්‍යයි. එවා කියවද්දි සමහර අවස්ථාවලදි එවා ට්‍රාන්ස්ලේෂන් වෙනවා. එතකොට එවා වල මීනින් එක වෙනස් වෙනවා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, නාගරික ලේකම්තුමාට මේ පිළිබඳ පැහැදිලි කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

**නාගරික ලේකම් - එම්.කේ.ඩී. තාරක මුණසිංහ මහතා**

ගරු නගරාධිපතිතුමනි, මහා නගර සභාවක මහා සභා රැස්වීමක් වාර්තා කිරීමේදී හැන්සාඩ් ගත කරන්න කියලා උපදෙස් දීලා නැහැ. එතකොට ඒ කරන කතාවක හරය තමයි අපිට වාර්තාගත කරන්න කියලා තියෙන්නේ. එතකොට අපි අපිට පුළුවන් උපරිමයෙන් මන්ත්‍රීවරයෙක් දක්වන අදහස් අපි උත්සහ කරනවා හැම තිස්සේම නිවැරදිවම වාර්තා කරන්න. ඔබතුමිය යෝජනා කරන්නේ ඉංග්‍රීසියෙන් කියන වචනයක් ඉංග්‍රීසි භාෂාවෙන් වාර්තාවට ඇතුල් කරන්න කියලා. අපි උත්සහ කරන්නම්. එයට අපිට තියෙන කාර්ය මණ්ඩලය හා පහසුකම් අනුව උත්සහ කරන්නම් ඒ යෙදෙන තත්ත්වය අනුව සුදුසු විදිහකට කරන්න.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2025.09.09 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

**2025.09.09 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.**

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන :-

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, න්‍යාය පත්‍රයේ පොඩි වැරදීමක් සිදුවෙලා තියෙනවා. 05(08) යෝජනාව නියෝජ්‍ය නගරාධිපති ලෙස ඩබ්. ජීවන්ත සුදර්ශණ කුමාර ප්‍රනාන්දු කියන නම ඇතුලත් වෙලා තියෙනවා, එය මුද්‍රණ දෝෂයක්.

**නාගරික ලේකම් - එම්.කේ.ඩී. තාරක මුණසිංහ**

ගරු නගරාධිපතිතුමනි, එම වැරදීම සම්බන්දයෙන් මා නියෝජ්‍ය නගරාධිපතිතුමියගෙන් සමාව අයද සිටිනවා. එය අප අතින් සිදු වූ මුද්‍රණ දෝෂයක්, අතපසු වීමක්. එම නිසා එතුමියගෙන් සමාව ඉල්ලා සිටිනවා.

## 03 සභාව අමතා එවන ලද ආයචනා හා පෙත්සම් පැමිණිලි හා සංදේශ සභාව හමුවේ තැබීම.

**03(1) මහා නගර සභා මන්ත්‍රී - එල්. ඩී. තිලක් විජේතුංග මහතා**

ගරු නගරාධිපතිතුමනි, මහජන පෙත්සමක් විදිහට ඉදිරිපත් වෙලා තියෙනවා කටුබැද්ද දකුණ කොට්ඨාශයෙන් හත්තොටුව මාවත මීට කලින් 2018 දී ප්‍රතිසංස්කරනය කළා. ඒ ප්‍රතිසංස්කරණය නොකරපු කුඩා කොටසක් තියෙනවා. අඩි 12 පළල අඩි 48 ක් දිග ප්‍රමාණයක් ඒ නිවැසියන් ඉල්ලීමක් කරලා තියෙනවා ඒ කොටස කොන්ක්‍රිට් අතුරලා හෝ ගල් අතුරලා හරි සංවර්ධනය කරලා දෙන්න කියලා.

**03(2) මහා නගර සභා මන්ත්‍රී - එල්. ඩී. තිලක් විජේතුංග මහතා**

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද විජේසිංහ මාවත, මෝල පාරේ මීටර් 100ක් දිග අඩි 15 පළල බොරළු පාර සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(3) මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා**

ගරු නගරාධිපතිතුමනි, පසුගිය සැප්තැම්බර් මාසයේ 29 වන දින කොරළවැල්ල ශාන්ත මයිකල් දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යා වෙනුවෙන් මොරටුව මහා නගර සභාවෙන් ඉටු විය යුතු සේවාවන් නොපිරිහෙළා ඉටු කිරිම සම්බන්දයෙන් විශේෂයෙන්ම ඔබතුමාටත් කොමසාරිස්තුමිය ඇතුළු නිලධාරි මණ්ඩලයටත් විශේෂයෙන්ම සේවක මහත්ම මහත්මීන්ටත් එම කොට්ඨාශයේ නාගරික මන්ත්‍රීවරයා විදිහට මම විශේෂ ස්තුතියක් පුද කර සිටිනවා.

**03(4) මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා**

ගරු නගරාධිපතිතුමනි, මා නවක මන්ත්‍රීවරයෙක් විදිහට සභාවට යොමු කරපු පළවෙනිම යෝජනාව ශාන්ත මයිකල් ජුබිලි පාර සංවර්ධනය කිරීම එම යෝජනාවට ඔබතුමා දැක්වූ යහපත් ප්‍රතිචාරය නිසාම ඊයේ දිනයේදී ශාන්ත මයිකල් ජුබිලි පාරේ තාර දාලා ඒ වැඩ කටුයුතු අවසන් කරන්න හැකියාව ලැබුණා ඒ සඳහා ඔබතුමාට ස්තුතිය පුදකර සිටිනවා.

**03(5) මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා**

ගරු නගරාධිපතිතුමනි, කොරළවැල්ල 554 ග්‍රාමසේවා වසමේ ග්‍රාම නිලධාරිතුමියගේ ලිපියක් ලැබිලා තියෙනවා එතුමිය මීට පෙරත් ඔබතුමාට ප්‍රදේශිය ලේකම්තුමා මඟින් ඉල්ලීමක් කරලා තියෙනවා. එතුමියට කාර්යාලයක් සඳහා කොට්ඨාශය තුල ඉඩකඩ නොමැති වීම සම්බන්ධයෙන්, එම ග්‍රාමසේවා වසම තුළ දැනට මෙල්විල් වත්ත ප්‍රජාශාලාවේ තමයි එතුමිය දැනට කාර්යාලය විදිහට පවත්වාගෙන යන්නේ. නමුත් කොට්ඨාශයේ සිටින වැඩිහිටි වයස්ගත පුද්ගලයින්ට, අබාධිත පුද්ගලයින්ට මේ කොට්ඨාශයේ සිට මැල්විල් වත්ත කොට්ඨාශයට යා යුතුයි ග්‍රාමසේවා නිලධාරිතුමිය හමුවීම සඳහා. හැකියාවක් තිබෙනවනම් කොරළවැල්ල 13 කණුව ලඟ මාතෘසායන ගොඩනැඟිල්ලේ තියෙනවා අපේ ප්‍රජාශාලාව එහි කාමරයක් එතුමියට ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(6)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ සභාව පිහිටවලා දෙවන සභා වාරයේදී මම ඔබතුමාට ඉදිරිපත් කරා අගලකඩ සිරිසුමන හිමියන්ගේ ලිපියක් සමඟ ලුනාව ශ්‍රී විසුද්ධාරාම පාර පිළිබඳව තියෙන ගැටුම පිළිබඳව. ඒ වගේම මම කියන්න ඕන 2006.07.07 පැවති මාසික සභා රැස්වීමේදී සජීවනී නිසංසලා මන්ත්‍රීතුමිය සහ ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමා විසින් යෝජනා ස්ථිර කරනු ලදුව කර්මාන්ත ස්ථාවර කාරක සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ලුනාව මන්සංදියේ සිට ශ්‍රී විසුද්ධාරාම පාර දෙසට ඇති ප්‍රධාන පාර උයන ශ්‍රී විසුද්ධාරාම පාර ලෙස නම් කරන මෙන් සභාවට යෝජනා කරන්නීය කියලා යෝජනාවක් ඉදිරිපත් වෙලා තියෙනවා. මේ කරුණ පිළිබඳව සලකා බැලූ කමිටුව 2008.03.24 වන දින පෙරවරු 11ට අවසන් විරෝධතා කැඳවීම කරලා තියෙනවා. ඒ කැඳවීමේදී කිසිවෙකු මේ සම්බන්ධව විරෝධතාවක් වෙලා නැති නිසා මේ කටුයුතු ඉදිරියට කරගෙන යාමට නිර්දේශ කරලා තියෙනවා. ඉතින් මම ඔබතුමාට යෝජනා කරනවා ඉහත කරුණු සොයා බැලීම සඳහා මාස ගණනක් ගතවී ඇතත් මේ සභා වාරය දක්වාත් මේ සම්බන්ධව හරියාකාර විමර්ෂනයක් නොකිරීම සම්බන්ධවත් මාගේ කණගාටුව ප්‍රකාශ කර සිටින අතර ඉතා ඉක්මනින් මේ පිළිබඳව විමර්ෂණයක් කොට ලුනාව මන්සංදියේ සිට 8වන පටුමග දෙසට ඇති ප්‍රධාන පාර උයන ශ්‍රී විසුද්ධාරාම පාර යනුවෙන් සභාව සතු මාර්ග ලේඛනයට ඇතුලත් කර එම නාම පුවරුව ඉදිකිරීමට අවසර ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**03(7)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ලුනාව ශ්‍රී බෝධිරාජා රාම පාර පටන් ගන්නේ 8 වන පටුමගේ සිට අගලකඩ සිරිසුමන හමුදුරුවන්ගේ පන්සලට යන පාර. ඒ පාර තියෙන්නේ ශ්‍රී බෝධිරාජා රාම පාර නමින් තමයි හඳුන්වන්නේ. උන්වහන්සේ ඉල්ලන්නේ ශ්‍රී බෝධිරාජා රාම විහාර මාවත යනුවෙන් නම් කරන ලෙසට. මේ ගැන සලකා බලා ඉතා ඉක්මනින් කඨින මාසේ නිසා මේ බෝඩ් එක සවිකිරීමට කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**03(8)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ නගර සභාවේ සේවකයින් කලාප 5කට ඔබතුමා වෙන්කරලා සේවයේ යොදවලා තියෙනවා. මේ කලාප 5ට සේවකයින් ගියාම ඒ නාම ලේඛනය අධීක්ෂණය කරන ඒ මහත්මයා. මේක කූඨ විදිහට විකුර්ති කරලා ඒ අත්සන් ලේඛනය වෙනස් කරනවා. මම මේ කතා කරන්නේ දීරිදීමනා වශයෙන් අපේ රියදුරු මහත්වරුන්ට දෙන පොහොර මුදල් පිළිඳව අත්සන් ලේඛනයේ දින විස්සක් විසිඑකක් වැඩ කරපු අයට දින විසිහතරක් පැමිණියා කියලා ඒ අත්සන් ලේඛන හරිගස්සවලා එවනවා මුදල් ගන්න. මොකද එතකොට අපේ සේවකයේ අධෛර්යය වෙනවා. මේ දීරිදීමනාව දෙන්නේ සේවකයින්ව අපි සේවයට ගෙන්න ගන්න. එක නිසා මම යෝජනා කරනවා ඒ කලාප 5ට වෙන් කිරීම හොඳයි හැබැයි එහෙට ඇඟිලි සළකුණු යන්ත්‍ර 5ක් ස්ථාපිත කරලා, ඔවුන්ට ඇඟිලි සළකුණු තියන්න සකස් කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(9)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, රාවතාවත්ත රෝමානු කතෝලික විදුහලේ කැළි කසල ඉවත් කිරීම සම්බන්ධව. ඔවුන් ඔවුන්ගේ කැළි කසල සියල්ලක්ම වෙන්වෙන් වශයෙන් තමයි තියලා තියෙන්නේ. ඉතින් ඒ කැළි කසල එගොඩ උයනේ පාසලක ඉවත් කිරීමක් මේ වන විටත් සිදු වෙනවා. අනිත් පාසල් වල ඉවත් කිරීමක් සිදු වන්නේ නැහැ. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා අනිත් පාසල් වලටත් මෙය ක්‍රියාත්මක කරන්න. මගේ ඉල්ලීම තියෙන්නේ රාවතාවත්ත රෝමානු කතෝලික විදුහලට හා උයන කණිෂ්ඨ විද්‍යාලයට ඒ වගේම ශාන්ත අන්තෝනි විද්‍යාලය කඩලාන ඒ පාසල් 3 විශේෂ කරලා කැළි කසල ඉවත් කිරීම සලසා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**03(10)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ආයාචනක් ලැබිලා තියෙනවා 1/1 ඒ,1/1 බී, 1/1 සී, 1/1 ඩී, හොලික්‍රොස් මාවතින්, අප නිවාස සඳහා ඇති විදුලි රැහැන් කණුව වෙනස් කිරීම සම්බන්ධව මම හිතන්නේ ඔබතුමා මේක දන්නවා. මේ අය අවුරුදු 50කට වඩා ජීවත් වෙනවා මේ පාරේ.ලස්සනට මේ පාර ගල් අල්ලලා වැඩේ කරලා තියෙනවා. ගෙවල් 6ක් තියෙනවා. අලුතින් ආපු කට්ටියක් විසින් තමයි මේ කණුව දාලා තියෙන්නේ. නමුත් ඒ අය උත්සහ කරනවා ප්‍රදේශිය ලේකම් කාර්යාලය සම්බන්ධ කරගෙන ඒ කණුව පාරෙන් එහා පැත්තට දාන්න. තුසිත් මන්ත්‍රීතුමත් මේ සම්බන්ධව දන්නවා ඇති.

එතුමාගේ ගෙවල් ආසන්නයේම. පුළුවන්නම් මෙතන ස්ථාන පරික්ෂාවක් කරලා ඒ සම්බන්ධව කටයුතු සොයා බලා එම ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම ඉටු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, මුඛ සුරක්ෂා වැඩසටහනක් කරා අපේ සජිත් දුමින්ද මන්ත්‍රීතුමා විසින් අපේ නගර සභා පරිශ්‍රයේ, ඒ සම්බන්ධව අවසර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**03(11)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕන වසර ගණනාවක්, අපේ නවක මන්ත්‍රී හිමාෂ මන්ත්‍රීතුමා කියපු ආකාරයට වසර ගණනාවක් ජුබිලි පාරේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, රීති ප්‍රශ්නයක් තියෙනවා. මේ යන්නේ ආයාචනා හා පෙත්සම් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නැවත වරක් එක ගැන කතා කරන්න බැහැ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම ස්තුතිවන්ත වෙන්න ඕන කියලා කිවුවේ ඒ සම්බන්ධයෙන්ම විතරක් නෙමෙයි. 2018 අපි මන්ත්‍රීවරු ලෙස සභාවට පත්වෙලා අපිට විදි ලම්පුවක් දාගන්න අවස්ථාව ඉල්ලුවහම. වසරක පමණ කාලයක් ගිහිල්ලා තමයි අපි මුදල් ගෙවලා අපිට දාගන්න අවස්ථාවක් ලැබුනේ. නමුත් ඔබතුමා මේ වෙනකොට ප්‍රදේශයේ විශාල ප්‍රශ්නයක් හැටියට නව ගාලු පාරේ ඔබතුමා සහ අධිකරණ අමාත්‍ය හර්ෂ නානායක්කාර මැතිතුමා මැදිහත්ව එකේ දැන් වැඩ අවසන් තත්ත්වයක පවතිනවා. ඒ සඳහා ස්තුතිවන්ත වෙනවා.

**03(12)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කොරළවැල්ල ශ්‍රමදාන මාවතේ වැසි ජලය බැස යාම සඳහා ඒ මාර්ගය හදලා තියෙනවා. මෙය ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමක් යකඩ ආවරණ දැන් අවුරුද්දක් විතර වෙනවා. ඒ යකඩ ආවරණ සොරුන් අරන් ගිහිල්ලා එක හදලා දෙන්න කියලා ඔවුන්ගේ ඉල්ලීමක් තියෙනවා.

**03(13)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කොරළවැල්ල මධ්‍යම බෙහෙත් ශාලාව සම්බන්ධව ප්‍රදේශවාසීන් 100ක පමණ අත්සන් ලේඛනය සමඟ ඔවුන් ඉල්ලීමක් ඉදිරිපත් කරලා තියෙනවා. මෝදර, එගොඩ උයන, කොරළවැල්ල ඒ ප්‍රදේශවාසීන් මහත්වූ පීඩාවට පත්වෙලා තියෙනවා. ඒ මධ්‍යස්ථානය මේ පරිශ්‍රයට ගෙනල්ලා තියෙනවා. නමුත් ඒ මිනිස්සුන්ට එන්න පුළුවන් තත්වයක් නැහැ ඔවුන් ඉල්ලා සිටිනවා ක්‍රිඩාංගන මාවතේ පුළුවන්නම් ස්ථානයක් හදලා එතනට ඒ බෙහෙත් ශාලාව හදලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(14)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කොරළවැල්ල සුසාන භූමියේ මේ වන විට වැඩ කරන සේවකයින් සම්බන්ධයෙන් මම මීට පෙරත් කොමසාරිස්තුමියව දැනුවත් කලා, වීඩියෝ මඟින් පෙන්නුවා. ඔවුන්ගේ රාජකාරිය ඔවුන් නිසි ලෙස ඉටු කරන්නේ නැහැ. සැහෙන්න ප්‍රශ්නයකට මුහුණ දීලා තියෙනවා, පහුගිය සතියේ දේහයක් මේ ස්ථානයට රැගෙන එනකොට මේ ඉන්න පුද්ගලයින් කොයි මොහොතේ බැලුවත් බීමත්ව සිටින්නේ. ඊයේ මළසිරුරක් අරන් ආවා කෙළින්වත් හිටගෙන ඉන්න බැහැ, අපි ඔවුන් ගැන හිතන නිසා අපි මුකුත් කරන්න ගියේ නැහැ ඒ අවස්ථාවේදී නමුත් මේ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් පරික්ෂණයක් පවත්වන්න. මම ඉල්ලා සිටින්නේ සුසාන භූමි භාරකරුවෙක් ඉන්නවා ඔවුන්ගෙන්වත් සේවාවක් වෙන්නේ නැහැ. වල් කපන්න තියා හිටගෙන ඉන්නවත් ඒ මිනිස්සුන්ට බැහැ. එම නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. සුසාන භූමි සඳහා වල් කපන්න අලුත් පිරිසක් මා විසින්ම එවුවා නමුත් ඔවුන්ට තවම අවස්ථාවක් ලැබුනේ නැහැ. මේ සඳහත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**03(15)** <u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, මට න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ වාචික පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න අවශ්‍යයි. මේ මස 04 වන දින සොයිසාපුර ක්ලිනින් ශ්‍රී ලංකා කියන වැඩසටහනක් දියත් කලා. ඒ අනුව සොයිසාපුර බොහෝ තැන් වල පිරිසිදු කිරීම් කටුයුතු සිදුවුනා ඊට අමතරව අනිත් ව්‍යාපෘතිත් සිදුවුනා. නමුත් කියන්න කණගාටුයි. ක්ලිනින් ශ්‍රී ලංකා කියලා ගොඩක් තැන් වල ක්ලින් කරා. ඒ අතු කපලා ඔක්කෝම එකතු කරලා තියලා නමුත් ඒ ටික ඊයේ ඉවත් කර ගත්තා කියලා මට දැනගන්න ලැබුණා. එතකොට ඒ ඉවත් කිරීම කරන්නේ අවසර දීලා තියෙන්නේ ලොඩ් 05කට පමණයි කියලා මට දැන ගන්න ලැබුණා. එතකොට ඒ ලොඩ් 05 ඉවත් කරාට පස්සේ කුණු, අතු, පස් එහෙම එකතු වෙලා තියෙනවා. එවා ඉවත් කරන්න අවසර නැහැ. ලොඩ් 05 එහාට ගෙනියන්න බැහැ කියලා ගරු මන්ත්‍රීතුමා මට දැනුවත් කරා. එක සහදිපත්‍යාට දැනුවත් කරන්න කියලා නමුත් මේ ඉතුරු කුණු ටික ඉවත් කරන්න කාටද අපි යොමු කරන්නේ. එතකොට එතන ගැටළුවක් තියෙනවානේ. කරනවනම් ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන් වගකීම අරගන්න ඕන. එතකොට ලොඩ් 05ට විතරක් සල්ලි ගෙවලා එවා කරදියානට ගෙනියන්න අවසර දීලා තියෙනවා. එතකොට ලොඩ් 05න් එහාට තියෙන කුණු ටික කවුද ඉවත් කරන්නේ. එම නිසා මම ඒ ගැටළුව ඔබතුමාට යොමු කරනවා.

**03(16)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද ගාඩ්න් සිටි නිවාස වාසීන්ගේ සුබ සාධක සංගමය මඟින් ඔවුන්ගේ ඉල්ලීම් කිහිපයක් ඇතුළත් ආයාචනයක් ඉදිරිපත් කරලා තියෙනවා. මම එය ඉදිරිපත් කරනවා.

**03(17)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද අද්මිරාල් කැලැරන්සි ප්‍රනාන්දු මාවතේ ප්‍රදේශවාසීන්ගේ අත්සන් සහිතව ඉල්ලීමක් ඉදිරිපත් කරලා තියෙනවා. මාර්ගය පිළිසකර කරලා කාණු පද්ධතියේ ඉතිරි කොටස සකස් කරලා දෙන්න කියලා. එය සභාවට ඉදිරිපත් කරනවා.

**03(18)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනවිරත්න මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, විල්ලෝරාවත්ත ප්‍රදේශයේ තියෙන විශාලම කාණුවක් තියෙනවා. බෝධාකුඹුර හරහා බඹටුව ගඟ දක්වා. එක හරහා ගිය පාලක සමයේදී විශාල කාණුවක් හදලා දුන්නා. එකෙන් සැහෙන්න සේවයකුත් වුනා ජනතාවට, ඒ අතරේ ඒ පාලම හරහා බෝධාකුඹුරේ ජනතාවට ඉදිබැද්දට යන්න කෙටි ගමන් මාර්ගයක් හදලා දීලා තිබුණා. එක පටු නිසා ඒ ගම්වාසීන් සහ ග්‍රාම සංවර්ධන සමිතියේ සමාජිකයින්ගේ ආයාචනයක් ලෙස එය පුළුල් කරලා දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරනවා.

**03(19)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද බටහිර කොට්ඨාශය තමුන්නාන්සේලා සතියට දවසක් සුද්ධපවිත්‍ර කරන දිනය හැටියට බ්‍රහස්පතින්දා දිනය ලබා දී තියෙනවා. ඒ ලබා දීමේදී ඔබතුමාගේ අනුදැනුම ඇතිව, කලාපෙට ඔබතුමන්ලා දැනුම් දීලා තියෙනවා පක්ෂයේ ඉන්න නියෝජිතයින් හරහා මේ සුද්ධ පවිත්‍ර කරන්නේ මොන කාණුවද මොන මාර්ගයද කියලා දැන හඳුනගෙන කරන්න කියලා. ඉතින් ඒ කලාපෙට ලැබිලා තියෙන උපදෙස් අනුව කලාපයේ මහතුන් විසින් ඔබතුමන්ලාගේ පක්ෂයේ සිටින නියෝජිතයින් හරහා අවශ්‍ය කරන මාර්ගය අරගෙන පවිත්‍ර කරනවා ඒ පිළිබඳ අපිට ගැටළුවක් නැහැ අපි ප්‍රදේශය නියෝජනය කරන මහජන නියෝජිතයින් හැටියට අපිට සිදුවෙන්න ඕන දේ මේකයි. කවුරු කරත් කමක් නැහැ අපිට අවශ්‍ය වැඩේ වෙන්න. හැබැයි ගිය මාසේ 18 වන දින මම පදිංචි වෙලා ඉන්න සේවා පටුමග මාර්ගය සුද්ධ පවිත්‍ර කරනවා හෙටට සති තුනක් වෙනවා අද වෙනකන් මේක ගෙනියන්න කටයුතු කරලා නැහැ. මේවා පාර දීගේ ගාලාගෙන යනවා. වැසි දිනත් එක්ක මේ ඔක්කෝම දියවෙලා යනවා. එම නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඔබතුමන්ලාගේ පක්ෂ නියෝජිතයා තමයි මේ මාර්ග පවිත්‍ර කරන තැනට එන්නේ. එතුමා තමයි මෙක කරන්න උපදෙස් දෙන්නේ. ඒ නිසා එතුමාට කියන්න ගෙනියලද නැද්ද කියලවත් බලන්න කියලා. අස්කරන දවසට එතනට ගිහින් හිටගෙන ඉදලා හරියන්නේ නැහැ. මේක නැවත අරන් ගියාද කියලා විපරමක් කරන්න කියන්න. කලාපය භාරව ඉන්න අජිත් මහත්මයා කියන්නේ ඉතා

හොඳ මහත්තයෙක් අපි දැනුම් දුන්නත් යම්කිසි වැඩක් කරනවා. හැබැයි මේක කෙරෙන්නේම නැති නිසා මම එතුමට කතා කරාම, එතුමා මට කිව්වා මන්ත්‍රීතුමා මට දවසක් හෝ දෙකක් දෙන්න මම මේක කරලා දෙන්නනම් කියලා. නමුත් මේක තාම කෙරිලා නැහැ, මම එතුමාට කිව්වේ පෙරේදා වගේ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේ සම්බන්ධව. මේක පවිත්‍ර කරා වගේම මේක ගෙනියන වැඩපිළි වෙලක් හදන්න කියලා ඉල්ලනවා.

**03(20)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමත්, මමත් අපේ ජීවන්ත මන්ත්‍රීතුමත් හොඳින් දන්නවා මොකද ඒ පැත්ත බලන මන්ත්‍රීවරයා හැටියට. මොකද මේ වෙනකොට ඉදිබැද්ද ප්‍රශ්න ගිහින් එතුමාට තමයි කියන්න ඕන. අපි එතුමාවත් සභාවත් දෙකම දැනුවත් කරනවා. පහළ ඉදිබැද්ද බැක්වත්තේ නිවාස වලට යාබඳව තමයි මේ ලොකු ඇල තියෙන්නේ බැක් වත්තෙන් තමයි ගඟට මායිම් වෙන්නේ. ඉතින් ඒ නිසා බෝහොම හොඳ වැඩක් කොමසාරිස්තුමියගේ පාලන කාලය තුළ ඔබතුමාන්ලාගේ රජය තුළ ක්ලීනින් ශ්‍රී ලංකා කියලා වැඩසටහනක් පටන් අරගෙන ඉතාමත් හොඳයි. කොමසාරිස්තුමියගේ සහයෝගය අරගෙන හිටපු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා එතන හිටගෙන ඉඳලා තමුන්නාන්සේලාගේ මහජන නියෝජිතයා එක්ක. මෙවා සුද්ධපවිත්‍ර කරා. එවා ඇත්තටම හොඳ දේවල් හැබැයි දැන් එවා සිදු වෙන්නේ නැහැ. බලය ගන්න කලින් මෙවා සුද්ධපවිත්‍ර කරා. බලය ගත්තට පස්සේ මේවා නොකෙරෙන තත්වයක් තියෙනවා. අද මේ වෙනකොට යන්න බැක්වත්තට මම හිතන්නේ මේ කාණුව අඩි 30ක් විතර පළලයි මීටර් 100කට එහා මේ කාණුවේ බෝතල් පිරීලා, ගස් අතු පිරීලා අද ඒ පැත්තේ ඉන්න ජනතාවට ඉන්න බැරි තත්ත්වයකට පත්වෙලා තියෙනවා. මේ ජීවන්ත මන්ත්‍රීතුමාගේ මස්සිනා කෙනෙක් ඉන්නවා එතන. මෙතුමට සැහෙන්න වතාවක් කියලා තියෙනවා. මෙතුමා එතකොට කියලා තියෙනවා. සේවකයෝ නැහැ කියලා, මොන මොනවා හරි කියන්න ඇති. එක වෙනම කාරණාවක් මේවා සිදුවිය යුතු දේවල් මීට පෙරත් එතන කුණු ගොඩ දාලා තියෙනවා, ඒත් සුද්ධ කරලා නැහැ. ඒ ගොඩවත් ඇදලා නැහැ. එම නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා ඉතා ඉක්මනින් මැදිහත්වෙලා මේ කාරණාව කරන්න කියන ඉල්ලීම කරනවා.

**03(21)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මීට සතියකට එකහාමාරකට කලින් මොරටුමුල්ල කලාපයට ගිහිල්ලා කොට කලිසමකුත් ඇඳගෙන පොඩ්ඩක් පැත්තකට වෙලා වාඩිවෙලා හිටියා. මරණයකට සේවකයෝ කිහිප දෙනෙක් ගන්න එක අනිවාර්යෙන් ලැබුණා. එක ගැන නෙමෙයි මේ කතා කරන්නේ. හැබැයි මම වාඩි වෙලා ඉන්නකොට මම දැක්කා මන්ත්‍රීවරයෙක් එක්ක අපේ ඔඩිට් එකෙන් මම හිතන්නේ සුසන්තිකා මහත්මිය එන්නෙත් නැති තරම් වේගයට පඩිපෙල් වලින් දුවගෙන ඇවිල්ලා එතන අත්සන් කරන පොත ආපු ගමන් ගත්තා. අරගෙන ආපු නිලධාරියා අත්සන් කරා ඊට පස්සේ විනාඩි දෙකක් තුනක් යනකොට අර අයට ඇවිල්ලා අත්සන් කරන්නත් අවස්ථාවක් නැහැ. එතකොට ප්‍රමාද වෙලත් නැහැ. ඊට පස්සේ ටික වේලාවක් යනකොට නිලධාරියා අත්සන් කරාට යටින් අත්සන් කරන්න දුන්නා බොහොම හොඳයි. අපි එක වරදක් දකිනවා නෙමෙයි අපි කියන්නේ කවුරු හරි අත්සන් කරලා ගෙදර යනවනම් වැඩ නොකර එක අල්ලන්න එක හොඳ දෙයක් හැබැයි මේ සේවකයින්ට විනාඩි 5ක් 10ක් ප්‍රමාද වුනාට ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න මේක අත්සන් කරන්න. එහෙම නැතුව අත්සන් කරලා ගෙදර යනවනම් ආමි යනවනම් කිසි ගැටළුවක් නැහැ ඔබතුමන්ලා මැදිහත් වෙලා ඒ දවස කපා හැරියත්, නීතිමය ක්‍රියාමාර්ග ගත්තත් හැබැයි අත්සන් කිරීමේදී මේ අයට විනාඩි 10ක් 15ක් ප්‍රමාද වුනොත් ඒ අවස්ථාව ලබා දෙන්න. මොකද අපි මේකේ දැකලා තියෙනවා ඕනි තරම් පුස්තකාලවල වැඩ කරන අය පවා කිසිම තැනක අත්සන් කරන්නේ නැතුව. ඇඟිලි සළකුණ තියන්නේ නැතුව මේකේ ඕන විදිහට වැඩ කරනවා. හැබැයි ඔබතුමාලා එක පැත්තකින් ඒ අයට සහනයක් ලබා දෙන ගමන් අර සුළු සේවකයට පහර පිට පහර දෙනවා ගරු නගරාධිපතිතුමනී, ඒ නිසා මේ සඳහාත් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න ඉල්ලා සිටිනවා.

**03(22)** **<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පසුගිය ඔක්තෝබර් 1 වනදා පැවැත්වුනා ලෝක ළමා දිනය, වැඩිහිටි දිනය ඊට සමගාමීව අපේ මොරටුව මහා නගර සභාවේ ඒ පුංචි දරුවන් වෙනුවෙන් පැවතුන ඒ අතිවිශිෂ්ට උත්සවයට දේශපාලන නායකත්වක ඔබතුමන්ලාගෙන් ලැබුනා වගේම අනිත් පැත්තෙන් මම ස්තුති කරන්න පොඩි අවස්ථාවක් ගන්නවා මොකද මේක ඉතාම උත්කෘෂ්ඨ අන්දමින් පැවතුනා. එකෙදී විශේෂ කැප කිරීමක් කරා තුල්සිකා මල්ලවාරච්චි අපේ නිලධාරිතුමිය එහි කැප වීම අති විශිෂ්ටයි. අපේ දුල්සිරි මහත්මයා එකට අවශ්‍ය තෑගි බෝග ටික හොයා ගන්න දැඩි මහන්සියක් වුනා. එවගේම අපේ කොමසාරිස්තුමිය නැති අඩුපාඩුව එතුමිය පැවරුවා අපේ වැඩබලන කොමසාරිස්තුමාට එතුමාත් එතුමාගේ දායකත්වය කරා. ඒ නිසා මම සභාව වෙනුවෙන් දරුවන්ට ඔවුන්ගේ ඒ ලස්සන ලෝකය හදන්න ඒ කරපු කැප කිරීමට කෘතවේදීත්වය පුදකරනවා. ඇත්තටම අපි සේවකයින්ට නිලධාරින්ට බොහෝ දොස් කියනවා වගේම හොඳ දේ කරාට පස්සේ ඔවුන්ගේ පර්සනල් ෆයිල් එකටත් හොඳ ඇගයීම් ලිපියක් ගියොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. ඒ සඳහා කටයුතු කරන්න කියලා මම පළමුව ඔබෙන් ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, අපේ මේ නගර සභාවේ හිටියා විශිෂ්ට ගණකාධිකාරිවරයෙක් එතුමා ගිය සභාවේ හිටියා මේ සභාව වෙනකොට එතුමා මම හිතන්නේ මුදල් අමාත්‍යාංශයට මාරු වෙලා ගිහිල්ලා තියෙනවා. එතුමා මේ සභාවට මුදල් හොයලා දෙන්න කැපකිරීම් කරන්න විශාල ශක්තියක් දුන්න කෙනෙක් එම නිසා මම හිතන්නේ ඔහු නැති අඩුව දැනෙයි. ඔහුගේ විශිෂ්ට රාජකාරි සේවය අගය කරලා ඔහුටත් ඒ ලිපියක් පර්සනල් ෆයිල් එකට යවන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**03(23)** **<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පසුගිය 23 වන දා මොරටුව මහා නගර සභාවට අපිට පුළුවන් වුනා. දතට මිතුරු මුඛ සුරක්ෂා වැඩසටහන ඉටු කරන්න සේවකයන් සහ නිලධාරින් වෙනුවෙන් එ සඳහා ඔබතුමා කිසිම පැකිළීමකින් තොරව අවස්ථාව ලබා දුන්නා. ඒ සඳහා ස්තුතිය පුද කරනවා. අපේ සේනක මන්ත්‍රීතුමා, සුජිත් මන්ත්‍රීතුමා, සුරේෂ් මන්ත්‍රීතුමා, අපේ ඔසඳ මන්ත්‍රීතුමා, තිලකසිරි මන්ත්‍රීතුමා අපේ පක්ෂ නායකයෝ සියළුදෙනා සහයෝගය ලබා දුන්නා, අපේ අණ්ඩු පක්ෂයේ සියළු දෙනාමත් ඇවිත් අපිව ඇගයකිරීම් කළා. මේ සියළුදෙනාටම අපේ කොමසාරිස්තුමියට අපේ ඒ වෙනකොට වැඩ බලන කොමසාරිස්තුමා පුර්ණ සහයෝගයක් ලබා දුන්නා. ඒ සියළුදෙනාට කෘතවේදීත්වය පලකරනවා. විශේෂයෙන් අපිට පුළුවන් කමක් ලැබුණා ඉතා විශිෂ්ට සේවයක් කරන්න මුඛ රෝග සම්බන්ධ දේවල් හඳුනාගන්න. දත් මදින තාක්ෂණය කියලා දෙන්න. ඒ නිසා මම ඉල්ලා සිටිනවා මාසේකට වාතාවක් මේ වගේ වැඩසටහන් පවත්වලා මේ සේවකයන්ට මේ නිලධාරින්ට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරන්න ඒ දායකත්වය ලබාදෙන්න කියලා.

**03(24)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඊයේ රාත්‍රියේ මට දුරකථනයෙන් ලැබුන පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. ධර්මබන්දු මාවතේ පසුගිය වැසිදින වල මැද තියෙන ගලි වලවල් මත්ද්‍රව්‍ය පාවිච්චි කරන අය විසින් අරන් ගිහින් තිබුණා කියලා දැනගන්න ලැබුනා. තාම එය පිලිසකර වෙලා නැහැ. වාහන යනකොට ඒ වලවල් වල වැටිලා අපහසුතාවයට පත්වෙනවා කියලා ඊයේ රාත්‍රියේ තමයි කෝල් එක ආවේ. එම නිසා මම ඉංජිනේරුතුමාව හා ඔබතුමාව දැනුවත් කරනවා මේ සම්බන්ධව සොයා බලා ඉක්මනින් මේ සඳහා කටයුතු කරන්න කියලා.

**03(25)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මුලින්ම අපි සුභ පතනවා ශිරෝමි ඉන්දිකා මන්ත්‍රීතුමියට එතුමිය කොළඹ දිස්ත්‍රික්කයේ කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංගමයේ සභාපති වීම සම්බන්ධව. සමස්ත මොරටු ජනතාවගේ හා සියළු පක්ෂ නායකයින්ගේ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ සුබ පැතුම් එක්කර සිටිනවා.

**03(26)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි තමුන්නාන්සේලා සැම දෙනාම මේ මොරටුවේ ජනතාවට යමක් කරන්න එක තමයි අපේ අධිෂ්ඨානය වෙන්නේ. ගොඩක් දුරට අපි මේ සභාවේ මේ කරුණට ආදාළව පැමිණිලි ඉදිරිපත් කරනවා පෙත්සම් ඉදිරිපත් කරනවා. නමුත් මම අහන්නේ අපේ

ලේකම්තුමා ඇතුළු කොමසාරිස්තුමියගෙන් මේ මිනිස්සු ඉදිරිපත් කරන ඉල්ලීම් වලට මෙතනින් එහාට වෙන ක්‍රියාදාමය මොකද්ද මීට පෙර උනෙත් නැහැ, දැන් වෙන්නෙත් නැහැ. මම ඉල්ලීමක් කරනවා කවුරු හෝ තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඉල්ලීමක් කරාම ඒ අයට මේ සභාවේ. අපි සමානයෙන් ආමාත්‍යාංශයකින් ඉල්ලීමක් කරාම ආමාත්‍යාංශයෙන් අපිට ලියුමක් එවනවා මෙන්න මේකට ඉදිරියේදී කටයුතු කරනවා කියලා ඉතින් ජනතාව දන්නවා ඒ මේ ක්‍රියාදාමය වෙනවා. ඉතින් අපි නගර සභාවෙනුත් ඉල්ලීමක් කරනවා අන්න ඒ කටයුත්ත කරන්න කියලා. මෙතනින් එහාට අපිට පණිවිඩේ එන්නෙත් නැහැ, ජනතාවට පණිවිඩේ යන්නෙත් නැහැ. අන්න ඒ නිසා ඔබතුමාගේ මේ කාලය තුළ මෙය කරලා දෙන්න කියලා ඉල්ලනවා.

**03(27)** <u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ සජිත් මන්ත්‍රීතුමා කිවුවා වගේ අපේ හිටපු ගණකාධිකාරි තරිඳු කුමාරරත්න මහතා ගැන වචනයක් කියන්න ඕන. අපි ඉතාම පොඩි කාලයයි මේ සභාවට ඇවිල්ලා. මුදල් කමිටුවේ කාර්ය භාර්ය පටන් අරන් පොඩි කාලයයි. ඒ කාලයෙදී ඕනෑම ප්‍රශ්නයක් ආදායම් පිළිබඳ, වියදම් පිළිබඳ ඕනෑම ප්‍රශ්නයකදී එතුමාට සාදනීය කරුණක් එකට ඉදිරිපත් කරන්න තිබුණා. වරිපනම් කපා හැරීමක් උනත් එතුමාට තිබුණා අනිත් නිලධාරින්ගේ වගකීමත් අරගෙන ඉතාම ඉහළ මට්ටමේ තීරණ ක්‍රියාත්මක කිරීමේ ශක්තියක් මුදල් කමිටුවේදී ලොකු අඩුපාඩුවක් වෙනවා ඒ මහත්මයා නැතිවීම. ඒ වෙනුවට අලුත් පත්වීමක් අරගෙන අලුත් නිලධාරිතුමියක් ආවා කියලා ආරංචියක් ආවා. එතුමියවත් පිළිගන්නවා. එතුමියට ආරාධනා කරනවා ඒ මහත්තයා එක්ක කතා කරලා දැනුම වර්ධනය කරගෙන අපිත් එක්ක කටයුතු කරන්න ලැබේවා කියලා කියනවා.

**03(28)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන්ම ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මියට සුභාශිංසනය පුද කර සිටිනවා. එතුමිය කොළඹ දිස්ත්‍රික්කයේ කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංගමයේ සභාපති ලෙස තේරීපත් වීම සම්බන්ධව.

ගරු නගරාධිපතිතුමනි, මේ සභාව නියෝජනය කරන එගොඩඋයන කොට්ඨාශයේ මහනගර සභා මන්ත්‍රීතුමා මම හිතන්නේ මාලිමාවේ මන්ත්‍රීතුමාගේ බිරිඳ අභාවයට පත්වුණා ඉතින් අපේ කණ්ඩායමේ සාතිශා සංවේගය ශෝකය එතුමාට පුදකර සිටිනවා.

**03(29)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මීට මාස 2කට කලින් ඉදිරිපත් කරා ලිඛිත ඉල්ලීමක් කටුබැද්ද විශ්ව විද්‍යාලයත් එක්ක කතා කරලා ජෝන් රුද්‍රිගු මාවතේ කිහිප තැනක් පුළුල් කරගැනීමේ වැඩසටහනක් සම්බන්ධව. මම ඊට පසුව කිසිම කමිටුවකවත් මේ සම්බන්ධව දැක්කේ නැහැ. මම දැන ගන්න කැමති මේකට මොකද්ද වුනේ කියලා. මේකට වියදමක් නැතුව විශාල ජනතාවකට සේවයක් කරන්න පුළුවන් යෝජනාවක් ඉදිරිපත් කරේ. මේක සාකච්ඡා මට්ටමේ තිබිලා සාකච්ඡාව සාර්ථක වෙච්ච අවස්ථාවක අණ්ඩු වෙනස් වීම තුළ තමයි මෙය නොහැකි වුනේ. පොඩි දෙයයි තියෙන්නේ විශ්ව විද්‍යාලයේ පාලන අධිකාරීය හා ඔබතුමා ඇතුළු කණ්ඩායම සාකච්ඡාවක් තියලා අපිට පුළුවන් මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න. එකට වියදම් කරනවනම් ජනතාව සුදානමින් ඉන්නවා ජෝන් රුද්‍රිගු මාවතේ එකට වියදම් කරන්න සැදීපැහැදී සිටිනවා කියලා මතක් කරනවා.

**03(30)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සභාවේ අපි අවස්ථා දෙකක යෝජනා කරා කටුකුරුන්ද තොටුපල පාරේ සභාව සතු කඩ කාමර අල්ලා ගැනීමක් කරලා යාබඳ නිවසේ පුද්ගලයා අල්ලා ගැනීමක් කරලා තියෙනවා කියලා. ප්‍රශ්නයක් තියෙනවා ඇයි සභා වාර 2ක් යනකනුත් මේක අපි මතු කරලත් මේක ගැන යුහුසුළු නොවුනේ කියන එක. මට ඊට පසුව හොයලා බලනකොට දැනගන්න ලැබුණා මේක මාලිමාවට සම්බන්ධ ප්‍රබල පුද්ලගලයෙක් ඒ නිවසේ ඉන්නවා. ඒ නිසාවෙන් මේක ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එක. හිතන්න තියෙනවා හිනාවෙන්න නෙමෙයි අපි අහනවා මාස 2ක් තිස්සේ මේ ගැන පියවරක් ගත්තේ නැත්තේ. හිනාවෙවි ඉන්න නෙමෙයි අවශ්‍ය වෙන්නේ මේවා ගිහින් බලන්නයි ඕන. මෙවා අපි කියන්න ඕන දේවල් නෙමෙයි අපි පෙන්නලා දුන්නා මාස 2ක් තිස්සේ. මේක ක්‍රියාත්මක උනේ නැහැ. ඒ නිසා අපි කියනවා මෙහි ෆෝටෝ තියෙනවා. මේක ගැන ක්‍රියාත්මක වෙන්න. මේවා අපි පෙන්නලා දෙන්නේ සභාව සතු දේපල අරක්ෂා කර ගන්න.

එහෙම නැතුව පෞද්ගලික වාසියක් අපිට නැහැ. ඒ නිසා මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(31)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙර පාසල් වල ගුරුවරු වෙනුවෙන් කුසුමාවති මහත්මිය නිතර නිතර අපෙන් ඉල්ලීම් කරනවා ඒ අයට සිදුවන අසාධාරණයක් සම්බන්ධව මම හිතන්නේ නැවත වතාවක් මේ ගැන සලකා බලා මේ පිළිබඳව කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(32)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා පෙත්සම් පැමිණිලි යටතේ මට තැපැලෙන් ලැබිලා තියෙනවා පෙත්සම් 2ක් ඒ පෙත්සම් 2ක මම පළමුව ඉදිරිපත් කරනවා. එහි එකක සඳහන් වෙනවා මේ ජනසෙත පුස්තකාලය සම්බන්ධයෙන් සඳහන් වන ලිපියේ පැහැදිලි චෝදනාවක් කරනවා. දැනට ජනසෙත පුස්තකාලයේ වැඩ බැලිමේ පදනමින් වෙන්න ඇති, පුස්තකාලයාධිපති කෙනෙක් පත්කරලා තියෙනවා. පුස්තකාලයාධිපතිතුමියට විශේෂ වරප්‍රසාද රාශියක් ඔබතුමා විසින් දීලා තියෙනවා. මේ නගර සභාවේ නාගරික කොමසාරිස්වරිය ඇඟිල්ල සළකුණු කරන්නේ නැද්ද, හත්වලාමේ නාගරික කොමසාරිස්වරිය ඇඟිල්ල සළකුණු කරනවා, හැබැයි මේ කියන තැනැත්තිය ඇඟිලි සළකුණු කරන්නේ නැහැ ජනසෙතේ ඇඟිලි සළකුණු යන්ත්‍රයක් තියෙනවා. ඒ තිබිලත් මේ කියන තැනැත්තිය ඇඟිලි සළකුණු යන්ත්‍රය පාවිච්චි කරන්නේ නැහැ. එතකොට මේ ආදාල තැනැත්තිය විශේෂයෙන්ම නාගරික කොමසාරිස්වරිය ඇඟිල්ල සළකුණු කරත් මෙතුමිය කරන්නේ නැහැ කියන එක තමයි අපිට කියන්න තියෙන්නේ. ඊලඟ එක තමයි නගර සභාවේ සේවකයන්ට දිගින් දිගටම මේ ජනසෙත පුස්තකාලයේ සේවය කරන සුළු සේවකයින්ට හා අනෙකුත් සේවකයින්ට දිගින් දිගටම විශාල බලපෑම් කරන්න අරන් තියෙනවා මෙතුමිය. ඔබතුමා පත්වුන ගමන් මෙතුමිය ඔබතුමාගේ කාර්ය මණ්ඩලයට එනවා සොයිසාපුර පුස්තකාලයේ ඉඳලා ඒ කාර්ය මණ්ඩලයට ඇවිල්ලා ඔබතුමා විසින් මොකක් හරි හේතුවක් නිසා නැවත වරක් සොයිසාපුර පුස්තකාලයට දානවා. එහෙන් මෙතුමියව දානවා ජනසෙත පුස්තකාලයට, එහෙදී මෙතුමියගේ අර සොයිසාපුර පුස්තකාලයේ හිටපු එක්තරා නිලධාරිවරියෙකුත් අරගෙන තමයි මෙතුමිය ජනසෙතට එන්නේ. අපි අහන්නේ ජනසෙත පුස්තකාලය කියන්නේ සමහර අවස්ථාවලදී යාපනය පුස්තකාලයට පමණක් දෙවෙනි වුන පුස්තකාලයක් ඒ තරම් වැදගත් කමක් තියෙන, ඒ තරම් වටිනාකමක් තියෙන, ඒ තරම් අපිට ජනතාව අතරට යන්න පුළුවන් සහ ජනතාවට විශාල සේවාවක් කරන්න පුළුවන් පුස්තකාලයක්. අපේ හිටියා නිලධාරීන් දෙදෙනෙක්, ඒ අයගෙන් එක්කෙනෙක් පුස්තකාලය සම්බන්ධ විශේෂ උපාධියක් තියෙන නිලධාරියෙක් සහ අනිත් නිලධාරිනිය ඔහුට උදව් කරා. එතකොට ඒ නිලධාරීන් දෙදෙනව අයින් කරලා සභා පත්වීමකට කම්කරු පත්වීමකට ඇවිල්ලා ඊට පසුව පුස්තකාල සහයක තනතුරක් සභාවෙන් දීපු පුස්තකාල සම්බන්ධ කිසිම සුදුසුකමක් සපුරලා නැති කෙනෙකුට ජනසෙත පුස්තකාලය භාර දෙන්නේ කෙසෙද කියන එක තමයි ප්‍රශ්නය. මේක අපි කරානම් නැත්තම් වෙන ආණ්ඩුවකින් කරානම් මේක දේශපාලන බලපෑම් කියලා හිතාගන්න පුළුවන්. හැබැයි අපිට තියෙන ගැටළුව මාලිමා පාලනයක් යටතේ මෙවැනි දේශපාලන හිතවතුන්ට මෙවැනි වරප්‍රසාද වාරදාන ලබා දීමෙන් ජනතාව ලොකු ගැටළුවක ඉන්නවා ඒ නිසා තමයි මේ වගේ ලිපි ඉදිරිපත් කරලා තියෙන්නේ. ඒ නිසා අපි වහාම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මේ ජනසෙත පුස්තකාලය විනාශ කරන්න එපා කරුණාකරලා. ඔබතුමාටත් හොඳට ඉගෙන ගත්ත දරුවෝ දෙන්නෙක් ඉන්නවා අපි දන්නවා. ඔබත් පියෙක් මාත් පියෙක්, මෙතන ඉන්න බහුතරයකට ඉන්නේ ඉගෙන ගන්න වයසේ දරුවෝ, ජනසෙත පුස්තකාලය කියන්නේ අපි අ.පො.ස.උසස් පෙළ කරනකොට ගිහින් පාඩම් කරපු තැන. ඒ නිසා අපි බොහොම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා මේ පුස්තකාලය විනාශ වෙන්න දෙන්න එපා. කරුණාකරලා මේ පුස්තකාලයට හරි සුදුසුකම් තියෙන පුස්තකාලයාධිපති කෙනෙක් ඉල්ලුවාහම දෙන්නේ නැත්තම් මේකේ හරි සුදුසුකම් තියෙන පුස්තකාලයාධිපතිවරයෙක්, සංවර්ධන නිලධාරිවරයෙක් හරි දාලා මේ පුස්තකාලය නැවත වරක් ගොඩගන්න කියන එක කියනවා. මේක විනාශ වෙන්න දෙන්න එපා මොකද මේ ලඟදීත් ලක්ෂ ගාණක වරිපනම් බදු ගෙවන ජනතාවගේ මුදල් වැය කරා මේ පුස්තකාලෙට. ඒ නිසා ඒ වැය කරලා හදපු පුස්තකාලය විනාශ කරන්න දෙන්නේ නැතුව කරුණාකරලා මේ පුස්තකාලය රැකගන්න කියන ගෞරවනීය ඉල්ලීම ඔබතුමාගෙන් කරන ගමන් මට ලැබී තියෙන ලිපිය සභාගත කරනවා.

**03(33)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දෙවැනි ලිපිය ලැබිලා තියෙන්නේ මේ සාහිත්‍යාංජලී උත්සවය සම්බන්ධයෙන්, ඒ සම්බන්ධයෙනුත් ඔබතුමාගේ ගරු අවධානය යොමු කරනවා. ඒ වගේම නාගරික කොමසාරිස්වරියේ අවධානය යොමු කරනවා. මේ වසර ගණනාවක් මේ උත්සවයට සම්බන්ධ වෙන්නේ එකම කණ්ඩායමක් මේ නගර සභාවේ ඉන්නවා සේවක සේවිකාවෝ විශාල ප්‍රමාණයක්, විවිධ දක්ශතා තියෙන පිරිස් මේ අතර ඉන්නවා. හැබැයි මේ සාහිත්‍යාංජලී කියන උත්සවයට මම දැක්කා මුදල් කමිටුවේ තියෙනවා ඇස්තමේන්තුව ලක්ෂ 10ක්. ඒ වගේ ලොකු ගාණක් වැය කරනවා. ඒ වැය කරන්නේ ජනතාවගේ මුදල් එහෙනම් මේ අපි කරන්නේ සේවක අභිප්‍රේරණයටනම් හොඳයි කරන එක. අපි එපා කියන්නේ නැහැ. හැබැයි ප්‍රශ්නය තියෙන්නේ මේ සේවකයෝ යම්කිසි පිරිසක් කාටහරි හිතවත් යම්කිසි පිරිසක් අරගෙන ඒ අයගෙන් විතරක් මේ වසර ගණනාවක් තිස්සේ මේක කරනවනම් මේක සාධාරණ නැහැ. ඒ නිසා මේ ඔබතුමාට එවලා තියෙන ලියුම, මටත් පිටපතක් ආවා. ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා අනිත් සේවකයින්ට සාධාරණයක් වෙයි කියලා. ඉතින් අපි නාගරික කොමසාරිස්වරියගේ අවධානය යොමු කරනවා මේ සම්බන්ධව. පොදු වැඩ පිළිවෙලක් හදන්න සියළු සේවකයින්ව සම්බන්ධ කරන්න. ඔවුන්ගේ දක්ශතා හඳුනාගන්න පොදු වැඩපිළිවෙලක් හදන්න. පොඩි පැනල් එකකට ගෙන්න සේවකයෝ ඒ කට්ටියට ඇප්ලිකේෂන් දාන්න කියන්න. ඇප්ලිකේෂන් දාලා පැනල් එකක් දාලා ඒ පැනල් එකකට සේවකයෝ ටික ගෙනල්ලා. ඒ අයගෙන් දක්ශතා තියෙන සේවකයින්ව තෝරලා දක්ෂතා තියෙන අයව ඉස්සරහට ගන්න. හැම තැනම මේ එකම කට්ටියක් තමයි රජකරන්නේ. මේක මේ එක්තරා අදිසි හස්තයක් විසින් තමයි මෙහෙයවන්නේ. මේක කියවුවනම් ඔබතුමා දන්නවා ඇති එච්චර අදිසි හස්තයක් තමයි මේක මෙහෙයවන්නේ. ඒ නිසා අපි ඉල්ලනවා සාහිත්‍යාංජලී කියන්නේ මොරටුවේ හොඳ වැඩසටහනක් අපි එකට විරුද්ද නැහැ ලක්ෂ 10ක් වගේ විශාල ජනතා මුදලක් වැය කරලා කරන්නේ සේවක අභිප්‍රේරණය සඳහා ඒ නිසා කරුණාකරලා ඔබතුමා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. මේක කුණු අදින සේවකයගේ ඉඳලා අපේ සංවර්ධන නිලධාරියා වෙනකන් හැම කෙනෙකුටම මේකට සම්බන්ධ වෙන්න පුළුවන් වැඩසටහනක් හදන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. එම ලිපියත් මා සභාගත කරනවා.

**03(34)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපිට තියෙනවා ප්‍රශ්නයක් මේ සේවකයින්ගේ තියෙනවා මැසිවිල්ලකි ඒ මැසිවිල්ලත් අපි මේ අවස්ථාවේ ඔබතුමාට කියන්න ඕන. මේ කලාප සම්බන්ධයෙන්. අපි කලාප 05කට මොරටුව බෙදලා තියෙනවා. මේ කලාප වල එක එක අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා මේ වෙනකොට. ඔබතුමාගේ නාගරික මන්ත්‍රී මණ්ඩලයේ සමහර නාගරික මන්ත්‍රීවරු ගිහිල්ලා විශාල බලපෑම් කරලා ඒ කලාප වල ඉන්න ඒ අපේ සේවකයින්ට විශාල බලපෑම් කරනවා. තිලකසිරි මන්ත්‍රීතුමා කතා කරපු නිසා මම ඒ ගැන කතා කරන්න යන්නේ නැහැ. ඔබතුමා මේ නාගරික මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න ඕන නාගරික මන්ත්‍රීවරුයෙකුට බැහැ කලාපෙකට ගිහින් අත්සන් ලේඛනයක් පරීක්ෂා කරලා එ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න. එක නිලධාරියෙක් කරන්න ඕන වැඩක් සහ මම ගෞරවයෙන් ඉල්ලනවා මේ සේවකයින්ව තලා පෙලන්න එපා කියලා. මොකද හේතුව මන් හැමදාම කියන කතාවක් මේ සේවකයෝ ටික නැත්තම් ඔබතුමත් හාන්සි අපිත් හාන්සි. අපිට ගෙවල් වල ඉන්නත් බැහැ ඔබතුමාට ඉන්නත් බැහැ මොකද හේතුව සේවකයෝ නිසා තමයි අපි හැම දෙනාම රැකිලා ඉන්නේ. මේ ඔෆිස් වල වැඩ කරන නාගරික කොමසාරිස්තුමිය ඇතුළු නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමා ඇතුළු නාගරික ලේකම්තුමා ඇතුළු මේ සේරම දෙනා රැකිලා ඉන්නේ මේ අහිංසක සේවකයෝ නිසා. ඒ නිසා මේ අහිංසක සේවකයින්ව තලාපෙළා කටයුතු කිරීම නවත්වන්න. මේ අහිංසක සේවකයාගේ බෙල්ල මීරිකන එක නවත්වන්න. ඒ සේවකයෝ වැඩ කරන නිසා තමයි අද මොරටුව මෙහෙම හරි තියෙන්නේ. ඒ නිසා ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කරනන්න කියලා ඉල්ලනවා මේ සේවකයින්ට වන අඩත් තේට්ටම් සම්බන්ධයෙන්.

**03(35)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,සභාවේ මන්ත්‍රීවරුන් මා වෙනුවෙන් සුභාශිංසන පුදකිරීම සම්බන්ධව ස්තූති කරනවා.ගරු විපක්ෂ නායක සහ හිටපු උප නගරාධිපති සමන්ත සිල්වා මැතිතුමාට.විශේෂයෙන්ම අපේ මන්ත්‍රී කණ්ඩායමේ පක්ෂ පාට නැතුව මම වෙනුවෙන් සුභ පතපු සියලු මන්ත්‍රීවරුන්ට ස්තූතිය

පුදකරනවා.අවුරුදු දහයක් පුරාවටම ශ්‍රී ලංකා පලාත් පාලන ආයතනයේ සංසදයත් එක්ක ඉදලා කොළඹ දිස්ත්‍රික්කයේ සභාපති විදියට මාව පත්කිරීම විශේෂයෙන්ම මේ මොහොතේ මම සීතාවක,අවිස්සාවෙල්ල,කොලොන්නාව,මහරගම,දෙහිවල,කොළඹ,මොරටුව,කැස්බෑව,බොරලැස්ගමුව,කෝට්ටේ සහ කඩුවෙල යන නගර සභාවල් වල මම වෙනුවෙන් ඡන්දය පාවිච්චිකරපු මන්ත්‍රීවරුන්ට මාගේ ස්තූතිය සහ විශේෂ ගෞරවය පුද කරනවා.

ආයාවනා හා පෙත්සම් පැමිණිලි යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න තියනවා.නමුත් කියන්න කණගාටුයි මීට සභා දෙකකට කලින් ඉදිරිපත් කරා පැමිණිලි පහක්,නමුත් ඒ පැමිණිලි පහෙන් එකකටවත් අද වන තුරු කිසිම ප්‍රතිචාරයක් ලැබිලා නැහැ.ඉතාම කණගාටුයි ඒ සම්බන්ධව.ජනතාව මැසිවිලි නගන කොට අපිට දෙන්න උත්තරයක් නැති තත්ත්වයකට පත්වෙලා තියනවා.ඒ සම්බන්ධයෙන් ඔබතුමා දැඩි අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.නො 130/4,ශාන්ත අන්තෝනි පාර,කඩලාන,මොරටුව යන ලිපිනයෙහි පදිංචි ඩී.සී.ඒ ප්‍රනාන්දු මහත්මිය නමින් යොමු කරන ලද ඉල්ලීමක් ප්‍රදේශයේ වැසි ජලය සහ නිවෙස්වලින් පිටකරනු ලබන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා මොරටුව මහා නගර සභාව විසින් කාණු පද්ධතියක් සකස් කරදෙන ලෙස ඉල්ලීමක් කරමින් ඒක නඩත්තු නොවන ආකාරයකින් කැඩී බිඳී ගිය තත්ත්වයකට පත්වෙලා තියෙන නිසා ඒ සඳහා ඔබතුමා ඇතුලු නගර සභාවේ අවධානය යොමු කර එම කාණු පද්ධතිය නිරාවරණය කරලා නැවත ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ඉල්ලීමක් කරනවා.එය සභාගත කරනවා.නමුත් මේවා ඉදිරියට නොවෙනවානම් සභාගත කරලා වැඩක් නැහැ.ඔබතුමා මේ පැත්තෙ ඉන්නකොටත් ඔබතුමත් එක්ක එකතු වෙලත් අපි හැමෝම එකතුවෙලා කතා කරා මේ සභාවේ වෙන්න ඕනා දේවල්.ක්ලීන් ශ්‍රී ලංකා කියන සංකල්පය ඔබේ අපේ නෙමෙයි.ඒක අනිවාර්යයෙන්ම ඉෂ්ඨ වෙන්න ඕනා.ජන්ද දාහකට ආසන්න සංඛ්‍යාවක් ලබාගෙන තමයි අපිව මෙතනට එවලා තියෙන්නේ.අපේ ජන්ද දායකයො අපෙන් අහන ප්‍රශ්න වලට අපිට දෙන්න උත්තර නැතිවුනොත් ඒක සභාවේ ඔබේ මගේ වගකීම බැහැරහැරීමක්.

**03(36)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, හිමාෂා මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කොරළවැල්ලෙ ග්‍රාම සේවක සම්බන්ධයෙන් දැන් මාස තුනකට ඉස්සර මමත් ඉදිරිපත් කරා. කොමසාරිස්තුමියත් එක්කත් කතා කරා.නමුත් නිසි පිළිතුරක් නැහැ කොරළවැල්ලෙ උතුරෙ ජනතාව අපහසුතාවයකට පත්වෙමින් තියෙන්නෙ.ඒ සඳහා අවධානය යොමු කරන් මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. කොරළවැල්ල දුම්රිය ස්ථානය හා නව ගාලු පාර අතර දිවෙන අතුරු මාර්ගයේ භූගත ජලය ගෙනයන්න විදියක් නැහැ. නල කැඩිලා බිදිලා. ඒවගේම ගලි දහතුනක් කැඩිලා නිවැසියන්ගෙ ගෙවල් හරහා කලු වතුර ඇදෙන තත්ත්වයකට පත්වෙලා තියනවා.ඒ සඳහා නිවැසියන් පෙත්සමක් ඉදිරිපත් කරලා තියනවා.

**03(37)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ලුනාව කලපුව ඇවිදින මංතීරුව පාවිච්චි කරන්නන් විසින් මා වෙත පෙත්සමක් ලබාදී තිබෙනවා.වටිනා ඇවිදින මංතීරුවක් සාදා දී තිබෙන නිසා ප්‍රථමයෙන් මහා සභාවට ස්තූතිවන්ත වෙනවා.මංතීරුව භාවිතා කරන අයි ඉන්න හිටන්න තැනක් නැති එක ලොකු අඩුපාඩුවක්.ඉස්සරහට එන්නෙ වැහි කාලය නිසා පුලුවන් තරම් ඉක්මණින් අඩු වියදමකින් මංතීරුව භාවිතා කරන්නන්ට වැසි ආවරණයක් ලබාදෙන්න සහ ඇතුල්වෙන දොරටු දෙකේ පුවරු දෙකක් සවිකරන්න මෝටර් සයිකල් සහ සියලු රථ වාහන ඇතුල්වීම තහනම් කියලා.ඒවගේම ඔබතුමා විසින් වැසිකිළි පද්ධතියක් සාදා ගෙන යනවා.එහි වැඩ අවසන් කරලා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, මගේ කොට්ඨාශය අඟුලාන දකුණ කොට්ඨාශයේ ලේක්විව් ගාර්ඩන් කියන නිවාස සංකීර්ණයේ මල අපද්‍රව්‍ය තිබෙනවා.ඔබතුමා මේ වෙනකොටත් දන්නවා ඇති මාලිමාවේ මන්ත්‍රීතුමා දන්නවා.මේ ප්‍රශ්නයට විසදුමක් ලැබිලා නැහැ නගරාධිපතිතුමනි,මේ ප්‍රශ්නය සුලුපටු ප්‍රශ්නයක් නෙමෙයි ලුනාව ඇළටත් මේ අපද්‍රව්‍ය මුදාහරිනවා.සෞඛ්‍ය ප්‍රශ්නයක් වගේම පරිසර ප්‍රශ්නයකුත් තියනවා.ඒ නිසා ඉතා ඉක්මණින් මේ පිළිබදව පිළියමක් කරන්න කියලා.ඒවගේම අඟුලාන මහජන මාවතේ පාරෙ අයිනෙ සුන්බුන් වගයක් ගොඩගැහිලා තියනවා.ඉතා ඉක්මණින් මේක ඉවත් කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.අඟුලාන පොදුජය විදුහල් භූමියේ විශාල පැලැටි වැවිලා තියන නිසා සෙල්ලම් කිරීමට අපහසුයි.පෙර පාසලේ වායු සමීකරණ යන්ත්‍රයේ

ප්‍රශ්නය, මාතෘ සායනයේ අඩුපාඩු ගැන, සභාව විසින් ස්ථාපිත කර ඇති නාන ළිං අපිරිසිදු වෙලා. කඩිනමින් මෙයට ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**03(38)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මම නියෝජනය කරන කොට්ඨාශයේ දොන් කරෝලිස් ආයතනයේ ඉදිරිපිට ඇති මාර්ගය නගර සභාවට පවරා ගන්නා ලෙසට යෝජනා කරනවා.ඒවගේම මගේ බිරිඳගේ අභාවය පිළිබඳව මාහා ශෝකය බෙදාහදාගත් නාගරික ලේකම් ඇතුලු නිලධාරීන් මණ්ඩලයටත්, පක්ෂ විපක්ෂ මන්ත්‍රීන්ටත් ස්තූතිය පුදකරනවා.

**03(39)** <u>මහා නගර සභා මන්ත්‍රී - එස්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, බී. නිශාන්ත පීරිස් නො:19/4 ඒ,බ්ලායියුස් පාර,ඉදිබැද්ද,මොරටුව මාර්ගයේ තිබෙන වලවල් වසාගැනීම පිළිබඳව මීට මාස දෙකකට කලින් ලිපි දෙකක් ඉදිරිපත් කරලා තියනවා.මෙයට කිසිම සාධනීය පිළිතුරක් ලැබුනේ නැහැ.මේ පාරේ යන්න බැරි තත්ත්වයටම වලවල් හැරිලා තියනවා.ගැබිනි මාතාවන් දෙන්නෙක් මේ පාරේ ඉන්නවා.ඔවුන් මාතෘ සායනයට යන්න පවා මීටර් සියයක් පමණ ඇවිදගෙන ඉස්සරහට ඇවිල්ලා තමයි වාහනයක නැගලා යන්නෙ.ඔබතුමාගේ අවධානය යොමු කරමින් ඉටු කරදෙන ලෙස ඉල්ලා සිටිනවා.ගරු නගරාධිපතිතුමා, කැෆේන් ප්‍රනාන්දු නො:17/5,බ්ලාසියුස් පාර,ඉදිබැද්ද පාරේ කාණුවක් පිළිසකර කරගැනීම සඳහා මීට මාස දෙකකට පෙර සභා වාරයේදී ඉදිරිපත් කරා කිසිම පිළියමක් නැහැ.ඔබතුමා මේ පිළිබඳව නිරීක්ෂණය කරලා බලන්න.මේ දිනවල වැසි තත්ත්වයත් එක්ක කාණු උතුරා ගිහින් ගෙවල් වලට වතුර එනවා.අනෙක් කරුණ මොරටුව ඉදිබැද්ද බිල්මෝරියා බංගලා වත්තෙ ප්‍රදේශවාසීන්ට අවුරුදු තුනකට කලින් වැසි ජලය හා නිවෙස්වල තිබෙන ජලය බැස යාමට ව්‍යාපෘතියක් ආරම්භ කරලා තියනවා.ඒ ව්‍යාපෘතියේ එක පැත්තක් විතරයි මේ වෙනකොට අවසන් කරලා තියෙන්නේ.අනෙක් පැත්ත ඉක්මණින් බට දාලා සකස් කරදෙන ලෙසට ඉල්ලා සිටිනවා. ප්‍රදේශවාසීන් එකතු වෙලා ගල්,වැලි,සිමෙන්ති සියලුම දේ ඔවුන් ලබාදෙන්නම් කියා ඔවුන් කියනවා. නගර සභාවේ සේවකයන් යොදවලා වැඩ කටයුතු ඉවර කරලා දෙන්න කියා ඔවුන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීතුමනි, පක්ෂ හා විපක්ෂ මන්ත්‍රීවරුන්ට ස්තූතිවන්ත වෙනවා.ජනතාවගේ ප්‍රශ්න කොයිතරම් ප්‍රමාණයක් අපි ඉදිරිපත් කරනවාද සාධනීය පිළිතුරු ලැබෙන ප්‍රමාණය මොන තරම් අඩුද මට කියන්න තියෙන්නෙ මම කිසි ලෙසකවත් දේශපාලන වශයෙන් කිසි ප්‍රශ්නයක් මඟරින්නෙ නැහැ.මට එහෙම අවශ්‍ය නැහැ.ඉංජිනේරුතුමාගේ අවධානය යොමු කරනවා මේ ප්‍රශ්න වලට විසඳුම් හොයන්න.සේවක හිගය තිබුනත් අඩුම තරමේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඉදිරිපත් කරාම එම ප්‍රශ්නය සැලකිල්ලට ලක්කරලා ලිපියක් යොමු කරන්න කටයුතු කලයුතුයි කියන අදහස තියනවා.ඒ වගේම ඔබ ඉදිරිපත් කරපු බොහොම කරුණු කාරණා ඉෂ්ට කිරීමට ඕන කරන වෙහෙසෙ මහන්සිය අභියෝගය භාරගෙන කටයුතු කරන්න හැමවෙලේම උත්සාහ කරනවා.අපට සියල්ල විසඳගන්න බැරිවෙයි.ඉදිරිපත් කරපු ප්‍රශ්න සෑහෙන ප්‍රමාණයක් අප කාටත් සතුටු විය හැකි මට්ටමට කරගන්න පුලුවන් වෙයි කියලා.ඒ නිසා අදාල දෙපාර්තමේන්තුවල හොඳින් අවධානය යොමු කරලා හැම මහජන නියෝජිතයම කැමතියි තමන්ට ජනතාව ඉදිරිපත් කරන ගැටලුවට විසඳුමක් ලබාදෙන්න.මම උත්සාහ කරනවා පුස්තකාල පද්ධතිය නගා සිටුවන්න.ආයතනයේ කිසි කෙනෙකුට මොනයම් හෝ වරප්‍රසාදයක් දෙන්නෙ නැහැ.ඒ වෙනුවෙන් කවුරුන්ද යොමු කරන්න කියන උත්සාහය යෙදෙවුවාට තාමත් එම මට්ටමට සාර්ථක නැති බව පිළිගන්නවා.පුස්තකාලවල හිටපු කෙනෙක් යම් විශ්වාසයක් සහිතව මගේ වැඩ කටයුතු වලට යොදාගත්තත් මගේ ලග තියාගෙන වැඩ කරගන්නවට වඩා හොඳයි පුස්තකාලයෙ හිටපු කෙනාව පුස්තකාලයටම යොමු කරලා පුස්තකාලය නගා සිටවන වැඩේ කරගන්න.බාධා තිබුනත් මම උත්සාහ කරනවා ජනසෙත පුස්තකාලයේ සැලකිය යුතු වෙනස්කම් ප්‍රමාණයක් කරගන්න ගියාට එතන තියන විවිධ සේවක ගැටලු විශේෂයෙන් ඔවුන් දීර්ඝ කාලයක් හුරුපුරුදු වෙච්ච රටාවන් සැලකිය යුතු බලපෑමක් තිබෙනවා.ශිරෝමි මන්ත්‍රීතුමියටත් මගේ විශේෂ සුභාශිංසන පලකරනවා.ඒ වගේම ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමාගෙ බිරිඳගෙ අභාවය වෙනුවෙන් ශෝකය පල කරනවා.පෙත්සම් පැමිණිලි යටතේ

ඉදිරිපත් කරපු හැම කාරණාවක්ම ඉදිරියට වැඩි සැලකිල්ලක් ලක් කරමින් ඒවාට සාධාරණය ඉෂ්ඨ කරන්න උත්සාහ කරනවා කියන ප්‍රකාශය කරනවා.

## 04. ප්‍රශ්න

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 04 (01) යටතේ මහා නගර සභා මන්ත්‍රී ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න සඳහා තොරතුරු රැස්කිරීමට තව දුරටත් ප්‍රමාණවත් කාලයක් ලබාදෙන නාගරික ඉංජිනේරු විසින් ඉල්ලා ඇත. කාලය දෙන්නම් හැබැයි මේ එච්චර හොද එකක් නෙමෙයි. අපි ලග තිබෙන තොරතුරු මහන්සි වෙන්න ඕන තොරතුරු නෙමෙයි. මේ තොරතුරු ලබාගැනීම තමාගේ භාරයේ තිබෙන ෆයිල් වල තිබෙන විස්තර ඇතුලෙ තියනවා.ඒ නිසා ප්‍රශ්න වලට උත්තරදීම මේ ආකාරයෙන් කල් ඉල්ලමින් ගියොත් තව ප්‍රශ්න එනවා. සභාවට පෙර ප්‍රශ්නයට උත්තර හොයාගෙන සභාවට සාධාරණය ඉෂ්ඨ කරන්න කටයුතු කරන ලෙස දන්වන අතර, මේ සඳහා පිළිතුරු ලබාදීමට මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**04(01) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න,**

1. මොරටුව මහා නගර සභාව මඟින් පාලනය වන ජනසෙත කලා කේන්ද්‍රය සංවර්ධන කටයුතු ආරම්භ වූයේ කවදාද?
2. ජනසෙත ගොඩනැඟිල්ලේ සංවර්ධනය කරන ලද කොටස් මොනවාද?
3. ජනසෙත ගොඩනැඟිල්ල සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද?
4. ජනසෙත ගොඩනැඟිල්ල සංවර්ධනය සඳහා සත්‍ය වශයෙන් වැය කළ මුදල කොපමණද?
5. ජනසෙත ගොඩනැඟිල්ලේ සත්‍ය වශයෙන් සංවර්ධනය කරන ලද කොටස් මොනවාද?
6. ජනසෙත ගොඩනැඟිල්ලේ වැඩ අවසන් කළ දිනය කවදාද?
7. ජනසෙත ගොඩනැඟිල්ලේ සංවර්ධනයෙන් පසු ජනතා අයිතියට පැවරූ දිනය (විවෘත කළ දිනය) කවදාද?
8. ජනසෙත ගොඩනැඟිල්ලේ ඇස්තමේන්තුවට අනුව සියලු කොටස් වල සංවර්ධනය නිම කොට තිබේද?

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 04 (02) යටතේ මහා නගර සභා මන්ත්‍රී ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දීමට මාසයක කාලයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

**04(02) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්ණ,**

1. මොරටුව මහා නගර සභාවේ 2025 සැසි වාරය ආරම්භ කළ දිනය කවදාද?
2. නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති ධූරවල වර්තමාන නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති දිවුරුම් දුන්නේ කවදාද?
3. 2025 වසරේ මොරටුව මහා නගර සභාවේ නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති නිල වාහන භාවිතය ආරම්භ කරන ලද්දේ කවදාද?
4. ඉහත අංක 03 හි සඳහන් නිල වාහන වල රියදුරන් ලෙස කටයුතු කරන ලද්දේ කවුරුන්ද? ඔවුන්ගේ නම් මොනවාද?
5. ඉහත අංක 04 හි සඳහන් රියදුරන් ලෙස කටයුතු කරන ලද රියදුරු මහතුන් මොරටුව මහා නගර සභාවේ ස්ථිර පත්වීම් සහිත රියදුරු මහතුන්ද?

   එසේ නොමැතිනම් ඔවුන් කවුද?

   කුමන පදනමකින් බඳවා ගත් රියදුරු මහතුන්ද?

6. නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති 2025 සැසිවාරය ඇරඹී දිනයේ දිවුරුම් දීමත් සමඟ නිල වාහන භාවිතය ඇරඹී දිනයේ දී සිටි රියදුරන් තවමත් එම රාජකාරියේ නියුක්තව ඇත්ද?

   එසේ වෙනස් වී ඇත්නම් ඔවුන්ගේ නම් මොනවාද?

   දැනට (2025 සැප්තැම්බර් මහා සභාව පැවැත්වෙන දිනය වනවිට) නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති නිල වාහන වල සිටින රියදුරු මහතුන් කවුද?

   ඔවුන් ස්ථිර සේවකයන්ද?

   එසේ නොමැතිනම් ඔවුන්ව බඳවාගත් පදනම කුමක්ද?

7. නියෝජ්‍ය නගරාධිපති නිල රථයේ දැනට රාජකාරි කටයුතු කරන රියදුරු මහතා ස්ථිර සේවකයෙකු නොවන්නේනම් හා ඔහු දෛනික ශ්‍රම පදනම මත බඳවාගන්නා ලද රියදුරු මහතෙකුනම් ඔහුව සෘජුවම බඳවා ගනු ලැබුවේ නියෝජ්‍ය නගරාධිපති නිල රථය පැදවීම සඳහාද?

8. ඉහත අංක 07 සඳහන් රියදුරු බඳවා ගැනීමට දැන්වීම් ප්‍රචාරණය කරන අවස්ථාවේ මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති නිල රථය සහ සභාවේ අනෙකුත් කැබ්රථ හා සැහැල්ලු වාහන සඳහා රියදුරන් බඳවා ගන්නා බව සඳහන් කර තිබුණේද?

9. 2025 වසරේ දෛනික ශ්‍රම සැපයීමේ පදනම මත බඳවා ගන්නා ලද රියදුරන් කී දෙනෙකු සිටීද?

   ඔවුන්ගේ නම් මොනවාද?

   ඔවුන් දැන් සේවය කරනු ලබන වාහන මොනවාද?

10. සභාවේ රියදුරන් බඳවා ගැනීමට යෝජනා කරන ලද්දේ කුමන දෙපාර්තමේන්තුව මඟින්ද?

    බඳවාගත් රියදුරන් එම ඉල්ලීම් කරන ලද දෙපාර්තමේන්තුවේ වාහන සඳහා බඳවා ගත් රියදුරන් යොදවා සිටීද?

    රියදුරන් නැති වාහන මොනවාද?

## 05. <u>යෝජනා</u>

**05(01) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

"මොරටුව මහා නගර සභා භූමියේ රථ වාහන නවතා තබන ස්ථානයේ ඉන්ටලොක් ගල් විශාල ප්‍රමාණයක් අතුරා ඇති නිසා විශාල වටිනාකමකින් යුතු වාහන, JCB යන්ත්‍ර අව්වට වැස්සට නිරාවරණය වන ලෙස ගාල් කර ඇත. එම ඉන්ටලොක් ගල් යොදා ගනිමින් ලුනාව කලපුව ඉදිරිපිට පාලමෙන් නැගෙනහිර පැත්ත කොටස ගල් අතුරා සංවර්ධනය කර එම ස්ථානයට පැමිණෙන ජනතාවට වාහන නැවැත්වීමට හෝ ස්වයං රැකියා කරන ජනතාවගේ නිමි භාණ්ඩ අලෙවි කිරීමට අවශ්‍ය පරිසරය හා පහසුකම් සපයා දෙන ලෙස මෙම සභාවට යෝජනා කරන්නීය."

මහා නගර සභා මන්ත්‍රී ඩී. සමන්ත සිල්වා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නගර සභා භූමියේ රථගාලෙ විශාල ඉන්ටලොක් ගල් ප්‍රමාණයක් ගාල් කරලා තියනවා වටිනා යන්ත්‍ර සූත්‍ර එළියේ අව්වට වැස්සට නිරාවරණය වන පරිද්දෙන් තියෙද්දි ගල්ටික ආරක්ෂා කරගෙන ගල් තෙමෙන්නෙ නැතුව තියාගෙන ගල්ටිකෙන් ප්‍රයෝජනයක් ගන්නෙ නැතුව තියාගෙන ඉන්න නිසා මම ඔබතුමාට යෝජනාවක් හැටියට එකතු කරා.ඒ ගල් ටික ලුනාව කලපුව, ඇතුලට ක්‍රීඩා කමිටුවෙනුත් යෝජනාවක් හැටියට ඉදිරිපත් කරත් කලපුවට වාහන ඇතුලත් කරන්න දෙන්න එපා කියලා මම යෝජනා කරා. වාහන කලපුව ලගම ගාල් කිරීමට අවශ්‍ය නිසා පාලමෙන් නැගෙනහිර පැත්තට වෙන්න එතන භූමිය ඉන්ටර්ලොග් ගල් ටික යොදා සකස් කරලා රථවාහන නවතා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ස්වයංරැකියාලාභි ජනතාවගේ පොඩි කඩ ඉවත් කරලා දැම්මා කලපුව වටේ තියෙන.එම පවුල්වලට රැකියාව නැතිවුන නිසා එම ස්ථානය සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(01) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(02) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ විශාල ප්‍රශ්නයක් වී තිබෙන අබලි පස් (කාණු පස්) ඉවත් කිරීමට සුදුසු ස්ථානයක් නොමැති හෙයින්, ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමා ආරම්භ කළ ජීවන් කුමාරතුංග ඇමතිතුමා ඉදිරියට කරගෙන ගිය බොල්ගොඩ වම් ඉවුර සංවර්ධනය කිරීම, ගහසිරිපුර මාර්ගය ඉවතලන අබලි පස් පුරවා සංවර්ධනය කිරීමට යෝජනා කරන්නීය."

මහා නගර සභා මන්ත්‍රී යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා_මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,නගර සභාවේ සියලුම දෙනාට ප්‍රශ්නයක් වෙලා තියෙන කාණු පස්,අබලි පස් ඉවත් කිරීමට අපට තැනක් නැහැ.බොල්ගොඩ ගඟ අයිනෙ පාරක් ඉදි කිරිම ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා තමයි පටන් ගත්තෙ.ජීවන් කුමාරතුංග ඇමතිතුමත් ඉදිරියට කරගෙන ගියා.ඔබතුමාටත් හැකියාවක් තියෙයි මේක කරගෙන යන්න.අබලි පස් කාණු පස් එකතු කරලා මෙම ස්ථානවලට දාලා අපේ ප්‍රදේශයේ තියෙන අවහිරතා මගහැරදෙන්න කියලා යෝජනාවක් හැටියට මම ඉදිරිපත් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා,සුරේෂ් ප්‍රේමකුමාර මන්ත්‍රීතුමාගේ යෝජනාව දිවංගත ටිරෝන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ සංකල්පයක්. මේ ව්‍යාපෘතිය තුලින් එකක් තමයි ගඟ ආරක්ෂා වෙනවා. එතකොට ඉඩම් හිමියන් ගඟ අල්ලගන්න එක නතර වීමක් සිදු වෙනවා. අනිත් එක ගරු නගරාධිපතිතුමා, ටිරෝන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මේකේ කොටසක් ආරම්භ කරා මේකේ දීර්ඝ කොටස, අනිත් එක මෙහි කොටඨාශ කිහිපයක් තියෙනවා. ඉදිබැද්ද, විල්ලෝරාවත්ත, කඩලාන මෙය විකල්ප මාර්ගයක් විදිහට මේක ඒ අයට පාවිච්චි කරන්න පුළුවන්. එම නිසා මෙයට මිනින්දෝරු සැලැස්මක් හදලා රක්ෂිතේ තියලා ඒ අනුව පාර සංවර්ධනය හෝ ඒ කටයුත්ත කරන්න කියන එක තමයි මගේ අදහස.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මට තේරෙන්නේ නැහැ අපේ සුරේෂ් ප්‍රේමකුමාර මන්ත්‍රිතුමා කියනවා කාලයක් තිස්සේ පැවතගෙන ආපු එකක්ලු, මේ පස් ටික දාන්න ඕනේලු ගහසිරිපුර මාර්ගයට. අපේ අනුරසිරි මන්ත්‍රිතුමා කියනවා එකක්. මට මේකේ අදහස තේරෙන්නේ නැහැ නමුත් මෙහෙම පස් ටික දාන්න ගියොත් මොකක්ද වෙන්නේ කියලා තේරෙන්නේ නැහැ. ඒ පස් දාලා කොහොමද සංවර්ධනය කෙරෙන්නේ කියලා පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. මොකද අනුසිරි මන්ත්‍රීතුමා කිව්වේ වෙනම කාරණයක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙය ප්‍රියනාත් මන්ත්‍රීතුමා ඉන්න කාලෙ මම දැක්කා මේ නගර සභාවෙන් පස් ලොරි අරන් ගිහිල්ලා ඔය පාරට හැලුවා ඒ නිසා තමයි මම යෝජනාව කරේ. මේ පාර හදන කාලෙ දැකලා තියෙන නිසා තමයි අපි ඒ අදහස යෝජනා කරේ. මේ වෙලා තියෙන ප්‍රශ්නෙත් එක්ක. පරිසර ගැටලු තියෙනවා ඒ වුණාට මේක කරන්න බැරි නැහැ එතුමන්ලත් හැදුවේ සැලැස්මවල් හදලා තමයි. එක එක්කෙනා මේකට පරිසර ගැටලු ගේනවා. ඒත් මේ පරිසර ගැටලු විසඳගෙන මේක කරන්න පුළුවන් මම දන්නවා ජාතික සැලැස්මෙත් තියෙනවා කියලා බොල්ගොඩ ගඟ වටේ ම නමුත් දැනට අපිට පොඩ්ඩක් හරි සහනයක් ලබාගන්න පුළුවන් ඔබතුමා මේක ක්‍රියාත්මක කරොත්. ගඟට ගිහිල්ල මේ පස් දානවා නෙමෙයිනේ කඩොලාන ශාක තියෙන හරියට තමයි මේක පිර වෙන්නේ කොහොමත් මේ ගම්වල ඉන්න මිනිස්සු මේක පුරවගෙන පුරවගෙන එනවා. ඒ එන එක නවත්තගන්නත් පුළුවන් මේ වැඩෙන්.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, ඔබේ අදහස මම තේරුම් අරගෙන ඉන්නේ. මේ වෙනකොටත් ඒ අදාළ මාර්ගයට සැලකිය යුතු මුදලක් වෙන් කරලා පාර සංවර්ධනය කරගෙන ඉදිරියට යන්න පුළුවන් උපරිම දුරට අවශ්‍ය කරන සියලුම කටයුතු කරල තියෙන්නේ කල්පනා කරමින් ඉන්නවා එතැන සිට ඉදිරියට පාර තව දික් කරගෙන යන්න පුළුවන් නම් ඒ කටයුත්ත නගර සභාවට පමණක් තනියෙන් කළ යුත්තක් නෙමෙයි. නමුත් අපිට යා හැකි දුර යා ගන්න, ඔබ කියනව වගේ පස් ටික උනත් දාන්න පුලුවන්ද කියලා බලලා ඒ කටයුත්ත අපි කරමු. මධ්‍යම ආණ්ඩුවෙන් දැනට මැනුම් කටයුතු කරමින් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ පහක් සම්බන්ධ කරගෙන ව්‍යාපෘතියක් දියත් කරන්න සාකච්ඡා යමින් තියෙනවා. එතකොට අපිට මේක මෙතනින් ආරම්භ කරගෙන ඉස්සරහට යන එක නරක නැහැ.

**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒකට මම අදහසක් එකතු කරොත් හොඳයි කියලා මට හිතෙනවා විශේෂයෙන්ම මෙතන මතු කළ විදිහට හිටපු අමාත්‍ය ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමාගේ අදහසකට අනුව ඊට පසුව විවිධ ආණ්ඩු මේක පවත්වාගෙන ගියා. ඊට පස්සේ මේක ජයිකා ව්‍යාපෘතියක් විදිහට මහ නගර සැලසුම යටතේ විශේෂයෙන්ම මේ මාර්ගය ආරම්භ වන ස්ථානය බවට පත්වෙලා තිබුණේ මෝදර ඉදලා මේ එන ලයින් එකේ කොස් පැලැන පාලම ළඟට ඇවිල්ලා එතන ඉදලා බොරුපන දක්වා යන මාර්ගය. මේක විශේෂයෙන්ම මේකට අදහස් කරේ මේ ගඟ අල්ලන සීමාව අඩු කරලා ඒක ආරක්ෂා කර ගන්න සහ විශේෂයෙන්ම මේකට එනර්ජි රෝඩ් කියන සංකල්පය තමයි දැම්මේ ඒ සංකල්පයට අනුව සැකසුනු මහ නගර සැලැස්මේ ප්‍රධාන සැලසුම තුළ තියෙනවා. ගරු නගරාධපතිතුමනි, ඒකට ආසියානු සංවර්ධන බැංකුවත් අනිත් පැත්තෙන් ජයිකා ජපන් සංවර්ධන මිත්‍රත්ව අරමුදලෙනුත් මේක අරගෙන යෝජනා කරා බොහොම අඩු පොලියට ඊට පස්සේ ඊළඟ අදහස බවට පත්වුණේ මේ මාර්ගයට පෙරරල් සමගාමීව අපි ව්‍යාපෘතියක් ඉදිරිපත් කරලා තිබුණා ඒ තමයි සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය. ඒ ව්‍යාපෘතියෙන් එනකොට ඒ ව්‍යාපෘතිය කොහොමද කනෙක්ට් කරන්නේ කියන එක. ඒත් එක්කම මේ ගඟ හුඟාක් වෙලාවට ගත්තට පස්සේ අද බැර ලෝහ වලින් පිරිලා තියෙන්නේ ඒකත් එක්කම ගඟ එන්න එන්නම අල්ල ගන්න එක වැඩි වෙනවා. එතකොට ඒකත් එක්ක සංචාරක සැලැස්මක් විදියට ඇවිල්ල තිබුණා. කොහොමද මේ හිස්ටෝරිකල් ටුවරිසර්මන් කියන එක ඩිවලොප් කරන්නේ කියලා. මේ සැලසුම පිළිබඳ භෞතික සැලැස්ම තුල මොරටුව අන්තර්ගත වෙලා ඒ අන්තරගත වෙච්ච සැලැස්ම තියෙනවා එකෙන් සමහරවිට නිවාස අහිමිවන පිරිසට තමයි ඔය බැට්ටිවත්තේ අපි අරම්භ කරපු ව්‍යාපෘතියෙන් නිවාස ලබා දෙන්න පොරොන්දු වුණේ. ඒකත් එක්ක අනිත් පැත්තෙන් ගත්තහම සෝමානන්ද මාවතේ තෙලවල තියෙන මිනිසුන්ගේ අත්පත් කරගත් ඉඩම් සම්බන්ධයෙන් මෙතන තියෙනවා. ඒ නිසා මේකෙ භෞතික සැලැස්මත් ප්‍රධාන සැලැස්මත් තියෙනවා ඒ වගේම ජයිකා සංවිධාන ආයතනයත් ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහයෙන් මේ කටයුත්ත කරන්න බලාපොරොත්තු වුනා. ඒ නිසා මේ ආණ්ඩුවට කියලා ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා ආරම්භ කරපු ජීවන් මැතිතුමා ඉස්සරහට ගෙනියපු ඒවගේම මෙගා පොලිස් එකෙන් අපි මැදිහත් වෙලා ඉස්සරහට ගෙනිච්ච මේ වැඩසටහන කරලා. මේ මොරටුව ජනතාවට ඒ සම්පූර්ණ සැලැස්ම ක්‍රියාත්මක කරලා දෙන්න මැදිහත් වෙන්න කියලා මං ඉල්ලා සිටිනවා. එතකොට මේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙනවා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (02) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(03) මහා නගර සභා මන්ත්‍රී, ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

“බ්‍රිතාන්‍ය සුදු අධිරාජ්‍යයට විරුද්ධව සටන් කොට අප මව්බිම වෙනුවෙන් දිවි පිදූ මොරටුවේ ජන්ම ලද වීර පුරන්අප්පු විරුවාගේ නමින් ජනසෙත ශ්‍රවණාගාරය නම් කරන ලෙස මෙසේ යෝජනා කර සිටින්නීය”

**මහා නගර සභා මන්ත්‍රී බී. සජිත් දුමින්ද පීරිස් මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.**

**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම මේ යෝජනාව හරහා බලාපොරොත්තු වෙන්නේ ජනසෙත ශ්‍රවණාගාරය වීර පුරන්නප්පු ශ්‍රවණාගාරය විදියට නම් කරන්න කියලා තමයි. ගරු නගරාධිපතිතුමනි, මම මේ සම්බන්ධයෙන් කතාවක් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ මොකද 2018 පුරන්අප්පු සමරුවක් මහජන උපයෝගීතා හා ප්‍රජා සංවර්ධන කමිටුවේ හිටපු සභාපති විදිහට එම සැමරුම කිරීම සඳහා එවකට හිටපු නගරාධිපතිතුමාගේ මඟපෙන්වීමත් යටතේ සේවක සේවිකාවන් එකතු කරගෙන අවසන් අසිපත කියලා පොතක් අපි එළිදැක්වූවා පළවෙනි වතාවට පළාත් පාලන ආයතනයක් මේ වගේ ජාතික වීරයෙක් සම්බන්ධයෙන් චරිතා ප්‍රදානයක් ඉදිරිපත් කරපු පළවෙනි වතාව. ඒ නිසා මම මහජන උපයෝගීතා හා ප්‍රජා සංවර්ධන ස්ථාවර කමිටුවේ එවකට හිටපු සභාපතිවරයා විදිහට මේ පොතට ලියපු පණිවිඩයක් තියෙනවා මගේම අත් අකුරෙන් මමම ලියපු පණිවිඩයක්, එම පණිවිඩයමේ අවස්ථාවේදී සභාවට ඉදිරිපත් කරන්න කැමතියි. ඒකට මට අවසර දෙන්න.

ශ්‍රී ලංකාව වූ කලී මහ මුහුදින් වට වූ දූපත් රාජ්‍යයකි. මහ මහාචාර්ය රාජ් සෝමදේවයන් පවසන ආකාරයට අප රට ඉන්දියාවෙන් භූගෝලීයව වෙන් වී ඇත්තේ මීට වසර හත්දහකට අසන්න කාලයකදීය. එතැන් පටන් නිරන්තරවම පසමිතුරු උවදුරුවලට අපේ රට මුහුණ දුනී. එක් පසෙකින් ඉන්දියාව ආසන්නයේ පිහිටීම, අනෙක් පසින් සේද මාවතේ අප රට පිහිටීමත් මෙසේ ආක්‍රමනිකයින්ගේ දඩ බිමක් බවට පත්වීමට නිරායාසයෙන්ම සිදුවිය. ප්‍රමාණයෙන් කුඩා වුවද සම්පත්වලින් අනූන අපේ රට මෙන් රටක් ලොව තුළ ඇද්දයි සැක සහිතයි. දේශගුණික මෙන්ම පාරිසරික විවිධත්වයන්ගෙන් සපිරි මේ පින්බිම පෙරදිග ලෝකයේ බබලන මුතු ඇටය නමින් පැවසීම අතිශෝක්තියක් නොවේ අපටම අනන්‍ය වූ භාෂාවක් අපිටම අනන්‍ය වූ අක්ෂර මාලාවක් අපිටම අනන්‍ය වූ වාරි තාක්ෂණයක් අපිටම අනන්‍ය වූ සංස්කෘතියක් අපිටම අනන්‍ය වූ රාජ්‍ය පද්ධතියක් අපටම අනන්‍ය වූ ආර්ථික ක්‍රියාවලියකින් සමන්විත වූ බලසම්පන්න රාජයක් ලෙස අපේ රට පැවැති බව ශ්‍රී විභූතියන් මොනවට පැහැදිලි කරයි. වර්ෂ 1505 දී පෘතුගීසීන් විසින් අප මාතෘ භූමිය විශේෂයෙන් වෙරළ තීරය ආක්‍රමණය කිරීමෙන් පසු ලන්දේසීන් ද ඉන්පසු ඉංග්‍රීසීන් ද ආක්‍රමණය කරනු ලැබීය. ජෝන් ඩොයිලිගේ කපටි කයිරාටික උපක්‍රම වලට හසු වූ ශ්‍රී වික්‍රම රජු හා ඇහැලේපොළ, මොල්ලිගොඩ, පිළිමතලාවේ ආදී නිලධාරීන්ගේ බල ලෝභී මෝඩ තීරණ හේතුවෙන් ඉතිහාසයේ පළමු වරට 1815 දී ඉංග්‍රීසින් විසින් අප මාතෘ භූමිය සහමුලින්ම යටත් කරගන්නා ලදී. එවකට හිරු ම නොබසින අධිරාජ්‍ය ලෙස උඩඟු බවින් හා බලකාමයෙන් ඔලුව උදම්මා ගත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට එරෙහිව අප මාතෘ භූමිය යටත් කර වසර තුනක් යාමටත් පෙර වීර මොණරවිල කැප්පෙටිපොල මඩුගල්ලේ නිලමේ. ඇල්ලේපොළ නිලමේ කිවුලේ ගෙදර මොහොට්ටාල බුටෑවේ රටේරාල ආදී දේශප්‍රේමී නායකයින් විසින් දැවැන්ත සටනක් ආරම්භ කරන ලදී. බ්‍රිතාන්‍යයන් යටත් කරගත් රාජ්‍ය වලින් ඉතාමත් කෙටි කාලයක් තුළ ඔවුන්ට එරෙහිව සටන්කල එකම රට අපේ රට විය. ඉන්දියාව තුළ බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව එවන් වූ අරගලයක් පැන නැගුණේ බ්‍රිතාන්‍ය ඉන්දියාව යටත් කර වසර දෙසීයක් පමණ ගිය විටදීය. ඒ හගත්සින් කරපු අරගලයයි. පාවාදීම් හා මෝඩ උඩඟු රදළ ගති පැවතුම් හේතුවෙන් 1818 නිදහස් අරගලය පරාජයෙන් කෙළවර විය. ඉන්පසුව සුදු අධිරාජ්‍යවාදීන්ට සිත්සේ ජනතාව පෙළීමට අප මව්බිම සූරාකෑම් කරමින් සිටින විටදී මොරටුවෙන් බිහි වූ වීර හැන්නැදිගේ ප්‍රැන්සිස් ප්‍රනාන්දු හෙවත් වීර පුරන්න අප්පු 1948 දී දෙවන නිදහස් අරගලයට නායකත්වය දුන්නෙමි. කුඩා කල සිටම අසාධාරණයට අයුක්තියට එරෙහිව සටහන් කළ පුරන්අප්පු සුද්දන් විසින් අප රටත් ජනතාවටත් එරෙහිව කරනු ලැබූ සාපරාදී ක්‍රියාවන් වලට විරුද්ධ වූ සටනේ පෙර ගමන්කරුවා විය. මෙහිදී ඉතා වැදගත් කාරණය වන්නේ පුරන් අප්පු උපතින්ම රාජ්‍යත්වයට උරුමකම් කිවුවෙක් හෝ ප්‍රභූ රදළ සම්බන්ධතා ඇති කෙනෙක් නොවීම. ඔහු සැබැවින්ම සාමාන්‍ය ජනතාව තුළින් හා අරගලය තුළින් මතු වූ නායකයෙක් වීමයි. එවකට ලොව ප්‍රබලම අධිරාජ්‍යවාදී වූ ආක්‍රමණයට එරෙහිව ඔවුන් බියෙන් මුසපත් කිරීමට සමත් වූ පුරන්අප්පු මාතලේදී බ්‍රිතාන්‍ය අධිරාජවාදීන් විසින් වෙඩි තබා ඝාතනය කරන ලදී. මේ වන විටද අප මව්බිමට එරෙහිව පවතින සතුරු ආක්‍රමණයන් වෙනත් ආකාරයකින් බටහිර රාජයන් විසින් දියත් කොට ඇත. එදාට වඩා අද මෙකී සතුරු ප්‍රහාර වඩාත් සංකීර්ණ කොට ඇත. අප මව්බිම අත්පත් කර ගැනීමේ උපක්‍රමය වඩාත් තීව්‍ර කර ඇත. සතුරා මිතුරා කවුදැයි හඳුනා ගැනීමට නොහැකි ලෙස අප සමාජය ගනීභූත කොට ඇත. කැප්පෙටිපොළ

පුරන්අප්පු, අනගාරික ධර්මපාලයන් වැනි අය විසින් පණ පෙවූ ජාතික සටන ජයග්‍රහණයෙන් කෙළවර කිරීමේ වගකීම මේ මොහොතේ අප වෙත පැවරී ඇත. එදා අද සහ හෙට එකී උරුමයේ අරගලය නොනමිතිනි යෂ්ටිය අතට ගැනීම සඳහා නූතන පුරන්අප්පුලා වීමට ඔබ සැමට ආරාධනා කරමි.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (03) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(04) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"එගොඩඋයන අලුත් පාලම හන්දියේ සිට මෝදර දෙසට පැමිණීමේ දී පොලිසිය අසල දක්වා මාර්ග දෙපස සුළු වැසි තත්ත්වයක වුවද මාර්ගය ජලයෙන් යට වී යයි. එම මාර්ග දෙපස ජලය රදා පැවතීම නිසා මාර්ගය දෙපස නිවෙස් වලටත් එහි ගමන් ගන්නා ජනතාව මහත් පීඩාවන්ට ලක්වන අතර, පාසල් යන දරු දැරියන්ද මේ නිසා අනතුරු වලට ලක් වී ඇත

මෙම මාර්ග දෙපස එකතු වන ජලය පොලිසිය අසල සිට මහවත්ත පාරෙන් රේල් පාර දක්වා කාණුවක් කපා ඒ අසල ඇති ජයගත්පුර කාණු පද්ධතියට සම්බන්ධ කිරීමට හැකි වුවහොත් මේ සිදුවන ගැටලු රාශියක් මඟ හරවා ගත හැකි බැවින් එම කාණු පද්ධතිය සකස් කර දෙන ලෙසට යෝජනා කරන්නීය."

මහා නගර සභා මන්ත්‍රී බී. සජිත් දුමින්ද පීරිස් මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, එගොඩ උයන අලුත් පාලම හන්දියේ ඉඳලා එගොඩ උයන පොලිසිය දක්වා පාර මම හිතන්නේ අමුතුවෙන් ඔබතුමාට කියන්න අවශ්‍ය නෑ ඔබතුමා දන්නවා සාම පෙදෙස ලඟත් පොලිසිය ළඟත් වතුර වලවල් පිරිලා. පොලිසිය ළඟ වතුර වල ජාතික නිවාසක පාරේ කානු පද්ධතියට අයින් කරන්න හැදුවහම ඒක ආර් ඩී එකට අයිතියි කියල තමයි කිව්වේ. ඒ නිසා මං දාලා තියෙනවා පොලිසිය ළඟ ඉඳන් මහවත්තපාරේ ජයගත්පුර කානු පද්ධතියට එකතු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (04) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(05) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව නැගෙනහිර ඉදිබැද්ද ශාන්ත බ්ලාසියුස් පාර වරිපනම් අංක 19/16 නිවස අසලින් තිබෙන පාරෙහි ප්‍රදේශවාසීන් ජල කාණුවක් නොමැතිකමින්, මහත් පීඩාවකට පත්ව ඇත. එම පාරෙහි කෙළවරෙහි ඇති ප්‍රධාන කාණුව වෙත එම ජලය මුදා හැරිය හැක. මහා නගර සභා ආඥා පනත උපයෝගී කරගෙන භූගත නලයක් යොදා ජලය බැස යෑම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකසා දෙන මෙන් මෙම සභාවට යෝජනා කරන්නීය"

මහා නගර සභා මන්ත්‍රී එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම මෙම යෝජනාවේ සඳහන් කරලා තියෙනවා මහා නගර සභා ආඥා පනත උපයෝගී කරගෙන භූගත නළයක් යොදා ජලය බැස යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකසා දෙන්න කියලා. විශේෂයෙන් ඉල්ලා සිටිනවා මහ නගර සභා ආඥා පනතේ 59 යටතේ නාගරික ඉංජිනේරු වරයාට හෝ ඒ නිලධාරියාට බලය තියෙනවා කාණුවක් ස්ථාපිත කිරීමේදී ඒ සඳහා විවිධ ගැටලු බාධක පැමිණෙනවා නම් 59 තමයි අපි උපයෝගී කරගන්නේ. එය උපයෝගී කරගෙන මෙම කානු පද්ධතිය සැකසීම සඳහා අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (05) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(06) මහා නගර සභා මන්ත්‍රී, එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව එගොඩඋයන ලකී සෙවන්පුර නිවාස ඉතා කුඩා බිම් කඩකින් යුක්ත වන අතර, එම නිවාස වලින් බැහැර වන අපවිත්‍ර ජලය (නාන ජලය) බැසයාම සඳහා ඉඩකඩක් නොමැත. එමෙන්ම මෙම ඉඩම් තුළ එක්රැස් වන වැසි ජලය ද බැස යාම සඳහා ක්‍රමවේදයක් නොමැත. මේ සඳහා ජලය බැස යාමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් ගරු සභාවට යෝජනා කර සිටින්නීය."

මහා නගර සභා මන්ත්‍රී පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (06) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(07) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"කඩලාන, ගලපිටහාබඩ පාර වරිපනම් අංක 73/A සිට පටන් ගන්නා සහ 73/8 අවසන් වන මෙම මාර්ගය පිලිසකර කර දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය"

මහා නගර සභා මන්ත්‍රී තුසිත් ද සිල්වා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (07) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(08) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"පුවක්අරඹ පාර වරිපනම් අංක 02 සිට වරිපනම් අංක 79 න් අවසන් වන මාර්ගය පිළිසකර කර දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය"

මහා නගර සභා මන්ත්‍රී තුසිත් ද සිල්වා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මට දැනගන්න අවශ්‍යයි. පුවක්අරඹ වරිපනම් අංක දෙකේ සිට 79 දක්වා කියන්නේ මොන මාර්ගයද කියලා. ඒ කියන්නේ මේක මේ නගර සභා මාර්ගයක්ද.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔව් මෙය නගර සභා මාර්ගයක්.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (08) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(09) නගරාධිපති, කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව තුළ ජීවත් වන ආර්ථික අපහසුතා ඇති පවුල් වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා පාසල් උපකරණ කට්ටලයක් ලබාදිය යුතු යැයි මෙම සභාවට යෝජනා කර සිටින්නීය"

මහා නගර සභා මන්ත්‍රී බී. සජිත් දුමින්ද පීරිස් මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේක ඉතාමත් හොඳ යෝජනාවක් අපි ස්තුතිවන්ත වෙනවා ඔබතුමාට මේ යෝජනාව නගරාධිපතිවරයා හැටියට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපිට මේක පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ගරු නගරාධිපතිතුමා, මේ පාසල් යන දරුවන්ට මොන කැටගරි යටතේ ද තෝරගන්නේ කොහොමද මේක බෙදන්නේ? මොනවද ඔබතුමා යෝජනා කරන්නේ මේකට දෙන්න කියලා. කොච්චර මුදලක් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවද කියලා අපිට දැනගන්න අවශ්‍යයි.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මගේ මූලික අදහස වුණේ මේ කටයුත්ත කරන්න ඕනේ කියලා. එය කරන්නේ කොහොමද කියන එක අදාල කමිටුවට යොමු කරලා සාකච්ඡා කරලා තීන්දුවක් ගමු. ඔබේ අදහසුත් එක්ක.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අදාල කමිටුව කියන්නේ මොකද්ද, මේකට වෙනම කමිටුවක් පත් කරනවද?

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, නැහැ අපි මෙය මහජන උපයෝගිතා කමිටුවට යොමු කරලා සාකච්ඡා කරමු.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි කලින් මේ වැඩේ කරා 2023 මම හිතන්නේ එක්කෝටි දස ලක්ෂයක් ගියා මේ පොත් කට්ටල ටික ලබා දෙන්න. ඒත් අපිට මේක බෙදාගන්න බැරි වුණා. මේක නාගරික කොමසාරිස්වරියගේ හා නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් තමයි බෙදා දීමේ කටයුතු සිදුකරේ. ඒකෙදි මම හිතන්නේ නිර්ණායක කිහිපයක් සැලකිල්ලට ගත්තා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අංක 05 (09) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මෙම පනත පිළිබඳව ලොකු අවබෝධයක් මම හිතන්නේ අපි සභාවේ කාටවත් මේ වෙනකොට නැහැ. අපි විශ්වාස කරනවා අපේ පාලනයක් විසින් කවදාවත් දරුවන්ට එරෙහිව දරුවන් පීඩාකාරී තත්ත්වයකට ඇද දමන්න පනතක් ගේන්නේ නැහැ. ඉතින් ඒ පනත සම්බන්ධයෙන් තවදුරටත් අධ්‍යනය කොට දැන් ඔබ කියන කාරණා ඔබ සත්භාවයෙන් ඉදිරිපත් කරන කරුණු කාරණා අපි පිළිගන්නවා. නමුත් මෙම යෝජනාව විවාදයකට ගත්තොත් ඡන්ද විමසීමකට යන්න වෙනවා. එතකොට පාලනයක් ලෙස අපිට මෙම යෝජනාවේ දැන් කියන්න හදන එක ඔබ කියන්න හදන එකට කරුණු කියා ගන්න තරම් අප අර පනත තවම අධ්‍යනය කරලා නැහැ. අපිට පොඩි අසාධාරණයක් සිද්ධ වෙනවා යෝජනා සම්මත වීමෙන් ඒ නිසා අපි ඉල්ලා සිටිනවා විවාදයකට නොගෙන අවස්ථාව දෙන්න ඔබ එය සත්භාවයෙන් ඉදිරිපත් කරපු නිසා යෝජනාව භාර ගැනීම කළා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට හැකිනම් මේ යෝජනාව මේ මොහොතේ විවාදයට ගන්නේ නැතුව, පසුව විවාදයට ගන්න හැකියාව තියෙනවාද?

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මේ සම්බන්ධයෙන් දැන් මේ සමාජය තුළ මතු වෙමින් යන කාරණා සම්න්ධයෙන් මහජන නියෝජිතයෝ විදියට අපිට මේ සම්බන්ධයෙන් අදහස් පල කරන්න මේ ඌ වගන්තිය යටතේ මේ යෝජනාව දැම්මා. දැන් ඇත්තටම ඔබතුමා අපි විමසුවේ ඒක ඔබතුමා මේ යෝජනාව ගන්නවා කියපු නිසා තමයි අපි හිටියේ, නැතිනම් ඔබතුමා ඉදිරිපත් කරපු

යෝජනාවක් තිබුණා පාසල් පොත් ලබා දීම. අන්න ඒ යෝජනාව යටතේ අපේ අදහස පල කරන්න තමයි අපි සූදානම් වෙලා හිටියේ. ඇත්තම කතාව ගත්තොත් ඔබතුමා පාසල් පොත් මේ සභාවේ මේ විදියට දවන්ට දෙන්න යෝජනා කිරීම ගැන අපි ගෞරවය පල කරනවා. ඉතාමත් ගෞරවයට ලක් කරනවා මොකද දරුවන්ට අනවශ්‍ය දේ යෝජනා කරපු වකවානුවක් මේ තියෙන්නේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අපි ඉල්ලා සිටිනවා ඔබතුමාලගේ ඔය කියපු කතාව මම පිළිගන්නවා. මේ වගේ බැරෑරුම් කාරණාවක් කතා කරන්න සූදානම් වෙලා නැහැ. ඒක හරි. නමුත්, මම ඉල්ලනවා එහෙනම් පහුවට හරි අද දවස ඇතුලත අපිට ඒ යෝජනාව ගැන කතා කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි අවස්ථාව දෙන්නම් අවස්ථාව මඟහැර යන්නේ නැහැ. දැන් සාධාරණ අවස්ථාවක් ඉල්ලුවේ මේ යෝජනාව අධ්‍යනය කරලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට මේ යෝජනාව සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් කළත් අපි ඒකට කැමති. අපි ඒකට විරුද්ධත්වයක් නැහැ. ඔබතුමාගේ මතය තමයි ඒක මුලසුනේ මතයනේ ඒ. හැබැයි ගරු නගරාධිපතිතුමා මෙහෙමයි දැන් අපේ මන්ත්‍රීවරුන්ගේ ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහස් අපිට මේකට ප්‍රකාශ කරන්න පුලුවන්. ඔබතුමාට පුලුවන් ඒක කැටි කරලා ඕනනම් ඔබතුමාලාගේ ඉහළ දේශපාලන අධිකාරියට මෙන්න මෙහෙම අපේ සභාවට යෝජනාවක් ආවා මෙන්න මෙහෙම මන්ත්‍රීවරුන්ගේ අදහස් මෙන්න මේවයි. ඔබතුමා මේ සම්බන්ධයෙන් සැලකිලිමත් වෙන්න කියලා ඔබතුමාට නගරාධිපතිවරයා හැටියට  ඒගොල්ලෝ කරන දෙයකට ඔබතුමාට දැනුවත් කිරීමක් කරන්න පුලුවන් මෙන්න මේකයි මොරටුවේ මතය කියලා. ඒක කිසි ගැටලුවක් නැහැ.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා,පාලනය විදියට ආණ්ඩු පාලනයෙත් අපි කරන්නේ, නගර සභා පාලනයත් අපි කරන්නේ. හැබැයි අපි ඒ පාලනය ඇතුලේ වඩාත් සාධාරණය වෙලා මේ කටයුත්ත කරගෙන යාමේ දී මන්ත්‍රීතුමියක් යෝජනාවක් ගෙනාපුවාම ඒ යෝජානව කියවගත්තාම ඇගේ සත්භාවය පිළිබඳව තේරුම් අරගෙන යෝජනාව ගන්නවා. නමුත් ඒ අන්තර්ගතය පිළිබඳව පනතක් තවමත් අපි කවුරුවත් අධ්‍යනය කරලා නැහැ. නමුත් අපි විශ්වාස කරනවා මාලිමා පාලනය විසින් කිසිලෙසකවත් දරුවෙකුට කිසියම් හිංසනයක් වෙන විදියට පනතක් ගේන්නේ නැහැ. ඒ විශ්වාසය. නමුත් අපිට පුලුවන් ඔබ කියන කරුණු කාරණා මෙය පොඩ්ඩක් ඉදිරියට දාලා ඒක මම හිතන්නේ ගොඩක් සාධාරණයි අපේ පැත්තෙන් අපි ඉල්ලා සිටින එක. අපි සාකච්ඡා කරලා ඔය අදහස යවමු. වෙන්නේ මෙහෙමයි අපි දැන් මේ යෝජනාවේ යමක් තියෙනවානම් එය සංවාදයට ගන්නවා වෙනුවට අපි අර පාලනය පැත්තෙන් අපි සැමවිටම උත්සහා කරනවා මේක ඇතුලේ අපිට එරෙහිව යම් අදහස් ප්‍රමාණයක් එනවා තමයි. හැබැයි පරාජයට පත් කරනවා ඡන්දය. ඒක අපිට හොඳ නැහැ. මම කියන්නේ හොඳ අදහසකින් හොඳ අවබෝධයකින් අපි ඒ සංවාදය කරගමු.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මෙය අද ගන්න එපා කියන එකයි අපේ අදහස. අපිටත් අවබෝධයක් නැහැ මේ පනත පිළිබඳව. ඒ නිසා දැන් ඔබතුමාලගේ පැත්තෙන් අදහස් මතුවෙයි. දේශපාලනික අදහස් මතුවෙයි. එතකොට අපිටත් දේශපාලනික අදහස් කියන්න වෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, සාමාන්‍යයෙන් 13(ඌ) වගන්තිය යටතේ යෝජනාවක් ඉදිරිපත් කළාම ඒක මේ සභාවෙන් එහාට කල් දාන්න බැහැ. ඒක නිත්‍යානුකූල නැහැ. එතකොට මේ සභාව තුල තමයි තීන්දුව ගන්න ඕන මේක අපි යෝජනාව ගන්නවානම්, අපි යෝජනාව අරගෙන අපි යෝජනා ඉදිරිපත් කළාට පස්සේ අපි ඒකේ අදහස් ප්‍රකාශ කරන එක සභාව තුළ වෙන්න ඕන මොකද 13(ඌ) වගන්තිය යටතේ දාන්නේ ඒකනේ නගරාධිපතිතුමා මහා නගර සභා ආඥා පනතේ. අතුරු ව්‍යවස්ථාවේ 13 ඌ වගන්තිය යටතේ. එතකොට ඒ නිසා මෙය වෙන සභාවකට ගෙනියන්න බැහැ. එහෙමනම් ඉතින් යෝජනාවක් හැටියට එන්න ඕනනේ. ඒක නිසා මම කියන්නේ ඔබතුමාලා අපහසුතාවයට පත් වෙන්නේ නැහැ මේ අදහස්නේ පල වෙන්නේ. මෙය තවමත් පාර්ලිමේන්තුවේ තියෙන යෝජනාවක්. යෝජනාවක් සම්මත වුණාට පස්සේ කතා කරලා වැඩකුත් නැහැ. අපි අපේ

අදහස් ප්‍රකාශ කරලා අපි කියන්නේ අපේ අදහස් ටික ප්‍රකාශ කළාට පස්සේ ඔබතුමාලට පුලුවන් ඕනනම් ඔබතුමාලගේ දේශපාලන අධිකාරිය හරි අහයි සමහර වෙලාවට මේ මොකද ගමේ තත්ත්වය කියලා. මේ සම්බන්ධයෙන් ඔයගොල්ලන්ගේ මතය මොකක්ද කියලා ඔබතුමාගෙන්ම විමසයි සමහර වෙලාවට. ඒ විමසනකොට ඔබතුමා ප්‍රධානියා හැටියට මොරටුවේ ඔබතුමාට පුලුවන්කම තියෙනවා මෙන්න මේකයි නගර සභාවේ තත්ත්වය කියලා යවන්න. මම කියන්නේ ඒකයි. ඒක ඔබතුමාට සාධනීය වෙයි. මෙහෙමයි දේශපාලනය වුණාම පක්ෂ විපක්ෂ මත මතු වෙනවා. ඒක අපිට නවත්තන්න බැහැ. ඉතින් ඔබතුමාලාගේ පැත්තෙන් ඒකට පක්ෂපාතීව කතා කරයි. අපේ පැත්තෙන් පක්ෂපාති නොවන ආකාරයෙන් කතා කරයි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීන්නාදු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඒක තමයි මම කියන්නේ ඒ සංවාදය සාධනීය සංවාදයක් වෙන එකක් නැහැ. ඔබ කියනවානම් නීතිය පැත්තෙන් බැහැ කියලා මම එකඟයි නමුත් එය අපි දීර්ඝ විවාදයකට යන්නේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ වෙලාවේ වැදගත් වෙන්නේ නගරාධිපතිතුමා, අපි කවුරුත් එකඟයි දරුවන්ගේ ඒ සුරක්ෂිතභාවය වෙනුවෙන් ඒ නිසා අපිට දැන් මෙය පාර්ලිමේන්තුවේ විවාද වෙමින් පවතින්නේ. අපේ අදහස් පාර්ලිමේන්තුවට ගියාට පස්සේ ඔබතුමාන්ලා හරහා හරි සභාව හරහා හරි අපේ ප්‍රාදේශීය අදහස යනවා. එතකොට අද මහානායක ස්වාමීන් වහන්සේලාගේ අදහස් ඉදිරිපත් වෙලා තියෙනවා කිසිම ප්‍රශ්ණයකින් තොරව උන්වහන්සේලා අදහස් ඉදිරිපත් කරලා තියෙනවා. ආණ්ඩුව පැත්තෙනුත් අනුකූලතාවයක් දක්වලා තියෙනවා. ඒ නිසා මෙතැනදි වැදගත් වෙන්නේ ගරු නගරාධිපතිතුමනි අපි ඡන්ද විමසීමක් කරන එක නෙවෙයි අපි ගන්න ඒ අදහස සමාජගත වීම කියන්නේ විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ දී මෙය සම්මත වෙලා ඊටපස්සේ ඊළඟට යන්න ඕන කෙටුම්පත් වෙලා ඊට පස්සේ නීතියක් විදියට සම්මත වෙන්න යනවා. ඊට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණය අදහස් විමසනවා. ඊට පෙර මෙය පාර්ලිමේන්තුව තුලදී විසඳගන්න පුලුවන් අදහස අපේ පැත්තෙන් මොරටුවේ ජනතාවගේ අදහස් ඉදිරිපත් වීම වැදගත්. එතකොට මේ ටර්ම් එක පැන්නට පස්සේ ලබන මාසේ වෙනකොට මෙය වෙලා ඉවරයි. ඒ නිසා ඌ වගන්තිය දලා තිබුණ නිසා ඔබතුමන්ලාගෙයි අපේ කිසි ගට්ටනයක් නැහැ අපි අදහස් කරලා මොරටුවේ ජනතාවගෙත්, දරුවන්ගෙත් තියෙන අපි කොහොමද සුරක්ෂිත කරගන්නේ කියන ප්‍රශ්ණයට මම හිතන්නේ විසඳුමක් විදියට අපේ යොජනාව මෙයයි කියන එක තමයි වැදගත් වෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - හරිෂ්චන්ද්‍ර පිලානවිතාන මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ පනත් කෙටුම්පත දෙවන වර කියවීම සඳහා සැප්තැම්බර් 24 වෙනිදා පාර්ලිමේන්තුවේ දී විවාදයට ගත්තා. එතකොට මේ පනත සම්මත වුණාට පස්සේ අපි කතා කරලා වැඩක් නැහැ. මේ පනත සම්මත වුණාට පස්සේ මුළු ලංකාවටම බලපානවා. එතකොට අපිටත් බලපානවා. දැන් ඔබතුමා දන්නවා මේ මොරටුව මහා නගර සභාවේ නගරාධිපතිවරයා වශයෙන් ගරු නගරාධිපතිතුමනි, ප්‍රධාන පුරවැසියා. අපි දැක්කා මාධ්‍ය වාර්තාවකින් කියනවා ලංකාවේ දරුවන්ට ජීවත්වීමට නුසුදුසු ග්‍රාම නිලධාරී කොට්ඨාශ වලින් එකක් මොරටුවේ තිබුණා. එතකොට මෙවැනි තත්ත්වයක් තියෙන වකවානුවක තමයි මේ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියෙවුවේ. මේ සංශෝධන පනත් කෙටුම්පත තුලින් බලාපොරොත්තු වෙන්නේ ශාරීරික හිංසනය, ළමා පෞර්ෂත්වය, නිර්මාණශීලිත්වය, මානසික ශක්තිය ආදි ධනාත්මක තත්ත්වයන් හීන වෙනවා මේ ළමයින්ට ශාරීරික දඩුවම් දුන්නාම. ඒක අපි පිලිගන්නවා. නමුත් මේ දඩුවම් දීම ඉලක්ක කරගෙන මේ දණ්ඩ නීති සංග්‍රහයේ 308 ආ වගන්තියේ තියෙන වගන්තියට කරන්න යන සංශෝධනය තුලින් සත්භාවයෙන් යුතුව ක්‍රියාමාර්ග ගන්නා දරුවන්ගේ විනය ශික්ෂණය හැදියාව ඉලක්ක කරගෙන කටයුතු කරමින් ඒ දරුවන් යහපත් පුරවැසියෙක් කරන්න කටයුතු කරන දෙමාපියන් හා ගුරුවරුන් ඉලක්ක කරගෙන කටයුතු කිරීම වරදක් විදියට අර්ථ දැක්වීම තුල අපිට මුහුණ පාන්නට තියෙන ආදීනව මොන වාගේ ආදීන වලට මුහුණපාන්න තියෙනවාද කියන එක බරපතල තත්ත්වයක්. විශේෂයෙන්ම දරුවෙකු කොටට ඇඳගෙන පාසලට ආපු අවස්ථාවකදී වෙන්න පුලුවන්. එහෙම නැතිනම් කියුටෙක්ස් ගාලා ආපු අවස්ථාවකදී වෙන්න පුලුවන් එහෙම නැතිනම් දරුවා ප්‍රමාදවෙලා පාසලට ආපු අවස්ථාවකදී වෙන්න පුලුවන් යම් ආකාරයකින් විනය ක්‍රියාමාර්ගයක් ගත්තොත් ඒ විනය ක්‍රියාමාර්ගය අර්ථ

නිරූපනයක් තුලට අවමානයකින් ප්‍රමාණයකින් අර්ථ නිරූපනය තුලට අරගෙන ඒ ක්‍රියාමාර්ග ගන්නා ගුරුවරුන් දෙමාපියන් දණ්ඩනයට ලක් කරනවානම් අපි කොහොමද විනය ගරුක ශික්ෂනයක් තියෙන අනාගතය බාරගන්න පුලුවන් රටට වැඩදායි පුරවැසියෙක් බිහි කරන්නේ කියන ගැටලුවට මුහුණ දෙන්න වෙයි. අපි දන්නවා හතර වටින්ම මත්ද්‍රව්‍ය උවදුර දරුවන් වෙලාගෙන තියෙනවා. ඒ වගේම නවීන තාක්ෂණය අන්තර්ජාලය ආදී විවිධ හේතු කරණා කරගෙන දරුවන්ගේ මානසික චින්තනය වෙනස් කරලා තියෙනවා. එවැනි තත්ත්වයක් තුලදී දරුවන් කොහොමද අපි මෙය කරන්නේ කියන එක වැදගත් වෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා මේ කාරණය යම් ආකාරයකින් අපිට නීතියක් හැටියට සම්මත වීමෙන් පස්සේ සියලු දෙනාටම මෙය බලපානවා. විශේෂයෙන් මොරටු පුරවරය මම විශේෂයෙන් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා දරුවන්ට ජීවත් වීමට නුසුදුසු ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් තියෙන මහා නගර සභාවක් බවට මාධ්‍ය වාර්තා වලදී එක ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් නම් වුණා. ඒ නිසා අපි ඒ සියලු කරුණු සලකා බලලා විශේෂයෙන් අපි මේ ආණ්ඩුව ඉලක්ක කරගෙනවත් එහෙම නැතිනම් වෙනත් ආකාරයකින් පටු දේශපාලන ඉලක්කයක් තුළ කතා නොකර සමාජ යථාර්තය වෙනුවෙන් සමාජ ප්‍රගමනය වෙනුවෙන් මේ යෝජනාව සාකච්ඡාවට ගතයුතුයි කියන කාරණය ඔබතුමාගේ අවධානයට ලක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම ඒ යෝජනාව මේ වෙලාවේ මම හිතන්නේ අපි හැම දෙනාම අවධානය යොමු කළ යුතුයි. විශේෂයෙන්ම මේ යෝජනාව මෙතැනට එන බව මම දන්නේ දැනුයි. කෙසේ වෙතත් මෙය ප්‍රායෝගික යෝජනාවක්. මේක මම හිතන්නේ ආණ්ඩු පක්ෂය ලෙස තමුන්නාන්සේලාගේ ඔබතුමා සහ මේ මන්ත්‍රීවරුත් අපහසුතාවයට පත්වෙන ක්‍රියාදාමයක් බවට පත්වෙන්නේ මාලිමාවේ මේ වෙනකොට තියෙන කල්පනා කරන්නේ නැතුව තමන්ගේ තියෙන දැනුමටද මන්දන්නේ නැහැ. එහෙම ඇමතිවරු මේ යෝජනාවල් පනත් ගෙනෙල්ලා සම්මත කිරීම තුළින් අපි හැමෝම බහුතරයක් මන්ත්‍රීවරු මම හිතන්නේ ආණ්ඩු පක්ෂයේ අයත් අපහසුතාවයට පත්වෙනවා. ඒ ඇමතිවරු මම දන්නේ නැහැ මොන මට්ටමේ ඉදලා කටයුතු කරනවාද කියලා මේ රටේ අපිට තියෙන, අපිට ආවේණික සංස්කෘතියක් තියෙන රටක්. අපිට සබ්භ්‍යත්වයක් තියෙන රටක් අපිටම ආවේණික. මේ දේවල් සිදුකිරීම තුළින් ඇත්තටම මේ වෙනකොට ඇමරිකාව ගත්තොත් ඇමරිකාවේ ඩොනල් ට්‍රම්ප්ටත් දැන් වෙලා තියෙනවා තමන්ගේ ආපු ඒ සංස්කෘතිය වෙනස් කරන්න. ඒගොල්ලෝ ඒ වෙනස් කරන්න හදනකොට අපේ රටේ මෙවැනි සංස්කෘතියන් සඳහා යෝජනා පනත් සම්මත කරනවා. උදාහරණයක් වශයෙන් මම ඒක ඔබතුමාට මම පැහැදිලි කරන්නම්. බිමල් රත්නායක ඇමතිතුමාගේ වොයිස්කට් එක. ඉතින් මේ රටේ මේ සංස්කෘතිය විනාශ කිරීමක් හැටියට තමයි අපි මෙය දකින්නේ. මේක අපි විශ්වාස කරනවා හැම කෙනාම කැමති වෙන්නේ නැහැ. ඉතින් මෙවැනි යෝජනා වලට අපි මෙතැනම ආරම්භ කරන ස්ථානයේම විරුද්ධ වෙන්න ඕන කියන එක මගේ විශ්වාසය. ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාවට අපේ පක්ෂපතාතීත්වය දක්වන අතර, ඒ වගේම මේ ක්‍රියාදායමත් අපි පක්ෂයක් වශයෙන් සර්ව ජන බලයේ පක්ෂය වශයෙන් අපේ සම්පූර්ණ විරෝධතාවය ප්‍රකාශ කරනවා. ඔබතුමා ඇත්තටම පනත පිළිබඳව අපි හැමෝටම අවබෝධයක් නැති වෙන්න පුලුවන්, මේ පනත් සංශෝධනය වෙන්න පුලුවන්. දැන් අපේ මහනායක හාමුදුරුවෝ මේ සඳහා කතා කරනකොට විවිධ පුද්ගලයෝ මේ සඳහා ඉදිරිපත් කරනකොට මේ පනත සංශෝධනය වෙන්න පුලුවන්. ඒ නිසා මම ඔබතුමාගේ ඉල්ලීමට අනුව ඒක සලකා බලලා කියනවා පුලුවන්නම් මේ යෝජනාව අපි ගත්තාට මේ සභාවේ ගත්තොත් මේක විවාදයට ලක් කරන්න වෙනවා. එහෙම නැතිනම් මේ යෝජනාව ඊළඟ මාසේට අරගෙන පනත පිළිබඳව අවබෝධයක් අරගෙන කටයුතු කරනවානම් ඒකටත් අපේ විරෝධතාවයක් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව අද ඉදිරිපත් කළා තමුන්නාන්සේට. මම හිතන්නේ මේ යෝජනාව ලබන සභාවට ගෙනියන්න බැහැ කියන නීත්‍යානුකූල පදනම තියෙනවා. ඒ නිසා මම හිතන්නේ මේ වෙනකොටත් මේ යෝජනාව තමයි මේ විවාද වෙන්නේ. ඉතින් ඒක නිසා අපි කියනවා මේක අපි කාල වෙලාවක් තීරණය කරලා හරි අරගෙන කෙටියෙන් කතා කරමු. මේකේ කවදාවත් අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ පක්ෂයක් විදියට ගහන්න නෙවෙයි අපි

බලාපොරොත්තු වෙන්නේ. මහජන නියෝජිතයෝ විදියට අපි අපේ වගකීමක් ඉෂ්ඨ කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා මේ යෝජනාව මෙහෙන්ම විවාදයට අරගෙන ඉවර කරමු කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවේ දී අතුරු ව්‍යවස්ථාවේ 13(ඉ) වගන්තිය යටතේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**05(10) මහා නගර සභා මන්ත්‍රී, එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා, ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා, මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය, බී. සජිත් දුමින්ද පිරිස් මහතා, ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා, ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා, එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය, එල්, දිලිප් රෝෂාන් කුමාර පෙරේරා මහතා, ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා, යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා යන මහත්ම මහත්මීන් විසින් අතුරු ව්‍යවස්ථාවේ 13(ඉ) වගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව මහා නගර සභා මන්ත්‍රී මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය, විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.**

“මොරටුව ප්‍රදේශයේ ජීවත්වෙන සියලුම දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීමද, ඔවුන්ට ඇති දැඩිවීමට සුදුසු සමාජීය, අධ්‍යාත්මික පරිසරයක් ගොඩනැඟීම, මොරටුව මහා නගර සභාවේ වගකීමකි. තවද ඒ වෙනුවෙන් සිදු කළ යුතු මැදිහත්වීම් මග පෙන්වීම් නොපිරිහෙලා ඉටු කිරීම නාගරික මන්ත්‍රීවරුන් වන අපගේ පරම යුතුකමක් බව මෙයින් ප්‍රකාශ කර සිටිමු. එම කරුණෙහි පිහිටා, පසුගිය 2025.09.24 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී විවාදයට නැගුනු දණ්ඩ නීති සංග්‍රහයේ 82, 308A, 308B, 314 සහ 316 යන වගන්ති වලට කරනු ලබන සංශෝධනයන්ට අදාලව ඉදිරිපත් කරනු ලැබූ නීති කෙටුම්පත හරහා “දරුවන්ට එරෙහි ශාරීරික වධහිංසා පැමිණවීම / දඬුවම් කිරීම වැලැක්වීම (corporal punishment in respect of children) යෙදුනු පනත සහ එහි අන්තර්ගතය තුලින් ගම්‍ය වන අරුත දරුවන්ට එරෙහි ශාරීරික දඬුවම්/ වධහිංසා පැමිණවීමෙන් ඔබ්බට ගොස්, දරුවන්ට කිසිඳු ආකාරයක ආවවාද දිම්, සහ දරුවන්ගේ විනය පිහිටුවීමට දෙමාපියන්ද, වැඩිහිටියන්ද, පාසල් ගුරුවරුන්ද විසින් කරනු ලබන ක්‍රියාවන් “අවමානය” යන සංකල්පය තුලට ගැබ්ව එමගින් වැඩිහිටියන්ට ගුරුවරුන්ට දරුවන්ව නිසි ලෙස මගපෙන්වීම, නිසි ලෙස විනය පිහිටුවීමට කරනු ලබන කරුණු දණ්ඩනය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් ලෙස හඳුන්වා දෙමින් එය තුළින් සමාජයට වැරදි පූර්වාදර්ශයක් දෙනු ලබන පනත් ගෙන ඒම තරයේ හෙලා දකින අතර,

දැනට මොරටුව ප්‍රදේශයේ ඉගෙනුම ලබන සහ මොරටුව ප්‍රදේශයේ ජීවත් වන සියලුම තරාතිරම්වල, සමාජීය හා පරිසර මට්ටම්වල හැදී වැඩෙන දරුවන්ව සහ එම දරුවන්ගේ දෙමාපියන්ද, එම දරුවන්ට මඟ පෙන්වන ලබන ගුරුවරුන්ද මෙම පනත තුළින් දැඩි අපහසුතාවයකට ලක්වන බවත්, දරුවන්ගේ අනාගතය ගැටලු සහගත තත්ත්වයක් උදාවන බවත්, දරුවන්ට වැරදි පූර්වාදර්ශයක් දෙනු ලබන බවත් ප්‍රකාශ කර සිටියි.

තවද දරුවන්ගේ වැඩිදියුණුව සහ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරනු ලබන මහා නගර සභාවක් වන මොරටුව මහ නගර සභාව මොරටුව නගරයේ ජීවත් වන සියලුම සමාජ ස්ථර වල පුද්ගලයන්ගේ මට්ටම් සලකා, මෙම පනත තුළින් සිදුවන සමාජ ව්‍යසනය ගැන සලකා, ඉදිරියේදී වත්මන් රජය විසින් මෙවැනි පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමට පෙර සාමාජීය ලෙසත් සමාජ ස්ථර ලෙස දරුවන් ඇති දැඩි කිරීමේදී දෙමාපියන් විසින් අත්දකින ප්‍රයෝගික ගැටළු සලකන ලෙසත් ගුරුවරුන් දරුවන්ට විනය පිහිටුවීමටත්, පාසල තුල විනය ඇති කරලීමට සිදු කරනු ලබන විනය ක්‍රියාමාර්ග (ශාරීරික නොවන දඬුවම් ) සලකන ලෙසත්, ඒ පිළිබඳ සුදුසු අධ්‍යයනයක් කොට අදාල පනත් වගකීමෙන් ඉදිරිපත් කරන ලෙසත්, මොරටුව මහා නගර සභාව ලෙස මෙයින් යෝජනා කර සිටියි”

මහා නගර සභා මන්ත්‍රී එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ශාරීරික දඬුවම් වලට එරෙහි කෙටුම්පත. මෙම කෙටුම්පත ඉදිරිපත් කරනු ලබන්නේ දරුවන්ගේ යහපතට බලපාන බරපතල සංවේදී කරුණු මෙම පනත තුළ අන්තර්ගත වෙලා තියෙනවා ද? දැන් අපි දන්න කරුණක් තමයි දණ්ඩ නීති සංග්‍රහයේ පනත් කෙටුම්පත

දෙවනවර කියවීම සඳහා පාර්ලිමේන්තුවේ සැප්තැම්බර් මස 24 වෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එය මුල්වරට ඉදිරිපත් කරුණු ලැබුවේ 2025 අගෝස්තු මස 19 වන දින. දෙවනවර කියවීමේ විවාදයේදී යම් උණුසුම් සහගත තත්ත්වයක් පාර්ලිමේන්තුව තුළ හට ගැණුනා. එතකොට මේ පනත් කෙටුපත හා කුමක්ද ඉදිරිපත් කරනු ලබන්නේ. ළමයි සම්බන්ධයෙන් ශාරීරික දඬුවම් කිරීම යටතේ 308 වන වගන්තිය සංශෝධනය කිරීමට මෙහි ඉල්ලා සිටිනවා. ඒ අනුව 308 ආ වයස අවුරුදු 18ට අඩු යම් තැනැත්තෙකුගේ භාරකාරත්වය, භාරය හෝ ආරක්ෂාව දරා සිටිමින් දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් හෝ නිවැරදි කිරීමේ ක්‍රමයක් වශයෙන් කෙතරම් අඩු වුවද යම් ප්‍රමාණයක වේදනාවක් හෝ අපහසුතාවයක් ඇති වීමට හේතු වන බව දැනුම ඇතිව ශාරීරිකව බලය භාවිතා කරනු ලබන යම් ක්‍රියාවක් සිදු කරන හෝ ආ යන්න කෙතෙරම් අඩු වූවද යම් ප්‍රමාණයක අවමානයක් ඇති වීමට හේතු වන බවට දැනුම ඇතිව ශාරීරික නොවන යම් ක්‍රියාවක් සිදු කරන කවර හෝ තැනැත්තෙකු ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදු කරන්නේය. මෙන්න මේක තමයි පනතේ අන්තර්ගතය. දැන් මම මුල් අවස්ථාවේ දීම කියන්න ඕන විපක්ෂයක් හැටියට පමණක් නෙවෙයි, මම නීතිඥවරියක් හැටියට, අම්මා කෙනෙක් හැටියට, පාසල් යන වයසේ දරුවන් ඉන්න අම්මා කෙනෙක් හැටියට සියලුම ආකාරයක දරුවන්ට දෙනු ලබන වදහිංසා, ශාරීරික වදහිංසා වලට ඇත්තටම අපි පැහැදිලිව විරුද්ධයි. දරුවන්ට ගැහීම සම්බන්ධයෙන් අපි විරුද්ධයි. ඒ ගැන කිසිම කතාවක් නැහැ. නමුත් අපිට මේ අවස්ථාවේ තියෙන බරපතල ගැටලුව තමයි මෙම පනත හරහා දරුවන්ගේ ශාරීරික වේදනා වලට අමතරව මෙම පනතේ ඉදිරිපත් කරනු ලබන සංශෝධනයේ 308 ආ යන්න හරහා කෙතරම් අඩු වූවද යම් ප්‍රමාණයක අවමානයක් ඇති වීමට හේතු වන බවට දැනුම ඇතිව ශාරීරික නොවන ක්‍රියාවක් කරන කවර තැනැත්තෙකුට හෝ ශාරීරික දඬුවම් කිරීමේ වරද කියන සංකල්පයට මේ රජය විසින් මෙම පනත් සංශෝධයන් හරහා ඇතුලත් කරලා තියෙනවා. දැන් මේ අවමානය කියන එක ඇත්තටම ඉතා භයානක සංකල්පයක්. මොකද අවමානය කියන එකට යටත් වන්නේ කුමක්ද යන්න සම්බන්ධයෙන් මේ පනත තුළ කිසිදු ආකාරයක විග්‍රහයක් කරන්නේ නැහැ. මම මේ අවස්ථාවේ කියන්න කැමති බරපතල සංවේදී කාරණා තියෙනවා. ඇත්තටම ගත්තොත් උදාහරණයක් හැටියට අපි දන්නවා පාසල තුළ ගුරුවරුන් සෑම අවස්ථාවකදීම දරුවන්ගේ විනය පිටුවීම සම්බන්ධයෙන් විශාල ලෙස කටයුතු කරනවා. එතකොට ගුරුවරුන්ට දරුවන්ව විනයානුකූලව හරි මඟට ගැනීමට ඒ නිසි වාතාවරණය, ඒ නිසි පරිසරය තියෙන්න ඕන. අපි කිසිම අවස්ථාවකදී කියන්නේ නැහැ දරුවන්ව විනය පිහිටුවීමේ දී ඔවුන්ට ශාරීරික ලෙස අපහසුතාවයට පත්කිරීම අපි කිසිම අවස්ථාවක අනුමත කරන්නේ නැහැ. නමුත් ගුරුවරයෙක්ට දරුවෙක්ට විනය පිටුවීමට තරවටු කිරීමට හෝ එතැනින් එහාට ගිහිල්ලා යම් කිසි අවවාදයක් දීමට ගුරුවරයෙකුට අයිතිවාසිකම තියෙන්න ඕන. හැබැයි මෙම පනත හරහා එවැනි දෙයක් වළක්වාලීමක් සිද්ධ වෙනවා. උදාහරණයක් හැටියට අපි කිවුවොත් ළමයෙක් පාසලට කරාබුවක් දාගෙන ආවොත් පිරිමි දරුවෙක්, එක්කෝ කාන්තා දැරිවියක් ඇඟිලි වලට නිය ආලේපන ගල්වාගෙන ආවොත්, නහය විදගෙන ආවොත්, කරාබුවක් දාගෙන ආවොත්, යුනිෆෝර්ම් එක කොටට ඇඳගෙන ආවෙත් මෙන්න මේ අවස්ථා වලදී මෙන්න මේක වැරදී කීමට හැකියාවක් තියෙනවාද? නැද්ද? එහෙම කරන ක්‍රියාවක් ගුරුවරයෙක් විසින් ඒ අවස්ථාවේ දී විනය පිහිටුවීමට කරනු ලබන යම් කිසි විධානයක් අවමානයක් ලෙස සලකලා දරුවෙකුට ඒ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කළ හැකිද? මෙන්න මේක ඇත්තටම රට තුළ භයානක වපසරියක් ඇති කරනවා. මොකද අපි දන්නවා දරුවෝ කියන්නේ වයස අවුරුදු බින්දුවේ සිට දහාඅට දක්වා වයස් කල සීමාව ඇතුලත සිටින පුද්ගලයන්. එතකොට දරුවෙකුට තමුන්ගේ මට්ටමින් තීන්දු තීරණ ගැනීමට හැකියාව, අවකාශය, දැනුම තියෙනවාද? මෙතන ඉන්නවා අම්මලා තාත්තලා මම කියන දේ දේශපාලන කෝණයකින් නෙවෙයි අම්මලා තාත්තලා හැටියට අපිට අවශ්‍ය සමාජයට වගකියන වැදගත් පුරවැසියන් ඉදිරිපත් කිරීම. එතකොට අපේ දරුවන් සම්බන්ධයෙන් ඒ දරුවන්ට හරි විනයක් ඇතුව හරි සමාජයට ඉදිරිපත් කිරීමට අපිට වගකීමක් තියෙනවා. එතකොට අපිට අපේ ළමයෙක්ට අවවාදයක් දෙන්න, තරවටු කිරීමට අපිට අවස්ථාව තියෙන්න ඕන. ඒක තියෙනවා කියන්නේ ඒ ළමයාව මානසික ලෙසින් පල්ලෙහාට දානවා නෙවෙයි. ඒ අයිතිය තිබිය යුතුයි. හැබැයි මේ රජය බලාපොරොත්තු වෙනවානම් දරුවන්ව විනයානුකූලව නිර්මාණය කරන ක්‍රියා පටිපාටිය වෙනස් කරන්න රජය බලාපොරොත්තු වෙනවානම් රජය පළමුව කළ යුත්තේ ඒ සම්බන්ධයෙන් සමාජය තුළ කතිකාවතක් ඇති කරලා ඒ සම්බන්ධයෙන් දරුවන් දෙමාපියන් අතර කතිකාවතක් ඇතුලත් කරලා කොහොමද දරුවන්ව අපි විනයානුකූලව හරි මාර්ගයට ගන්නේ, වැරැද්දක් කෙරුවාම

කොහොමද පහදලා දෙන්නේ මෙන්න මේවා කියන්න ඕන. එකපාරට පාර්ලිමේන්තුවට නීතියක් ගෙනෙල්ලා දාලා ඒ නීතිය හරහා සමාජය වෙනස් කරන්න බැහැ. නීතියක් කියන්නේ, නීතියක අවශ්‍යතාවය කුමක්ද? නීතියක් තුලින් සමාජය ප්‍රගතශීලි ලෙස ඉදිරියට ගෙනයාම තමයි නීතියක අරමුණ. වී බ්‍රින් ලෝව්ස් ටු මේක් ෂුවර් ද සොසයිටි මූව්ස් ප්‍රෝග්‍රැසව්ලි නොට් ටු හේක් ද සොසයිටි ගෝ බැක්වර්ඩ්ලි ප්‍රගතශීලි ලෙස ඉදිරියට යාම තමයි නීතියක අරමුණ. නමුත් මේ නීති හරහා ඔබ මම ජීවත් වෙන සමාජය අපේ දරුවන්ව, අපේ මේ ශ්‍රී ලාංකීක රට අපේ දරුවන්ව පල්ලෙහාට ඇදීමකට ලක් කරනවානම් ඇත්තටම මේ නීති පිළිබඳ අපි දෙපාරක් හිතන්න ඕන.

ගරු නගරාධිපතිතුමනි, මම නැවත වරක් අවධාරණය කරනවා දරුවන්ට දඬුවම් කිරීමට ශාරීරික වද හිංසා පැමිණවීමට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි. නමුත් මේ අවස්ථාවේ මේ මාලිමා රජය විසින් මේ ගෙනෙල්ලා තියෙන පනත ඇත්තම මම කියනවා දෙමාපියෙකු හැටියට වගකීම් විරහිත පනතක්. මොකද මෙවැනි පනත් ගෙන ඒමට ප්‍රථම මම දන්නවා පාර්ලිමේන්තුව නිකන් පනතක් ගේන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් කතිකාවත් කරනවා. රිසර්ච් කරනවා. මේ සම්බන්ධයෙන් යූ.එන්.එච්. හා යුනයිටඩ් නේෂන් කන්වෙන්ෂන් ඔෆ් රයිට්ස් ඔෆ් චයිල්ඩ් වගන්ති සම්බන්ධයෙන් අවධාරණය කරලා තමයි මේ පනත් ගේන්නේ. නමුත් මෙහෙම ගේනකොට ඩ්‍රාෆ්ට් කරනකොට මේවා කන්සල්ටර්ටඩ් කමිටි හරහා ගිහිල්ලා මේවා ඉදිරිපත් කරනවාද? එහෙම කරනවානම් අවමානය කියන වචනයට පුළුල් නිර්වචනයක්වත් නොදී මෙවැනි පනතක් මේ ආකාරයෙන් ඉදිරිපත් කරන්නේ කොහොමද? මම කියනවා මේක රජයේ වගකීම් විරහිත ක්‍රියාවක් කියලා. අපි මේ අවස්ථාවේ කිසිම අවස්ථාවක කියන්නේ නැහැ දරුවන්ට ගහන එක අපි අනුමත කරන්නේ නැහැ. නමුත් මෙවැනි දේවල් නීති ගෙන ඒම තුලින් රටක් ඉස්සරහාට යන්න ඕන. ප්‍රගතිශීලි ලෙස ඉස්සරහාට යන්න ඕන. අපිට තියෙන ඉතාම බරපතල බය තමයි වර්තමාන රජයට පාර්ලිමේන්තුවේ 3/2 ක බලය තියෙනවා. 159 ක් පාර්ලිමේන්තුවේ ඉන්නවා. එතකොට ගේන හැම එකකටම අත ඉස්සීමට ඔවුන්ට අවකාශය තියෙනවා. එතකොට මෙවැනි දේශපාලන මත පිහිටුවලා මෙවැනි ගේන පනත් වලටත් ඔබලාට හැකිනම් ඔබලා රජයට අත උස්සලා මෙවැනි දේවල් සම්මත කිරීමේ අවශ්‍යතාවය තියෙනවා. එතකොට මේ රටේ මිනිස්සු ඡන්දය දෙනකොට මෙන්න මේවා හිතුවාද කියන එක අපි දන්නේ නැහැ එතකොට විපක්ෂයක් හැටියට අපේ වගකීම මෙවැනි දේවල් වලට අපිට පාර්ලිමේන්තුවේ බලය නැතත් අපිට තියෙන එකම බලය අපේ කටේ බලය, අපේ හඬනැඟීමේ බලය, අපේ ඇක්ටිවිෂන් බලය, අපි කතා කිරීමේ බලය, අන්න ඒ මත පිහිටලා තමයි අපි මේ පනත් ගැන සාකච්ඡා කරන්නේ. මොකද අපිට අවශ්‍ය සමාජයක් හැටියට පස්සට එන රටක් නෙවෙයි. අපිට අවශ්‍ය අපේ දරුවන්ව හරි මඟට යොමු කිරීමට නීති හදන පාර්ලිමේන්තුවක්. එතකොට මම මේ අවස්ථාවේ කියනවා මොරටුව නගරය ගන්න. මොරටුව නගරයේ දූවාදරුවන් ගැන ගත්තාම සාමාජීය වශයෙන් විවිධ වූ ස්ථර වල ඉන්න දරුවන් දරුවන් ඉන්නවා. හැම දරුවෙක්ම අර දරුවන්ව ප්‍රොග්‍රසිව් තින්කින් වල ඉන්න හොඳ පවුල් වලින් එන හැම ළමයෙකුටම ඒ ශික්ෂණයේ දැනුම නැහැ. අපි පොඩි කාලේ ඉඳලා හැදිච්ච යම් කිසි පරිසරයක තියෙනවා. එතකොට ඒ හරහා ළමයින්ව විනයානුකූලව හදපු පරිසරයක් තියෙනවා. එතකොට විවිධ ස්ථර වල ඉන්න අම්මලා ළමයින්ව ඩිසිප්ලින් කරන්නේ විවිධ ආකාරයට. විවිධ පාසල් මට්ටම් තියෙනවා. දැන් මොරටුව ප්‍රදේශය ගත්තාම රජයේ පාසල් තියෙනවා, පළාත් සභාව මඟින් පාලනය වෙන පාසල් තියෙනවා. ඉතා කුඩා පාසල් තියෙනවා. එතකොට මේ ගුරුවරුන්ගේ සමාජ මට්ටම් වෙනස්. එතකොට මෙවැනි නීති එකපාරට ගෙනල්ලා දාලා දරුවෙකුට මේ නීතිය හරහා දරුවන්ව බලාත්මක කිරීම තුළින් දරුවන්ට වයස අවුරුදු 18ට අඩු දරුවන්ට ඔවුන්ට කරන අවමානයක් සම්බන්ධයෙන් ඔවුන්ට කරන අවවාද අවමානයක් ලෙස සලකලා ඒ සම්බන්ධයෙන් පොලිසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න පුලුවන් පරිසරයක් මේ රට තුළ නිර්මාණය කිරීමම මාලිමාවේ අරමුණ කියලා අපි අහන්න කැමතියි. මම තව දෙයක් කියන්න කැමති මේ අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් කියනවා විපක්ෂය මේවා සම්බන්ධයෙන් බිල්ලෝ මවනවා කියලා. විපක්ෂය බිල්ලෝ මවන්නේ නැහැ. විපක්ෂය ගේන හැම දෙයකටම විරුද්ධ වෙන්නෙත් නැහැ. නමුත් මේ අවස්ථාවේ දී මේ සම්බන්දයෙන් තියෙන සමාජීය ව්‍යසනය අපිට ඉදිරියේ දී අපි දකිනවා මේ හරහා රට තුළ සිදුවිය හැකි සමාජ ව්‍යසනය ගැන සලකලා තමයි අපි මේ අවස්ථාවේ මේ යෝජනා ඉදිරිපත් කරන්නේ. එතකොට තව දෙයක් මම කියන්න කැමති මම මේ අවස්ථාවේ කියනවා අර සමන්ත මන්ත්‍රීතුමා ඉස්සෙල්ලා වීඩියෝ පටයක් ඉදිරිපත් කළා. එතකොට අපි දන්න දෙයක් තමයි ලංකාවේ නීතියේ අවුරුදු 18 ට වැඩි පුද්ගලයෙක් තමයි වැඩිහිටියෙක් වෙන්නේ. නමුත් අවුරුදු 16 ට වැඩි වුණාම දරුවෙකුට තමුන්ට තීන්දු තීරණ

ගැනීමේ අයිතිය තියෙනවා. එතකොට ළමයෙකුට තමුන්ට අවශ්‍යනම් ලිංගිකව එක්වීමේ අර කියන සෙක්ස් කිරීමේ අයිතිවාසිකම තියෙනවා. එතකොට අපි දකිනවා පාර්ලිමේන්තුවේ දී බිමල් රත්නායක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කියනවා 16ට වැඩි වුණාම ළමයෙක් සෙක්ස් කළාම ප්‍රශ්ණයක් නැහැ කියලා. ඇත්තටම අහන්න කැමති මෙතැන ඉන්න ඔයගොල්ලන්ගෙන් පවුලේ අවුරුදු 16 ළමයි ඉන්නවානම් ඔයගොල්ලෝ කැමතිද අවුරුදු 16 ළමයෙක් එවැනි දෙයක් කරනවාට පාසල් යන ළමයෙක්ට. අයිතිවාසිකම් කියන එක වෙනස් දෙයක්, අයිතිවාසිකම් ක්‍රියාත්මක කරන එක වෙනස් දෙයක්. නමුත් වගකිව යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේ හිටගෙන එවැනි කතා කියලා ඒවා සමාජගත කිරීම ඉතාම භායනක ප්‍රසිඩන්ස් එකකක්. ඉතාම භයානක පූර්වාදර්ශයක්. අයිතිවාසිකම් කියන්නේ එකක්. ඒ වුණාට ඉලෙබරේට් කරලා පාර්ලිමේන්තුව තුළ කීම ඇත්තටම අපි ඒක අනුමත කරන්නේ නැහැ. නීතිය හරි 16ට වැඩ ළමයෙක්ට පුලුවන්කම තිබුණත් අපිට අවශ්‍ය 16 හා 18 අතර තියෙන නීතිමය පරතරය නැති කරලා ඒ 16 දහඅට කිරීම තමයි මාලිමාව කළ යුත්තේ. අපි අවුරුදු ගණනාවක් කළා මේ වයස අවුරුදු 16 හා 18 අතර තියෙන වෙනස ගැන පාර්ලිමේන්තුවේ ඇක්ටිවිස්ලා කාන්තා මන්ත්‍රීවරියන් හඬ නගලා තියෙනවා. එතකොට මාලිමාවෙන් ඇත්තටම අපි බලාපොරොත්තු වුණේ 16 වයස කියන එක 18 කරයි කියලා. නැතුව 16 වයස ඇවිල්ලා කියන්න නෙවෙයි. 16 න් පස්සේ ඔබලා සෙක්ස් කළාට ප්‍රශ්ණයක් නැහැ කියලා. මේවා ඇත්තටම වැරදි මන්ත්‍රීතුමා අපි ඒ මත පිහිටලා තමයි කියන්නේ අප ප්‍රගතශීලි රටක් ලෙස ඉස්සරහාට යනවානම් මේ රජය වගකීමෙන් කටයුතු කළ යුතුයි. ඔබේ රජයේ වගකීම වෙන්නේ මේ රට තුළ සමාජීය පරිසරය තිබුණාට වැඩිය හොඳට ශික්ෂණය තුළින් රට ඉස්සරහාට ගෙනයාම. අපි දන්නවා ඔබලාගේ රජය තුළ ඉතාම ප්‍රොග්‍රසිව් තින්කින් තියෙනවා. ඔබතුමන්ලා මේ රට තුළ ආන්තීකරණය වෙච්ච පාර්ශව වෙනුවෙන් කතා කරනවා. ජෙන්ඩර් ඉන්ක්ලූසික් රටක් නිර්මාණය කිරීමට ඔබලා කතා කරනවා. ඒ සම්බන්ධයෙන් අපිට යම් අවස්ථාවලදී යම් යම් විවේචන තිබුණාට පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමහර දේවල් දිහා සාධනීය ලෙස බලනවා. නමුත් මේ කරන දේවල් ගාල කඩාගෙන කරන්න බැහැ. පාර්ලිමේන්තුවක් කියන්නේ එක එක මන්ත්‍රීවරුගේ එක එක අජෙන්ඩර්ස් ක්‍රියාත්මක වෙන තැනක් නෙවෙයි. අපේ අනාගතය දරුවන්ගේ අනාගතය. මම අවසාන වශයෙන් කියනවා රටක් ඉස්සරහාට යන්නනම් රටක නීති ප්‍රගතශීලි විය යුතුයි. එතකොට විනය පිහිටුවලා කටයුතු කිරීම සඳහා මේ ගෙනෙල්ලා තියෙන පනත. ඇත්තෙන්ම මොරටුව මහා නගර සභාවේ මහජන නියෝජිත වරියක් හැටියට පමණක් නෙවෙයි එතැනින් ගිහිල්ලා නීතිඥවරියක් හැටියට අම්මා කෙනෙක් හැටියට මෙවැනි වගකීම් විරහිත පනත් පාර්ලිමේන්තුවට ගෙන ඒමට ප්‍රථම මෙ සම්බන්ධයෙන් කටයුතු කරලා අඩුමගාණේ කන්සල්ටේඩිව් කමිටිස් දරුවන් ගුරුවරුන් සමහ සාකච්ඡා කරලා දෙමාපියන් සමඟ සාකච්ඡා කරලා විනය පිහිටුවනවානම් මොනවද විනය පිහිටුවන විකල්ප ක්‍රම. මේවා කියන්න ඕන. එකපාරට පනතක් ගෙනෙල්ලා නීතියක් දාලා ළමයාට අවමානයක් කිවුවාම එතකොට ඒ අවමානයක් කියන ළමයා හෙට ගිහිල්ලා පොලිසියේ පැමිණිල්ලක් දැම්මොත් හෙට අපේ අම්මලාව පොලිසියට ගෙනියයි. එතකොට ඔබලම ප්‍රගතශීලි ලෙස ගෙනාපු පනත් පසුගාමී රටක් නිර්මාණය කිරීමට තමයි ඔබලා බලාපොරොත්තු වෙන්නේ. ඒ හින්දා මම නැවත වරක් අවධාරනය කරනවා දරුවන්ට ශාරීරික වද හිංසා දීමට අපි සපුරා විරුද්ධයි. නමුත් ඒ මත පිහිටලා මෙවැනි වගකීම් විරහිත ලෙස අර්ථ දක්වලා ඉදිරිපත් කරලා තියෙන මෙවැනි පනත් වහාම හකුලා ගන්න කියලා ඉල්ලීමක් කරනවා. එපමණක් නෙවෙයි අපි මේ අවස්ථාවේ කියනවා ඔබලාගේ රජයේ මේ වගකීම් විරහිත ලෙස මෙලෙස කටයුතු නොකරන්න කියලා අපි ඉල්ලනවා. පනත් ගෙන ඒමට පෙර රාජ්‍යකරණය ආණ්ඩුකරණය සහ පනතක වගකීම පිළිබඳ මීට වැඩිය වගකීමෙන් කටයුතු කරන්න කියලා අපි මාලිමා රජයෙන් සහ මොරටුව මහා නගර සභාවේ විපක්ෂ මන්ත්‍රී කණ්ඩායම හැටියට මේ අවස්ථාවේ යෝජනා කර සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දැන් ඒක සාධාරණ නැහැනේ. එළිවෙනකන් හරි වාද කරමු. ඒක සාධාරණ නැහැනේ. දැන් විපක්ෂ පැත්තෙන් ගරු නගරාධිපතිතුමනි, මම විපක්ෂය කියන්න කැමති නැහැ. නමුත් අපි එහෙම කතා කළොත් දැන් ඌ වගන්තිය යටතේ මේ දරුවන්ට වදහිංසා පැමිණවීම සම්බන්ධයෙන් සමාජය ඇතුලේ කතාබහ වෙන සංවාද කරන මාතෘකාවක් ඉදිරිපත් කළා. දැන් ගරු නගරාධිපතිතුමනි, මේ සුන්බුන් වෙච්ච කණ්ඩායම එහෙම ප්‍රකාශ කරන්න වෙනවා ඒ කණ්ඩායම

හැමදාම අපේ පාලනය දැන් අවුරුද්දක් ගත වෙලා. ඒක ඇතුලේ යම් යම් මතිමතාන්තර නිකන් අර රට නිකන් මාර ප්‍රපතයකට ඇදගන්න හදනවා වගේ මත හදන්න දක්ෂයි. දැන් මේ ගේන පනත අපි ඇත්තටම ලොකු අධ්‍යනයක් කරලා නැහැ තාම. හැබැයි අපිට දැන ගන්න ලැබිච්ච, අපි අහපු කරුණුත් එක්ක ගත්තොත් මේ මහත්වරුන්ට පැටලවිලා තියෙනවා ගරු නගරාධිපතිතුමනි දඬුවම් දීම හා වදහිංසා පැමිණවීම කියන දෙක පටලවගෙන ඉන්නේ. දැන් මේ පනතේ කොහේවත් අම්මා කෙනෙක් හරි ගුරුවරයෙක් හරි දරුවෙකුට වරදක් කළාම දඬුවම් කරනකොට ඒ දරුවා දුවගෙන ගිහිල්ලා පොලිසියට පැමිණිලි කරලා කුදලගෙන අම්මව හරි ගුරුවරයාව හරි අල්ලන් එන සමාජයක් එහෙම නැහැ. හැබැයි මේ දැන් හදනවා උත්සහ කරනවා. දැන් මේක ගෙනාවොත් අපේ අම්මේ තලන්න බැහැ දරුවාට, ගුරුවරයාට තලන්න බැහැ මාර සීන් එක මත හදනවා. මේගොල්ලන්ට පුලුවන් මත හදන්න විතරයි. ඒකට හරියන්න යූටියුබ් ටිකක් තියෙනවා, චැනල් ටිකක් තියෙනවා. කලබල වෙන්න එපා. කලබල වීම තමයි මේ අප්සෙට් එක. මේ කලබල වීම තමයි ගැටලුව. ගරු නගරාධිපතිතුමනි, මේගොල්ලෝ හැම වෙලාවේම කලබලයි. ඇයි දැන් සමාජේ පිලිගන්නේ නැහැ. දැන් මහත්තයෝ අපි නිහඬව හිටියනේ ඔයගොල්ලෝ කතා කරනකොට. ඔයගොල්ලොත් ඉන්න ටිකක් කලබල වෙන්නේ නැතුව. අපිත් මේවායේ අදහස් දක්වනවා. කලබල වීම හොඳ නැහැ. ඒ කලබල වීම ඇත්ලේම තමයි අනාගන්නේ. අපි හොඳට දරු දුක හඳුනනවා. දරුවෝ කියන්නේ කවුද කියලා අඳුනනවා. මේ මාලිමා පාලනය කවදාවත් දරුවන්ට හෝ මේ සමාජයේ අයහපතක් වෙන කිසිම දෙයක් කරන්නේ නැහැ. ඒක අපි සහතික කරනවා. හිනාවෙන්න පුලුවන් මොකද ඒගොල්ලෝ කරපු දේවල් මේ සමාජේ දන්නවා. ඒ නිසා තමයි දෙකයි පනහට වැට්ටුවේ. ඒක නිසා මේ මහත්වරුත් එක්ක වාද කිරීම කියන්නේ නිකන් පව් කියන එක තමයි කියන්න තියෙන්නේ. හැබැයි, ඒ කෙසේ වෙතත් මේ පනත ඇතුලේ ගරු නගරාධිපතිතුමනි, කිසියම් හෝ අසාධාරණයක් දරුවන්ට හෝ ගුරුවරුන්ට හෝ දෙමාපියන්ට හෝ කාටහරි සිද්ධ වෙනවානම් ඒවා සංශෝධනය වෙන්න පුලුවන්. මේවා සාකච්ඡාවට බඳුන් කරලා තියෙන්නේ. පනත ගෙනාව පමණින් හෙට ගිහිල්ලා සම්මත කරන්නේ නැහැ. ඕන කෙනෙකුට ඕනනම් උසාවි යන්න පුලුවන්. මේකට විරුද්ධව ඉදිරිපත් වෙන්න පුලුවන්. ඒකට කිසි බාධාවක් කරලා නැහැ. හැබැයි මේ හදන්නේ මොකක්ද ? මොකක් හෝ පනතක් හෝ මොකක් හෝ ක්‍රියාලියක් ආරම්භ කරපු ගමන් අන්න එනවා ටක්ගාලා මේගොල්ලන්ගේ යූටියුබ් ටික. මේගොල්ලන්ගේ ඉන්නවා ටිකක් සෙට් එකක්. ටක් ගාලා හදනවා පොඩි පොඩි ක්ලිප් කෑලි. කෑලි ටික අමුණලා කියනවා බිමල් රත්නායක මෙහෙම කිව්වා අරයා මෙහෙම කිව්වා මටත් පුලුවන් අපේ අගමැතිතුමිය කරපු ප්‍රකාශය මෙතන කියන්න. ඒක කියන්නේ නැහැ. නැහැ වැඩක් නැහැ. ඔයගොල්ලොත් එක්ක ඒ සංවාද කරලා වැඩක් නැහැ. මොකද ඔයගොල්ලෝ පිලිගන්නේ නැහැනේ. ඒක අපි සමාජයට කියනවා. ඔයගොල්ලන්ට කියලා වැඩක් නැහැ. දැන් මේ වාදයක් ඇතුලේ අපි ඉතා නම්‍යශීලීව මේ මහත්වරු කතා කරනවා දැන් ලිහිණි මන්ත්‍රීතුමිය මහා හරසර බොහෝම ලස්සන එකක් කිව්වා. ඉතින් අපි අහන් හිටියා. අපි ඒකට වාද කරන්න ගියේ නැහැ. බාධා කරන්න ගියේ නැහැ. හැබැයි අපි කතා කරනකොට අර පරණ සංස්කෘතිය එනවා. ඒවා දැන් යල්පැන ගිහිල්ලා තියෙන්නේ. මේ සමාජය ඉස්සරහාට යනවා අපි මේ සමාජ ප්‍රගමනයේ ඉස්සරහාට යන්න තමයි විවිධ කටයුතු සිද්ධ කරන්නේ. හැබැයි අපිට අදටත් බාධා තියෙනවා. ඒවා බිඳගෙන අපි යනවා. මම ලොකු කාරණා කියන්න යන්නේ නැහැ ගරු නගරාධිපතිතුමනි මේ පනතේ අපි දන්න විදියට කිසිදු ආකාරයක එවැනි දඬුවම් දීමක් සම්බන්ධයෙන් කිසිදු ආකාරයක ගැටලු මතු වෙන්නේ නැහැ. හැබැයි මේ පනතින් අනිවාර්යෙන් මේ දරුවන්ට වදහිංසා දඬුවම් දීම නමින් වදහිංසා පැමිණවීමක් තියෙනවා. ඒකට අදාළ දරුවන්ට, දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරන පනතක් කියලා තමයි අපි විශ්වාස කරන්නේ. ඒ නිසා මේක ඇතුලේ බිල්ලෝ මවන්න හැදුවත්, මොන කතන්දර කියන්න හැදුවත් මේක සමාජය පිලිගන්නේ නැහැ. මේවායේ මොනවාහරි අඩුපාඩු තියෙනවානම් සාක්ච්ඡා කරලා ඒ සංශෝධනයන් හදාගන්න අවස්ථාව තියෙනවා. ඒ අවස්ථා ඇතුලේ පාර්ලිමේන්තුව නිසියාකාරව පාර්ලිමේන්තුව ඇතුලේ සිද්ධ වේවී. අපිත් දරුවෝ හදපු තාත්තලා. අපිටත් දරුවෝ ඉන්නවා. ඒ නිසා අපේ දරුවන්ට අපි දඬුවම් කරලත් තියෙනවා. අපේ දරුවන්ට අපි අවවාද කරලත් තියෙනවා. ඒ දෙකේ වෙනස අපි හොඳින් හඳුනනවා. හැබැයි ඔය කියන විදියට බිල්ලොත් එක්ක සෙල්ලම් දාලා මේ සමාජය රවට්ටලා මේ සමාජය නොමඟ යවලා මාලිමා ආණ්ඩුව වට්ටන්න හදනවානම් පව් කියලා විතරයි මට කියන්න තියෙන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා ලිහිණි මන්ත්‍රීතුමියට කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධව. ඒවගේම තමුන්නාන්සේට විශේෂ ස්තුතියක් කරනවා ඒකට අවස්ථාව සලසා දීම සම්බන්ධව. මම හිතන්නේ තමුන්නාන්සේට එසේ නොකර ඉන්න හිතට එකඟ වෙන්නේ නැහැ. මොකද අපිත් එක්ක විපක්ෂයේ වාඩිවෙලා ඉඳලා තමුන්නාන්සේ කරපු ලොකු කාර්යය භාර්යයක් තියෙනවා ආණ්ඩු පක්ෂයට විරුද්ධව. ඒ නිසා තමුන්නාන්සේ ඒ අවස්ථාව දුන්නා කියන විශ්වාසය මා තුළ තියෙනවා. ඒ එක්කම මම ලිහිණි මන්ත්‍රීතුමිය කරුණු දැක්වූවායින් පස්සේ සුදේශ් මන්ත්‍රීතුමා මම හිතන්නේ මේක වෙනත් පැත්තකට යොමු ආකාරයක් පෙනුනා. මේක ලොකු විවාදයකට ගෙනෙල්ලා මේක පක්ෂයක් විදියට මඩ ගැහිල්ලක් විදියට ලක් කරනවා කියන්නේ එහෙම දෙයක් නෙවෙයි මම මුලින්මත් කිවුවේ. අපිට අවශ්‍ය ඒක නෙවෙයි. තමුන්නාන්සේලා සාධනීය දේවල් ඉදිරිපත් කරන්න අඩුපාඩු තියෙනවානම් දැකලා. පක්ෂයක් ආරක්ෂා කරගන්න කල් ඉන්න එපා. මෙතන මන්ත්‍රීවරු ඉන්නවා මාලිමාවේ අලුතින් ආව මන්ත්‍රීවරු ඉන්නවා. උගත් බුද්ධිමත් මන්ත්‍රීවරු ඉන්නවා. ඒ නිසා තමුන්නාන්සේලා අපි සියලු දෙනාගේම දරුවන් ඉන්නවා. මේ දරුවන් වෙනුවෙන් කතා කරන්න. මම කියනවා මාලිමාවේ මන්ත්‍රීවරුන්ට හෘදසාක්ෂියට එකඟව හිතන්න, කතා කරන්න කෙනෙක් කිවුව පලියටම අපි ඒකට නතු වෙන්න අවශ්‍ය නැහැ මේ පක්ෂයක් විදියට බදාගෙන. මම කවදාවත් අපේ පක්ෂයේ හිටියත් පක්ෂයේ නායකයො වැරදි කළත් මූණටම කියන උදවිය. ඒක හරි කියලා පිලිගන්න උදවිය නෙවෙයි සමහරක් තැන් වලදී. පක්ෂය ආරක්ෂා කරනවා හැබැයි වැරදි දැක්කාම වැරදි කියන එක නිහතමානීව නායකයොත් එක්ක අපි තර්ක විතර්ක කරනවා. ඒ නිසා මම කියන්නේ නගරාධිපතිතුමනි, මේ පනත මේ සංශෝධනයන් තුලින් දණ්ඩ නීති සංග්‍රහයේ අංක 31, 82, 308, 314, 316, 341 මේ යටතේ ඒ පනවලා තියෙන ඒ සංශෝධන යටතේ ඒ ගුරුවරුන් වෙනුවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පනවලා තියෙන මේ වගන්ති තුලින් පනවලා තියෙන ක්‍රියාදාමයන් නිසා අද ගුරුවුරු අවිනිශ්චිතභාවයකින් පෙලෙනවා. අපේ ශ්‍රී ලංකාවේ අපේ සංස්කෘතිය සබ්භ්‍යත්වය ආරක්ෂා කරමින් අපේ දෙමාපියෝ අපි තවමත් ඒ ආකාරයෙන් කටයුතු කරන පරම්පාරාවක් වර්තමාන සමාජයක් තියෙන්නේ. මේ සමාජය යම් කිසි විදියට මම හිතන්නේ ලෝකයේ අනෙකුත් රටවල් වලට වඩා සාරධර්ම වලින් පිරිපුන් පුද්ගලයෝ මේ ලංකාව තුළ ඉන්නවා. අපි නිර්මාණය කරන්න හදන්නේ උගත් බුද්ධිමත් කියන අය පමණක් නෙවෙයි. නිර්මාණය කරන්නට ඕන අපේ දරුවන් සාරධර්ම වලින් ගුණදහමින් පරිපූර්ණ දරුවන් තමයි අපේ දෙමාපියෝ බලාපොරොත්තු වෙන්නේ මේ සමාජයට දායාද කරන්න. මම දන්නේ නැහැ අනික් අය කොහොම වුණත් පෞදගලිකව අපි ඒ තැන් වලයි ඉන්නේ. මම දක්නවා අද ඒ සමාජය ගිලිහී ගිහිල්ලා තියෙනවා. විශේෂයෙන්ම අපි තරුණ කාලේ දහම් පාසල් යනකොට මම හිතන්නේ කටුබැද්ද දහම් පාසලේ මා සමඟ එකට හිටියා තිලක් විජේතුංග මහත්මයා. අපි දරුවන් 800 ක් විතර අපි ඒ දවස් වල ඒ දහම් පාසලේ ඉගෙනුම ලැබුවා. අද එහෙම දරුවන් පිරිසක් නැහැ දහම් පාසල් වල. කටුබැද්ද දහම් පාසලේ ඉන්නේ ළමයි 200කට වගේ ආසන්න පිරිසක්. විශේෂයෙන්ම අපේ දෙමාපියන් අද දරුවන්ව අධ්‍යාපනය කෙරෙහි වෙනත් පැත්තකට යොමු කරනවා වගේ විතරයි පේන්නේ සාරධර්ම ගැන කතා කරන්න අපි එතැනට ඇවිල්ලා තියෙනවා. දරුවන් අයාලයේ යන සමාජයක් නිර්මාණය වෙනවා. ඒ නිසා තමයි අපි දකින හැම පැත්තකම හැම වත්තකම ගිහිල්ලා බැලුවොත් මොරටුවේ කුඩා වතුවල කුඩු ගහනවා කියයි අයිස් ගහනවා කියයි. ඒ දරුවන් දෙමාපියන්ට, වැඩිහිටියන්ට සලකන්නේ නැති සාරධර්ම ගුණධර්ම පිරිහීම්කට ලක්වුණ දරුවන් කොටසක් බිහි වෙන්නේ. ඒ නිසා අපි පාසල් යන කාලේ ඔබ තමුන්නාන්සේලා අපි ගුරුවරුන්ගෙන් ගුටිකාලා දණගහලා තියෙනවා. හැබැයි අපි ඒ ගුරුවරුන්ට අදටත් සලකනවා අපි ඒ ගුරුවරුන්ට භක්තියෙන කතා කරනවා අර නොගහපු ගුරුවරුන්ට වඩා අපිට පහර දුන්නු ගුරුවරුන්ට. ඒ තමයි අපේ හැදියාව. අපි කියන්නේ නැහැ ශාරීරික දණ්ඩනය, වදහිංසා පැමිණවීම 100%ක් සාධාරණයි කියලා. හැබැයි එයට ලක්වුණ පුද්ගලයෙකු හැටියට අපි ඒ ගැන අද හිතනවා අපිට මීට වඩා දෙයක් කරන්න තිබුණා. අපිට තව ටිකක් ඇහුන්කම් දුන්නානම් ගුරුවරුන්ට කියලා. අන්න ඒ තැනට අපි පත්වෙලා තියෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අපි තමුන්නාන්සේට කියනවා මේ 308 ආ වගන්තිය යටතේ මේ දරුවන්ට අවමානය කියන චෝදනාව යටතේ ඕන දෙයක් කරන්න පුලුවන්. දරුවෙක් ගුරුවරයා දිහා ඔරවලා බැලුවත් ඒකත් අවමානයකට ගන්න පුලුවන්කම තියෙනවා. සැර කළත් අර්ථ නිරූපණය කරන්න පුලුවන්කම තියෙනවා. ඒ නිසා මේකට දෙන අවම මාස 06ක සිර දඬුවමක් හෝ

ලක් කරන්න පුලුවන් කියලා තියෙනවා මේ ගුරුවරුන්ව. ඒක නිසා මම කියන්නේ තමුන්නාන්සේලා හිනාවෙන එක නෙවෙයි. ඒක නිවැරදි කරන ක්‍රමයක් තියෙනවා. එහෙනම් චක්‍රලේඛනයක් මඟින් පාසලට එවුවනම් මොන විදියටද මේ දඬුවම් පැමිණවිය යුත්තේ කියලා එතකොට මේ ප්‍රශ්ණය නිරාකරණය කරගන්න පුලුවන්කම තියෙනවා. ඒ නිසා අර්ථ නිරූපණයක් හරියට ඉදිරිපත් නොකර කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් තමයි අපිට දකින්නට තියෙන්නේ. ඒ නිසා 200/11, 305/17, 316/12 ශාරීරික දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් යුනිස්කෝ සංවිධානය, ළමා ආරක්ෂණ අධිකාරිය පැහැදිලිවම කරුණු දක්වලා තියෙනවා. අන්න ඒ කරුණුත් එක්ක අපි තමයි මේ තරම් දුරට කරගෙන ආවේ. ඒ නිසා ඒ කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා. විශේෂයෙන්ම අද අපි දකිනවා අද පාසල් පද්ධතිය තුළ ලොකු අඩුපාඩුකම් රැසක් තියෙනවා. ගුරුවරු 40000ක හිඟයක් තියෙනවා. විදුහල්පතිවරු 3000ක හිඟයක් තියෙනවා. ඒ වගේම සංවර්ධන නිලධාරීන් 16500ක් අදත් උද්සෝෂණයට ලක්වෙලා තියෙනවා. අපි කියනවා මේ අය අතුරින් පහුගිය කාලේ මේ අය ලොකු කාර්යය භාර්යයක් කළා පාසල තුළ. මේ අයට තමුන්නාන්සේලාගේ රජය බලයට පත්වෙන්න ඉස්සෙල්ලා පොරොන්දුවක් දුන්නා මේ අයට අධ්‍යාපන ක්‍රමය තුල ඒ ගුරුවෘත්තියට බඳවා ගන්නවා කියලා. ඒ අයගෙන් මේ පුරප්පාඩු පුරවන්න කටයුතු කරලා මේ පාසල් පද්ධතිය නගා සිටුවන වැඩපිළිවෙලක් දියත් කරන්න. ඒ පද්ධතිය දියත් කරන ගමන්ම මේ දරුවන්ව ගුණගරුක සාරධර්ම වලින් පරිපූර්ණ දරුවන් පිරිසක් මේ සමාජයට බිහි කරන චේතනාවෙන් තමයි අපි මේ යෝජනා ඉදිරිපත් කළේ. නැතිනම් කිසි කෙනෙකුට මඩ ගහන අරමුණකින් නෙවෙයි. මේකට තමුන්නාන්සේලාගේ සාධනීය අදහස් ඉදිරිපත් කරලා අපි මේක මොරටුව මහා නගර සභාවේ සම්මත වුණ යෝජනාවක් විදියට අපි අදාළ තැන්වලට යොමු කරලා නිසි පියවර ලබා ගන්න කටයුතු කරමු කියලා ඒ ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අද දින අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් විශේෂයෙන් ලිහිණි මන්ත්‍රීතුමිය ඉතාම චතුර කථිකාවියක් ලෙස ලොකු කතාවක් ඉදිරිපත් කළා. මට මේ සම්බන්ධයෙන් කියන්න තියෙන්නේ මෙන්න මේ වගේ අදහසක් එතුමිය සහ අනෙක් අපේ විපක්ෂ මන්ත්‍රීවරු කතා කරලා කියපු දේවල් තුළ යම් යම් සාධනීය අදහස් තියෙනවා. එසේම එතුමිය සහ පිලිගත්ත විදියට දරුවොන්ට තාඩන පීඩන කරන එක ගැන එතුමියලා විරුද්ධයි කියන එක. දැන් මෙතන ප්‍රශ්ණය තියෙන්නේ මේ දරුවන්ට දඬුවම් කරන එක සම්බන්ධයෙන් එතුමියලා මේකට දෙන අර්ථ නිරූපණය සහ මාලිමාව කියනවානම් එහෙම නැතිනම් අපි පාර්ලිමේන්තුව කියන එකේ පාර්ලිමේන්තුවේ තියෙනවානේ නීති පනවනකොට අභිලාශයක් කියලා එකක්. ඒ අභිලාෂණයනේ නීතියක් නීතියක් හැටියට එන්නේ. එතකොට ඒ නීති අභිලාෂය සහ මෙතුමියලා හිතාගෙන ඉන්න අර්ථ නිරූපණය අතර ලොකු වෙනසක් තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, මම මේ වෙලාවේ ලිහිණි මන්ත්‍රීතුමියට පොඩි අවධානයක් යොමු කරන්න කියනවා ද මිනිස්ට්‍රි ඔෆ් එඩියුකේෂන්, හයර් එඩියුකේෂන් ඇන්ඩ් වොකේෂනල් එඩියුකේෂන් එකේ දීලා තියෙන වෙබ් අඩවියේ කියලා තියෙන කතන්දරයක්. ඒකේ මම ඉංග්‍රීසි එක කියන්නම් සිංහල එක කියලා. වට් වී ආර් සෙයින්ග් ඊස් දැට් දෙයාර් ආර් පොසිටිව් වේයිස් ටු පනිෂ් ඇන්ඩ් ටු ඩිසිප්ලීන්. දෙයාර් ආර් මෙනි මෙතඩ් ටු ඩිසිප්ලීන් අ චයිල්ඩ් විත්අවුට් හියුමිලේටින්ග්, අබියුසින්ග් ඔර් සබ්ජෙක්ටින් දෙම් ප්‍රෙෂර් මේ කියන්නේ නීතිය පැනවීමේ දී අපේ තිබුණ අදහස තමයි අපි කියන්නේ නැහැ දඬුවම් දෙන්න එපා කියන එක. නමුත් දඬුවම් දෙන්න ඕන විදිය පිළිබඳ තමයි අපේ මේ විශේෂ අවධානය තියෙන්නේ. දෙයාර් ආර් මෙනි මෙතඩ් ටු ඩිසිප්ලීන් අ චයිල්ඩ් විත්අවුට් හියුමිලේටින්ග්, අබියුසින්ග් ඔර් සබ්ජෙක්ටින් දෙම් ප්‍රෙෂර් මෙතන මෙන්න මේ වචන තුන හරි වැදගත් මන්ත්‍රීතුමිය. මෙතන තියෙන්නේ මොකක්ද ළමයෙකුට දඬුවමක් දෙන්න ඕන අවමානයට පත් නොකර අබියුසින්ග් නොකර පීඩනයට පත් නොකර. ඔබතුමිය හිතනවා මේ පනත තුළින් මේ ජාතියේ ඒවා කියන්නේ කියලා. අපි කියන්නේ ඒක නෙවෙයි. ඒකේම යටින් කියනවා අපිට වර්ක්ශොප් තියෙනවා මේ තවම කෙටුම්පත් අවස්ථාවේ තියෙන්නේ. ඔබතුමිය ළඟ තියෙනවා ඇති අදහස් ඒක කිසි වරදක් නැහැ. අපේ දරුවෙකුට දඬුවම් කරන එක ගැන, මම මේ අත්දැකීමෙන් දැකලා තියෙනවා මම නම් වලින් කියන්නේ නැහැ. මම සහ මගේ දරුවා ඒ ගියපු තැන් වල තියෙනවා පොඩි දරුවෙක් මට ඇත්තටම කඳුළු ආවා මම කියන්නම් ඒක වේල්ස් කුමරි විද්‍යාලයේ මට ඒ ඉස්කෝලයත් එක්ක තමයි සම්බන්ධය තියෙන්නේ. එක දවසක් යනකොට ප්‍රයිමරි එකේ පුංචි ගෑණු දරුවෙක් ප්‍රින්සිපල්ගේ ඔෆිස් එකේ ඉන්නවා ඒ පුංචි

දරුවාව, දරුවාගේ ඔළුව උඩ පන්තියේ කුණු බාස්කට් එක ඔළුව උඩ තියාගෙන ඉන්නවා. දරුවාගේ මොකක් හරි වරදකට දීලා තියෙන දඬුවම තියෙනවා ඒ දරුවාගේ ඔළුව උඩ ඒ කුණු බාස්කට් එක තියාගෙන ඉන්න කියලා. ප්‍රින්සිපල්ගේ ඔෆිස් එකේ. එතකොට යනඑන හැමට. මෙන්න මේ වගේ ඒවා නොවිය යුතු දේවල්. ඒවා තමයි අපි මේ කතා කරන්නේ. ඒවා වෙන්න ඕන නැහැ. හැබැයි ගුරුවරුන්ට දෙන්න ඕන අවස්ථාව තියෙනවා දරුවොන්ව හරි ගස්වන්න. ඒක නවත්තලා නැහැ. ඔබතුමියලා හිතෙනවා මේ මේකෙන් වෙන්නේ ළමයිට ඔහේ ඕන දෙයක් කරන්න ඉඩ දෙනවායි කියන එක. ඒක නෙවෙයි හැබැයි මම ඔබතුමියගේ අදහස් ප්‍රකාශ කරන්න තියෙන අයිතිය පිළිගන්නවා. ඔබතුමාගේ අයිතිය පිළිගන්නවා. නමුත් කලබල වෙන්න එපා කිවුවා වගේ මේ කිසිම පාලනයක් නැතුව ළමයිව ගාලේ යවන්න හිතාගෙන ගේන පනතක් නෙවෙයි කියන එක මම දැනට මේ අවස්ථාවේ කියනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂලායා පෙරේරා මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ලිහිණි මන්ත්‍රීතුමියගේ යෝජනාව සම්බන්ධයෙන් මවක්, ගෘහනියක්, කාන්තාවක් සහ ගුරුවරියක් හැටියට ඒ යෝජනාව සම්බන්ධයෙන් එතුමියගේ මාලිමා රජයේ ඒ ගෙන ආව පනත සම්බන්ධයෙන් සම්පූර්ණ අපේ විරුද්ධත්වය පල කර සිටිනවා. මොකද ගුරුවරයෙක් විදියට ඇත්තටම දරුවෙක්ව හදන්න දඬුවම කියන දේ ශාරීරික වදහිංසනය නෙවෙයි. ළමයෙක් දිය යුතු ආකාරයේ දඬුවම් තියෙනවා ගුරුවරයෙක්ට සීමාවක් තියෙනවා ශාරීරික වදහිංසනය අපි හෙලා දකිනවා. නමුත් මොරටුව කියන්නේ අඩු වයසින් ගැබිනි මව්වරුන් ඉන්න ප්‍රදේශයක්. එතකොට අපි දරුවන්ට දෙවන පූර්වාදර්ශය මොකක්ද වයස 16 ට අඩු ළමයින්ට ලිංගිකව හැසිරෙන්න අපි උත්තේජනයක් දෙන රජයක් නම් මොකද්ද අපි මේ සමාජයට දෙන පූර්වාදර්ශය. මම මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමතියි තමන් කැමතිද තමන්ගේ ගෙදර ඉන්න දරුවාට දඬුවමක් දෙන්න අවවාදයක් දෙන්න බැරුව එතනින් එහාට ගිහිල්ලා දරුවා තමන්ට කැමති කැමති විදියට හැසිරෙනවානම් එහෙම දරුවෙක්ව හදන්න කැමතිද? කියලා මම අහන්න කැමතියි. එතකොට අර අපේ සමාජ කියමනක් තියෙනවා හැදි නොගා හදන කිරි හොද්ද කැටි වෙනවා වගේ දරුවෙක් කියන කෙනාව සමාජයට දයාද කරන්න ඕන විනයක් නීතියක් ඇතුව. එතකොට විනයක් නීතියක් නැතුව සමාජයට දායාද නොකරන දරුවා සමාජයට පිලිලයක් වෙනවා. එහෙනම් දැනට අපේ මේ තියෙන මත්ද්‍රව්‍ය උවදුර මේ හැමදෙයක්ම නැති කරන්නනම් ගුරුවරයෙක් විදියට දෙමාපියෙකු විදියට දඬුවමකට යටත් කරලා ශාරීරික වදහිංසනය නෙවෙයි දඬුවමකට යටත් කරලා දරුවෙක්ව මේ සමාජයට භාර දෙන්න ඕන. එතකොට තමයි දරුවෙකුගෙන් මේ සමාජයට අවශ්‍ය දේ බිහි වෙන්නේ. අපේ මන්ත්‍රීතුමියක් කිවුවා පොසිටිව් වේ එකක් තියෙනවා කියලා මෙතර්ඩ්ස් තියෙනවා කියලා දරුවෙකුට දඬුවම් කරන. වට් ආ දර් මෙතඩ්ස්, වට් ආ දර් පොසිටිව් වේයිස්, අයි වෝන්ට් ටූ ආස්ක් යූ. එතකොට මේ විදියට මම කියන්න කැමති දරුවෙකුගේ ගුරුවරයා කියන්නේ දෙවන මව. එතකොට අම්මාට පස්සේ දරුවෙක් බලාපොරොත්තු වෙන්නේ දෙවන මවගෙන් හරියාකාර මඟ පෙන්වීම. ඒ නිසා ලිහිණි මන්ත්‍රීතුමියගේ යෝජනාව හා එකඟ වෙනවා. ඔය පනතට සම්පූර්ණයෙන්ම විපක්ෂ මන්ත්‍රීවරු විදියට අපි අපේ විරෝධතාවය පල කරනවා. ඒ වගේම ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා කිවුවා සුන්බුන් වෙච්ච විපක්ෂයක් කියලා. නැහැ ඒ විපක්ෂය සුන්බුන් වෙන්නේ විපක්ෂය නෙවෙයි ඔය වගේ පනත් ගෙනාවාම ආණ්ඩුව තමයි සුන්බුන් වෙන්නේ තව ඉස්සරහාට යනකොට ආණ්ඩුවේ නොහැකියාව ඔප්පු කරන්න ඔය වගේ දේවල් මම යෝජනා කරලා මේ පනතට අපේ සම්පූර්ණ විරෝධතාවය මේ විදියට ප්‍රකාශ කරනවා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, සභාවේ අවධානය යොමු කරනවා. විවාදයක් යනවානේ. කැමති වුණත් අකමැති වුණත් මොකක්හරි නිශ්චිත කාල රාමුවක් දාගත්තොත් හොඳයි නේද?

<u>**මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම පළමුවෙන්ම මේ නිර්ණායකය සම්බන්ධයෙන් මම ඒකඟතාවයක නැහැ. පළමුව ස්තුතිවන්ත වෙනවා ලිහිණි මන්ත්‍රීතුමිය ඔබ ඉතා බුද්ධිමත් ඔබ ගේන මේ තර්ක වල ලොකු හරයක් තියෙනවා. මේ පනත තුල ඉදිරිපත් වෙලා තියෙන ඇතැම් වාක්‍ය හා නිර්ණායක සම්බන්ධයෙන් ඔබතුමිය ත්වර ලෙස හිතලා තියෙනවා. අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම විරුද්ධ පක්ෂයට කියලා එකක් නැතුව ඔබලාට ඕනෑම දේශපාලන මතයක් දරමින් ඕන ආකාරයට

ආණ්ඩුවේ අණපනත් විවේචනය කිරීමට අයිතියට අපි ගරු කරනවා අපි අපේ පක්ෂය තුල කියලා කාරණයක් නැහැ. අපි ඉන්නේ පොදු මතවාදය, නිවැරදිකම මේවා තුළ තමයි අපි ඉන්නේ. ඒ නිසා අපි ජාතික ජනබලවේගයේ මන්ත්‍රීවරු විදියට ආණ්ඩුව ආරක්ෂා කිරීම සහ සභාවේ යම් යම් ඡන්ද විමසීම් වලදී අපි ගන්න තීරණය පක්ෂයේ තීරණය රාජ්‍යයේ තීරණයම වෙනවා. ඒක ගැන පළමුවෙන්ම මා කණගාටු වෙනවා. මොකද අපි කොන්දේසි විරහිතව අපේ රාජ්‍ය සහ පක්ෂය ආරක්ෂා කර ගත යුතුව තියෙනවා. අපි දිග ගමනක් යන්න යන්නේ. එහිදී මේ අණ පනත් වල ප්‍රශ්ණ තියෙනවා. යම් යම් දෝෂ මතු වෙන්න පුලුවන්. නමුත් මේ ළමයෙකුගේ අධ්‍යාපනය සහ ඒ ළමයාගේ චර්යාවන් සම්බන්ධයෙන් දඬුවම් කිරීමේ අයිතිය අහෝසි කිරීම සඳහා සමහර චර්යාවන් සම්බන්ධයෙන් ගුරුවරයෙකුට හෝ දෙමාපියන්ට ඒකට විරෝධය පල කිරීමට හෝ ඒවා වළක්වා ගැනීමට තියෙන අයිතිය සම්බන්ධයෙන් මේ පනතේ යම් යම් සඳහන් ඇතුලත් වෙනවා. එහිදී මට හිතෙනවා අපගේ යෝජනා කරන අපගේ ඇමතිතුමිය එහෙම නැතිනම් පක්ෂය අධි යථාර්තවාදී මේ සමාජයට නොගැලපෙන ඈත දුරක ගිහිල්ලා ඉතාම දියුණු සමාජයක අද පවතින පින්ලන්තය, ඕස්ට්‍රේලියාව වැනි රටක සමාජ තත්ත්වයකට ගිහිල්ලා තමයි මේ ප්‍රශ්ණය විසඳීමට විසඳුම් ඉදිරිපත් කරන්න යන්නේ. ඒක නිසා යම් කිසි ළමයෙකුට අවමානයක් වන ආකාරයට කටයුතු කිරීම මේ දියුණු රාජ්‍ය තුල නීතියෙන්ම තහනම්. පොඩි නිදසුනක් මගේ යාලුවෙක් දයා ප්‍රනාන්දු දරුවොත් එක්ක ගියා ඇමරිකාවට. දරුවෝ අතර ඇති වුණ ප්‍රශ්ණයකදී ඉන්දියානු පියෙක් දරුවාට බැන්නා, දරුවා ගිහිල්ලා පොලිසියේ එන්ට්‍රියක් දැම්මා. ඇමරිකානු පොලිසිය දෙමාපියන්ව ගෙන්නලා ඔවුන්ට අවවාද කළා එහෙම නැතිනම් ඔවුන්ට විරුද්ධව විනයානුකූලව නීතිය ක්‍රියාත්මක කරන බවට දැඩි ලෙස අවවාද කළා. එතකොට ඉන්දියානු පියා තමන්ගේ දරුවාවත් අරගෙන සියලුම රැකියාවන් අයින් කරලා දාලා ඉන්දියාවට ආවා. මදුරාසි එයාර්පෝර්ට් එකට ඇවිල්ලා බැහැපු හැටිය ඒ ළමයාට ගැහුවා කමුලට හැකි වේගයෙන් ගැහුවා. ගහලා දැන් පුලුවන්නම් ගිහිල්ලා ඇමරිකන් පොලිසියට දැන් ගිහින් පැමිණි කරන්න කියලා දරුවාට කිවුවා. ඉන් පස්සේ වුණේ ඇත්තම ඉන්දියානු පරිසරය සහ ඉන්දියානු දෙමාපියන් ඒ තත්ත්වයට වර්ධනය වෙලා හිටියේ නැහැ. අනෙක් පැත්තෙන් ඉන්දියානු සංස්කෘතිය අද යුරෝපයේ පවතින ඒ සංස්කෘතියත් එක්කලා එකම මට්ටමකට පැහිලා තිබුණේ නැහැ. ඒ නිසා පින්ලංන්තයට හෝ ඇමරිකාවට හෝ ඕස්ට්‍රේලියාවට ගැලපෙන නීතියක් සමහරවිට අපිට නොගැලපෙන්න පුලුවන් කාලය තුළ. නමුත් මේක අධි ප්‍රගතිශීලී බවක් දරණවා මේ ඉදිරිපත් කරන යෝජනා. දරුවෙකුට අවමාන කරන්න බැහැ. ඇත්තටම ගුරුවරයෙකු වන මම අනෙක් එක මේ සභාවේ බොහෝ දෙනා කතා කරනකොට පොඩි වරදක් වුණා කියලා මට හිතෙනවා. මට සමාවෙන්න මම වැඩිහිටි දරුවන්ට උගන්වපු උසස් පෙළ පංති ගුරුවරයෙක් දීර්ඝ කාලයක්. අපි ගොඩක් කතා කළේ පොඩි ළමයි ප්‍රාථමික අවධිය ගැන. ඇත්තටම ප්‍රාථමික අවධිය පහු කරලා වැඩිහිටි අවධියට එනකොට සාමා න්‍ය පොළ සහ උසස් පෙළ වලදී ළමයි ඉතා හිතුවක්කාරයි. අතීතයේත් අදත් නමුත් අද සමාජමය හා සංස්කෘතිකමය කාරණා මත ළමයා අන්ත දූෂණය වෙනවා. දෙමාපියෝත් අන්ත දූෂිතයි. සමාජයත් දූෂිතයි. දැන් මෙහෙම දූෂිත සමාජයක්, සමාවෙන්න හැම දෙමාපියාටම නෙවෙයි හැම ගුරුවරයෙකුටම නෙවෙයි. ගුරුවරයා පවා දූෂිතයි. දැන් එහෙව් සමාජයක මේක යථාර්තය කරා ගෙන යන්නේ කොහොමද? ඒකට දැඩි බවක් පෙන්නලා සුමට වීම කළ යුතු වෙනවා රාජ්‍ය ඔවුන් කළේ නීති දැඩිව නීති තදින් පෙන්වනවා මේවාට අනිවාර්යෙන්ම ඉදිරි කාලය තුළ සංශෝධන සහ චක්‍රලේඛන මඟින් අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කරාවී මේ කටයුතු සම්බන්ධයෙන් ඔබ ක්‍රියා කල යුත්තේ මේ අකාරයට කියලා මඟ පෙන්වීමක් කරාවි. ඒක ගැන කලබල වෙන්න එපා. දැන් මේ මෙතුමිය ඉදිරිපත් කරපු කාරණාව වැදගත්. ඇත්තටම අවමාන කිරීම සාපරාදී ක්‍රියාවක්. ඇතැම් රටවල ළමයි පසුකාලීනව ඉන්දියානු සිනමාව පෙන්වනවා මේ වගේ චරිත ඕනතරම්. තෙලිඟු සිනමා පෙන්නවනවා මේවගේ තත්ත්වයට පත්වෙච්ච ළමයි අනාගතයේ පසුකාලීනව කරන සාපරාදී ක්‍රියා. කිසිම ඉවක් බවක් නැතුව දාම මිනීමැරුම් විශාල ඝාතන කරනවා පාසලේදී අම්මාගෙන් වෙච්ච ඒක වචනයක් නිසා. දැන් ඒ නිසා ළමයා ආරක්ෂා කරගැනීම සමස්ථ සමාජයේ වගකීමක්. ඒක ආර්ථික සමාජීය දේශපාලන සංස්කෘතික මේ සියලු කරුණු කාරණා වල ඒකාබද්ධ ගැටලුවක් මේක. ඒක නිසා අපි මදක් සාවනාදව රාජ්‍යයේ එකඟතා එක්ක වැඩ කරමු. ඒ නීතියේ තියෙනවා හුඟක් වෙලාවට වියුක්ත බවක්. සාමන්‍යයෙන් නීතිය සාමාජීය හෝ මානුෂියම වෙන්නේ නැහැ හැම කාලයකම හැම සමාජයකම. නීතිය කියන්නේ එක මිනුමක්. ඒ නිසා නීතියේ ඇතැම් වචන තාර්කිකව එහාට මෙහාට පෙරල ගැනීම් සහ ඒවා සම්බන්ධයෙන් අපි දැඩිව සහ මෘදුව කටයුතු කිරීම ඒ සමාජයක

ඉඩකඩ තියෙනවා. ඒක තමයි ප්‍රශ්ණය. අන්න ඒක තමයි අපි කතා කරන ධනේෂ්වර නීතිය. මේකේ ගැටලුවක් තියෙනවා අපිට. ඒකයි මම කිවුවේ අපි අධි යථාර්තවාදී නොවී ඉමු කියලා. පවතින නීති රාමුවට මේ නීතියේ යම් අපහසුතාවයක් ඇති. ඒක ගැන අපි රාජ්‍යයෙන් ඉල්ලා සිටිමු ඔබ ඉල්ලා සිටින්න මේක මෘදු කරන්න මීට වඩා සරල කරන්න. මේක සංශෝධනයක් කරන්න කියලා. ඕන පනතක් සංශෝධනය කරන්න රාජ්‍ය බැඳිලා ඉන්නවා පාර්ලිමේන්තුවකට යුතුකමක් තියෙනවා ජනතාව බහුතරයක් ඒකට අකමැතිනම්. හැබැයි මේ රට අද පවතින තත්ත්වය එක්කලා බොහෝ දේවල් ඉතා දැඩිව කළ යුතු වෙනවා නීති පවා අපිට තේරුණා මේ සභාව පවා මේ අවට පරිසරය මේ නගර සභාව මේ පාර මේ සියල්ලටම නීති අවශ්‍ය වෙනවා. ඒක නිසා ඒ නීතිය මදක් දැඩිවීම සම්බන්ධයෙන් අපි මදක් සානුකම්පිත වෙමු. දරුවන් යහමඟට පොළඹවා ගැනීම තමයි රාජ්‍යයේ පරමාර්ථය. අපි ඒක නිසා කරුණාකරලා අපි ඒ සම්බන්ධයෙන් වඩා තාර්කිකව සහ ළමුන්ගේ අනාගතය ළමුන්ගේ යහපත කියන චේතනාව තුළ අපි මේ සිද්ධිය ගැන කතා කරමු කියලා යෝජනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මුලින්ම ස්තූතිවන්ත වෙනවා ඔබතුමා අපහට මේ අදහස පල කරන්න අවස්ථාව ලබා දීම ගැන.මුලින්ම මම ඉල්ලා සිටිනවා සියලුම මන්ත්‍රීවරු මම කතා කරන මේ කතාව දේශපාලඥයෙක්,මන්ත්‍රීවරයෙක්, විපක්ෂයේ ජාතික ජන බලවේගයේ වෙන්න පුලුවන් සජබේ වෙන්න පුලුවන්.මේ පක්ෂ කියන එක පොඩ්ඩක් අමතක කරලා මම දන්නවා නගරාධිපතිතුමා මේ යෝජනාවට ඉඩ දුන්නෙත් මම විශ්වාස කරනවා පක්ෂයකට වඩා තාත්තා කෙනෙක් විදියට කියලා මම විශ්වාස කරනවා.ඒ වගේම ඒ කාරණාව අමතක කරලා දරුවෝ ඉන්න අම්මලා තාත්තලා කියලා හිතාගෙන කවුරුත් තමන්ගේ දරුවන්ට ආදරෙයි.උනහපුළු පැටියත් උනහපුළුවාට වටිනවා වගේ අපි කාටත් අපේ දරුවෝ වටින නිසා අන්න ඒ පදනමේ ඉඳගෙන මේ කතාව සාවදානව අහන් ඉන්න කියලා මම ආයාචනාත්මකව ඉල්ලනවා.ගරු නගරාධිපතිතුමනි,අපේ මහින්ද ගුරුතුමා එතුමා ඉතා සාධනීය කතා කිහිපයක් කිවුවා.දැන් එතුමා කිවුවා එතුමාගේ කතාව ඇතුලේ දී විශේෂයෙන්ම අග්‍රාමාත්‍යතුමිය මේ ඉදිරිපත් කරලා තියෙන්නේ ගොඩාක් දියුණු සමොජයක නිකන් එහෙම වෙන්න ඕන සමාජයක නිකන් දේශපාලනය කතා කරනවානම් කොමියුනිස්ට් සමාජයක වෙන්න ඕන එකක් තමයි දැන් මේ කරලා තියෙන්නේ වගේ අදහසක් එතුමා කිවුවා.මම ඒක පිලිනොගන්නවා නෙවෙයි.පින්ලන්තය ගැන කිවුවා.පින්ලන්තයේ දරුවෙකුගේ මානසික මට්ටම සහ සමාජ මට්ටමයි අපේ ලංකාවේ ඉන්න දරුවෙකුගේ මානසික මට්ටම සහ සමාජ මට්ටමයි දෙකක්.ඔබතුමන්ලාගේ ඒ කාලේ මම දන්නේ නැහැ දැන් කරනවාද කියලා පංති පහේ පළවෙනි අධ්‍යාපන පංතිය ධනේෂ්වර ක්‍රමයේ අර්බුධය ඒකේ අපිට ඉගැන්නුවා ලංකාවේ ධනේෂ්වර ක්‍රමය හැදුනේ උත්තරාරෝපණය කරලා.ඒ කියන්නේ බලහත්කාරයෙන් පටවලා.ඒ නිසා මේක ස්වභාවික වැඩුනේ නැහැ ඒක බලහත්කාරයෙන් පැටවුණ නිසා තමයි මේ අලකලන්චි මේ සමාජ ප්‍රශ්ණ නිර්මාණය වුණා.ස්වභාවිකව මේක වැඩුණානම් මෙහෙම වෙන්නේ නැහැ.අන්න ඒක මම අර පින්ලන්තයේ කතාවත් එක්ක සමපාත කරන්නේ මේ ගෙනාපු යෝජනා අද සමාජයේ අපේ ඉන්න මේ දරුවන් අද මේ අත්විදින දරුවන්ට මොනතරම් දුරට ගැලපෙනවාද කියලා.මගේ පදනම වෙනයි. මේ යෝජනාව හරහා දැන් මේකේ මොනවාද තියෙන්නේ.දරුවන්ව පිඩාවට පත් කරනවා කියලා කියනවා පීඩාවට පත් කරන එක විරුද්ධයි කියලා කියනවා ඒකට පනතක් කියනවා.හැබැයි පීඩාවට පත් කරන විදිය මොකක්ද?ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇත්තටම මට හරි කණගාටුයි මම ඇසුරු කරපු බිමල් නෙවෙයි දැන් මම ඇසුරු කරපු හඳුන් නෙවෙයි දැන් ඉන්නේ.මම දන්නේ නැහැ මොකක්ද වෙලා තියෙන අලකලන්චිය කියලා.එදා එයාලා අපි ඉන්නකොට හිටපු මතය අදහසට පරස්පර ලිබරල්වාදී චින්තනයක් සහිත අදහසක් දැන් කියන්නේ.ගරු නගරාධිපතිතුමනි,දැන් මේ කතාව හරහා දැන් මේ තියෙන පනත හරහා මොකක්ද කරන්න හදන්නේ.දරුවන්ට නිදහස් මනසක් තියෙන්න ඕන.අභිමානයක් තියෙන්න ඕන.ඒගොල්ලන්ගේ ආත්ම විශ්වාසය තියෙන්න ඕන.ඒ නිසා දඬුවම් කරන එක නවත්වන්න ඕන.අර කිවුවා වගේ කිරි හොද්ද හැදි ගාන්නේ නැති වුණාම කැටි ගැහෙනවා.ඒක ප්‍රශ්ණ කරනවා මේගොල්ලන්ගේ මන්ත්‍රීවරු කිරිහොද්දයි දරුවයි කොහොමද සමාන වෙන්නේ කියලා.රටේ උපහැරණයක් සම්බන්ධයෙන් අවබෝධයක් නැති අවබෝධයක් තිබුණත් දැන් නැති විදියට හැසිරෙන අයගෙන් මේ දේවල් බලාපොරොත්තු වෙන එක ස්වභාවිකයි.ගරු නගරාධිපතිතුමනි,

දැන් මේ පනතේ කියන්නේ මොකක්ද?සරලව කියන්නේ බිමල් මන්ත්‍රීතුමා සභානායකතුමා නිකන් කෙනෙක් නෙවෙයිනේ සභානායකතුමානේ.ඊළඟ ජනාධිපතිතුමා විදියට එන්න ලෑස්තිවෙලා ඉන්නවානේ. එතුමාගේ කටින් කියනවානම් අවුරුදු 16 අයට සෙක්ස් කරන්න ඉඩ දෙන්න.අර යෝජනාව නරක නැහැ.රුපියල් 5000ක් දෙන්න හැබැයි රුපියල් පන්දාහේ චිත්‍රපටිය බලනවානම් හොඳයි. නාට්‍යක් බලනවානම් හොඳයි.ඊට වඩා හොඳයිනේ ළමයාට ෆ්‍රී ටිකට් දෙන්නකෝ ළමයිට මේ චිත්‍රපටය බලන්න අපිත් ඉස්කෝලේ යන කාලේ ඉස්කෝලෙන් අරගෙන ගිහිල්ලා චිත්‍රපටි පෙන්නුවානේ. රුපියල් 5000ක් අතට දුන්නොත් ඒ පන්දාහෙන් චිත්‍රපටි බලයිද?රූම් යයිද?අයිස් ගහයිද?කියලා කාටද විශ්වාසය තියෙන්නේ.එතකොට දරුවාගේ මනස එතනට හදන එකද පීඩාවෙන් ඒ දරුවාව නිදහස් කරනවා කියන්නේ.ඒ දරුවාට නිදහස දෙනවා කියන්නේ එහෙමද? ඒ දරුවෝ විවිධ අවධි පරිනත අවධියත් නෙවෙයි අවුරුදු 15,16 කියන්නේ.ඕනෑම දෙයක් අත්හදා බලන්න තියෙන අවධිය.කිසි දෙයක් කියන්කොට ඒ ගැන බැරෑරුම්ව තීරණය කරන්න පුලුවන් වයසක් නෙවෙයි ඒක.ඒ වයස එච්චර නිදහස් කරලා මෙච්චර ලිබරල් කරලා රුපියල් 5000ක් අතට දුන්නොත් එහෙම මොකද වෙන්නේ කියලා දෙමාපියෝ විදියට මම රත්තරන් මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාගෙන් වැඳලා ඉල්ලන්නේ දෙමාපියෝ විදියට කල්පනා කරලා බලන්න. පස්සේ මේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කරනවා කියලා සමලිංගික ක්‍රමය ගැන විශය නිර්දේශ වලට දානවා.අර හොඳට ඉන්න කොල්ලාව කෙල්ල කරන, හොඳට ඉන්න කෙල්ලව කොල්ලා කරන විදියේ ප්‍රවර්ධනාත්මකව ඒක උගන්වන විශය, එහෙම දාන එකේ මොකද්ද ඒ දරුවන්ට වෙන යහපත. මොකද ඒ දරුවා ඒවා ඉගෙනගෙන උසස් අධ්‍යාපනය ලබලා, කැම්පස් ගිහිල්ලා පී.එච්.ඩී. අරගෙන මේ රටේ හොඳ රැකියා කරන්න ඒවට දායක වෙනවාද මේ තියෙන පනත? මේකෙ ඇත්ත කතාව මේක නෙවෙයි. මේකෙ ඇත්ත කතාව අපේ රටේ පදනමට ගහන්න ඕන. ඒක රොබට් බ්‍රවුන්රිග් කරන්නත් බැලුවා ඒත් කරන්න බැරි වුණා. ඒ රොබට් බ්‍රවුන්රිග්ට කරන්න බැරි වුණ වැඩේ මේ බ්‍රවුන්රිග්ලා කරනවා. පදනමට ගහනවා. සබ්‍යත්වයට ගහනවා. මුලක් නැති, මුදුන් මුලක් නැති වේලිච්ච පරඬැලක් හදන වැඩේ තමයි මේ තියෙන්නේ.ගරු නගරාධිපතිතුමනි, 1988, 1989 කාලේ අපි කවුරුත් දන්නවා දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය කියලා සන්නද්ධ ව්‍යාපාරයක් හැදුනා.ඒකේ ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න මිනිස්සුත් හිටියා.සමාජෙ හිටපු එක එක හොරු,තක්කඩි, අමනයෝ මේ ඔක්කොම ජාතිත් මේකේ හිටියා.අවසානයේ මොකද වුණේ පක්ෂය ස්වයං විවේචනයක් කළා පස්සේ.ඒක ජවිපෙ පාලනයෙන් ගිලිහුණ නිසා තමයි අපේ විනාශය අපිට අත්වුණේ. ඒකේ හිටපු හොරු තක්කඩි ඔක්කොම ටික අර රත්තරන් වගේ හිටිය මිනිස්සු ටික පාවා දුන්නා.ඒකෙන් තමයි මේකේ දෙදරීම ඇති වුණේ.ඊට පස්සේ ස්වයං විවේචනය කළා.දැනුත් ඒක තමයි වෙන්නේ.අර ගුණයක් තිබුණ පක්ෂයේ දැන් මාලිමාව කියලා ඒක ආක්‍රමණය කරලා ලිබරල්වාදි චින්තනය බටහිර ගැති චින්තනය.ඩයස්පෝරාවට සම්බන්ධ චින්තනය මේක ආක්‍රමණය කළාට පස්සේ දැන් අර කියන ගුණය නැහැ.ගරු නගරාධිපතිතුමනි,ඒ නිසා මේ පනත මම හිතනවා මේ වෙනකොටත් බරපතල විදියේ සමාජ කතාබහකට ලක් වෙලා තියෙනවා.මහා නායක හාමුදුරුවරු විරුද්ධ වෙලා තියෙනවා.අති උතුම් මැල්කම් රංජිත් කාදිනල්තුමා විරුද්ධ වෙලා තියෙනවා.ගුරුවරු විරුද්ධ වෙලා තියෙනවා.මේ හැමෝම විරුද්ධ වෙලා තියෙන්නනේ ඒ හැමෝටම එක එක විදියෙන් මේ පනත පිළිබඳ තියෙන වියවුල තේරෙන නිසා. අවසාන වශයෙන් මම ඉල්ලා සිටිනවා ඔබතුමන්ලා අපි කවුරුත් දේශපාලනය කරන්න පුලුවන් ආණ්ඩු ලබා ගන්න පුලුවන් ආණ්ඩු වල ඉන්න පුලුවන් විපක්ෂයේ ඉන්න පුලුවන් මොන පැත්තකින්වත් දේශපාලනය නොකරන්න පුලුවන් ඒවා අනාගතයට බාරයි.හැබැයි අවසානයේ මෙතන ඉන්න පිරිස හිතනවානම් තමන්ගේ ආණ්ඩුව තමන්ගේ නායකයෝ කරන දේවල් හරි ශෝක් නියම ඒවා හොඳටම හොඳයි කියලා හිතනවානම් ඒ අය ගැනනම් මට විවාදයක් නැහැ. හැබැයි යම්කිසි සංවාදාත්මකව දේශපාලනය කියන කාරණාවට එහා ගිහිල්ලා මනුස්සකමින් සමාජමය වශයෙන් හිතනවානම් හිතන කෙනෙකුට තමන්ගේ පක්ෂය ඇතුලේ ඒ අරගලය කරන්න. මේකෙන් සිද්ධ වෙන්නේ රටට අයහපතක්,රටේ අනාගතයට අයහපතක්,ඒකේ ප්‍රතිඵලය තමන් ආදරේ කරන තමන්ගේ දරුවන්ට අත්විදින්නට සිද්ධවෙයි. ඒ නිසා ඒ පිළිබඳව තේරුම් අරගෙන ඉදිරියේ දී යහපත් ඕන දෙයකට එකඟ වෙන්න හැබැයි අයහපතක් සිද්ධ වෙනවානම් ඒක ගැන හොඳට හොයලා බලලා ඒක අයහපත ගැන පක්ෂය ඇතුලේ නිවැරදි කරන්න බලන්න කියලා මම ඉල්ලා සිටිනවා.

සභා ඝෝෂා

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ අපේ මේ දකුණු පැත්තේ ඉන්න මන්ත්‍රීවරු මන්ත්‍රීවරියන් ගොඩක් දෙනෙක් දැන් අදහස් ප්‍රකාශ කළා. වර්තමානයේ පාර්ලිමේන්තුව තුළ ගොඩනැඟි ඇති මේ ආඥා පනතක් පිළිබඳව අපේ ලිහිණි මන්ත්‍රීතුමිය ගොඩක් උද්වේගීකර අදහස් ප්‍රකාශ කළා. මම හිතන්නේ අපි පනත පිළිබඳව ලොකු අදහසක් මේ වෙලාවේ ඉදිරිපත් කරන්න පුලුවන් විදියේ පනත පිළිබඳ දැන්වත් වීමක් නැහැ. නමුත් මම කතා කරන්න ඕන අපේ සුරේෂ් මන්ත්‍රීතුමා කිවුව විදියට අද පාර්ලිමේන්තුවේ ඉන්න කලින් හිටිය බිමල් නෙවෙයි. අද එතැන ඉන්නේ වෙනම ම බිමල් කෙනෙක් පාර්ලිමේන්තුවේ සභා නායක විදියට. ඒ වගේම තමයි අද එතන හදුන් කලින් හිටපු හදුන් නෙවෙයි. අද එතැන කර්මාන්ත ඇමති විදියට හදුන් කෙනෙක්. ඒ වගේම තමයි මම හිතන්නේ කලින් මෙතන හිටිය එදා හිටපු සුරේෂ් නෙවෙයි. අද ඉන්නේ අමුතුම සුරේෂ් කෙනෙක් කියලයි මම හිතන්නේ. මම හිතනවා මම ගුරුවරියක් විදියට එක එක්කෙනා මේ තම තමන්ගේ දැන් ඉන්න තනතුරු වලට ලඟු වෙන්නේ නැතුව මේ ගෙනාපු යෝජනාව අපි සාධනීය විදියට හිතන්න ඕන මේ රටේ පුරවැසියෝ විදියට. උගත් බුද්ධිමත් ඒවගේම මම හිතන්නේ අපි මේ වැඩිහිටියෝ විදියට මේ ගෙනාපු පනත පිළිබඳව ඒ වගේම මේ අදහස පිළිබඳව වැඩිදුර හිතන්න ඕන. එහෙම හිතකනොට මම හිතන්නේ අපිට තනි තනි විදියට මේ මම ගුරුවරයෙක්ද මම නීතිඥවරයෙක්ද මම තව උගත් කෙනෙක්ද කියන එක නෙවෙයි මෙතනදි වැදගත්. අපි මේ ගෙනෙන කාරණය කොයිතරම් සාධනීයද වර්තමාන ශ්‍රී ලංකාවට කියන එක. අපි ගෙම්බෝ වගේ හැමදාම එක තැනම ඉන්න බැහැ. මම හැමදාම ඇඩ්වාන්ස් ලෙවල් ළමයි එක්ක වැඩ කරගෙන යද්දි, ඒ වගේම ඕලේවල් ළමයි එක්ක වැඩ කරගෙන යද්දි දැකපු දෙයක් තමයි උන් ඒ වයසට එනකොට මේ අපි කියන දේටම එහෙයි එහෙයි කියන්න බලාගෙන නැහැ. මේක අපි එක එක රට තුළ තියෙන සංස්කෘතීන් එකිනෙකට වෙනස්. අපි ප්‍රධාන සංස්කෘතිය යටතේ උප සංස්කෘතීන් ගොඩාක් තියෙනවා. රෝයල් එකේ විශාඛා එකේ කල්චර් එක නෙවෙයි අපේ මේ මොරටුවේ දකින වේල්ස් කුමර විද්‍යාලයේ හෝ එහෙම නැතිනම් මෙතෝදිස්ත විද්‍යාලය දකින්න ලැබෙන්නේ ඒ සංස්කෘතිය නෙවෙයි. නමුත් අපි ප්‍රධාන සංස්කෘතීන් තුන එළඹගෙන කටයුතු කරන්න ඕන මේ සංස්කෘතිය තුළට දරුවන්ව කොහොමද අපි යොදාගන්නේ කියන තැන. එතනදි අපිට හරිම වැදගත් මේ දරුවාට දඬුවම් කරනවාද හිංසනයට ලක් කරනවාද කියන කාරණයනේ අපි මේ කතා කරගෙන ආවේ. මෙතනදී මම හිතන්නේ මේ දඬුවම් කිරීම සම්බන්ධව අපේ දැනුවත් කිරීම තියෙනවා අපේ විදුහල්පතිවරයෙකුට වේවැලක් පාවිච්චි කරන්න පුලුවන් ඒක වේවැල ප්‍රදර්ශණය කරලා තියන්න ඕන ඔෆිස් කාමරය තුළ ඒ වේවැලෙන් දරුවාට දඬුවම් කරන්න පුලුවන් දණහිසෙන් පහළට විදුහල්පතිවරයෙකුට විතරයි දඬුවම් කරන්න පුලුවන්. නමුත් අපි මේ වෙනකොට මම හිතන්නේ මේ කතා කරන්නේ පාසල් වල දරුවෝ ගැන විතරක්නේ. නමුත් මේ සමාජයේ ඕනම තැනක දරුවා දරුවෙකු විදියට පෙනී සිටිනවානේ. අපි මවක් විදියට පියෙක් විදියට ගෙදරක් තුළදී දරුවාට දඬුවම් කරන එක ගැන නෙවෙයි මේ කථිකාවත ගොඩනැඟිලා එන්නේ. මේ සංස්කෘතියේ පසුගිය දිනෙක මම දැකපු දෙයක් තමයි ලංකාවේ වැඩිපුරම තියෙන්නේ හැරෙස්මන්ට් එකට ලක් වෙන්නේ දරුවෝ පාසල තුළ දී සහ තමන්ගේම නිවස තුළ දී කියන කාරණය. ඒකට මම හිතන්නේ උදාහරණ කතා කළා අපේ ඒ කතා කරපු මන්ත්‍රීවරිය සහ මන්ත්‍රීතුමා. නමුත් මේ හැරෙස්මන්ට් එක තමයි අපි නවත්වන්න ඕන කියන එක තමයි මේ කතා කරන්නේ. එහිදී අපි මේ කලබල වෙලා, ඇයි මේච්චර කලබලයක්? මේ තවම පාර්ලිමේන්තුවේ මේක සාකච්ඡා කරලා නීතියක් විදියට එළියට ආවේ නැහැ. එළියට එන්න කලින් එතකොට අපිට මේක ගුරුවරුන්ව දැනුවත් කරන්න විදියක් නැහැ. දෙමාපියන් දැනුවත් කරන්න විදියක් නැහැ කියලා අපි මේකට කලබල වෙනවා. මේච්චර මේ කලබලයක් හදාගන්න ඕන නැහැ. නමුත් සමාජයක් විදියට යම් යම් කාරණා වලදී කලබල වෙන එකේ යම් කිසි හොඳ ප්‍රවනතාවයක් ගොඩනැගෙනවා. ඒකෙන් මම හිතනවා අපි ඉදිරිපත් කරන්න යන යෝජනාව වඩාත් ගැඹුරු පුළුල් හොඳ තත්ත්වයකට නිර්මාණය වෙනවා කියන එක. ඒක වඩාත් සාධනීයයි. ඒ වගේම තමයි මම කියන්න ඕන අපේ මේ උප සංස්කෘතීන් ගැන බලනකොට ඇත්තටම මේ දරුවන්ගේ සමාජ මට්ටම් එකිනෙකට වෙනස්. ඒ නිසා දරුවන්ට අපි කොහොමද වඩාත් හොඳ තැනකට යන්න, සංස්කෘතිකමය වශයෙන් ඉහළ තැනකට තල්ලු කරන්න කොහොමද ඒ දරුවන්ව පොළඹවන්නේ කියන එකේ දී, මේ දඬුවම කියන එක ඉවත් කරලා අපිට පුලුවන් කටයුතු කරන්න. විශේෂයෙන්ම කියන්න ඕන එක අපේ මන්ත්‍රීතුමෙක් ඉදිරිපත් කළානේ විඩියෝ එකක්. එහිදී අදහස් කළානේ මේ බිමල් මන්ත්‍රීතුමා රුපියල් 5000ක් දීලා කොහෙද අර

සෙක්ස් වලට යන්න කියලා යෝජනාවක් කළා වගේ අදහසක්නේ ඒ පැත්තෙන් ගොඩනැගුනේ. නමුත් මම හිතන්නේ එහෙම එකක් නෙවෙයි අපි ගොඩක් හිතන්න ඕන අවුරුදු 16, 17 වෙනකොට මම හිතන්නේ අපි අපේ ළමයින්ට දෙනවා ඒ ළමයිගේ සම වයස් කණ්ඩායම් එක්ක එකතු වෙලා නොයෙකුත් ක්‍රියාකාරකම් වල යෙදෙන්න අවස්ථාව ළමයෙක් චිත්‍රපටියක් බලන්න යාළුවෝ කණ්ඩායමක් එක්කලා එකතු වෙලා චිත්‍රපටි සිනමා ශාලාවකට ගියාම ඒක ඇයි අපි නරක විදියට දකින්නේ. මම හිතන්නේ අපේ චින්තනයයි පුළුල් වෙන්න ඕන කරන්නේ. වැඩිහිටියො විදියට දරුවෝ හඳුනාගන්න ඕන. ඕලෙවල් මට්ටමේ දරුවන්ව අපි හඳුනනවා ඒ දරුවන් එක්ක අපි ගොඩාක් ලඟින් කටයුතු කරනවා. ඒ ළමයි කොහොමද ගෑනු ළමයෙක් පිරිමි ළමයෙක් එක්ක ගනුදෙනු කරන්නේ කොහොමද? මොකද මම හිතන්නේ අවුරුදු 40, 50 වෙලා නෙවෙයිනේ ළමයි ගෑනු ළමයි පිරිමි ළමයි යාලු වෙන්නේ කරන්නේ. බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් හොයාගන්නේ. ඒක නිසා මම හිතන්නේ අනවශ්‍ය විදියට මේකට කලබල වෙන්න යන්න නරකයි. අපි ඒක තේරුම් ගන්න ඕන. ඒක තේරුම් නොගෙන ඒ ළමයින්ගේ ලිංගික විපර්යාස වලට අපි ඒ අවස්ථාවන් වලට ගැලපෙන විදියට ළමයා අධ්‍යාපනිකව සහ ළමයා අධ්‍යාත්මිකව පෝෂණය කරන්නේ කොහොමද කියලා අපි හිතන්න ඕන. ළමයෙක් විනයගරුක කිරීම සඳහා අපිට තියෙන අඩිතාලම මොකද්ද කියලා අපි හිතලා බලන්න ඕන. ඒක අපේ මහා සංස්කෘතියෙන් අපිට දීලා තියෙනවා. ළමයෙක් කොහොමද විනයගරුක කරන්නේ කියන එක ගැන. ළමයෙක් විනය ගරුක කරන්න දැඩි දඬුවම් වලට අපිට යන්න ඕන නැහැ. පාසල් මට්ටමේදී ළමයෙක් විනය ගරුක කරන්න වගේම අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් විදියට ඒ වගේම පාරෙදි වෙනත් දරුවෙක් දකින වැඩිහිටියෙක් විදියට විශේෂයෙන්ම මම දැකලා තියෙනවා බස්වල යනකොට අපේ මේ පිරිමි ළමයි ඉන්න පාසල් වල ළමයි රංචුවක් බස් එකකට ගොඩ වුණාම ඒ ළමයා ගොඩක් කලහාකාරී විදියට එහෙම නැතිනම් විනෝදකාමී විදියට බස් රථය තුළ හැසිරෙන විදිය මම දැකලා තියෙනවා. විශේෂයෙන්ම දෙහිවල ඉඳලා මම එනකොට බස් එකේදී මම දැකලා තියෙන දේවල්. ඉතින් ඒ වගේ වෙලාවක මම දකිනවා අපේ ගෑනු ළමයි හැංගෙනවා. මොකද ඒ ළමයි රංචුවකට මුහුණ දෙන්න බැහැ. අපි අන්න ඒවා වැඩිහිටියෙක් විදියට ළමයින්ව අපි ගුණගරුක කරන්න යොදා ගන්න අවස්ථාවන් විදියට අපි යොදාගන්න ඕන. ඉතින් ඇත්තටම මේ පනත පිළිබඳව අනවශ්‍ය විදියට කලබල නොවී අපි ඉවසිලිවන්තව හිටියොත් මට හිතෙනවා අපිට පුලුවන් ඉදිරියේ දී කොහොමද පාසලක දරුවෙක්ව විනයගරුක කිරීම සඳහා අපිට මේ දඬුවම කියන එක යොදා ගන්න පුලුවන් කියන එක ගැන කතා කරන්න අවස්ථාව ලැබෙනවා කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපි දන්නවා මේ පනත හොරු අල්ලන පනතක් නෙවෙයි අපේ රටේ ජාතික සම්පතක් සුරක්ෂිත කරන පනතක්. ඒ නිසා අපිට ලොකු වගකීමක් තියෙනවා මේ පනත සම්බන්ධව සාකච්ඡා කරන්න. මේ මන්ත්‍රීතුමිය කිවුවා අපි ඇයි කලබල කියලා. මම අහන්න කැමති ඇයි ඔයගොල්ලන් කලබලෙන් මේ පනත ගෙනාවේ? ඔයගොල්ලන්ට මේක හොඳය ස්ටර්ඩි කරන්න තිබුණා. ඇති වෙන්න ඔයගොල්ලන්ට විද්වත් මණ්ඩලයක් ඉන්නවා. මේක ස්ටර්ඩි කරලා මේක ගැන සෑහෙන දුරට කතා කරලා ඊට පස්සේ කෙටුම්පත ගේන්න තිබුණා. මොකද මේක දරුවන්ගේ අනාගතය සම්බන්ධ පනතක් නිසා. අනෙක් එක තමයි අපි විනය ගැන කතා කරනවා. ලංකාවේ විනය ගැන කතා කරන්න අපි දන්නවා අපේ රටේ රජයේ පාසල් වගේම ප්‍රයිවට් පාසල් තියෙනවා. ප්‍රයිවට් පාසලේ ළමයි හැසිරෙන විදියයි අපේ දරුවෝ හැසිරෙන විදියයි දෙකක්. ඒ නිසා අපි මේ පනත ගෙනෙල්ලා සාකච්ඡා කරන්න කලින් පාර්ලිමේන්තුවට ගෙනෙල්ලා අපි කරලා දීලා තියෙන්නේ මේ දරුවන්ට වෙපන් එකක් දීලා තියෙනවා. අද දරුවන්ට පොඩි පහේ පාසල් වලත් දරුවෝ දන්නවා දැන් ගුරුවරයාටත් කැගහන්න බැහැ විදුහල්පතිතුමාටත් මේ සම්බන්ධව කටයුතු කරන්න බැහැ. දෙමාපියන්ටත් මේකේ ලොකු කරදරයක් තියෙන බව දන්නවා දරුවෝ. ඒ නිසා මේගොල්ලෝ ආයුධයක් කරගන්නවා. ඒ ආයුධය කරගන්න කලින් පාර්ලිමේන්තුවේ වගකිව යුතු මන්ත්‍රීවරියක් හැටියට ඇමතිතුමියක් හැටියට එතුමියට තිබුණා මේකට වගකීමෙන් කටයුතු කරලා ඊට පස්සේ කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේන්න. ඒ වගේම තමයි මම දකිනවා අපේ බිමල් ඇමතිතුමා කියලා තියෙනවා අවුරුදු 16න් පස්සේ සෙක්ස් කරන්න පුලුවන්. අපි දන්නවා අවුරුදු 13 වෙනකොට ම ළමයිට ෆීලින්ස් ඇති වෙනවා. ඒක අපිට බොරු කියන්න බැහැ. නමුත් ඇයි අපි 16 දී අනුමත කරන්නේ ඒක. ඒ දරුවෝ තවම පාසල් යන දරුවෙක්. ඒ දරුවාට වගකීමක් නැහැ.

දෙමාපියන් හැටියට අපිට ලොකු වගකීමක් තියෙනවා මේ දරුවන්ව කොතරම් දුරට අපි හොඳ විදියට යොමු කරන්න ඕනද කියන එක. අනෙක් එක රුපියල් පන්දාහක් මේ දරුවන්ට දීම ගැන කතා කරනවා එතුමා දන්නවා අපේ රටේ කාන්තාවෝ 53%ක් ඒ කාන්තාවන් අවුරුදු 55 වයස දරන කාන්තාවන් ගොඩක් ඉන්නවා. නමුත් අපි ප්‍රාදේශිය ලේකම් ගත්තොත් අපි දන්නවා වැඩිහිටි දීමනාවක් දීගන්න බැහැ අපේ මව්වරුන්ට. එතකොට මේ දරුවන්ට දෙනවා රුපියල් 5000ක්. මොකක්ද තියෙන වගකීම? ඒගොල්ලන් හරියට ෆිල්ම් එකක් බලන්න යයි, හරියට නාට්‍යක් බලන්න යයි ඒවා අත්‍යාවශ්‍යයි. දරුවන්ට අත්‍යාවශ්‍යයි. නමුත් අපි ෆෝන් එකක් දීලා තියෙනවා ඇති වෙනකන් ඉන්ටර්නෙට් දීලා ඒ අවස්ථාව දීලා තියෙනවා. තව කොහෙද මේ සිනමාහල්. එතකොට එතුමාටත් තිබුණා තව වගකීමක් ඇතුව කටයුතු කරන්න. වැඩියමක් කතා කරන්නේ නැහැ විනය සම්බන්ධව. අනෙක් එක තමයි මම දකිනවා තවත් කෝණ මානයක්. මේක සංස්කෘතිය හා සම්බන්ධ ගැටලුවක්. අපේ මුස්ලිම් මැරේජ් ඇන්ඩ් ඩිවෝස් ඇක්ට් එක තියෙනවා එම් එම් ඩී ඒ කියලා මම හිතින්නේ මෙතන ඉන්න මන්ත්‍රීවරු අවධානය යොමු කළොත් හොඳයි මේ පනත හරහා හැංගිච්ච න්‍යාය පත්‍රයක් තියෙනවා කියන එක මම දකිනවා මුස්ලිම් කාන්තාවක් හැටියට. මොකද මුස්ලිම් සංස්කෘතිය හැටියට අපි කැමති නැහැ අපේ දරුවෝ අඩු වයසින් විවාහ වෙනවාට. ඒ නිසා අපි එම් එම් ඩී ඒ කියලා පනත ගෙනෙල්ලා තවම ඒක සම්මත කරගන්න බැරුව ඉන්නවා අපි. අපි කියන්නේ අවුරුදු 16 නෙවෙයි විවාහය අවුරුදු 18 කරන්න කියලා. නමුත් දැන් පාර්ලිමේන්තුවේ වගකිව යුතු පාලනයක් ඇවිල්ලා ඒගොල්ලන් අවුරුදු 18ට ඉදලා අවුරුදු 16 ට අවස්ථාව දෙනවා සෙක්ස් කරන්න සහ කොන්ඩම් භාවිතයටත් ඒගොල්ලන් අවස්ථාව දෙනවා කියලා කතාවක් යනවා. මම ඒක හරියටම දන්නේ නැහැ. නමුත් මම කියන්න කැමති මේ පනත හරහා හැංගිච්ච න්‍යාය පත්‍රයක් තියෙනවා. ඒ සම්බන්ධවක් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ දරුවෝ ගැන කතා කරද්දි අපේ හැමෝටම සංවේද හින්දා වෙන්න ඇති විපක්ෂයෙන් ඒ සම්බන්ධයෙන් දැඩි උනන්දුවකින් කතා කරන්නේ මේකේදී ඇත්තටම අපි අපේ දරුවන්ට ආදරේයි ඒ නිසා මේ සම්බන්ධයෙන් කතා කරද්දි මගේ අදහස ඉදිරිපත් කරන්න අවශ්‍යයි. දරුවන්ට දඬුවම කියන එක මම හිතන්නේ සුදුසු නැහැ. ඒකට හේතුව තමයි යම් දරුවෙක් වරදක් කරනවානම් ඒ වරද කරන්නේ දෙමාපියන්ගේ සහ සමාජයේ තියෙන යම් කිසි අඩුපාඩුවක් නිසා. මොකද ළමා මනස වර්ධනය වීම තමයි දඬුවමකින් සිද්ධ වෙන්නේ. ඒක මනෝ විද්‍යාත්මකව පිලිගන්න කාරණාවක්. බොහෝ අවස්ථා වලදී මේ වැරදි කරන දරුවන්ගේ තත්ත්වය බැලුවාම එක්කෝ ඒ පවුල් පසුබිම ඇතුලේ දෙමාපියන්ගේ තියෙන වැරදි නිසා තමයි ඒ දරුවෝ සමහර අවස්ථා වලදී වැරදි වලට පෙලබෙන්නේ. ඉතින් මෙහිදී අපි දන්නවා අපේ රටේ තියෙන තත්ත්වය තමයි සමහර පවුල් වල දෙමාපියෝ කුඩාකල සිටම තමන්ගේ දරුවෝ දාලා, දරුවාට ලොකු පීඩනයක් දීලා ඒ පවුල් විනාශ වුණ අවස්ථා තියෙනවා. ඒ වගේ දරුවන්ගෙන් මොනම අවස්ථාවකදීවත් අපිට බලාපොරොත්තු වෙන්න බැහැ යහපත් සමාජ තත්ත්වයක්. ඉතින් එවැනි අවස්ථාවලදී දරුවන්ට දඬුවම් කිරීම තුලින් ඒ දරුවෝ හිංසනයට පත් කිරීම තමයි ඒ තුළින් සිද්ධ වෙන්නේ. අම්මා තාත්තා හොරකම් කරනවානම් අනිවාර්යෙන්ම දරුවෝ හොරකම් කරන එක නවතින්නෙත් නැහැ. එතකොට ඒ වගේ අවස්ථා වලදී දරුවන්ට දඬුවම් කරලා ඒ සමාජය නිවැරදි කරන්න බැහැ. මේ සම්බන්ධයෙන් හඬ පටයක් තියෙනවා හැමෝටම සවන් දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ අවසර පතනවා ඒ සම්බන්ධයෙන්. ගරු නගරාධිපතිතුමනි, දැනට සංවාදයට ලක් වෙලා තියෙන ගුරුවරු සහ සමාජයේ අය පැහැදිලි කරන කාරණාව සම්බන්ධයෙන් තමයි විරෝධතාවය පල කරලා තියෙන්නේ. ඉතින් ඒක නිසා මම ඉල්ලා සිටිනවා තව මේ පිළිබඳව ඔබතුමන්ලා දැනුවත් වෙන්න කියලා.

සභා ඝෝෂා

<u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, පහුගිය කාල වකවානුව තුළ පත්තර හා මාධ්‍ය වාර්තාවල පල වෙච්ච වාර්තා කිහිපයක මතක සටහන් ඉදිරිපත් කරන්න කැමති. ඒ තමයි කසිප්පු බීලා ශිෂයෝ තුන්දෙනෙක් කසිප්පු අරගෙන ඉස්කෝලෙට ආවා ලෝක ළමා දිනය සමරන්න. එතකොට ගුරුවරුන්ට ඉස්සරහාට කසිප්පු බීලා ආවොත් මෙහෙම උපදෙස් දෙන්න පුලුවන්ද බැරිද කියන ප්‍රශ්ණය පැන

නගිනවා. ඊට පස්සේ ගරු නගරාධිපතිතුමනි, මේ පනත් ගේන්න කලින් විදුහල්පතිතුමාට මේ ලංකාවේ තියෙන හොඳම කුණුහරප ටික කියලා ශිෂයෙක් බැන වදිනවා විදුහල්පතිතුමාගේ මේසය ළඟට ඇවිල්ලා මොකක්ද මේ ෆෝන් එක ඉස්කෝලෙට අරගෙන ආවා කියලා. මේ ඉස්කෝලේ විදුහල්පතිතුමාට ගුරුවරයාට බනින කුණුහරප ටික හරියට කිවුවොත් ආචාර උපාධියක් දුන්නොත් ඒ ළමයාට ආචාර්ය උපාධියක් නෙවෙයි ගරු නගරාධිපිතුමනි, මහා චාර්ය උපාධියකුත් ඔහුට ලබා දෙන්න වෙනවා. ගරු නගරාධිපතිතුමනී, ඊට පස්සේ අපි කතා කළා ඒඩ්ස් වලින් අද ඒඩ්ස් රෝගය වැඩි වෙලා තියෙනවා. කළුබෝවිල 33 කාමරයට ගියොත් එහෙම ඒ ඉන්න අවුරුද් 18,19 වුණ ළමයින්ට ඒඩ්ස් වැළඳිලා තියෙන සංඛ්‍යාව බලාගන්න පුලුවන්. ගරු නගරාධිපතිතුමනි, කොළඹත් ඒ වගේම ගම්පහත් ඒඩ්ස් වලින් වැඩිම තරුණයන් පිරිසක් එහෙම නැතිනම් ශිෂ්‍යන් පිරිසක් ඉන්න දිස්ත්‍රික්ක බවට පත් වෙද්දි ඒඩ්ස් රෝගීන්ගේ සංඛ්‍යාව ටී නේජර්ස් වලින් වැඩි වෙලා තියෙනවා තරුණ අවධියේ. එහෙනම් අපි මේ පනත ගෙනියන්නේ කොතනටද කියලා මම කියන්නම්. ඊළඟට ගරු නගරාධිපතිතුමනි, ග්‍රාම සේවා වසම් 42 ක කොට්ඨාස 29 ක ඉන්න සමහර කොට්ඨාස මොරටුවේ ගත්තොත් අවුරුදු 16ත් 17 ත් අතර දරුවෝ සමහරක් වෙලාවට දරුවෝ අම්මලා බවට පත් වෙලා තියෙනවා. එතකොට ඒකට හොඳම උදාහරණය තමයි එයට අම්මලාගේ ගුරුවරුන්ගේ රැකවරණය උපදෙස් ලැබිච්ච නැති නිසා තමයි එහෙම වෙලා තියෙන්නේ, අන්න ඒක එකක්. ඊට පස්සේ මේ ලගදී ආසන්නම නගරයක ආසන්නම ප්‍රසිද්ධ පාසලක දරුවෝ තුන්දෙනෙක් රුපියල් 5000කුත් අරගෙන හොයලා බලන්න 5000 දෙන්න ඉස්සෙල්ලා අරගෙන ගියා අම්මලා හොයනවා දාගෙන කෝ කියලා. බලද්දි ළමයි තුන්දෙනා ගෝල්ෆේස් ගිහිල්ලා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මෙන්න මේකයි තත්ත්වය. ඒ නිසා මේ ගේන පනත සමාජයට අනුකූලද? අනනුකූලද? කියන ප්‍රශ්ණය තියෙන්නේ. මේක සංස්කෘතියට ද අනනුකූලද? අනුකූලද කියන ප්‍රශ්ණයයි තියෙන්නේ නගරාධිපතිතුමනි. මම හිතන්නේ මෙතන අම්මලා තාත්තලා ගොඩක් ඉන්නවා. අපිට සහෝදර සහෝදරියෝ ඉන්නවා. අපි ඇහුවොත් කාගෙන් හරි මේ අම්මලා තාත්තලා ටික සහෝර සහෝදරියෝ ටික කැමති තමන්ගේ ඉන්න සහෝදරයා සහෝදරිය දරුවා අවුරුදු 16න් සෙක්ස් කරනවාටද? එහෙම නැතිනම් මේ රටේ වැදගත් උගත් වියත් දරුවෙක් මේ සමාජයට වැඩදායී පුද්ගලයෙක් වෙනවාද කියන එකට. ගරු නගරාධිපතිතුමනි, අපි දෙවෙනි එකටයි කැමති. එහෙකම් අවශ්‍ය වෙන්නේ ලිංගික අධ්‍යාපනය ලබා දීම වැදගත් හැබැයි ලිංගික අත්දැකීම් ලබා දෙන්න කරන මේ පුරාජේරුව තමයි නැත්නම් මේ වැරැද්ද තමයි වැරැද්ද. අපි මේ රටේ මිනිස්සු හැදුනේ කාහිල් ජිබ්‍රාන්ගේ තියෙන උපදෙස් කියවන්නවත් නෙවෙයි. ඕමාර් කයියාම්ගේ රුබෙයි ආර්ට් වල තියෙන දේවල් වලින් නෙවෙයි. ගරු නගරාධිපතිතුමනි වාග් වානක්‍යගේ කාම සූත්‍රය පොතට අනුවෙනුයි ජීවත් වුනේ. මේ ඓතිහාසික මේ මුනේ දරුවෝ හැදුනේ අම්මලා තාත්තලා හැදුනේ බුදුරජාණන් වහන්සේගේ සිඟාලෝවාද සූත්‍රයට අනුව. ඒ වගේම බයිබලයට අනුව හිතෝපදේශයේ තියෙනවා පුත ඔබ ඔබගේ අවවාදය ඉවත නොදමන්න. පියාගේ උපදෙස් ඉවත නොදමන්න. එය ඔබගේ හිසට වැටෙනා ඔටුන්නක් ද ගෙලය ගෙන ආ මාලයක්ද වන්නේය කියලා. ඒ වගේම කුරානයේ මතක් කළා අනෙක් පැත්තෙන් බගවත් ගීතාව මතක් කළා. ගරු මන්ත්‍රීතුමිය දුන්න දුනුගමුවේ ඊතල කිතලගමුවේ රාල මීගමුවේ මුවෙක් හැඩුවයි සබරගමුවේ කියලා කතාවක් අහලා තියෙනවා. මේ ප්‍රස්තුතය එන්නේ අපිට මේ තියෙන වදහිංසා හරි දඩුවම් හරි අපිට තියෙනවා මන්ත්‍රීතුමිය මොකෙන්ද අපිට තියෙනවා දණ්ඩ නීති සංග්‍රහයේ වරදක් කළොත් දඩුවම් කරන්න. ගරු නගරාධිපතිතුමනි, මෙතන තියෙන වරද තමයි ඒගොල්ලන්ට දෙන දරුවන් වෙනුවෙන් ඔවුන්ට කරන බලපෑම නැතිනම් අවමානය. ගරු නගරාධිපතිතුමනි මෙන්න මේකට අර්ථපූර්ණයක් නැහැ. අන්න ඔතනයි ප්‍රශ්ණය. නැත්නම් අපිට ඒක තිබුණානම් ප්‍රශ්ණයක් නැහැ. අවමානය කියන එක මෙතන අර්ථ ගැන්වීම කරන්නේ අපිට තියෙන අභිනයට අනුව සශ්‍රීය අභිනය. අපේ ඇඳුම් වලින් අපි බලපෑමක් කරනවා කියලා ඒත්තු ගැන්වුණොත් දරුවාට ඒකේ වැඩි වාසිය යනවා. ඊළඟට ගරු නගරාධිපතිතුමනි, වාචික අභිනය. අපි වචන වලින් කියන දේවල් පුතේ මෙහෙම කරන්න එපා කියලා කිවුවොත් එහෙම ඒක යනවා. ඊට පස්සේ ආංගික අභිනය මෙහෙම කළා කිවුවොත් කියයි මට මේ බලපෑමක් කළේ ලිංගික බලපෑමක් කළේ කියලා. අපිට තියෙන ප්‍රශ්ණය වදහිංසා දඩුවම් වලට දඩුවම් දීමවත් ඒ නිසා නෙවෙයි මේකේ අවමානයේ තියෙන අර්ථ පූර්ණය. ඒ නිසාම තමයි ගරු නගරාධිපතිතුමනි, 1815 මාර්තු 02 උඩරට ගිවිසුම ගහපු උඩරට මඟුල් මඩුවට ගිහිල්ලා එදා මහානායක හාමුදුරුවෝ රාමඤ්ඤ නිකාය අමරපුර නිකාය සියම් නිකායේ පාර්ශව දෙකත් එක්ක මහානායක හාමුදුරුවෝ කියපු දේ නිසා තමයි නගරාධිපතිතුමනි එදා අනුර කුමාර දිසානායක ශ්‍රී

ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමාට පිළිගන්න සිද්ධ වුණේ එහෙම කරන්න ආවේ හාමුදුරුවනේ අපට වැරැද්දක් වුණා තමයි කියලා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අන්න ඒ විදියට මේක පිළිගන්න. මේක කරන්න කාදිනල්තුමාගේ පැත්තෙනුත් ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා මේක සමාජ කථාකාවත ගොඩනැඟුනේ මෙහෙමයි. අනෙක් පැත්තෙන් කිව්වා පාසලට පාසලක් අනෙක් පැත්තෙන් සමාජයට සමාජයක් සංස්කෘතිය වෙනස් කියලා අන්න ඒ වෙනස නිසා තමයි රෝයල් කොලේජ් එකේ ඉඳලා ඒ වගේම තමයි අනික් පැත්තෙන් ගත්තාට පස්සේ යාපනයෙන් නිල්ලඩි විද්‍යාලය ඉඳලා දික්වැල්ල විජිත මහා විද්‍යාලය දක්වාත් ඒ වගේම රෝයල් කොලේජ් එකේ ඉඳලා සුනන්දෝපනන්ද විද්‍යාලය දක්වා දරුවන්ගේ සංස්කෘතිය වෙනස් නිසා තමයි ගරු නගරාධිපතිතුමනි අපි කියන්නේ මේකට උපදෙස් අවවාද අවශ්‍යයි කියලා. ඒ නිසා තමයි මේකේ හරි ඩෙෆිනේෂන් එකක් අවශ්‍ය වෙන්නේ. ගරු නගරාධිපතිතුමනි මෙතන කතා කළා ඇමරිකාව පිළිබඳ. මම කියන්නම් අපේ අල්ලපු ගෙදර ඇවිල්ලා ඉන්නවා දරුවෙක් ඕස්ට්‍රේලියාවේ පදිංචි වෙලා හිටියේ. ඒ පදිංචි වෙලා හිටිය දරුවා අවුරුදු 16ට අඩුයි. නැවත වතාවක් අම්මයි තාත්තයි ගෙදරට එක්කන් ආවා. ඕස්ට්‍රේලියාවේ පුරවැසිකමත් තියෙද්දි. ගරු කොමසාරිස්තුමියනි හේතුව තමයි එයාගේ හොඳම යාලුවා අවුරුදු 16ට අඩුයි. තමන්ගේ පෙම්වතා එක්ක ගෙදරට ගෙනෙල්ලා සෙක්ස් කළා. තාත්තා ඒකට විරුද්ධ වුණා කියලා තාත්තට විරුද්ධව ඒ ඕස්ට්‍රේලියානු දරුවා ගියා අධිකරණයට. අද තාත්තාව එළියට දාලා, තාත්තා බලාගෙන ඉන්නකොටම මේ දරුවා දැන් ලිංගිකව හැසිරෙනවා. අන්න ඒ නිසා මේ දරුවාව ආරක්ෂා කර ගන්න ඕන නිසා පුරවැසිභාවයට පයින් ගහලා ආවා. ගරු නගරාධිපතිතුමනි අපි කතා කළා පින්ලන්තය ගැන මෙතුමන්ලා. පින්ලන්තයේ අධ්‍යාපනය මොකක්ද? මේ අවමානය සම්බන්ධ ප්‍රශ්ණයක් නෙවෙයි. කලින් ජීබ්‍රාහන්ගේ ප්‍රශ්ණයක් නෙවෙයි. ඕමාන් කයියාර්ගේ වදන් අනුව නෙවෙයි. වාග් වානක්‍යාගේ කාම සූත්‍රයට අනුව නෙවෙයි. ඒගොල්ලෝ කතා කරන්නේ හොවාර්ඩ් ගාර්ඩන්ගේ බහු දින බුද්ධි න්‍යාය අනුව කොහොමද මේක මේ රටේ අධ්‍යාපනය සංවර්ධනය කරන්නේ, විධිමත් දරුවෙකු බවට පත් කරන්නේ කියලා. එදා අපේ තිබුණ විස්තෘත පවුලත් මේකට උපමා කරගෙන ජීවත් වෙනවා ගරු නගරාධිපතිතුමනි. ඒ නිසා අභිමානවත් සංස්කෘතියේ ප්‍රශ්ණයක්. මේක අනනුකූලයිද අනුකූලයිද කියන ප්‍රශ්ණය අද පැනනැගිලා තියෙනවා. ඒ නිසා මේක අනනුකූලයි. ඒ නිසා තමයි සමාජ කථිකාවතක් වෙන්නේ. අපිට ඕන දරුවාට කොන්ඩම් එකක් වෙනුවට දරුවාට ඕන කරන අධ්‍යාපන දැනුමෙන් සන්නද්ධ කරන සංස්කෘතිකමය දරුවෙක්. ඒ දරුවාව මේ පනත තුළින් විග්‍රහ කරනවානම් ඒකේ ඔබතුමත් වැරදි අපිත් වැරදි. ගරු නගරාධිපතිතුමාට මතකයි මේ සභාවට ගෙනාවා මංගල සමරවීර ඇමතිතුමා ඉන්න කාලේ මම විපක්ෂයේ හිටියේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ගෙනාවා ඒ තමයි මත්ද්‍රව්‍ය මත්පැන් සම්බන්ධව පර්මිට් දෙනකොට ඒකට විරුද්ධව විපක්ෂයේ පක්ෂව සිට ඡන්දය දුන්නා. ඒ නිසා අපිට ඕනා හෘද සාක්ෂියට අනුව උත්තර දෙන සමාජයක්, හෘද සාක්ෂියට අනුව උත්තර දෙන මන්ත්‍රීවරයෙක්. ඒ මන්ත්‍රීවරයාව බිහි කරන එක අපේ වගකීමක් ගරු නගරාධිපතිතුමනි. ඒ නිසා ඔබතුමන්ලාට හෘද සාක්ෂියට අනුව අපේ නායකයෙකු මොනවාද කරන්නේ කියන එක වැදගත් නැහැ. මේ සමාජයට අනුව අවුරුදු 2500ක් තිබුණ ඉතිහාසයක් තිබුණ රටක් මේක. ඒ රටේ දරුවෝ ටික ආරක්ෂිත වුණේ අම්මා තාත්තාගේ උපදෙස් වලට අනුව. ඒ නිසා මේක සමාජයට අනනුකූලයි. ඒ වගේ ම සංස්කෘතියටත් අනනුකූලයි. ඒ නිසා මොරටුවේ ජනතාවගේ ඒ විරුද්ධතාවය ඒ ප්‍රතික්ෂේපත්වය තමයි අපි ඉදිරිපත් කරන්නේ. ඒක දෙවනවර කියවීම, තුන්වර කියවීමට පෙර මේක ගන්න ඕන. එහෙම නැතිනම් මේ පනත ආවොත් අපි ජීවිත පරිත්‍යාගයෙන් මේ රටින් මාවිල්ලාරු ගිහිල්ලා තියෙනවා. අපි මේකටත් සූදානම්. ඒක පරාජයට පත් කරන්න අපි අධිකරණයටත් යනවා කියන්න ප්‍රකාශ කරමින් මේ රටේ දරුවන්ට ජයවේවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අද දිනයේ අපි සූදානම් වෙලා ආවේ නැති වුණත් විපක්ෂයේ ඉල්ලපු විවාදය අපි දැන් කරගෙන යනවා. මගේත් අදහස් දැක්වීමක් තියෙනවා මේ සම්බන්ධයෙන්. පළවෙනියට මම කියන්න කැමති මේ පනතට අනුකූලව පාසල් සංදර්භයේ ශාරීරික දඬුවම යනු කුමක්ද? ශාරීරික දඬුවම යනු ගුරුවරුන් හෝ පාසල් අධිකාරිය විසින් ශිෂයන්ට දඬුවමක් ලෙස වේදනාව හෝ අපහසුතාවයකට ඇති කිරීමේ බලාපොරොත්තුව ඇතිව භාවිතා කරන ශාරීරික බලයයි. උදාහරණය කස පහර දීම, අතට ගැසීම, කෙනිත්තීම, දිගු වේලාවක් දණ ගැස්වීම. මෙහිදි වඩාත් වැදගත්

කාරණය වන්නේ අදාළ හිංසනය ක්‍රියාත්මක කරන ලෙස කරන්නේ ද යන්නයි. එනම් නිවැරදි කිරීමේ ක්‍රමවේදයක් හෝ ශාරීරික හෝ මානසිකව දඬුවම් පැමිනවීම. කුමන සන්දර්භයක වුවද වැඩිහිටියෙකුට හෝ දරුවෙකුට එරෙහිව ශාරීරික හිංසනයක් කිරීම දණ්ඩනීය වරදක්. මෙන්න මේක තමයි මේ පනතට අනුකූලව ජාතික ජනබලවේගය ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ. අපි සියලුම ආකාරයෙන් ළමා හිංසනයට විරුද්ධයි. මේ පනතේ මූලික අරමුණ වන්නේ දරුවන්ට කායික හිංසා පැමිණවීමට විරුද්ධ වීම පමණයි. ඒවගේම තමයි මම කියන්න කැමති මේක නව පනතක් නෙවෙයි ගරු නගරාධිපතිතුමනි. මේ පනත මේ චක්‍රලේඛනය 2016/12 චක්‍රලේඛනය මඟින් දඬුවම් පැමිනවීම තහනම් කරලා තියෙනවා. මේ අලුත් නීතියක් නෙවෙයි පවතින නීතිය ශක්තිමත් කරමින් තව දිගුවක් විදියට ගෙන යාමක් පමණයි. ඒ වගේම තමයි විපක්ෂය මේ සම්බන්ධයෙන් අදහස් දක්වපු ගොඩාක් මන්ත්‍රීවරුන් දන්නේ නැතුව ඇති මේක තවම තියෙන්නේ පනත සාකච්ඡා කිරීමේ මට්ටමේ. ඒ වගේමයි ඉදිරියේ දී කාරක සභා අවස්ථාවේ දී සියලුම පාර්ෂව වලින් සමාජයේ මේ පනත සම්මත කිරීම පෙර සියලු පාර්ෂවයන්ගේ අදහස් විමසීමේ කාලයක් ලබා දීමට තීරණය කරලා තියෙනවා. ඒ පිළිබඳව දන්නවාද නැද්ද කියන කාරණය මේ ගැන කතා කරද්දි පැහැදිලි නැහැ. ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමනි, මේ ශාරීරික දඬුවම් තහනම් කිරීමේ ධනාත්මක පැති මොනවාද? ළමා හිමිකම් ආරක්ෂා කරනවා. ළමා හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කන්වෙන්ෂන්ස් සී.ආර්.සී. එක්ක ගලපලා තමයි මේ පනත හදලා තියෙන්නේ. ඉගෙනුම් පරිසරය වඩාත් හොඳයි. ළමයින්ට ආරක්ෂිතභාවය දැනෙන නිසා අවධානය හා කාර්ය සාධනය වැඩි වෙනවා. පීඩනය හා අපයෝජනය වළක්වන්න පුලුවන්. ගුරුවරුන්ට අතිරේක මට්ටමින් බලය යෙදීමේ බලය අවම කරනවා. ධනාත්මකව පරිපාලන ක්‍රමෝපායන් පිළිබඳව උනන්දුව, උපදේශනයන් මිතුරන් අතර ගැටලු විසඳීම වැනි විකල්ප මාර්ග භාවිතා කිරීමක් යොදවනවා. ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමනි, මෙතනින් දිඟින් දිගටම කිවුවා මේ ගුරුවරුන්ට මේ පනතත් එක්ක දඬුවම් කරන්න තියෙන අවස්ථාවක් නැහැ. ළමයෙක්ට වචනයක් කියන්න නෙවෙයි ඔරවලා බැලුවත් ගුරුවරයාට විරුද්ධව ක්‍රියාමාර්ග වලට යන්න පුලුවන් කියලා. ඒක අමූලික බොරුවක්. මොකද මේ සුන්බුන් වෙච්ච විපක්ෂය කැමති හැමවෙලේම සුනේසුන් වෙච්ච විපක්ෂය කැමති හැමවේලේම කොරහේ කිඹුල්ලු දකින්න. ඒ කිඹුල්ලු ජනගත කරන්න. පහුගිය කාලේ පුරාම ඔය වගේ බොරු වැපුරුවා. ඔය වගේ බොරු ජනගත කළා. හැබැයි වෙච්ච දෙයක් නැහැ. ඒ ශක්කෝම බොරු කියලා ජාතික ජනබලවේගය ආණ්ඩුව ඔප්පු කරලා පෙන්නුවා. ඒ වගේම තමයි මේ පනත යටතේ දඬුවමක් කළාම ගුරුවරයාට එරෙහි නීතිය මොකක්ද? දණ්ඩ නීති සංග්‍රහය යටතේ වගන්ති 74 සත්භාවයෙන් කරනු ලබන ක්‍රියාව. 88 වගන්තිය යටතේ සුළු හානීන් සම්බන්ධ වරදවල් හා ආත්මාරක්ෂාවට අදාළ වගන්තිය 90 සිට අනෙකුත් වගන්ති තම විත්ති වාචකය ලෙස ගුරුවරයාට භාවිතා කළ හැකිය. ගුරුවරයාට මේ දඬුවම කළේ සත්භාවයෙන් කියලා ඔප්පු කරන්න පුලුවන්. එතකොට ඒ සම්පූර්ණ බොරු කතා. ගුරුවරු දන ගස්සපු පාර්ලිමේන්තු ඉතිහාසයක් තිබුණ පාලකයෝ දැන් ඇවිල්ලා ළමයින්ට ළමා හිංසනය වැළැක්වීමට එරෙහිව කතා කරනකොට නව නීති සම්මත කරනකොට ඒවාට විරුද්ධව කොරහේ කිඹුල්ලු දකින සමාජයක් ගොඩනහන්න හදනවා. ඒකට ජාතික ජනබලවේගය ආණ්ඩුව තුළ කිසිදු ඉඩක් නැහැ. ඒ වගේම තමයි මම අවධානය යොමු කරන්න කැමති මේ සභාව ආරම්භයේ දී කිවුවා මොරටුවේ ග්‍රාමසේවා වසම් තුළ එක වසමක් තියෙනවා දරුවන්ට ජීවත් වෙන්න සුදුසු නැහැ කියලා. ගරු නගරාධිපතිතුමනි, අවුරුදු 76 ක් මේ නීති පැවතියානම් මේ නීති ක්‍රියාත්මක වුණානම් ඔය කියන දඬුවම් අතින් ගොඩනහන්න පුලුවන් වුණානම් අද ඒ දරුවන්ට එහෙම සමාජයක් ගොඩනැගෙනවාද? අද ඒ දරුවන්ට එහෙම වෙනවාද? අවුරුදු 16ට අඩු ළමයි විවාහ වෙනවාද? එහෙම වෙන්නේ නැහැ. මේතාක් පැවති දඬුවම් කිරීමේ නීතිය ක්‍රියාත්මක කිරීම කිසිසේත්ම සාර්ථක වෙලා නැහැ කියලා මම කියන්න කැමති. ඒ වගේම තමයි අද අපේ රටේ ප්‍රවීන සූපවේදියෙක් ඉන්නවා පබිලිස් සිල්වා කියලා. එතුමා එක අවස්ථාවක කියනවා අනේ පුතේ මම 3 වසරට වෙනකන් විතරයි ඉස්කෝලේ ගියේ. ගුරුවරු ගහන එක දරාගන්න බැරුව මම පාසැ හැරගියා කියලා. එතුමාගේ ජීවිත කතාව පිළිබඳ කියවන්න. එහෙම මිනිස්සු සමාජයේ යම් අධිෂ්ඨානශීලී ගමනක් ගියා අතරින් ගමනක් යන්න පුලුවන් වුණත් හැමකෙනාටම ඒ මට්ටමට යන්න පුලුවන්කමක් නැහැ. ඒ වගේම මම තව අදහසක් දක්වන්න කැමති. මේ සභාව තුළ එක අදහසක් මතුවුණා හැදි නොගා හදන කිරි හොද්දක් ගැන. ගරු නගරාධිපතිතුමනි මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමති පුරාතන රෝමය ගැන. රෝමයේ විශේෂයෙන්ම ජනරජ යුගය තුළ සැමියාට අවසර තිබුණා බිරිදට පහර දීලා හික්මවන්න.

හැබැයි කාලයත් එක්ක සමාජගත වෙනකොට කාන්තා හිංසනයට විරුද්ධව නීතිරීති හැදිලා ඒ අවස්ථාව නැති වුණා. ඒ වගේම තමයි මේ සමාජයක් ඉදිරියට යනකොට දරුවන්ට දඬුවම් කිරීම කියන කාරණය නෙවෙයි ළමා ප්‍රචණ්ඩත්වය නෙවෙයි ඊට එහා ගිය ක්‍රමවේදයන් තුළින් දරුවාව ගොඩනඟන්න ඕන කියන කාරණය අපි මතක් කරගන්න ඕන. ඒවගේම තමයි මේ වගේ නීතිරීති පද්ධතියක් හදන්න සමාජයේ අර කියන පුළුල් තැනට යනකන් සිටිය යුතුද? ඒ පුළුල් තැනට යනකල් ඉඳලා තමයි අපි නීතිය හදන්නේ. ඒක සම්පූර්ණ විභිළුවක්. නීතිරීති මගින් ආරම්භයක් ලබාගෙන සමාජයේ අන්න අර අපි බලාපොරොත්තු වෙන පුළුල් ගොඩනැඟීම කරා ගෙන යා යුතුයි. ඒ පිළිබඳව මම ඔබතුමාලා සියලු දෙනාටම මතක් කරන්න ඕන. ඒවගේම තමයි මේක පනතක්. තවම සාකච්ඡාවට සංවාදයට ලක්වන පනතක්. කෙටුම්පතක් විරතයි. සම්මත කරපු නීතියක් නෙවෙයි. මේ රටේ රාජ්‍ය නායකයෝ හිටියා. මගේ වචනේ ගැසට් එකක් කියපු හැබැයි අපේ එහෙම නැහැ. සියලු දෙනාට කතා කරලා සාකච්ඡා කරලා ඒ පනත සම්මත කරන්න පෙර සියලු දෙනාගේ අදහස් අරගෙන, ඒ වගේම ඒ අදහස් වලින් ගන්න පුලුවන් හොඳම දේ අරගෙන නව නීතියක් මඟින් ළමා හිංසනය වැළැක්වීම පමණයි අපේ අරමුණ. ඒ වගේම තමයි පහර දීලා ගහලා ළමයි මේ පැවතිච්ච නීති වලින් හරි මාර්ගයට යවන්න පුලුවන් වුණානම් අද ඔය කියන කිසිදු අපරාධකාරයෙක් ළමයෙක් ගුරුවරයෙක් ඔය කිසිදු කෙනෙක් සම්බන්ධයෙන් මෙවැනි කථිකාවක් ගොඩනඟන්න සමාජයට ඉඩ ප්‍රස්තාව හම්බවෙන්නේ නැහැ. බොහොම ස්තූතියි. අපේ එකම අරමුණ වන්නේ ජාතික ජනබලවේගය ආණ්ඩුවේ එකම අරමුණ සුරක්ෂිත දරුවෙක් වෙනුවෙන් අනාගතයක් ගොඩනැඟීම එපමණයි ඒ පනතේ සියලුම අරමුණ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, සෙව්වන්දි මන්ත්‍රීතුමියගේ කතාව මම අහගෙන හිටියා එතුමියගෙන් මම අහන්න කැමති ඔබතුමිය අම්මා කෙනෙක්ද? ඔබතුමියට දරුවෝ ඉන්නවාද? ඔබතුමිය අම්මා කෙනෙක්නම් ඔබතුමියට දරුවෝ ඉන්නවානම් ඔබතුමියගේ හෘද සාක්ෂියට අනුව නෙවෙයි ඔබතුමිය ඔය ප්‍රකාශ කළේ. අපි දැක්කා ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරු දෙන්නේ හෘද සාක්ෂියට අනුව කතා කළා. ඒ ගුරුවරු දෙන්නෙක්. අපේ මහින්ද ගුරුතුමා කිව්වා මේ පනත ඕස්ට්‍රේලියාවට පින්ලන්තයට ඇමරිකාවට අවශ්‍ය විදියට තමයි මේක හදලා තියෙන්නේ කියලා. අපි කියන්නෙත් ඒක. ඒ වගේම අපි ගුරුතුමියක් ඉන්නවා ස්වර්ණා ගුරුතුමිය. එතුමියත් ගුරුතුමියක් හැටියට එතුමිය එතුමියගේ කතාව ආණ්ඩු පක්ෂයට සරිලන විදියට සකස් කරන්න උත්සහා කළත්, එතුමියගේ මුවගින් ආපු වචන මාලාව පිළිබඳව අපි සැලකිලිමත් වෙනකොට එතුමිය මේ පනත සම්බන්ධව එතුමියගේ මතය එතුමියත් නොදැනීම එළියට ආවා. මමත් අවුරුදු 18 ක ගුරුවරයෙක්. අවුරුදු 18ක් මගේ තරුණ කාලේ ගුරු වෘත්තිය කළා. මමත් අ.පො.ස සාමාන්‍ය පෙළ දරුවන්ට තමයි ඉගැන්නුවේ. එතකොට මේ අ.පො.ස සාමාන්‍ය පෙළ දරුවන් එක්ක දීර්ඝ කාලයක් අවුරුදු 18 ක් වගේ දීර්ඝ කාලයක් බොහෝම ළඟින් ඇසුරු කරපු ගුරුවරයෙක්. ඒ නිසා අපේ සුරේෂ් මන්ත්‍රීතුමා කිව්වා දඬුවම හා වදහිංසාව පටලවාගෙන තියෙන්නේ කියලා. හැබැයි මන්ත්‍රීතුමා ඕකේ ඉර ගහන්නේ කොතනින්ද? දඬුවමයි වදහිංසාවයි ඉර ගහලා වෙන්කරන්නේ කොතනින්ද ගුරුවරයෙක්? එහෙම නැහැ. ඔබට බනින මිතුරා හොඳ මිතුරෙක්ය. බොරු ගුණ කියන්නා ඔබගේ හතුරෙක්ය. ගුරුවරයෙක් හැම තිස්සේම දඬුවම් කරන්නේ තමන්ගේ දරුවාව හදාගන්න. මෙතන වේවැල් පහරක් කාපු නැති දඬුවමක් වින්දේ නැති යම් කිසි කෙනෙක් මේ සභාවේ සිටිය නොහැකියි. අනිවාර්යෙන්ම අපි සියලු දෙනාම අපේ ගුරුමෑණිවරුන්ගෙන් පියවරුන්ගෙන් යම් හෝ දඬුවමකට පත් වෙලා තියෙනවා මෙතන ඉන්නවා මට දඬුවම් කරපු එක්කෙනෙක්. මම දහම් පාසල් යන කාලේ අපි පරක්කු වෙලා ගියාම තිලක් අයියලා පාර්ට් එක දානවා. පර්ට් එක දානවත් නෙවෙයි වේවැලෙන් ගහනවා. ඉතින් අපි දෙන්නාම එක දහම් පාසලේ. අපි යන කාලේ තිලක් අයියා දහම් පාසලේ ඉගැන්නුවා. ඉතින් මේවගේ ඒ සෑම හොඳට බලන්න පාසලක විනය සම්බනධයෙන් ක්‍රියාකරන ගුරුවරයා එක්ක වැඩියෙන් දඬුවම් කරන ගුරුවරයා එක්ක තමයි වැඩිහිටි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ වැඩියෙන් එකතු. ඇයි ඒ. හොඳට බලන්න ඔබ ආදරය කරන ගුරුවරයා ඔබේ හදවතට දැනිච්ච ගුරුවරයා වැඩියෙන්ම දඬුවම් කරන ගුරුවරයා නොවෙයිද කියලා. ඇයි අපි ඒ ගුරුවරයාට ආදරේ. අපේ හෘද සාක්ෂිය අපිට කියනවා ඒ ගුරුවරයා තමයි අපිව අද මේ තැනට ගෙනාවේ. මම පැහැදිලිව කියනවා මම මේක හැම තැනම කියන ප්‍රකාශයක් මගේ පාසල තමයි අද මාව මේ තැනට ගෙනෙල්ලා තියෙන්නේ. මට මතකයි මම කිසිම දෙයකට කතා නොකර ඉන්නකොට අපේ

පාසලේ වැඩියෙන්ම දඬුවම් කරන ගුරුවරයා තමයි කතා කරලා කිවුවේ අද කතාවක් කරන්න ඕන කියලා. එදා තමයි මම ඉස්සේල්ලාම කකුල් වෙවුල වෙවුල උදෑසන රැස්වීමේ කතා කළේ. ඒ ගුරුවරයාට තියෙන බයට. හැබැයි ඒක මට වැරදුනේ නැහැ. අද වෙනකෙට මම මෙතැනට ඇවිල්ලා තියෙන්නේ ඒ ගුරුවරුන්ට පින්සිද්ධ වෙන්න. ඒ නිසා මගේ ගුරුවරුන්ට මම තාමත් ආදරෙයි. මගේ ගුරුවරුන්ට මම තවමත් පහන තියනකොට මම පින් දෙනවා. මොකද හේතුව ඒ ගුරුවරුන් නොවන්නට අද අපි කොහෙද කියලා හිතාගන්නවත් බැහැ. මේ හැම දෙනාටම ඒක තමයි. කොමසාරිස්තුමියගේ ඉදලා මේ සියලුදෙනාටම තමන්ගේ අතීතය මතක් කළොත් එහෙම ඒ ගුරුවරුන්ගෙන් යම්කිසි බැනුමක් අහපු, ගුටියක් නොකාපු කෙනෙක් ඉන්නවානම් ඔහු මෙතන ඉන්න විදියක් නැහැ. ඒ නිසා පැහැදිලිව අපි කියනවා මේ ගේන පනත නිසා ශ්‍රී ලංකාවේ අපිට තිබුණ සංස්කෘතිය සභ්‍යත්වය එහෙම්පිටින්ම විනාශ කිරීමේ එන්.ජී.ඕ. අරමුණක්, එහෙම නැතිනම් මේක අයි.එම්.එෆ්. එකේ අරමුණ ඒ මනදොල සංසිදුවීම සඳහා තමයි මේ වගේ පනතක් ගෙනෙල්ලා උත්සහා කරන්නේ. ඒ නිසා මේකට අපිට අටුවා ටීකා කියන්න පුලුවන් මේක හරි අපේ ආණ්ඩු පක්ෂයේ නම් අපේ මේ කතාව වෙනස් වෙන්න පුලුවන්. හැබැයි අපේ කතාවල් වෙනස් වුණාට අපි කියන වචන වෙනස් වුණාට අපේ හෘද සාක්ෂිය අපිට කියනවා මේක වැරදි කියලා. ඒක තමයි මහින්ද මහත්තයාලගේ කටින් එළියට ආවේ. මොකද හේතුව එතුමන්ලා අපි බොහොම ගරු කරන ගුරුවරු මේ මොරටුවේ බහුතරයකට උගන්නපු මිනිස්සු. ඒ නිසා දේශපාලනය මොකක් වුණත් එතුමන්ලාගේ හෘද සාක්ෂිය එතුමන්ලාට කියනවා හරි දේ හරි විදියටත් වැරදි දේ වැරදි විදියටත් ප්‍රකාශ කරන්න. ඒ නිසා අපි පැහැදිලිව කියන්නට ඕන මේ අපිට සුන්බුන් විපක්ෂය කියලා හරියන්නේ නැහැ. මේක සුන්බුන් විපක්ෂය හරි මොන විපක්ෂය හරි අපි ගෙනාපු යෝජනාව හොඳද නරකද කියන එකයි බලන්නයි ඕන. ඔබට අවස්ථාවක් තියෙනවා ආණ්ඩු පක්ෂය විදියට.

ගරු නගරාධිපතිතුමාට හොඳ දූවරු දෙන්නෙක් ඉන්නවා. මම හිතන්නේ තාත්තා හැටියට එතුමා කිවුවොත් එහෙම මමනම් මේ දරුවන්ට දඬුවම් කරලා නැහැ කියලා. අපිට ඒක පිලිගන්න බැහැ. මොකද බොහොම වැදගත් විදියට හැදිච්ච අපි දන්න විදියට දරුවන් දෙදෙනෙක් ඉන්නවා. මේ හැමෝටම මේ දරු මල්ලෝ ඉන්නවා. අවුරුදු 15 ක පුතෙක් ඉන්නවා. දැන් අවුරුදු 16ට පියනගන්න. එතකොට මේ අවුරුදු 16 අපේ පුතා මගෙන් අහනවා තාත්තේ කොණ්ඩේ කපාගෙන යන්න ඕන නැහැනේ දැන් ඉස්කෝලේ. දැන් පනතක් ගේනවනේ ඒ නිසා අපිට ආපහු කොණ්ඩේ කපාගෙන ඉස්කෝලේ යන්න ඕන නැහැ. කොණ්ඩේ අපිට ඕන විදියට වවාගෙන යන්න පුලුවන්ද? කියලා අහනවා. ඒ තත්ත්වෙට ළමයින්ගේ මනස අද වෙනකොට වෙනස් වෙලා තියෙනවා මේ පනත සම්මත වෙන්නත් ඉස්සර වෙලා. පනත සම්මත වෙන්නත් ඉස්සර වෙලා පොඩි එකා අහනවා මට කොණ්ඩේ කපන්න ඕන නැහැ නේද කියලා. එහෙනම් මේ පනත සම්මත වුණාට පස්සේ ගුරුවරුන්ව නිවාස අඩස්සියට ගන්නවා අනිවාර්යෙන් වැඩිහිටි ශිෂ්‍යාවෝ. ගුරුවරු නිකන්ම නිකන් පංකියට ඇවිල්ලා විෂය කරුණු ටික උගන්වන්නවා කැමති කට්ටිය ඉගෙන ගන්නවා. අකමැති අය නැඟිටලා යන මට්ටමකට පත්වෙනවා. කරාබු දාගෙන ඉස්කෝලෙට ආවත් ගුරුවරයාට බැරි වෙනවා දඬුවමක් කරන්න. එහෙම නැතුව අවුරුදු 16 පහුවුණාට පස්සේ සමහර වෙලාවට බඩදරු අම්මලත් ඉස්කෝලෙට එන්න පුලුවන්. ඒ තත්ත්වයට අද සංස්කෘතිය විනාශ කරමින්, වෙනස් කරමින් යන්න තමයි මේ පනත ඔස්සේ උත්සහා කරන්නේ. ඒ නිසා මේ පනතේ තියෙන අකාරුණිකභාවය, ඒ පනතේ තියෙන අවුල තව තවත් කියන්නට පුලුවන්. හැබැයි අපි එකක් දන්නවා මෙතනින් කතා කරපු සියලු දෙනා කතා කලේ තමන්ගේ ආණ්ඩු පකෂය රැකගන්න මිසක් මේ පනතට පක්ෂපාතීව නෙවෙයි. සෙව්වන්දි මන්ත්‍රීතුමියත් කියනවා මේ පනත සංශෝධනය කරන්න අවස්ථාව තියෙනවාලු. හත්වලාමේ සංශෝධන කරන්න අවස්ථාව තියෙනවානම් තියෙනවා කියන වචනය තුළම පිලිගන්නවා සංශෝධනය කරනවා කියන වචනය තුළින්ම පිලිගන්නවා මේ පනතේ අවුලක් තියෙනවා කියලා. ඒ නිසා මේ පනතේ තව තැනක කියනවා රුපියල් 5000 ගානේ බෙදනවා කියලා. හත්වලාමේ අද කන්න නැතුව කී දාහක් ඉන්නවාද මේ රටේ. ඇයි ඒ ඇමතිවරයාට බැරි වුණේ කන්න නැතුව ඉන්න මිනිස්සුන්ට එහෙම නැතිනම් පාසල් යන්න විදියක් නැතුව ඉන්න දරුවන්ට පාසල් යන්න පොඩි ඉන්ජක්ෂන් එකක් එහෙම නැතිනම් පොඩි දිරිගැන්වීමක් හැටියට රුපියල් 5000ක් දෙනවා කිවුවානම් ඒක කොච්චර ලස්සනද? රුපියල් 5000 අරගෙන ෂෝ බලන්න යන්නයි අරෙහෙ යන්නයි මෙහෙ යන්නයි ආතල් ගන්න යන්නයි ඒවට රුපියල් 5000ක් දෙනවා කිවුවාට වඩා අපේ පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරලා ඒ පාසල් අධ්‍යාපනයට එන්න බැරි, අපේ නගරාධිපතිතුමා අපි ස්තුතිවන්ත වෙනවා එතුමා දැම්මා

යෝජනාවක්. මොකක්ද යෝජනාව එතුමා දැම්මා පොත් බෙදාදීමේ යෝජනාවක්. අපි බොහෝම සාධනීය විදියට දකිනවා ඒක. නගරාධිපතිවරයා හැටියට ඉතාම හොඳ යෝජනාවක් දැම්මේ පාසල් උපකරණ බෙදා දීම සම්බන්ධයෙන්. ඉතින් අපි කියන්නේ මේ ආණ්ඩුවට බැරි ඇයි මේ රුපියල් 5000 කතාව යහපත් දෙයකට යොදවනවා කියලා කියන්න. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේක ආණ්ඩු පක්ෂයේ කියපු මන්ත්‍රීවරු කියපු කරුණෙන් කරුණ විග්‍රහා කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැබැයි මේ පනත ඇතුලේ සුවිශාල වූ අවුලක් නිර්මාණය කරනවා සංස්කෘතික වශයෙන් ලොකු පරිහානියකට මේ රට පත්කරලා අනාගතයේ මේ රට ඉතා විශාල ඛේදනීය තැනකට ගොනුකිරීමේ අරමුණයි මේ පනත තුළින් තියෙන්නේ. ඒ අරමුණ කාට තියෙනවාද කියන එක පිළිබඳව අපිට අවබෝධයක් නැහැ ගරු නගරාධිපතිතුමනි. හැබැයි අපි කියන්නේනම් අයි.එම්.එෆ්. එකේ මනදොල සපුරන්න අයි.එම්.එෆ්. එකේ වුවමනාවට මේ පනත ගේනවා කියලා. හැබැයි මේ පනත ගෙනාවොත් ඔබතුමා ඔය පුටුවේ තව අවුරුදු තුනහාමාරක් ඉන්නවා. අපි ඔබතුමාව බස්සන්නේ නැහැ. ඒ නිසා ඒ තුනහාමාර තුළ අපිට අහන්න පුලුවන් ඔබතුමාගෙන් දැන් සැපද කියලා මොකද හේතුව රටේ දරුවෝ ටික විනාශ වෙන්න මේකේ වචනයකින් හරි උදව් කළොත් එහෙම ඒක මහා පවුකාර වැඩක් කියන එක පිළිබඳව කියමින් මේ අවස්ථාව ලබාදුන්නාට මා ස්තුතිවන්ත වෙනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, දණ්ඩ නීති සංග්‍රහයට එකතු කරන සංශෝධන පනත් කෙටුම්පතක් පිළිබඳව දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ගෙන එන පනත් කෙටුම් පතක් පිළිබඳව ලොකු විවාදයක් අපි උදේ ඉඳන් අහගෙන ඉන්නවා. ඇත්තටම කියන්න ඕන මේ පනත් කෙටුම්පත පිලිබඳව මේ යන සාකච්ඡාවේ දී මට පොඩි කතාවක් මතක් වුණා. ඒක තමයි, එක මනුස්සයෙකුට වමනේ ගියාලු. ඒ වමනේ ගොඩ උඩට කාක් පිහාටුවක් වැටිලා. ඒ කාක් පිහාටුව දැකපු මනුස්සයෙක් ගිහිල්ලා කියන්නවා අන්න අර මනුස්සයා කාක් පිහිටුවක් වමනේ දාලා කියලා. හැබැයි ඔය කාක් පිහාටුව අන්තිමට කාක්කෝ හත්දෙනෙක් ගාණට යනවා. අන්න ඒ වගේ තත්ත්වයක් තමයි අද මේ සභාව ඇතුලේ අපිට දකින්න තියෙන්නේ. ඇත්තටම ගරු නගරාධිපතිතුමනී මුලින් ම කියන්න ඕන, මේ පනත් කෙටුම්පත ඇතුලේ ගුරවරු ඉලක්ක කරගෙන ගෙනාපු පනත් කෙටුම්පතක් නෙවෙයි මේක. අපි දකිනවා පාසල් යන දරුවෝ ඒ වගේම අපේ පාසල් නොයන දරුවෝ සියලු දරුවෝ අතින් විවිධ වැරදි සිද්ධ වෙනවා. ඒවා සමහර වැරදි චර්යාත්මක වැරදි විදියට අපි දකිනවා. ඒ වගේම ආකල්පමය වැරදිත් දකිනවා. ඒ වගේම අපරාධමය වැරදිත් දකිනවා. ඉතින් ඒ චර්යාත්මක වැරදි. අපි දකින චර්යාත්මක වැරදි ඇතුලේ අපිත් ඒවාට දඬුවම් විඳලා තියෙනවා. ගුරුවරුන්ගෙන් විවිධ දඬුවම් වලට අපි මුහුණ දීලා තියෙනවා. ඒ චර්යාත්මක වැරදි නිවැරදි කරගන්න වෙන්නේ ගුරුවරුන්ට එහෙම නැතිනම් දෙමාපියන්ට එහෙම නැතිනම් වැඩිහිටියන්ට. මොකද දරුවෝ ආදර්ශ ගන්නේ ගුරුවරුන්ගෙන් දෙමාපියන්ගෙන් වැඩිහිටියන්ගෙන් සහ මේ සමාජයෙන්. එතකොට ඒ ආදර්ශ මත තමයි දරුවන්ගේ ක්‍රියාකාරකම් සිද්ධ වෙන්නේ. ඒ ක්‍රියාකාරකම් නිවැරදි කරගන්න එක අපේ සමාජයේ සියලු දෙනාගේ වගකීමක් බවට පත්වෙලා තියෙනවා. අපි හිතමු චර්යාත්මක වැරදි විදියට දැන් මෙතනින් කියවෙනවා දරුවෙක් පාසලට කරාබුවක් දාගෙන එන්න පුලුවන්, දරුවෙක් කොණ්ඩෙ වවාගෙන එන්න පුලුවන්, නිල ඇඳුම හරියට ඇඳලා නැතුව එන්න පුලුවන්, ඔව් ඒවා චර්යාත්මක වැරදි. ඒවා අපිට කතා කරලා හදාගන්න පුලුවන් වැරදි. හැබැයි ඒ චර්යාත්මක වැරැද්දට අපරාධමය වැරැද්දකින් දඬුවම් දෙනවානම් ඒ අනුමත කරන්න බැහැ ඒ චර්යාත්මක වැරැද්දට කණ්අඩි පැලෙන්න ගහලා අපරාධමය වැරැද්දකින් දඬුවමක් දෙනවානම් ඒක කොහොම හරි කියලා කියන්නේ. ඒ වගේම කියන්න ඕන ගරු නගරාධිපතිතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට මේ කතා කරපු හැමදෙනාම කතා කළේ පාසල් දරුවන් පිළිබඳ විතරයි. හැබැයි පාසල් දරුවන්ගෙන් එහාට ගියපු දරුවන් විශාල පිරිසක් මේ සමාජයේ ජීවත් වෙනවා. ඒ දරුවෝ ළමා නිවාස වල, දෙමාපියන්ගේ රැකවරණය අහිමි වුණාට පස්සේ ළමා නිවාස වලට, පරිවාස වලට සහ විවිධ භාරකාරීත්වයන්ට ලක් වෙනවා. ඒ ලක් වෙච්ච දරුවන්ට ඉතිහාසය පුරා කොයිතරම් අභාවාචක අත්දැකීම් වලට මුහුණ දෙන්න සිද්ධ වුණාද? හැබැයි කෝ ඒවා වෙනුවෙන් ක්‍රියාත්මක වෙන නීතියක්. දැන් මේ කියන කතා ඇතුලේ අපි දකිනවා හැම දරුවෙකුටම තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී ඉන්න වුවමනාවක් තියෙනවා. ඒ දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ඕන. ඉතින් අයිතිවාසිකම්

ආරක්ෂා කිරීම වෙනුවෙන් තමයි මේ පනත් කෙටුම්පත ගේන්නේ. අපි දැක්කා ඉතිහාසයේ ඉඳන් ම මේ ගුරුවරු කතා කරපු විදියත් එක්ක ඉතිහාසයේ ඉඳන් දරුවන්ට දඬුවම් දීපු අවස්ථා තිබුණා. මේ කියන විදියට දඬුවම් දීලා දරුවාව හදන්න පුලුවන්නම් දශක ගානක් තිස්සේ ඉඳන් මේ රටේ දරුවන් දැන් පත්වෙලා තියෙන තත්ත්වය. මොරටුවේ අඟුලාන පැත්තට යන්න ළමා මව්වරුන්ගේ ප්‍රමාණය අති විශාලයි. මත්කුඩු වලට ඇබ්බැහි වුණ දරුවන්ගේ ප්‍රමාණය අති විශාලයි. මේ දඬුවම් වලින් හැදුනාද? කෝ ඒ දරුවෝ හිරගෙට යන එක නැවතුණාද? ඇයි එහෙම වුණේ? එහෙම හදන්න පුලුවන් වුණානම්, මේ දඬුවමින් හදන්න පුලුවන් වුණානම් අද සුපිරිපන්නයේ සමාජයක් මේ රටේ තියෙන්න ඕන. කතාවට කියනවා හොද්ද හැඳි ගෑවේ නැතිනම් රස නැහැලු කියන මේ අය, දරුවන්ට ගැහුවේ නැත්නම් දරුවෝ හදන්න බැහැ කියලද කියන්නේ? ඒ නිසා මම කියන්නේ මේ පනත ඉදිරිපත් වෙන්නේ දරුවන්ගේ චර්යාත්මක වැරදි නිවැරදි කිරීමට අපරාධමය වැරැද්දකින් දඬුවම් දෙන එක නවත්තන්න. ඒ නිසා ඒ වෙනුවෙන් අවශ්‍ය නීතිමය කටයුතු සියල්ල සම්පාදනය වෙනවා. අපිට වුවමනා ජාතික ජනබලවේගය ආණ්ඩුවක් විදියට අපි මේ රටේ සියලු දරුවන් වෙනුවෙන් යහපත් අනාගතයක් නිර්මාණය කරනවා ඒක සහතිකයි. ඒ වගේම මම කියන්න ඕන මේ සුජිත් මන්ත්‍රීතුමා රුපියල් 5000 දීමනාවක් දෙනකොට ඇයි ඒගොල්ලන්ට පාසල් යන්න දීමනාවක් දෙන්න බැරිද? කියලා ඇහුවා. ඉතිහාසයේ කිසිදු ආණ්ඩුවක් නොකරපු විදියට දරුවන්ට රුපියල් 6000ක අධ්‍යාපන උපකරණ ගැනීමේ දීමනාවක් දුන්නේ ජාතික ජනබලවේගය ආණ්ඩුව. ඇයි ඒවා මතක නැද්ද? ඇයි ඒවා නිවුස් වල දැක්කේ නැද්ද? ඒ නිසා හම්බවෙච්ච දරුවන්ගෙන් අහලා බලන්න ලක්ෂ 14ක් දරුවන්ට මේ රටේ කිසිදු ඉතිහාසයක කිසිදු දවසක නොදීපු දීමනාවක් ලබා දෙන්න ජාතික ජනබලවේගය ආණ්ඩුව සමත් වුණා. ඒවට මේගොල්ලන්ගේ ඇස්කන් වැහිලා තියෙන්නේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාවක් ගන්න අපි සූදානම් නැති වුණාත්, මේගොල්ලන් සූදානම් වෙලා ආවේ. හැබැයි අපි සූදානම් නැති වුණාත් අපි මේ පනත් කෙටුම්පතේ දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටින බව ප්‍රකාශ කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීන්නාදු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මට දැනුන දේ තමයි එකක් එතුමියට ස්තුතිවන්ත වෙනවා කලබලේ වුණත් මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධව. අවශ්‍ය සාකච්ඡාවට බඳුන් වියයුතු කාරණාවක්. දැන් මේ පනත මොන තරම් ඵලදායකද? මේ අවස්ථාවේ මේ විවාදය ඇතුලේ අපිට ඉතා හොඳින් ඒත්තු ගැන්වුණා. ඵලදායී සාකච්ඡාවක්. ඒ කියන්නේ අපි කාටත් බොහෝ දේ තේරුම් ගන්න වෙන්නේ අපේ අත්දැකීම් ඇතුලේ. අපි දකින දේ අපි අහන දේ අපේ ඇඟට දැනෙනවා. මේ වෙලාවේ අපි ඉතාමත් මේ අත්දැකීම් ඇතුලේ තේරුම් අරගෙන තියෙනවා අපේ සමාජය තිබුණ තැන. අපි පුංචි කාලේ අපිට තිබුණ මතකය ඇතුලේ දරුවෝ මොනතරම් ආරක්ෂිතද? සමාජය දරුවාට මොනතරම් බැඳීමක් තිබුණාද? මොනතරම් ආරක්ෂාවක් තිබුණාද? හැබැයි මේ දශක කිහිපයේ දැන් අද ඇති වෙච්ච තත්ත්වය. දරුවා හා දෙමාපියන් අතර තියෙන සම්බන්ධය. දරුවා සහ ගුරුවරයා අතර තියෙන සම්බන්ධය. අපි කවුරුත් විශ්වාස කරනවා අනාගත සමාජය දරුවන්ගේ. දරුවන් තමයි ඉදිරියේ මේ සියල්ල භාර ගන්න ඉන්නේ. හැබැයි දැන් මේ නිශ්චිත මොහොත වෙනකොට සහ අතිශය බහුතරයක් දරුවන්ට අත්වෙච්ච ඉරණම. ඒවා විශාල ඛේදවාචකයක්. දැන් සමාජයක් ලෙස අපි වග කියන්න ඕන නැද්ද මේ තත්ත්වය නිවැරදි කරගන්න. අපිට වගවීමක් නැද්ද? අපේ විවාදය ඇතුලේ කෙනෙක් උත්සහා, මම කියන්නේ අරමුණු ගණනාවකින් මේ සංවාදය ආවා. යහපත් පැතිකඩිනුත් ආවා ඊට අමතරව තම තමන්ගේ අර දරුවන්ගේම ස්වභාවය ගත්තු සමහර විවාදකයොත් හිටියා. දරුවන්ගේ ස්වභාවය අර ගෙදර කවුරුහරි ආපුවාම අර දරුවා දඟළලා කෑගහලා පෙන්වන එහෙම එකකුත් තිබුණා. කමක් නැහැ. මම කියන්නේ ඇත්තටම මේ සාකච්ඡාව තවදුරටත් පළල් ලෙස ගතයුතුයි. අපේ ඇස් පනාපිට අපේ ඇස් වල තනියෙන් අඩනවා අපි මේ තරුණ දරුවන්ට වෙච්ච ඉරණම. පාසල් වල අද සැලකිය යුතු ප්‍රශ්ණ ගණනාවකට මුහුණ දීලා තියෙනවා. ඒ නිසා මේ පනතේ හොඳ තියෙයි, නරක තියෙයි. ඔබ කරන සමහර විවාද. හැබැයි මේ පනත නීතිගත කරලා නැහැ. සංවාදයකට ගෙනෙල්ලා තියෙනවා. සාකච්ඡාවට ගෙනෙල්ලා තියෙනවා. ඔබ දන්නවා සමාජයක් ඉතිහාසයේ දීර්ඝ අත්දැකීම් හරහා වෙනස් තැනකට ගමන් කරමින් තියෙනවා. හුදු දේශපාලන පක්ෂයක් නෙවෙයි මේ බලයට ගෙනාවේ තමන් ලබපු අත්දැකීම් හරහා වෙනස් තැනකට මේ සමාජය ඔසවා තබන්නටයි මේ බලයට ගෙනාවේ. ඒ නිසා මම කිසිලෙසකින්වත් විශ්වාස කරන්නේ නැහැ ආපස්සට අපේ සමාජය

යයි කියලා. මාලිමාවේ සමහර නායකයින්ගේ සමහර කතා ඇතුලේ අඩුපාඩුකම් සිද්ද වුණාට මාලිමා පාලනය කිසිලෙසකවත් මේ සමාජයට අඩුවක් කරලා නැහැ. කිසි වරදක් කරලා නැහැ. එය සත්‍යක්. ඒ නිසා මේ පනත හරහා තවදුරත් සාකච්ඡා කරයි සංවාද කරයි. එහෙම තමයි රටක් නිවැරදි ගමනකට අවතීර්ණ වෙනකොට අහඹු ලෙස වෙන්නේ නැහැ. වෙන්නේ සංවාද සාකච්ඡා මතගැටුම් එහෙම තමයි වඩාත් යහපත් දේ එන්නේ. ඉතින් අපි ඒකට ඉඩ හැදුවා. දැන් හිතන්නකෝ මම මේ යෝජනාව ආපු වෙලාවේ ඒ යෝජනාව මට කියව ගන්නත් බැහැ. පිටු ගණනාවක් ලියලා. මම කියන්නේ ඇයි ඒ කඩිමුඩියේ එහෙම ගෙනාවේ. මෙහි වැදගත්කම. මම කියන්නේ මාලිමා පාලනය ඒ සඳහා ඉඩ දුන්නා. දේශපාලනය ඇතුලේ කිසි කුහකත්වයක් නැහැ. මෙය සංවාද කළ යුතුයි කියන අදහස ආවා. ඒක මම බලාපොරොත්තු වුණේ මේ විදියට විවාදයකින් මේක නිශේධනය කරන්න නෙවෙයි. අපි කැමති වුණත් අකමැති වුණත් මේ සභා නීති පද්ධතියක් ඇතුලේ තියෙන්නේ. යෝජනාවක් ගෙනෙල්ලා ඒක වාද විවාදයකට ලක් කෙරුවාම ඡන්ද විමසුමකට යන්න වෙනවා. ඒක පුංචි වේදනාකාරි බවක් තියෙනවා. මොකද මේක ඇතුලේ තියෙන සාධනීය දේවල් මීට පෙර අපිට පුලුවන් වුණානම් සාකච්ඡා කරලා එකඟතාවයක් ඇතුලේ උඩට මේක දැනුම් දෙන ක්‍රමයක්. හැබැයි අද මේ යෝජනාව සම්මත වීමෙන් අපි අපේ පාලනය පරාජයට පත්වුණා වගේ හැඟීමක් අදහසක් සමාජයට යනවා. මේ යෝජනාව සම්මත වුණොත්. හැබැයි යෝජනාව පරාජයට පත් වුණොත් මේ සභාව එහෙමයි. වරදක් කරලා උසාවි දාපුවාම අහන්නේ වැරදිකරුද? නිවැරදිකරුද? මේ සභාවට එකපාරට එහෙම ගෙනාපුවාම පාලක පක්ෂය විදියට මේ යෝජනාව ජයග්‍රහණය කරනවා ඇරෙන්න. ඉතින් ඒ නිසා කෙසේ නමුත් මම හිතනවා සමහර මන්ත්‍රීවරු මන්ත්‍රීවරියන් හදිස්සි වුණත් ඉතාම හොඳින් කතා කළා පනතට අනුව. එය විය යුතුයි. සභාවක මේක තමයි අනාගත දේශපාලන ගමනක ආරම්භය තියන්නේ පක්ෂ හෝ විපක්ෂ. ඒ මේ පුංචි කාලයක් තමයි. පුංචි කාලයක් ගියා. කමක් නැහැ. විවාද වලට හුරු වෙනවා, පුරුදු වෙනවා කරුණු කාරණා එකතු වෙනවා තමන් කතා කරපු ඒවා නැවත ගිහිල්ලා ඔබ කියව ගන්නවා හරිද? වැරදිද? කියලා. මේ හැම එකක්ම වෙනවා. ඒ හැම එකක්ම වියයුතුයි. මේ ගෙනාපු පනතට අපේ විරෝධය පල කරමින් මේ පනත තවදුරටත් ශක්තිමත් කරමින් නිවැරදි කරමින් ඉදිරියට අරගෙන යායුතුයි කියන ස්ථාවරයේ ඉදිමින් මේ යෝජනාවට පිළිතුරු සැපයීම සඳහා අවස්ථාව දෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මුලින්ම ස්තූතිවන්ත වෙනවා පක්ෂ විපක්ෂ සියලු දෙනාටම මේ පනත සම්බන්ධයෙන් ඉතා සාධනීය කරුණු ගණනාවක් ඉදිරිපත් කිරීම සහ මේ සම්බන්ධයෙන් විවාද කිරීම ගැන. මම මුලින්ම කියන්න කැමති අපි විපක්ෂයක් හැටියට කිසිම අවස්ථාවකදී ළමා හිංසනය අනුමත කරන්නේ නැහැ. ළමයින්ට ගැසීම අනුමත කරන්නේ නැහැ. ඒ මත හිටලා නෙවෙයි මේ පනත මේ යෝජනාව ඉදිරිපත් කළේ. මේ යෝජනාව ඉදිරිපත් කළේ හුදු නෛතික පදනමක් මත පිහිටලා මේ පනත ඩ්‍රාෆ්ට් කිරීම මේ පනත ලේඛනගත කිරීමේ දී සහ මෙම පනත ඉදිරිපත් කිරීමේ දී රජය විසින් ගෙන ගිය අරගෙන තියෙන වැරැද්ද පෙන්වා දීම තමයි අපේ සැබෑ අරමුණ වුණේ. මෙතන ඉතාම වගකීමෙන් අපි ප්‍රකාශ කරනවා මෙවැනි පනත් ඉදිරිපත් කරනකොට මීට වැඩිය වගකීමෙන් රජයක් කටයුතු කළ යුතුයි. මගේ මුල් කතාවේ මම පැහැදිලිව සඳහන් කළේ කොතරම් අඩු වුවත් ප්‍රමාණයක අවමානය කිරීම මේ අවමානය කිරීම කියන එක කිසිම අවස්ථාවකදි නිර්වචනය කරලා නැහැ. ඒක භයානකයි. දැන් මෙතන මන්ත්‍රීතුමියන්ලා ගණනාවක් කතා කළා ශාන්තිනි මන්ත්‍රීතුමිය කතා කළා, සෙව්වන්දි මන්ත්‍රීතුමිය කතා කළා. ඔබතුමන්ලා කතා කරලා ඔබතුමියන්ලා සත්භාවයෙන් මේ පනතේ තිබිය යුතු දේවල් ඔබතුමියන්ලාගේ හදවතින් කිවුවාට ලේඛනයක සඳහන් වෙන්නේ නැහැ. යමක් ලේඛනයක සඳහන් වෙන්නේ නැතුව ඔයගොල්ලන්ගේ හිතේ තියෙන අරමුණු නීතිය නෙවෙයි. මේක තමයි රටේ හැමෝටම වැරදුනේ. නීතිය තුල රීඩ් ලොට් ඔෆ් රූල්ස් ඔෆ් ඉන්ටර්ප්‍රිටේෂන්. දැට් ඊස් බැඩ් දැට් ඊස් ඩේන්ජරස්. ඒ නීතිය අර්ථ දැක්වීමට ඒ පුළුල් පරාසයක් ලබාදීම භයානකයි. අන්න එතන ඉඳලා තමයි අපි කටයුතු කළේ මන්ත්‍රීතුමියන්ලා. එතකොට මේ අවස්ථාවේ දී මේ පනත ගේන්න ඕන අවමානය නිර්වචනය කරන්න පුලුවන් යුනයිටඩ් නේෂන් කන්වෙන්ෂන් ඔෆ් හියුමන් රයිට්ස් සෙක්ෂන් එයිට් පැහැදිලිව සඳහන් වෙනවා ළමයින්ගේ වරද ශාරීරික දඩුවම සහ මානසික දඩුවම ගැන නිර්වචන සඳහන් වෙනවා. ඒ නිර්වචන මේකට ගේන්න. අපි දන්නවා 2006 අයි.සි.සී.පී.ආර්. ඇක්ට් එක ගෙනවා. අයි.සි.සී.පී.ආර්. ඇක්ට් එක ගෙනෙල්ලා ඒ ඉන්ටර්නැෂනල් කන්වෙන්ෂන් සිවිල් ඇන් පොලිටිකල්

ඇන් රයිට්ස් කියන එක ලංකාවේ නීතිගත කළා. එතකොට තමයි ඒක බලාත්මක වුණේ. අපි යූ.එන්. කන්වෙන්ෂන්ස් ලංකාවේ රැටිෆයි කළාට ඒක නීතියක් බවට පත්වෙලා නැහැ. ඒක නීතියක් බවට පත් වෙන්නනම් ඒ නීතියට ඇතුලත් වෙන්න ඕන අඩුම ගානේ මේ නීතිය ගේනකොට දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධනයක් ගේන්න ඉස්සෙල්ලා අඩුම ගානේ මේ ආණ්ඩුවට තිබුණා රයිට්ස් ඔෆ් චයිල්ඩ් රෙකග්නයිස් කරන්න යූ.එන්.ආර්.සී. කන්වෙන්ෂනර් එක ලංකාවේ රැටිෆයි කරන නීතිය ගේන්න. අන්න ඒක ගෙනාවානම් ඒක ප්‍රොග්‍රසිව් මෙතන කරන්නේ දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධනයක් ගේන එක. මේක කරන්නේ අර හදිස්සි ගෙනෙල්ලා දානවා. ඇයි මේ හදිස්සිය. නීතියක් ගේනකොට මීට වැඩිය වගකීමෙන් කටයුතු නොකිරීම පිළිබඳ මාලිමා රජයට අපේ අප්‍රසාදය. මම නීතිඥවරියක් හැටියට අම්මා කෙනෙක් හැටියට මගේ අප්‍රසාදය ප්‍රකාශ කරනවා. කිසිම අවස්ථාවකදී මෙතන ඉන්න මාධ්‍ය අයටත් කියනවා වැරදියට රිපෝර්ට් කරන්න එපා. මෙතන ඉන්න විපක්ෂයේ කිසිම කෙනෙක් දරුවන්ට ගහන එක අනුමත කරන්නේ නැහැ. විපක්ෂයේ අරමුණ දරුවන්ට ගැහීම සාධරණය කිරීම නෙවෙයි. මාලිමා රජය විසින් ගෙනෙල්ලා තියෙන වැරදි ප්‍රතිපත්තිය වැරදි නීතිය ගැන සමාජය තුළ කථිකාවතක් වීම. මේක අපි විතරක් නෙවෙයි කියන්නේ ජස්ටිස් මිනිස්ටර් හර්ෂණ නානායක්කාර මොරටුවේ මාලිමා සංවිධායකතුමා එතුමත් කියනවා මේ නීතිය එතුමාම තමයි කියන්නේ තාම නීතිගත කරලා නැහැ මේකට සංශෝධන ගේන්න පුලුවන් කියලා. ඇයි එහෙම කියන්නේ. සංශෝධන ගේන්න පුලුවන් කියලා පාර්ලිමේන්තුවට නීතියක් ඩිබෙට් කරන්න ඕන නැහැනේ. ඉස්සෙල්ලා මේක කතා කරන්න, සමාජ කථිකාවතක් ඇති කරන්න එරස් තියෙන දේවල් ඉදිරිපත් කරලා එතනින් පෙන්වන්නේ ඔබලාගේ ආණ්ඩුවේ ආණ්ඩුකරණයේ දුර්වලතාවය. ඒකයි මෙතන කියන්නේ. ප්‍රගතශීලි රටක් නිර්මාණය කිරීම ගැන අපේ කිසිම විරුද්ධතාවයක් නැහැ. රටවල් ප්‍රගතශීලි වෙන්න ඕන. අපිට 2000 වර්ෂයේ තිබුණ ඒ යාවත්කාලීන නීති හරහා යල් පැනගිය නීති හරහා ඉස්සරහාට යන්න බැහැ. දරුවන්ට දඩුවම් කරනවානම් මෙතුමා කිවුවා වගේ පින්ලන්තයේ ක්‍රමවේද තියෙනවා. නමුත් පින්ලන්තයේ තියෙන ක්‍රමවේද ලංකාවට එහෙම්පිටින්ම ගෙඩිය පිටින් ගෙනෙල්ලා දාන්න බැහැ. අපේ සමාජ මට්ටම් වෙනස්. මේ සමාජ මට්ටම් අපි තේරුම් ගන්න ඕන. මම කියන්නම් දරුවන්ට දඩුවම් කරන්නේ නැතුව  පොසිටිව් රිගින් පෝස්මන්ට් කරන්න පුලුවන්. ක්ලියර් කමියුනිකේෂන්, ටයිම් අවුට්ස් දෙන්න පුලුවන්. කන්සිස්ටන් රූල්ස් ඇන්ඩ් බ්‍රවුන්ඩ්‍රීස් ද මොඩරයිසින් ගුඩ් බිහේවියර් නැචුරල් ඇන්ඩ් ලොජිස්ටිකල් කොන්සික්‍යුක්ෂන් එම්පති ඇන්ඩ් කනෙක්ෂන් මේ ගොඩක් දේවල් තියෙනවා සහකම්පනයෙන් දරුවන්ව හරි මඟට යොමු කිරීම කොහොමද ගුඩ් බිහේවියර් ගැන කතා කරලා දරුවාව හරි මඟට යොමු කරන්නේ. මේ දේවල් තියෙනවා අපි මේ දේවල් නොකර යුතුයි කියලා කිසිම අවස්ථාවකදී කියන්නේ නැහැ. නමුත් එහෙම කරන්න සමාජය තුළ කථිකාවතක් ඇති කරන්න ගුරුවරු දැනුවත් කරන්න. චක්‍රලේඛ ගහන්න. ගිහිල්ලා ඒ පාසල් වල ගුරුවරුන්ව ගෙන්නලා ඒ වර්ක්ෂොප්ස් තියන්න. ඒවා කිසිම දෙයක් කරන්නේ නැතුව එක පාරට මේ ෆිනල් කෝර්ඩ් එකක් ගේන්න අමෙන්මන්ට් එකක් ගේනවා. අමෙන්මන්ට් එක ගේනකන් ෆ්ලෝර්ඩ් අමෙන්මන්ට් එකක් අන්න එතන ඉඳලා තමයි අපි කියන්නේ මම ශාන්තිනී මන්ත්‍රීතුමියට කියනවා ලීවින් රූම් ෆෝ ඉන්ටර්ප්‍රිටෙන්ෂන් ඊස් අ බෑඩ් රිසිඩන්ස් දැට් ඕපන් ඩේන්ජර් කැලස් රෙස්පොන්සිබල් ලෝච්ස් අෆ් ආර් ඩෙන්ජරන්ස්. ලෝස් ලෝන්ග් කාර්ඩ් චේන්ජ්. නීතියට පමණක් මේ රට වෙනස් කරන්න බැහැ. සෝෂල් එඩියුකේෂන් තියෙන්න ඕන හැබැයි ඒ සෝෂල් එඩියුකේෂන් කරන්න මාලිමා රජය මේ පනත ගේන්න ඉස්සෙල්ලා කළ යුතුයි. හැබැයි ඒක කරලා නැහැ. එතකොට ඔබතුමන්ලා රටේ සමාජයේ වෙනස් මට්ටම් තේරුම් අරගෙන නැහැ. මේ මන්ත්‍රීතුමිය කිවුවා රෝයල් කොලේජ් එකෙයි විශාඛා එකෙයි තියෙන තත්ත්වයෙයි මොරටුව ඉස්කෝල වල තියෙන තත්ත්වයයි වෙනස් කියලා. හරියට හරි. එකම නීතිය සම ලෙස හැමෝටම අප්ලයි වෙන්නේ නැහැ. සමාජ මට්ටම් හඳුනා ගන්න ඕන. එතකොට ඒ වගේ වෙනස් සමාජ මට්ටම් තියෙනකොට නීතිය පැහැදිලිව ඩිෆයින්ඩ් වෙන්න ඕන. නීතිය පැහැදිලිව සඳහන් වෙන්නේ නැතිනම් ඉට් ලීව්ස් ෆෝ රූම් ඉන්ටර්ප්‍රිටේෂන් ඒක ඊට වැඩිය භයානකයි. මෙතනින් අපි විපක්ෂයක් හැටියට කියන්න හිටියේ මම නැවත නැවතත් කියනවා අපි කිසිම අවස්ථාවක දරුවන්ට ගහන එක අනුමත කරන්නේ නැහැ. සෙව්වන්දි මන්ත්‍රීතුමිය කතා කරනකොට කිවුවා එතුමියගේ කතාවේ සම්පූර්ණයෙන්ම හැඟෙවුවේ හරියට අපි දරුවන්ට ගහන්න කියලා අනුමත කරනවා. සෙව්වන්දි මන්ත්‍රීතුමියගේ කතාවෙන් හැඟී ගියේ අපි කිසිම අවස්ථාවකදී විපක්ෂයක් හැටියට අපි දරුවන්ට ගහන එක කිසිම අවස්ථාවකදී සාධාරණීකරණය කරන්න ගියේ නැහැ. මේ පනත ගේනවානම් මීට

වැඩිය වගකීම් විරහිතව කටයුතු කරන්න. ඒකට සංශෝධන ගේන්න ඩිෆයින්ඩ් කරන්න. මමඅර ඉස්සෙල්ලා කිවුවා වගේ යුනයිටඩ් නේෂන් හියුමන් රයිට්ස් කන්වෙන්ෂන් ෆෝ රයිට්ස් ෆෝ ද චයිල්ඩ් ඒක නීතිගත කරන්න. ඉස්සෙල්ලා ඒක නීතිගත කරලා දරුවන්ගේ අයිතිවාසිකමට ඊට වැඩිය තැනක් දෙන්න. ඊට පස්සේ ගේන්න මේ නීති. අපි ප්‍රගතිශීලී දේවල් අනුමත කරමින් සහ මේ වගේ වගකීම් විරහිත නීති නොගත යුතුයි කියන පදනම මත සිටලා තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, දැන් ඉදිරිපත් වූ අංක 05(10) යෝජනාවට ඡන්දය විමසනවා.

**අංක 05(10) යෝජනාවට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
14. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලීප් රොෂාන් කුමාර පෙරේරා මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
21. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
23. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිළිනි නෙත්සරණී මෙනවිය

**අංක 05(10) යෝජනාවට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා

| | | | |
|---|---|---|---|
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**අංක 05(10) යෝජනාව වැඩි ඡන්දයෙන් ප්‍රතික්ෂේප විය.**

**(එම අවස්ථාවේ දී මහා නගර සභා මන්ත්‍රී ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා සභා ගැබෙහි නොසිටියහ.)**

## 06. <u>2025 සැප්තැම්බර් මස ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශන් සළකා බැලීම.</u>

**06(1) 2025.09.16 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ එච්. අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 02(1) කරුණ මොරටුව මහා නගර සභාවට අයත් නමුත් දීර්ඝ කාලීන පදිංචිකරුවන් පදිංචි ඉඩම් වල ඔප්පු බැහැර කිරීම සඳහා සභාව වෙත දැනට ලැබී ඇති හිමිකම් සහතික සම්බන්ධයෙන් වාර්තාවක් මීළඟ කමිටුවට ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලසන්න කියලා තියෙනවා. මම දැනගන්න කැමතියි ඔප්පු බැහැර කිරීම කියන්නේ මොකක්ද කියලා?

**<u>මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙතන බැහැර කිරීම කියලා අදහස් කරන්නේ ඇත්තටම ඔවුන් වෙත ලබාදීම කියන අදහස. ප්‍රදානය කියන අදහසම තමයි. අපේ ආයතනය තුළින්, එක එක අංශ තුළින් අවශ්‍ය තොරතුරු ටික දුන්නට පසුව තමයි මේ ක්‍රියාවලියට අපිට යන්න පුළුවන්. ඒ වචනය මම හිතන්නේ මම ම පාවිච්චි කළා නෙමෙයි නමුත් මම හිතනවා ඒකේ බරපතල වරදක් නැහැ කියලා. ඔප්පු ප්‍රදානය සඳහා අපේක්ෂාවෙන් කියන වචනය තමයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ එච්. අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ සභාව සතු ඉඩම් අපි කොහොමද දැනගන්නේ කියලා වාර්තාවක් ඇති මම හිතන්නේ. ඒ සම්බන්ධව සාකච්ඡා කරලා ගත්තා නම් ගොඩක් හොඳයි. මේ බැහැර කිරීම කියන වචනය යෝග්‍ය නැහැ. මොකද ඒකට හරි වචනයක් දැම්මා නම් හොඳයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තීරණයක් ගමු. මේ පිළිබඳව ඒ ඒ මන්ත්‍රීවරුන්ට දැනුවත් කරලා තියෙනවා දැනට ඒ නිවෙස් වලට ගිහිල්ලාම පුළුවන් නම් හැකිතාක් ඔවුන්ව ඔබේ ඔප්පු ලබාගන්න පුළුවන්, ඒ සඳහා ගණකාධිකාරීතුමිය (ආදායම්) මුණගැහිලා විස්තර

ගන්නත් පුළුවන් කියලා. කොපමණ මුදලක් ඔවුන් විසින් ගෙවන්න ඕනෙද කියලා ඒ පිළිබඳව අවබෝධය ලබාගන්න කියලා.

**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ එච්. අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම 02(12) කරුණ සම්බන්ධයෙන් අපේ ගොඩක් මන්ත්‍රීවරු නොදන්නාකම නිසා ද දන්නේ නැහැ ගොඩක් පාරවල් හදන්න කියලා ඔබතුමාට ලියුම් එවලා තියෙනවා. ලියුම් එව්වාම ඔබතුමා කමිටු වලට දානවා. දැම්මොම තාක්ෂණ නිලධාරී ගිහින් වාර්තා ලබාදෙනවා. වාර්තා ලබාදීලා ගොඩක් අයිතම තියෙනවා යෝජක මන්ත්‍රීතුමා වෙත දන්වා යැවීමට නිර්දේශ කළා කියලා. පොඩ්ඩක් අපි දැනුවත් කළා නම් හරි පාරක් පළල අඩි 10 නම් දිග මීටර් 100 නම්, ඒක මහා නගර සභාවට අයත් නැත්නම්, දැන් දිගින් දිගටම මෙහෙම යෝජනා ගෙනෙද්දි මේවා පිරෙනවා විතරයි වෙන්නේ. ඒක ගැන කට්ටියව දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි,02(7) කරුණ සම්බන්ධයෙන් මම ගිය පාරත් මේ සභාවේ මේ ප්‍රශ්නය ඇහුවා.පාරක් පවරා ගැනීමේදී කරනු ලබන කාර්ය පටිපාටිය.අපි දන්නවා අත්සන් ලේඛනය දීලා එෆිඩෙවිට්ස් දීලා පාර පවරා ගැනීම සම්බන්ධයෙන්.ඊටපස්සේ ඇමුණුම -05 නීති නිලධාරී විසින් එයාගේ රෙකමන්ඩේෂන් එක දෙනවා. අංක 3 කියනවා යම් ඉඩමක අයිතිකරු බවට හිමිකම්පාන තැනැත්තෙකු විසින් වර්තමානයේ බලපවත්නා නීත්‍යානුකූල ක්‍රමවේදය අනුව ඉඩම පවරාදෙනු ලබන්නේ නම් පමණක්,එකී ඉඩම සභාව සතු කරගැනීම නිරවුල් හා නීත්‍යානුකූල බවයි.එතකොට සොයිල් රයිට් ඕනෙද පවරාදෙන්න. එතකොට සොයිල් රයිට් ඕනෙ පවරාදෙන්න කියලා එතුමිය නිර්දේශ කරනවා නම්,දැන් වර්තමානයේ පාරවල් පවරා ගැනීමට අත්සන් ලේඛනයක් දෙනවානේ.දුන්නාම පවරාගන්නවා. මෙතන ඇමුණුම -05හි නීති නිලධාරී කියනවා පවරාගන්න ඕනනම් සොයිල් රයිට් ඕන,හිමිකම්පාන තැනැත්තෙකු විසින් වර්තමානයේ නීත්‍යානුකූල ක්‍රමවේදය අනුව ඉඩම පවරාදෙනු ලබන්නේ නම් පමණක්,ඉඩම සභාව සතු කරගත යුතුයි.දැන් අපි මෙච්චර කල් කරගෙන යන ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම වැරදි ද? මේක විශාල ප්‍රශ්නයක්.මේකෙම තියෙනවා හැමතැනම අත්සන් ලේඛන ලබාදීලා පාරවල් පවරාගෙන පාරවල් හදනවා.මෙතනත් තියෙනවා. ඇමුණුම - 12.මේක සෙක්ෂන් 49 එක හා සම්බන්ධයි. ඇමුණුම -12 තියෙනවා අත්සන් ලේඛනයක් කඩලාන පුවක්අරඹ ප්‍රදේශයේ. එතකොට අත්සන් ලේඛනයයි මැප් එකයි දීලා පවරාගෙන.එතකොට දැන් නීති නිලධාරී ඇමුණුම -05 න් කියනවා හිමිකම් පාන තැනැත්තා විසින් පවරාදෙනු ලබන්නේ නම් පමණක්,සොයිල් රයිට් එක,ඉතින් එතුමිය නීතිය පැත්ත කතා කරන්නේ. එතකොට අපි මෙච්චර කල් සභාව විසින් කරගෙන ගිය ක්‍රමවේදය වැරදි ද?

**මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, අපේ ඉඩම් නිලධාරියා අපිට පැහැදිලි කරපු විදිහට සෙක්ෂන් 49 එකේ බොහෝම සිම්පල් සිස්ටම් එකක් තියෙනවා ඉඩම් පවරාගන්න. ඒකට ඒ පාරේ වෙසෙන ජනතාව නගරාධිපතිතුමා ඉදිරියේ අත්සන් කරන සරල ඇග්‍රීමන්ට් එකකින් පාර පවරාගන්න පුළුවන්. අපි මීට වඩා බොහොම කොම්ප්ලිකේටඩ් සිස්ටම් එකකට තමයි කරලා තියෙන්නේ මීට ඉස්සෙල්ලා. හැබැයි දෙහිවලින් හම්බෙලා තියෙනවා ඒ ඇග්‍රීමන්ට් එකේ කොපි එකක් අපි ඒක රැටිෆයි කරන්න හරි ඒක වෙට් කරන්න දීලා තියෙනවා ලීගල් ඔෆිසර්ට. ලීගල් ඔෆිසර්ගේ රිපෝට් එකක් එන්න ඕන. ඕකට ගහිල්ලා තියෙන්නේ මොකද හුඟක් පාරවල් වල ඕනර්ස් හා නව් දිස් ඊස් දේ ආ ගෝන්. ඉතින් දැන් ඒක නිසා සොයිල් රයිට් තියෙන කෙනක් නැහැ පාර පවරන්න.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, මට තේරෙනවා සෙක්ෂන් 49 එකයි අපි කරගෙන යන ක්‍රියාමාර්ගයයි. ඒක නෙමෙයි මම මෙතන කතා කරන්නේ නීති නිලධාරී ඇමුණුම - 05 හි කියනවා මහා නගර සභා ආඥා පනතේ 49 වන වගන්තිය යටතේ යම් ඉඩමක් සභාව සතුවීම සඳහා එකී ඉඩමේ අයිතිකරු බවට හිමිකම්පාන තැනැත්තාගේ කැමැත්ත හා නගරාධිපතිවරයා හෝ නගරාධිපතිවරායා විසින් ලිඛිතව බලය පවරන ලද තැනැත්තෙකු ඉදිරිපිටදී ඒ බවට ඔහු විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ වාර්තාවක් ප්‍රමාණවත් වේ. මෙහිදී යම් ඉඩමක අයිතිකරු විසින් පමණක් ලියවිල්ලකින් තම දේපල සභාව සතු කර දිය හැකි වන බව පැහැදිලි වේ. එබැවින් යම් ඉඩමක අයිතිකරු බවට හිමිකම් පාන තැනැත්තෙකු විසින් වර්තමානයේ බලපවත්නා නීත්‍යානුකූල

ක්‍රමවේදය අනුව ඉඩම පවරාදෙනු ලබන්නේ නම් පමණක් එකී ඉඩම සභාව සතු කරගැනීම වඩාත් නිරවුල් හා නීත්‍යානුකූල බවයි. එතකොට අපි කරගනෙ යන ක්‍රමවේදයට පටහැනියි මෙතුමිය කියන දේ. එතකොට යම් අවස්ථාවකදී සොයිල් රයිට් ඔන ජීවත්ව ඉන්නවා නම් සභාව සොයිල් රයිට් ඕනර්ගෙන් රයිට් එක ගන්න ඕන පාර පවරාගන්න. එතකොට නීතිමය තත්වය සහ ඇක්ට් එකේ තියෙන තත්වය. සභාවේ නීති නිලධාරී මේ කියන්නේ. එතුමිය වගකිවයුතු තැනැත්තියක්. එතුමිය කියන දේ සහ අපි කරගනෙ යන කරුණ පටහැනියි. මම ආණ්ඩු පක්ෂයෙන් මේකට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ එච්. අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් අපේ පාරක් තියෙනවා නම් අපි ඔක්කොම අත්සන් කරලා භාර දෙනවා ලිඛිතව. එතකොට අපේ ෆෝමැට් එකක් තියෙනවා. ඒ ෆෝමැට් එක නගරාධිපතිතුමාට දුන්නාම නගරාධිපතිතුමා අත්සන් කරනවා. අත්සන් කරාට පසුව පාර අපේ නගර සභාව සතු වෙනවා. මේ නීති නිලධාරීතුමිය කියන විදිහට මේකේ අයිතිය සම්බන්ධව, අපි වරිපනම් අංකයත් එක්ක තමයි දෙන්නේ. ඒක ප්‍රමාණවත් මම හිතන හැටියට. ඇමුණුම අනුව අපිට ඒක ප්‍රමාණවත් නොවෙයි වගේ තමයි පේන්නේ. පොඩ්ඩක් ඒක විග්‍රහ කළා නම් හරි.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, එතුමිය කරන ප්‍රකාශය අනුව මෙච්චර කල් අපි කරගෙන ගිය ක්‍රමවේදය වැරදි බවට එතුමිය කියනවා. එතනම තියෙනවා ඇමුණුම 12 කඩලාන පුවක්අරඹ හන්දිය අතරමැද පිහිටි නිවාස සඳහා පවතින පුද්ගලික මාර්ගය නගර සභාව වෙත පැවරීම කියලා අත්සන් 6 කින් ලේඛනයක් සහ ප්ලෑන් එකකුයි දෙනවා. එතකොට මෙච්චර කල් සභාවේ මන්ත්‍රීවරුත් කරලා තියෙන්නේ එහෙම අත්සන් ලේඛනයක් මත පාරවල් පවරා ගැනීම. කරුණාකරලා මේක පැහැදිලි කරන්න. මේ කරන ක්‍රමවේදය වැරදි නම් නිවැරදි ක්‍රමවේදය කියන්න.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, මටත් මේකේ ගැටළුවක් දැනුණා. අපි පවත්වාගෙන යන ක්‍රමවේදයක් තියෙනවා. ඒ ක්‍රියාවලියට බාධාවක් වෙනවා මේ අදහස. නීති නිලධාරීතුමිය ඔබට පැහැදිලි කිරීමක් තියෙනවාද?

<u>**නීති නිලධාරී - ටී. සමරරත්න මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, 49 වගන්තියේ කියලා තියෙන්නේ අයිතිකාරයාට තමයි දෙන්න පුළුවන් කියලා. ප්‍රවේශ අයිතිය තියෙන අයට දෙන්න පුළුවන් කියලා එකක් 49 වගන්තියෙන් කියවෙන්නේ නැහැ. තියෙන විදිහ වැරදියි. දැන් හල්ලනකුඹුර ඉඩම ගත්තෙත් පාර දෙපැත්තේ අය, ඒවා කොටස්නේ. ඒගොල්ලෝ පාර පළල් කරන්න කෑලි කෑලි දුන්නා. අයිතිකාරයට කෑලි දෙන්න පුළුවන්. ප්‍රවේශ අයිතිය තියෙන කෙනෙකුට ඉඩම පවරලා දෙන්න බැහැ සභාවට. මුල් අයිතිකාරයා පසු අයිතිකාරයට ඒක අපිට දෙන්න. 49 වගන්තියේ තියෙන විදිහට ලියවිල්ලක් දෙන්න පුළුවන් වෙන්නෙත් මුල් අයිතිකාරයට විතරයි. ඉන්පසුව අයිතිය තියෙන කෙනාට විතරයි. ඒ නිසා ප්‍රවේශ අයිතිය තියෙන අය අත්සන් කරලා දෙනකොට ඒක සභාවට පැවරෙන්නේ නැහැ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ කියන්නේ රයිට් ඔෆ් වේ තියෙන අයට අත්සන් කරලා දෙන්න බැහැ. එහෙනම් මෙච්චර කල් සභාව කරලා තියෙන ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම වැරදියි. එතකොට මේ ඉඩම් කමිටුවේ පාරවල් පවරා ගැනීමට මේ සභාව විසින් අනුමත කරලා තියෙන ක්‍රමවේදයත් සම්පූර්ණයෙන්ම වැරදියි. එතකොට ඒ සම්බන්ධයෙන් මුදල් යොමු කරලා පාරවල් නඩත්තු කළා නම් ඒකත් වැරදියි.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, ඒ නිසා අපි කොහොමත් නැවත මෙම කමිටුවේදී මේක සාකච්ඡා කරමු මොකද වැරදියි වැරදියි කියලා වෙනම කතන්දරයක් කරනවට වඩා අපි විශාල අසීරුතාවයකට පත්වෙනවා පාරක් පවරාගන්නකොට.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, සමාවෙන් ඔබව අපහසුතාවය පත් කිරීමට නොවෙයි කිව්වේ.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය, නැහැ මට පැහැදිලියි. දැන් පාරක් පවරාගත් විධි ක්‍රමය අපිට පමණක්ම බැහැ අවසානයේ පළාත් පාලන කොමසාරිස්ගේ පවා අනුමැතිය ඕනෙ. පාරක් පවරාගන්න විදිහක් නැහැ. ගැටළු ගොඩකට මුහුණ දෙනවා. 49 වගන්තිය පොඩ්ඩක් කියවන්නකො.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, මම කියවන්නම්. "යම් වීථියක් සළකුණු කිරීම, හැරවීම, විපථ කිරීම, පළල් කිරීම, විවෘත කිරීම, විශාල කිරීම හෝ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුගේ ඉඩමක සන්තකය මහජන ප්‍රයෝජනය සඳහා ලබා ගැනීමට යම් නගර සභාවකට අවශ්‍ය වී ඉඩම ඒ කාර්යය සඳහා සභාවට තෑගි කිරීමටත්, ඒ සඳහා වූ වන්දි වලට ඇති සියලු හිමිකම් පෑම් අතහැරීමටත්, ඒ ඉඩමේ අයිතිකරු බවට හිමිකම්පාන තැනැත්තා කැමති වන්නේ නම්, ඒ බවට නගරාධිපතිවරයා ඉදිරිපිටදී හෝ තත්කාර්ය සඳහා නගරාධිපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තෙකු ඉදිරිපිටදී පළමු කී තැනැත්තා විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ වාර්තාවක් ඉඩම සභාව වෙත සතුවීම සඳහා ප්‍රමාණවත් වන්නේය. ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහ සාක්ෂිකරුවන් විසින් සහතික කිරීම පිළිබඳව වංචා වැළැක්වීමේ අඥා පනතේ 2 වන වගන්තියේ නියමයන්ට අනුකූල නොවීම හේතුව නිසාම පමණක් එකී කිසිඳු වාර්තාවක් අවලංගු වූ ලෙස නීතිය හෝ අනුව බල රහිත වූ ලෙස සැළකිය නොහැකිය." ඉතින් මෙතනින් කියන්නේ සොයිල් රයිට් ඕර්නර් පවරාදෙන්න ඕනෙ. සොයිල් රයිට් ඕර්නර් විසින් ඒ පාරට තියෙන අයිතිය අතහරින්නත් ඕන. එතකොට අයිතිය අතහැරීමේ ඔප්පුව තියෙන්නත් ඕන. තමුන්ගේ රයිට් එක රිවෝර්ක් කරනවා කියලා අයිතිය අතහැරීමේ ඔප්පුව තියෙන්නත් ඕනෙ, සොයිල් රයිට් ඕර්නර් පවරන්නත් ඕනෙ. ඒ ක්‍රමවේදය විතරයි. දැන් එතකොට මේ හරහා මේ අත්සන් ලේඛන දීලා පාරවල් පවරාගැනීමේ ක්‍රමවේදය කරන්න බැහැ.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, අපිට තවදුරටත් පනතතේ තව වගන්ති ගණනාවක පැහැදිලි කිරීම් තියෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේ පනතේ යම් යම් වගන්ති තියෙනවා. එක වගන්තියක් තමයි මේ තියෙන්නේ. මේ වගන්තිය අනුව තමයි මේ කියන කතාව වෙන්නේ. මේකේ තව වගන්ති තියෙනවා ඒවා හරහා ඒ වගන්ති වලට අනුකූලව තමයි මෙතෙක් කල් නගර සභාව ක්‍රියාත්මක වුණේ. එතකොට ඔබතුමා ඊළඟ කමිටුවට ගන්න අපි ඒ වගන්ති ටික බලලා ඒකට අවශ්‍ය කටයුතු කරමු. දැන් මේ හදිසියේ කඩිමුඩියේ තීන්දුවක් ගන්නේ නැතුව.

**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පිරිස් මහතා**

අනික් එක තමයි ගරු නගරාධිපතුමා අපි මොරටුව නගර සභාවේ අඩි පහේ හයේ පොඩි පාරවලුත් අපි පසුගිය ටිකේ සංවර්ධනය කළා. ඒකට විශේෂ අනුමැතියක් ගත්තා අපි මන්ත්‍රීවරුන්ට මතක ඇති. පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියෙන් ඔවුන්ගේ පොඩි පාරවල් වල අයිතිය පවරලා දෙන්න තමයි මට හිතෙන්නේ. සභා අනුමැතියක් අරගත්තා අරෙහෙටත් මම හිතන්නේ යැවුවා. ඔබතුමා පොඩ්ඩක් හොයලා බලන්නකෝ දැන් වැඩේ කියන්නේ ප්‍රශ්නෙ තියෙන්නෙ නගරාධිපතිතුමා මේක අපි වෙන ක්‍රමයකට අනුව මේක පවරාගෙන පාරක් සංවර්ධනය කරලා තියෙනවනම් යම් විදියකින් යම් පාර්ශවයක් විසින් කියන්න පුළුවන් අපේ පාර එහෙම නොකරන්නේ ඇයි කියලා. හැබැයි එහෙම කළොත් එහෙම ඔවුන් නඩු මාර්ගයකට ගියොත් එහෙම අපි ගන්ධබ්බ අවධියකට පත්වෙනවා. එතකොට ඔබතුමත් අපහසුතාවයකට පත්වෙනවා. නගර සභාවේ විදියට සමස්ත අපිව අපහසුතාවයකට පත්වෙනවා. එතකොට ඔබතුමන්ලාට කිසිම වැඩක් කරන්න හම්බවෙන්නේ නැහැ මේ ඉදිරි කාලය තුළ. ගරු නගරාධිපතිතුමනි, ඒකත් එක්කම හතරවෙනි කාරණාව තියෙනවා අපේ පොලිස් මුරපොලක් හදන්න අපේ කිරිහල තිබුණු ස්ථානයේ අවසරයක් ඉල්ලලා නිර්දේශයක් ලබාගෙන තියෙනවා කියලා. නිර්දේශ කරා කියලා. එතකොට ගරු නගරාධිපතිතුමනි, මේක තාවකාලික මුරපොළක් ද? එහෙම නැත්නම් අර එගොඩඋයනේ

තියෙන වගේ මුරපොළ තියෙන තත්ත්වය වගේ ස්ථාවර මුරපොලක්ද කියන එක පිළිබඳ පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. එහෙම අර එගොඩඋයනේ හැදුවා වගේ මුරපොල කියන සංකල්පයෙන් හදපු එකක් නම් ස්ථාවරයි. එතකොට ඒකෙදි අපිට පොලිසිය විසින් යම් ගෙවීමක් කරනවද? එහෙම නැත්නම් අර පොඩි මුරපොලක්ද කියන එක පොඩ්ඩක් තාවකාලික එකක්ද කියලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 2025.09.16 දින පැවති ඉඩම් කමිටු වාර්තාවේ අංක 02(7) කරුණ ඉවත් කිරීමට යටත්ව ඉඩම් කමිටුවට ඡන්දය විමසනවා.

**2025.09.16 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(7) කරුණ හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.09.16 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(7) කරුණ හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

| | | | |
|---|---|---|---|
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය |

**2025.09.16 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ අංක 02(7) කරුණ හැර අනෙකුත් සියලුම නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මෙම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් සභා ගැබෙහි නොසිටියහ.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා) |

**06(2) 2025.09.16 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි නිවැරදි කිරීමක් කරන්න මට අවසර දෙන්න. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අපේ විවාදය පැවති වෙලාවේ මගේ අතින් මේ සභාවට නොගැලපෙන වචනයක් කියවුණා. ඉතින් මම ඉල්ලා සිටිනවා ඒ වචනය මම ඉල්ලා අස්කර ගන්නවා. ඒ හරහා අපේ ජාතික ජනබලවේගයේ මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා යම් කිසි සිත් තැවුලක් සිදු වුණානම් කනගාටුව පළ කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙර පාසල් ගුරුවරියන්ගේ පැත්තෙන් ඉල්ලීමක් ආවා ඒගොල්ලන්ට මේ වෙනකොට ලැබෙන්න ඕන නිල ඇඳුම සාරිය හා සපත්තු ඒවා මේ වෙනකොට ලැබිලා නැහැ. ඒවා ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම විශේෂයෙන්ම ලෝක ළමා දිනයේ වැඩසටහන අපේ සභාවේ පහුගිය දවසක පැවැත්වුවා. ඇත්තටම බොහොම අලංකාරවත්ව ඒ ළමා දිනයට ගැලපෙන විදියට පැවැත්වීම සම්බන්ධයෙන් ඔබතුමා ඇතුළු අපේ මහජන උපයෝගීතා කමිටුවේ සභාපතිතුමියගේ ඉඳලා සියලුම මන්ත්‍රීවරුන්ටත් ඒ වගේම විශේෂයෙන්ම නිලධාරීන්ට තාරක මහත්තයා විශාල මහන්සියක් ගත්තා. දුල්සිරි මහත්තයා ප්‍රජා සංවර්ධන නිලධාරී තුල්සිකා මහත්මිය කොමසාරිස්තුමිය හිටියේ නැති වුණත් එතුමියගේ සම්පූර්ණ සහයෝගය එතන තිබුණා. මට කියන්න ඕනකම තිබ්බේ ඉතාමත් හොඳට ලස්සනට පිළිවෙලට ළමා දිනයට ගැලපෙන විදිහට ඒ අවුට්ලුක් එකයි ඒ කියන්නේ පිට පෙනුමයි අභ්‍යන්තරයයි දෙකම හොඳට සිද්ධ වුණා. මේ සම්බන්ධයෙන් මගේ ප්‍රසාදය පළ කරනවා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, සාහිත්‍යාංජලී සාහිත්‍ය උත්සවයේ මිල ගණන් සම්බන්ධයෙන් යම් අපැහැදිලිකමක් තිබුණා කියලා මට කලින් පෙත්සන් පැමිණි යටතේ කවුරුහරි අපේ මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කළා. මම කියන්න ගත්තේ ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මිල ගණන් සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. සාහිත්‍ය වැඩේට ලක්ෂ

දහය නෙවෙයි පහළොව විස්ස වුනත් අවුලක් නැහැ මොරටුවේ ඒ සාහිත්‍ය උත්සවයේ තියෙන සාර්ථකත්වයේ තියෙන ගතිකත්වය අරමුණ ජයග්‍රහණය කරන්න. මෙතනදි තියෙන කාරණාව තමයි ගරු නගරාධිපතිතුමනි, දැන් අපි මෙවර මේ ආකෘතිය නගර සභා අකෘතියේ කියන එකට මෙවර කරමු. ලබන වර මමත් යෝජනාවක් දැම්මා ඒ යෝජනාව මම ලබන අවුරුද්දට කල් තිබ්බා නමුත් ලබන අවුරුද්දේ සාහිත්‍ය උත්සවය මොරටුවේ ජනතාවටත් සහභාගි වීමට පුළුවන් මොරටුවේ දරුවන්ටත් සහභාගි වීමට පුළුවන් අපේ ආයතනයේ ඉන්න අයටත් සහභාගී වීමට පුළුවන් විදියේ ටිකක් පළල් සාහිත්‍යය උත්සවයක් කරමු කියලා ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙහි මතුවන කාරණයක් තමයි අපේ ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමත් මමත් පල්ලෙහා ඉන්නකොට අපේ පෙර පාසල් ගුරුවරු කීහිපදෙනෙක් මතක් කරපු කාරණාවක් තමයි පිපෙන කැකුළු පෙර පාසලේ මේ වනවිට ඒ දරුවෝ ටිකට ගරු නගරාධිපතිතුමා උඩට නගින්න තියෙන්නේ ස්ටෙයා කේස් එකෙන්. ඒ ස්ටෙයා කේස් එකට ආරක්ෂිත වැටක් නැහැ. ඒ නිසා කොයි වෙලාවේ හරි ගිහිල්ලා වැටෙන්න පුළුවන්. ඒ නිසා මේ වෙනකොට අපේ ගරු ඉංජිනේරුතුමාගෙන් ඒ පිළිබඳව ඉල්ලීමක් කරලා තියෙනවා. ඒක එකක් සහ ඒ වගේම වහලේ ෂීට්ස් තුනක් මාරු කරන්න තියෙනවා කියලා කිව්වා. ඒ නිසා මම හිතන්නේ අපිට හැම වැඩක්ම බොහොම යුහුසුළුව කරල දෙන තරුණ ඉංජිනේරුතුමෙක්. ඒ නිසා ලබන මාසෙ වෙනකොට අපි හිතනවා මෙය ඉක්මනට කාර්යක්ෂමව අපිට කරලා දෙයි කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම හිතනවා මේක ගැන වචනයක් කිව්වොත් වැදගත් කියලා. එදා පහුගිය ඔක්තෝම්බර් මාසේ තුන්වෙනි දින මොරටුව නගර සභාවේ රැස්වීමක් තිබුණා විශ්‍රාම පෙරපාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය සම්බන්ධයෙන්. අපි දීර්ඝ ලෙස සාකච්ඡා කළා අද දිනයේදී ඔවුන් අපිට ලිපියක් ලබා දුන්නා. ඒක සභාගත කළා. මේ අවස්ථාවේ ඉල්ලීමක් කරන්න කැමතියි මම දන්නවා නීතිය සීයයට සීයක් අපි බලනවද මේ අවස්ථාවේ දී එතනින් එහාට ගිහිල්ලා මානුෂික පැත්තෙන් බලනවද කියලා හිතනවා. මම හිතන්නේ සභාවේ අපි හැමෝටම මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්න යෝජනාවක් සම්මත කර ගැනීමට අවස්ථාවක් ලැබිලා තියෙනවා. නමුත් ඊට ප්‍රථමව මේ සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය කරන්න කියලා මම ඔබ සියලු දෙනාගෙන්ම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරන්න කැමතියි. මේ මහජන උපයෝගීතා කමිටුවේ වාර්තාවේ හතරවෙනි ඇමුණුම සහ ඒ ඇමුණුමට ඇතුළත් කරලා තියෙන ලේඛන සම්බන්ධයෙන් ඔබතුමන්ලා අද දිනයේදී හෝ පසු දිනයකදී ඔබතුමන්ලාගේ අවධානය යොමු කිරීමට මම ඉල්ලා සිටිනවා. එහිදී විශ්‍රාම වැටුප් දැනට මොරටුව නගර සභාවට අනුබද්ධිත විශ්‍රාම වැටුප් පෙර පාසල් ගුරුවරුන් තිස් දෙනෙක් අත්සන් කරලා ලබා දීලා තියෙනවා. ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගණනය සම්බන්ධයෙන් සිදු කළ යුතු සංශෝධනයක් පිළිබඳව. දැන් ඔවුන් මොරටුව මහ නගර සභාවට කාලයක් තිස්සේ සේවය කරලා තියෙනවා. සමහර අය පත්වීම් ලැබීමට බස්නාහිර පළාත් සභාව මගින් තනතුර ස්ථාපනය කිරීමට ප්‍රථමව 1980 ගණන්වල දීමනාවකට වැඩකඩ කරලා තියෙනවා. ඊට පස්සේ දීමනාවකට පස්සේ නගර සභාවේ දීමනාවක් අනුමත කරගෙන වැඩ කරලා තියෙනවා. ඊට පස්සේ 2006 වර්ෂයේ තමයි පළාත් පාලන ගමන විසින් ඒගොල්ලන්ව ස්ථිර කරලා තියෙන්නෙ. එතකොට මේගොල්ලෝ අපෙන් ඉල්ලීමක් කරනවා ඒගොල්ලන්ගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමට මේ අර දීමනා කාල පරිච්ඡේදය සලකන්න පුළුවන්ද කියලා. මුලින් ඒගොල්ලෝ ඒ දීමනාව විශ්‍රාම වැටුපට එකතු කරන්න කියලා ඉල්ලීමක් කලා. හැබැයි අපි තාරක මහත්තයා මේ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු දැක්වුවා. එතනදි කිව්වා ඒ සම්බන්ධයෙන් අමවුන්ට්ස් ඒකවුන්ට්ස් ෆැසිලිටි ඇඩ් කරලා, නැත්නම් ඒ කියන්නේ ඇලෝකේෂන් වෙලා නැතිනම් එහෙම කිරීම අපහසුයි. එතකොට චක්‍ර ලේඛනයට පිටින් නමුත් මේ අවස්ථාවේ ඒගොල්ලෝ ඒගොල්ලන්ගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමට ඉතාමත් මානුෂීය ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කරනවා. ගණනය කිරීමට දේ විල් බී එන්ටයිටිල් ෆො ද පෙන්ෂන් ඒක තමයි මෙතන ඉල්ලන්නේ. ඉතින් මේක මේ අවස්ථාවේ අපි තීන්දුවක් ගැනීමට අවශ්‍යතාවයක් නැහැ ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලීමක් කරනවා. මේ ලේඛන ටික පොඩ්ඩක් අධ්‍යයනය කරන්න කියලා ඉදිරියේදී ඔවුන් විසින් සභාවට යෝජනාවකුත් දාලා තියෙනවා. ඒ යෝජනාව මහජන උපයෝගීතා කමිටුවෙත් අපි සාකච්ඡා කරලා විධිමත් ලෙස නීතිමය ප්‍රතිපාදන, නීතිමය රාමුව ඇතුලේ සභාවේ මන්ත්‍රීවරුන්ට අපි යෝජනාවක් ලෙස ඉදිරිපත්

කරනවා මේ අවස්ථාවේදී අපි සාකච්ඡා කරලා හැකිනම් නීතියේ රාමුවට ඇතුළත්ව මානුෂීය මට්ටමෙන් සලකලා තීන්දු තීරණයක් ගන්න පුළුවන් නම් අපි සලකා බලමු කියලා ඉල්ලීමක් කරන්න කැමතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද පොදු වෙළඳ සංකීර්ණයේ ප්‍රධාන දොර සම්බන්ධව. එය අපේ සභාවේ සේවකයන්ගෙන් අලුත්වැඩියා කර ගන්න බැහැ කියලා. ඒ සම්බන්ධ ඇස්තමේන්තු සකස් කරන්න කියලා තියෙනවා දැන් මේක ගිය මාසෙත් ආවා, එපිට මාසෙත් ආවා. ඒ වගේම තමයි ලිෆ්ට් එක සම්බන්ධව මොකක්ද මේ. දිගින් දිගටම යනවා. ඇස්තමේන්තු කරනවා. මොකක්ද මේ වෙන්නේ?

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

මේ සම්බන්ධව අදහස් දක්වන්න නාගරික ඉංජිනේරුතුමා. මොකක්ද වෙන්නේ කවදාද ඉවර වෙන්නේ. දැන් අපිට ඒ අදාළ ආයතනය එක්ක කතා කරලා. දැන් පේමන්ට් එකක් ආවා නේද ඒකේ. දැන් මේ ගමන ඇවිල්ලද තියෙන්නේ. සැලකිලිමත් වෙන්න අර පෙර පාසලේ විශේෂ ප්‍රශ්ණයක්.

**2025.09.16 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2025.09.16 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
18. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණී මෙනවිය

**2025.09.16 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මෙම අවස්ථාවේ දී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් සභා ගැබෙහි නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා)

**06(3) 2025.09.16 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(07) නිල ඇඳුම් සම්බන්ධ කාරණාවේ දී මේ දාලා තියෙන නිර්දේශය වැරදියි. අපි මෙහෙම නිර්දේශයක් නෙමෙයිනෙ කලේ. අපි ඒ වෙලාවේ කිව්වේ කොමසාරිස්වරියට දවසක් කල් දුන්නා පළාත් පාලන කොමසාරිස් එක්ක කතා කරලා තීන්දු කරන්න කියලා. මෙහි තියෙන්නේ ඊට කලින් ගත්ත ඩිසිෂන් එක තමයි. දුෂ්කරතාවය සම්බන්ධයෙන් කතා කරලා නාගරික කොමිසාරිස්තුමිය කිව්වා කොළඹට දීලා තියෙනවා. ඒ නිසා අපිටත් ගන්න පුළුවන් කතා කරලා කියලා. ඊට පස්සේ අපි කිව්වා කතා කරල බලන්න එහෙනම් කතා කරල බලලා කියලා. මේ නිර්දේශයේ දාන්න එපා නාගරික කොමසාරිස්තුමියගේ පොඩ්ඩක් කතා කරලා ඉවර වෙලා පළාත් පාලන කොමසාරිස් එක්ක තීන්දු වෙනකන් කියලා ඉවර වෙලා. එතකොට ඒ තීන්දුව තමයි අපි දාන්න කිව්වෙ. එතකොට ඒක හරි ගිහිල්ලා නැද්ද

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>**
ගරු නගරාධිපතිතුමනි, මීට අදාළ ලිපිය මේ වෙනකොට ඇවිල්ලා තියෙනවා. නමුත් ඒක කමිටුවට ඒ වෙලාවේ ඇවිල්ලා තිබුනේ නැති නිසා අපිට නැති එකක් දාන්න බැරි නිසා ලේකම්තුමා එක්කත් කතා කරලා ඉදිරි කමිටුවේදී ඒ ලියුමත් එක්ක කටයුතු කරන්න සූදානමින් මේ වාර්තාව ඉදිරිපත් කළා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, පැහැදිලිව නාගරික කොමසාරිස්වරියට දවසක් දුන්නා කමිටුවේදී. මේක මේ කමිටුවේදී දුන්න තීන්දුව. එහෙම නැත්නම් කමිටුවේදී තීන්දු කරන ඒවා එනකොට වෙනස් විදියට නම් එන්නේ අපි කමිටු වලට එන්නේ නැතුව ඉන්නම් ඕගොල්ලන්ට ඕන විදියට කරගන්න. අපි පැහැදිලිව කිව්වා මේ කල් යනවා දැන් මේ ඔක්තෝම්බර් මාසේ තව මාස දෙකයි තියෙන්නේ. දැන් ඊළඟට ආයතන කමිටුව තියෙන්නේ ආපහු අනුමත වෙන්නේ ලබන සභා වාරේ. ඒ මිනිස්සුන්ට කවද්ද මේ නිල ඇඳුම් දීමනාව දෙන්නේ. කමිටුවකට දැම්මට ක්‍රියාත්මක වෙන්න බැහැනේ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි දැන් නිශ්චිත කරගමු. අපිට දැන් ගැටලුවක් නැහැ ලොකු වරදක් නැහැ. ඒ කියන්නේ පළාත් පාලන කොමසාරිස් එක්ක සාකච්ඡා කරලා මීළඟ කමිටුවට වාර්තාවක් ලබා දෙන්න ඊළඟ කමිටුවට තමයි නිර්දේශය තියෙන්නේ කමිටුව මේ ළඟ එනවානේ. කමිටුවට අරගෙන මන්ත්‍රීතුමා මුදල් කමිටුවටත් ගමු.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, එහෙම බැහැනේ. මෙය මුදල් කමිටුවට ගන්න නෙමෙයි. ප්‍රශ්නෙ තියෙන්නේ මේක මේ ආයතන කමිටුව අනුමත වෙන්න ඕනා මේ තීන්දුව නිත්‍යානුකූල වෙන්න.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**
ගරු මන්ත්‍රීතුමා, ඔව්, ඉතින් දැන් අනුමත වෙනවානේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, නැහැ. ඒ වුනාට කමිටුව තියලා දවස් දෙකකට පස්සේ කොමසාරිස්තුමිය කිව්වා මේ වැඩේ හරියි කියලා. දැන් අපිට කියන්න ගරු නගරාධිපතිතුමා දැන් මේ සේවකයින්ට නිල ඇඳුම් දීමනාවනේ දැන් දෙන්නේ. දැන් ලියුම ඇවිල්ලානේ තියෙන්නේ. නිල ඇඳුම් දීමනාව කවද වෙනකොට දෙන්න පුළුවන් වෙයිද කියලා අඩුතරමේ මේ නිලධාරීන්ගෙන් අහලා කියන්න?

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව කිසි බාධාවක් නැහැ. හැකි විගස දෙනවා. අවුරුදු ගණනාවක් දීලා නැහැ නිල ඇඳුම් දීමනා. මම වෙනම සී.එල්.ජී. ට කතා කරලා කිවුවා කොළඹට දෙන්න පුලුවන්නම් ඇයි අපිට දෙන්න බැරි. වහාම ඒ ලියුමේ කොපියක් අපිට එවන්න. අපි ඒ දරපු උත්සහායේ ප්‍රතිඵල තමයි මේ තියෙන්නේ. දැන් අපිට තියෙන්නේ මහා ලොකු එකක් නෙවෙයි ආයතන කමිටුවට අරගෙන මෙය දැන් ඒ ඒ ශ්‍රේණිවල, ඒ ඒ ගණන් මිනුම් ඇතුලේම දෙමු.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ ලියුමවත් අඩුතරමේ මේ සභාවට ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ පිළිබඳව පැහැදිලි කිරීම සඳහා නාගරික ලේකම්තුමාට අවස්ථාව ලබා දෙනවා.

**<u>නාගරික ලේකම් - එම්.කේ.ඩී.ටී.මුණසිංහ මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, පළාත් පාලන ලේකම් විසින් 2025 වර්ෂය තුළ වෙන් කර ඇති අයවැය සීමාව තුළ කළමනාකරණය කරගත හැකි වන පරිදි 2025 වර්ෂය සඳහා පමණක් නිල දීමනාවක් ගෙවීම අනුමත කරන බව ලිඛිතව දන්වා එවා තියෙනවා. එම ලිපිය 2025.09.22 දින සභාව වෙත ලැබී තියෙනවා. ඒ ලිපිය ඊළඟ ආයතන කමිටුවට ඉදිරිපත් කරනවා. කමිටුවේ දී සාකච්ඡා කරලා

වෙන් කරලා තියෙන මුදල් ප්‍රතිපාදන අනුව එක් එක් තනතුරු වලට දිය යුතු නිල ඇඳුම් දීමනාව නිර්දේශ කරන්න කමිටුවට පුලුවන්. කමිටුව නිර්දේශ කරන මුදල සභාවේ දී අනුමත වුණාම අපිට ඒ ගෙවීම් කරන්න පුලුවන්. බොහෝ විට නොවැම්බර් අග හෝ දෙසැම්බර් වෙනකොට නිල ඇඳුම් දීමනාව ගෙවන්න පුලුවන් වෙයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේකේ හතරවෙනි කරුණේ ඇමුණුම පොඩ්ඩක් බලන්න ඕනා. මේ ඇවිල්ලා කෝට් ඔෆ් ඇපිල් කේස් එකේ 47/2020 ඒකේ රිට් ඇප්ලිකේෂන් එකක් ඉල්ලලා තියෙනවා කවුද ළිදමුලගේ ටිරාජ් නිරෝෂන් සිල්වා කියලා ඩොක්ටර් කෙනෙක්. අපි ගිහිල්ලා දැනුම් දීමක් කරන්නේ නැතුව ඉඩම හාරලා පයිප්ප දාන්න කරපු වැඩක් තියෙන්නේ. ඒකට නඩුවක් දාලා තියෙනවා. මේකෙදි නඩුවේ තීන්දුව හම්බවෙලා තියෙනවා. මේ තීන්දුවත් මේකට අමුණලා තියෙනවා. එතකොට අපේ නීති නිලධාරිනී කියනවා ඒ ඇමුණුම 4(3)2 තියෙනවා එම නඩුවේදී පෙත්සම්කරුවන් ඉල්ලා තිබූ සහන අතරින් මොරටුව මහ නගර සභාව හා නාගරික කොමසාරිස්ට එරෙහිව අදාළ දේපළ සම්බන්ධයෙන් තහනම් නියෝගයක් එකී තීන්දුව ලබාදීම මඟින් ලබා දී ඇත. ඒ රිට් එක ග්‍රාන්ට් කරලා තියෙන්නේ එයාට. හැබැයි තවදුරටත් කියනවා එසේ වුවද එම දේපළ පිළිබඳව මහ නගර සභා ආඥා පනත අනුව නීත්‍යානුකූලව කටයුතු කිරීමට මහ නගර සභාව සතු බලය සම්බන්ධයෙන් එකී නඩු තීන්දුව මගින් බලපෑමක් සිදු නොවන බව පෙන්වා දෙමින්. ඒ අනුව අභියාචනාධිකරණ නඩු තීන්දුව සම්බන්ධයෙන් අභියාචනා කරමින් නැවත නඩු කටයුත්තක් සඳහා යෑමේ අවශ්‍යතාවයක් නොමැති බව දැනුවත් කළ සිටීමි. නමුත් මේ ජජ්මන්ට් එකේ අන්තිම පිටුවේ අන්තිම පැරග්‍රාෆ් එකේ කියනවා ඔන්රබල් ජජ් කියනවා ෆොරොම් කන්ටිනුයින් විත් එනි ෆර් ද ඩිගින් කන්ස්ටක්ෂන් ඕ අදර් ඇක්ටිවිටි ඔන් ද පෙටිෂනර්ස් ලෑන්ඩ් එක්සෙප්ට් ස්ට්‍රික්ලි ඉන් අකෝඩන්ස් විත් ද ලෝ ඇන්ඩ් විත් ඩියු නෝටිස් ටු ද පෙටිෂනර් ඇන් හිස් එන්ටයිට්ලමන් ටු ඔබ්ජෙක්ට් ඇන් ටු බී හර්ඩ්. මම මේ ඔබ්ජෙක්ට් කියන එක විරෝධය පල කිරීම කියන ඔබ්ජෙක්ට් කරන්නේ කියන එකේ ප්‍රවිශන් එකක් මම දකින්නේ නැහැ සෙක්ශන් 8 එකේ හරි සෙක්ෂන් 97 හරි. එතකොට ඒකෙන් මට හිතෙන දේ මේ නීති නිලධාරී ඉන්නවනම් පැහැදිලි කරන්න මට හිතෙන දේ තමයි ද පවර්ස් ඔෆ් ද කවුන්සිල් ඊස් ඉන්ෆ්‍රින්ජ්ස් බයි දිස් ඩික්රිස් සෝ විල් ප්ලීස් සම්බොඩි එක්ස්ප්ලේන් අ බවුට් ඉට්. සෝ රියලි ඩෝන්ට් හැව් ටු ෆෝ අපිල්.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, එදා අපි ආයතන කමිටුවේදී මේ නඩු සම්බන්ධයෙන් රැස්වෙච්ච අවස්ථාවේදී නඩු කමිටුවේදී මේ සම්බන්ධව ඉතා දීර්ඝ ලෙස සාකච්ඡා කළා. එය අවසානයේදී ඒක නිම වුණේ කොමසාරිස්තුමියට අපි කිව්වා මේ සම්බන්ධයෙන් රසික දිසානායක කියන නීතිඥතුමාට කතා කරලා මේක ඇපිල් කරන්න ඕනෙද නැද්ද කියලත් අපිට දැනුම් දෙන්න කියලා සභාවට. ඒ සම්බන්ධයෙන් කටයුතු කළාද? කොමසාරිස්තුමියට තමයි අපි ඒ අවස්ථාවේදී කිව්වේ. හේතුව මේ නඩු තීන්දුව මොරටුව මහ නගර සභාවට විරුද්ධව තමයි නඩු තීන්දුව ලබා දීලා තියෙන්නේ. එතකොට අපි දිගින් දිගටම හඬ නැගුවා. එතකොට මේක රයිට් ඔෆ් අපිල් එකක් තියෙනවා. ඉතින් එතකොට ඒ තීන්දුව ලෝයර් කිව්වනම් අපිල් කරන්නේ නැද්ද? ඔපිනියන් එක ඉන්රයිටින් ගෙන්න ගන්න කියලා කිව්වා. මෙතන නඩු කමිටුවට මාත් එක්ක හිටපු නීතිඥතුමන්ලා ඉන්නවා. නිලධාරීන් විසින් නඩු කමිටුවේදී ඉතා දීර්ඝ ලෙස සාකච්ඡා කළා. අපේ අප්‍රසාදය පල කළා මේ නඩු සම්බන්ධයෙන්. නඩු සම්බන්ධයෙන් දක්වන උනන්දුව සහ ඒ ෆයිල් මෙන්ටේන් කිරීම සම්බන්ධව සහ මෙවැනි නඩු තීන්දු සම්බන්ධයෙන් නගර සභාවට කරන දැනුවත් කිරීම සම්බන්ධයෙන් අපේ අප්‍රසාදය අපි දැඩි ලෙස ප්‍රකාශ කර සිටිනවා. නමුත් මේ නිලධාරීන් ඉතාම වගකීම් විරහිත ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් ඔබතුමා තීන්දුවක් ගත යුතුයි. දැඩි තීන්දුවක් ඔබතුමා ගත යුතුයි. මේ නඩුවලට මේ නගර සභාවේ මුදල් වියදම් වෙනවා. එතකොට නගර සභාවේ අයිතීන් ආරක්ෂා කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. දැන් වෙනදට නගර සභාවේ මේ ආයතන කමිටුව වාර්තාවට නඩු කමිටු වාර්තා ඇතුළත් වෙනවා. අද ඒ නඩු කමිටු වාර්තා ඇමුණුමත් නැහැ. මේකේ 02(1) ගැන සාකච්ඡා වුණාට නඩු වාර්තාව මේකට ඇතුළත් වෙන්න ඕන. ඒක ආයතන කමිටුවේ තිබිය යුතු දෙයක් නැත්නම් මේ මන්ත්‍රීවරු කිසිම දෙනෙක් මේ නඩු සම්බන්යෙන් මොනාද ප්‍රගතිය පිළිබඳව දන්නෙත් නැහැ. එතකොට ඒකත් නැහැ මෙතන. නඩු කමිටුවේ වාර්තාව නැති වුණාට නඩු වල ප්‍රගතිය මේ වාර්තා වල තියෙන්න ඕන. ඒක

ඇමුණුමක් හැටියට ආයතන කමිටුවේ අනිවාර්යෙන්ම තිබිය යුතුයි. එතකොට එදා 225 බෙදුම් කියන නඩුවේ මම හිතන්නේ නීතිඥ චන්දන කතා කළා දිගින් දිගටම. ඒ නඩුවට මැදිහත් වීමට අවශ්‍යතාවයක් නැහැ කියලා කිවුවා. එවා අපි නඩු කමිටුවේදී ෆයිල් බැලුවා. ඒ ෆයිල් වල ජර්නල් එන්ට්‍රීස් මේ කිසිම දෙයක් මේන්ටේන් වෙන්නේ නැහැ. එතකොට ඒවා වල ලේඛනගත නීතිඥතුමිය මොරටුව මහා නගර සභාවේ නිති නිලධාරීනිය. එතකොට එතුමියගේ වගකීම මේ ෆයිල් හරියට මේන්ටේන් කරන එක. අපි අහන ප්‍රශ්ණවලය ඍජු පිළිතුරක් දෙන්නෙත් නැහැ. එතකොට මේ අවස්ථාවේදී මෙවැනි නඩු තීන්දුවක් ඇවිල්ලා තියෙනවා මේක අපිල් කරන්නද නැද්ද කියලා සභාවට හරි ගයිඩන්ස් එකක් දෙන්නෙත් නැහැ. ඉතින් අපි මේක දැන් මේ කීවෙනි කමිටුවද දැන්, නඩු කමිටු 02කට අපි දැන් හිටියා. සභාවේ තුන්වෙනි පාරට අපි මේ කියන්නේ. ඉතින් ඔබතුමාට මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අධිකාරී බලය ඔබතුමාගේ බලය පාවිච්චි කරලා මේ සම්බන්ධයෙන් පියවරක් ගන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමති.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ කරුණ සම්බන්ධයෙන්මයි. මේකෙ සඳහන් වෙනවා එම නඩුවේ පෙත්සම්කරුවන් ඉල්ලා තිබූ සහන අතරින් මොරටුව මහ නගර සභාව හා නාගරික කොමසාරිස්ට එරෙහිව අදාල දේපළ සම්බන්ධයෙන් තහනම් නියෝගයක් එකී තීන්දුව මඟින් ලබා දී ඇත. නඩුවේ තහනම් නියෝගයක් ලබා දීලා තියෙනවා. එහෙම එකේ මෙතුමිය කියනවා එසේ වුවද එම දේපළ පිළිබඳව මහ නගර සභා අඥා පනතට අනුව නීත්‍යානුකූලව කටයුතු කිරීමට මහ නගර සභාව සතු බලය සම්බන්ධයෙන් එකී නඩු තීන්දුව මඟින් කිසිදු බලපෑමක් සිදුනොවන බව පෙන්වා දෙමි. එතකොට මහ නගර සභා ආඥා පනත අනුව එකේ බලපෑමක් නැහැලු. හැබැයි නඩු තීන්දුව තියෙන්නේ අරම. එතකොට මෙය පරස්පරයිනෙ.

<u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, නඩුව හා සම්බන්ධ තව නඩුවක් තියෙනවා ඒකේ තමයි වාරණ නියෝගය ලබා දීලා තියෙන්නේ මේ නඩුවේ තීන්දුව ඒ 937/L කියන නඩුවට ඍජුව බලපානවා මන්ත්‍රීතුමා. එතකොට නඩු දෙකක් කනෙක්ටඩ්. මේ හරහා විශාල අගතියක් වෙනවා නගර සභාවට.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ඔව් දැන් අපි ඇත්තටම ගත්තොතින් එහෙම දීර්ඝ කාලය ඉඳලා මේ නඩු පිළිබඳ විශාල ප්‍රශ්ණයක් මොරටුව මහා නගර සභාවේ තියෙනවා. මේ ජනතාවගේ මුදල් සෑහෙන ප්‍රමාණයක් නාස්ති කරනවා. නඩුවල අවසාන ඵලය සභාවට වාසිදායක ලෙස නෙවෙයි හැමවිටම අනික් පැත්තට වාසිදායක වෙන්න තමයි වෙන්නේ. අපි විශාරදයෝ නෙවෙයි නීති ක්ෂේත්‍රයේ. අපි ප්‍රායෝගිකව අත්විදලා තියෙන දේ තමයි ඇත්තටම අපිට සතුටු වියහැකි මට්ටමක නෙවෙයි අපේ නීතිමය පැත්තේ කටයුතු සිද්ධ වෙන්නේ. දැනුත් ඔය සංවාද සාකච්ඡා ගොඩක් ඇතුලේ තවමත් මේක නිරවුල් තැනකට ආවේ නැහැ කියලා තමයි මගේ අදහස. ඒ හින්දා මේ සභාවේ වගකීම තමයි දැන් අපිට නඩු කමිටුවකුත් වෙනම තියෙනවා. අපිට අදත් තියෙනවා අපිට ඕනතරම් කතා කරන්න පුලුවන්. හැබැයි මට හිතෙන්නෙ දැන් ඒක නෙවෙයි දැන් කළ යුත්තේ. දැන් අපි ක්‍රියාමාර්ගයකට එන්න වෙනවා. දැන් මේ කොච්චර කතා කළත් සිද්ධ වෙන්නේ එකම දේ නම් දැන් අපිට විරුද්ධව දෙනවා තීන්දුවක්. නැහැ ඒකට ආයේ ඇපිල් කරන්න ඕනත් නැහැ කියනවා. පනතට අනුව අපිට මුකුත් වෙන්නෙත් නැහැ කියනවා. එහෙනම් මම කියන්නේ අපි යම් එකඟතාවයක සාකච්ඡාවක හිටියා. මේ නඩු පිලිබඳව පැනල් එකක් හදන්න. දැනට මේ තියෙන ඒවා අපි වෙනම බේරගත යුතුයි. හැබැයි මෙතනින් ඔබ්බට හරි මේක බේර ගන්නනම් මේ සභාව තීන්දු කරලා මේ මේ නඩු මොන මොන නීතිඥයින්ට ද ලබා දෙන්නේ මූලික අවබෝධයක් ඇතුලේ මේ සභාවට යම් කරුණු පැහැදිලි කරන්න හැකියාවක් තියෙන්න ඕන.

<u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පැනල් එක වෙන කතාවක්. පැනල් ඔෆ් ලෝයර්ස් ඉන්න ඕන නඩුව ඉදිරියට යාම කොයි ලෝයර්ද මොන නඩුවටද භාර දෙන්නේ කියලා. මෙතන තියෙන පැහැදිලිම ප්‍රශ්ණය නගර සභාව ඇතුලේ තියෙන නීති නිලධාරිනියගේ කටයුතු කිරීම. ඒකයි මෙතන තියෙන ප්‍රශ්ණය. ඒ ප්‍රශ්ණය අපි එඩ්‍රස් කරන්න ඕන.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, මම කියන්නෙත් ඒක තමයි. නැවත දැන් එතුමියගෙන් දැන් විමසීමක් කළොත් එතුමියටත් කරුණු තියෙයි ඕනතරම් කියන්න. හැබැයි අපි දෙගොල්ලෝ මේ කරන කරුණු වල ප්‍රතිඵලය ජනතාවගේ පැත්තට සාධාරණයක් ඉෂ්ඨ වෙන්නේ නැහැ. ඉතින් ඔබ කියනවානම් දැන් මේ ඉතාම චේතනාන්විත විදියටම කටයුත් කිරීමක් ඇතුලේ මේ සභාවට හානි කරලා කියලා එය තහවුරු කරනවානම් ඒකට විරුද්ධව මොකක්හරි ක්‍රියාමාර්ගයකට යන්න පුලුවන්. නමුත් නඩු කියනකොට බොහෝවිට පරදින්නත් පුලුවන්, දිනන්නත් පුලුවන්. වාසිත් වෙයි අවාසිත් වෙයි. ඒක අධිකරණයේ තීන්දු තීරණ වෙලපහ අපිට දැනගෙන අවබෝධයෙන් යන්න බැහැ. හැබැයි දැන් දිගින් දිගටම මෙතන තර්ක කරන්නේ අපේ නීති නිලධාරිනියගේ පැත්තෙන් කළ යුතු දේ වෙනුවට නොකළ යුතු දේ කරනවා වගේ එකක්. ඉතින් නිශ්චිත කරලා ඇහුවොත් එතුමිය උත්තර දෙයි.

**මහ නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, තව දෙයක් කියන්න තියෙනවා අගති රහිතව විතවුට් ප්‍රිජෙඩිස්. අර ඉස්සෙල්ලා හිටපු නගරාධිපතිතුමාගේ නඩුවක් තියෙනවා වෛද්‍ය නිලධාරීතුමියත් එක්ක පටල ගත්ත. ඒක තියෙන්නේ ඔහුගේ නමින්. නමුත් ඒ නඩුවට අපි මීට පස්සේ ඉදිරිපත් නොවෙන්න අපි තීරණය කළා නඩු කමිටුව නමුත් ඒකට විශාල මුදලක් දරලා තියෙනවා නීති ගාස්තු. එක්ලක්ෂ පනස්දාහක්. මේකටත් අපිට ප්‍රශ්ණයක් තියෙනවා. මේකත් රිකවර් කරගන්න වෙනවා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, දැන් අපි 02(7) මොකද කරන්නේ. දැන් අපි යනවාද මේක ආයේ නඩු කමිටුවට අරගෙන සාකච්ඡා කරනවාද?

**මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, එතන කල් පැනලා ඉවරයි. දැන් අපිල් කරන්න බැහැ. මම මෙතන කතා කලේ ගරු නගරාධිපතිතුමා මෙතන වගකීම් විරහිතව කටයුතු කිරීම සම්බන්ධයෙන් කතා කරන්නේ. කවුද මේකේ අවසාන වගකීම භාර ගන්නේ? අපි මාසෙකට සැරයක් ඇවිල්ලා අපිට කරන්න පුලුවන් අපි කතා කරනවා කමිටු වලට එනවා වැරදි පෙන්නලා දෙනවා තීන්දු තීරණ ගන්න ඕන. එතකොට මෙහෙම වගකීම් විරහිතව වැඩ කරනවානම් එතනින් එහාට සභාවේ අභිවෘද්ධිය වෙනුවෙන් කවුද කටයුතු කරන්නේ? කාගේද අවසාන වගකීම?

සභා ඝෝෂා

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, ඕකම තමයි මේ මතු වෙන්නේ. ඒ අවස්ථාව මම කියන්නේ ඔබට දෙනවා. දැන් මට නීති ක්ෂේත්‍රයේ මහා විශාරදයෙක් නෙවෙයි. හැබැයි මම දක්ෂ වෙන්න එපැයි මේක හරියට මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන කරුනු කාරණා ටික මට සමහර කාරණා පැහැදිලි නැතිනම් ඔබව මෙතැනට ගෙන්නගෙන තියෙන්නේ ඒකට. නිලධාරීන් ඉන්නේ ඒ ඒ විෂය පිළිබඳව දැනුම අවබෝධය සහිතවනේ. ඉතින් ඔබට ඒ අවස්ථාව දෙනවා. එතනින් එහා අපි බලමු මොකක්ද කරන්නේ කියලා. මම ඉන්නේ පැහැදිලි හොඳ අදහසක නෙවෙයි නඩු කටයුතු සම්බන්ධයෙන්. දැන් ඔබට දැනගන්න ඕන කාරණාව හරියට නිශ්චිත කරලා කිවුවානම් දැන් නැතුව මේක කෝලාහලයක් කරගන්න නෙවෙයි.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මට රීති ප්‍රශ්ණයක් තියෙනවා ඉදිරිපත් කරන්න. අපි මහජන නියෝජිතයෝ. අපි කමිටුවකට එන්නේ කැප කිරීම් කරලා. හැබැයි නිලධාරීන් එන්නේ කැප කිරීම් කරලා නෙවෙයි. නිලධාරීන්ගේ ඩියුටිය ඒක. නගර සභාවේ පළාත් පාලනේ වැඩ කරන නිලධාරීන්ගේ ඩියුටිය ඒක. අපි සභාවට හරි කමිටුවකට හරි ඇවිල්ලා අපි ඉදිරිපත් කරන කරුණු හරි වෙන්නත් පුලුවන් වැරදි වෙන්නත් පුලුවන්. මොකද අපි සියල්ල දත්අය නෙවෙයි. හැබැයි නිලධාරීන් කියලා කියන්නේ ඒ ඒ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පූර්ණ දැනුමක් තියෙන අයව තමයි නිලධාරීන් කරලා එවලා තියෙන්නේ. උදාහරණයක් කමිෂනර් ගත්තාම කමිෂනර් රාජ්‍ය පරිපාලනය පිළිබඳව අපිට වඩා ලොකු දැනුමක් එතුමියට තියෙනවා. ඒ නිසා තමයි මෙතන කමිෂනර් කරලා එවලා තියෙන්නේ.

එතකොට ඒ ඒ නිලධාරීන් ඒ ඒ දැනුම් මට්ටම් වල ඉන්න නිලධාරීන්. එතකොට අපි ඇවිල්ලා දෙයක් කියනකොට නිලධාරියා කනේ ඇඟිලි දෙක ගහගන්නවානම් නිලධාරියා අපිට විරුද්ධව මහා ලොකු සෝරනාඩු කරනවානම්, විවිධ හැසිරීම් දක්වනවානම් අපි කාටද කතා කරන්නේ. ඒ නිසා කරුණාකරලා මම එදා ආයතන කමිටුවට ඇවිල්ලා අපි අදහස් දක්වනකොටත් නීති නිලධාරී කනේ ඇඟිලි දෙක ගහගෙන මම හිතන්නේ කොමසාරිස්වරිය කියද්දි කියද්දි ඔහොම හැසිරෙන්න එපා එපා කියද්දි මෙතන නිකන් මහ පහත් හැසිරීමක් තිබුණා. මම ඒක ලිඛිතව දැනුම් දුන්නා කොමසාරිස්තුමියට වහාම පරීක්ෂණයක් කරන්න. මේ අපේ මන්ත්‍රී වරප්‍රසාදයි මේ උල්ලංඝනය කරන්නේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමා ඔබතුමාගෙන් අපි කාරුණික ඉල්ලීමක් කරනවා අපි මේ නිලධාරීන් එක්ක ප්‍රශ්නයක් නැහැ අපිට. අපි මේ ඇවිල්ලා ඉන්න පනස්දෙදෙනාම ඇවිල්ලා ඉන්නේ මහජනතාව වෙනුවෙන්. ඔබතුමා ඇතුළුව. එතකොට අපි මේකට ඉදිරිපත් කරන්නේ මිනිස්සුන්ගේ සල්ලි මේ සෙල්ලම් කරන්නේ. මේවා වරිපනම් බදු ගෙවන ජනතාවගේ මුදල්. එතකොට ඒ මුදල් එක්ක තමයි මේ සෙල්ලම් කරන්න හදන්නේ. එතකොට ඒ මිනිස්සු වෙනුවෙන් තමයි අපි ඇවිල්ලා කතා කරන්නේ. ඒ නිසා කරුණාකරලා මේ අපි ප්‍රශ්නයක් ඇහුවාම මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවාම මන්ත්‍රීවරයාව හැල්ලුවට ලක්වෙන විදියට නිලධාරීන් හැසිරෙන්න තියාගන්න එපා. එහෙම දෙන්න එපා නගරාධිපතිතුමා. ඒක ඔබතුමාටත් හොඳ නැහැ. අද අපිට වෙච්ච දේ හෙට ඔබතුමාට වෙන්න පුලුවන්. ඔබතුමා මොනවාහරි කිවුවාමත්කනේ ඇඟිලි දෙක ගහගනී. ඉතින් ඒ නිසා ඒ තත්ත්වයට පත්වෙන්න දෙන්න එපා. ඒ නිසා අපි බොහෝම කරුණාවෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා මේ සම්බන්ධයෙන් දැන් හරි ඔබතුමාගේ අවසරයකින් තොරව නිලධාරියා නැඟිට්ටාම ඔබතුමා විනයානුකූලව පියවරක් ගන්න ඕන. ඒක තමයි නීතිය. නැත්නම් විනයක් නැතුව මේ සභාවේ යන්න බැහැනේ. දැන් ඔබතුමාගේ වචනයට අපි අවනත වෙනවානේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

දැන් 7 පිළිබඳව එතුමියගෙන් එතුමියට කියන්න යමක් තියෙනවානම් අහමු. මොකද තව මේක මේ විදියටත් හැරිලා ගියොත් මම දැක්කා මටත් එවලා තියෙනවා එන්තර වාසියක් පොඩි ගාණක් නෙවෙයි මිලියන 500ක්ද කොහෙද. රුපියල් 500ක් අතේ නැහැ. ඉතින් මම කියන්නේ දින ගාණයිනේ දෙන්නේ. අපි එතුමියට අවස්ථාවක් දීලා මේක ඉවර කරමු.

<u>නීති නිලධාරී - ටී. සමරරත්න මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, එදා නඩු කමිටුවේ දී කිවුවා මේකට ජ්‍යෙෂ්ඨ නීතිඥ උපදෙස් ලබා ගන්න එයාගෙන ලිඛිතව ගන්න කියලා. රසික සර්ගෙන් ඒකට ලිඛිතව ඇවිල්ලා තියෙන්නේ. ඒක දැන් හෙට නඩු කමිටුව තියෙනවා. ඒකේ තියෙන්නේ අභියාචනා කිරීමේ අවශ්‍යතාවයක් නැහැ. නීත්‍යානුකූලව පනත අනුව කටයුතු කරන්න. මේකෙන් බාධාවක් නැහැ. දැන් අපි ගිහින් තියෙන්නේ ඒ ඉඩමට බලෙන්. බලෙන් ගිහින් කරපු නිසා තමයි ඒ මනුස්සයා නඩුව දැම්මේ. නීත්‍යානුකූලව ඒ මනුස්සයාව දැනුවත් කරලා අපේ සභාවේ තියෙන බලතල අනුව කටයුතු කරන්න මේ තීන්දුවෙන් බලපෑමක් නැහැ කියන එක තමයි රසික සර් කියලා තියෙන්නේ. ඒක ලිඛිතව ගෙන්න ගත්තා මම.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

හරි දැන් පැහැදිලිනේ. අපි යම් තැනකට ඇතුල් වෙනවානම් යම් දැනුම්දීමක් සහිතව ඇතුල් වෙන්න පුලුවන්. දැන් මේ දැනුම්දීමකින් තොරව ඇතුලු වුණා කියන එකනේ මේ කියන්නේ. නඩුවෙන් අපේ බලයට හානියක් නැහැ. ඕනම තැනකට යන්න පුලුවන් දැනුම්දීමක් සහිතව. මට හෝ මම නම් කරන නියෝජිතයෙකුට.

<u>මහ නගර සභා මන්ත්‍රී - තුසිත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 97ත් තියෙනවා 108ත් තියෙනවා ඩියු නෝටිස් කියන එක තියෙනවා අපි දැනුම් දෙන්න ඕන හරි. අපි දැනුම් නොදී ගිය හින්දා මෙතන මෙතන අපි වරදක් කරලා තියෙනවා. ඒක හරි. හැබැයි දැනුම්දීලා අපිට යන්න පුලුවන් කියන එක තියෙනවා. හැබැයි ඔබ්ජෙක් කියන එක නැහැ. ඔබ්ජෙක් කියන එක නැති හින්දා තමයි කම්පැන්සෙට් කියන එක තියෙන්නේ. ඒ කියන්නේ මේකට බාධා කරන්න බැහැ. ඒක හින්දා තමයි අපිට හානි පූර්ණය තියෙන්නේ ආඥා පනතින්. දැන් මෙතන මේ ජජ්මන්ට් එකේ තියෙන්නේ ඩියු නෝටිස් සබ්ජෙක්ට් ටු හිස් ඔබ්ජෙක්ට්.

එයාට ඔබ්ජෙක්ට් කරන්න පුලුවන්. එතකොට එයා ඔබ්ජෙක්ට් කරන්න අයිතිය තියෙනවා කියන්නේ අපිට ආඥා පනතින් ලැබෙන බලය ඉන්ෆ්‍රෙන්ජ් වෙනවා. දැනුම් දීම නෙවෙයි මෙතන ප්‍රශ්ණය අර ජජ්මන්ට් එකේ තියෙන ඔබ්ජෙක්ට් කියන වචනය.

**නීති නිලධාරී - වී. සමරරත්න මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ජ්‍යේෂ්ඨ නීතිඥතුමාගේ පැහැදිලි කිරීම හෙට මම කමිටුවට දානවා. ඒක බලන්න පුලවන්. එතුමාගේ උපදෙස් මතනේ අපි මේ නඩුව පෙනී සිටියේ. අනෙක් එක අපි අභියාචනයක් දැම්මා කියමුකෝ. දාලා ඉල්ලන්නේ මොකක්ද? අපිට නීති විරෝධීව ඉඩමට යන්න අයිතිය දෙන්න කියලාද ඉල්ලන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, කාගෙන්ද ඒ ප්‍රශ්ණය ඇහුවේ? නගරාධිපතිතුමාගෙන්. ඔන්න විනය. අපි ඔබතුමාට ගරු නගරාධිපතිතුමා කියනවා කතා කරනවා. මෙතනට එනකොට ඔළුවපහත් කරලා එනවා. අපි මන්ත්‍රීවරු. මේ නිලධාරියා කතා කරන විදිය. කරුණාකරලා නගරාධිපතිතුමා ඔබතුමා නිශාන්ත ප්‍රදිනාන්දුට නෙවෙයි අපි මේ කතා කරන්නේ. අපි කියන්නේ ගරු නගරාධිපතිතුමා කියලා. ඒ තනතුරේ ගෞරවය ආරක්ෂා කරන්න. මේ නිලධාරීන් එහොම හැසිරෙන්න ගියාම කොහොමද මෙතන මේ සභාවක් ගෙනියන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - එල් . ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම ඇත්තටම සතුටුවෙනවා මම පැරදිලා තුසිත් වගේ මන්ත්‍රීවරයෙක් මේ සභාවට පත්වීම සම්බන්ධව. හොඳටම ප්‍රශ්ණ අහනවා. නගරාධිපතිතුමනි, 02(3) ගවු පේ හරහා අපිට ක්‍රියාත්මක වෙන ඔබතුමා අර ඊයේ පෙරේදා මම හිතන්නේ ඒකේ වාඩිවුණා. එකේදී 2025.08.19 කමිටුවේ මොකක්ද ගත්ත තීන්දුව සහ ඒ නිර්දේශය දෙන්න. අපිට මේක ලිහිණි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු දෙයක්. ඒක අපිට නොම්ලේනේ ලබා දෙන්නේ. ඒ සම්බන්ධයෙන් ඒ සියලුම තාක්ෂණය සහ ඒ ඩිජිටල් වොලට්ස් ඔක්කෝම අපිට අරන් දෙනවා. ඉතින් මේකට ගත්ත තීන්දුව මොකක්ද මේක ක්‍රියාත්මක කරන්න පුලුවන් එකක්ද බැරි එකක්ද කියලා ඔබතුමා ගත්ත තීන්දුව මොකක්ද? ඒ සම්බන්ධව පොඩි දැනුවත් කිරීමක් කරන්න ඕන.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,ඒක රජයේ වැඩ පිළිවෙලක්නෙ. අපි දැනට සාකච්ඡා කළා අපේ දැනට වරිපනම් අයකර ගැනීම තමයි දැනට මෙම ආකාරයට සිද්ධ වෙන්නේ.ඊට අමතරව වරිපනම් හැර අනෙකුත් සියලු සේවාවන් ටික මේ ගව් පේ ලයින් එකට සම්බන්ධ කරන්න ඕන කියන තැන ඉදලා තමයි අපි එතට යන්න සූදානම්. මූලික සාකච්ඡාව තමයි කලේ. ඒගොල්ලන්ගෙන් පැහැදිලි කරගැනීම කරගත්තා. ඒගොල්ලන් ඇවිල්ලා ආයතනයෙන් ඇවිල්ලා ඉස්සෙල්ලා ඒගොල්ලන් ඒ කරන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් කළා. අපේ නිලධාරීන් ටිකත් අරගෙන වගකිව යුතු නිලධාරීන් ටිකත් අරගෙන සාකච්ඡා කරලා අවබෝධයක් ලැබුණා. සරල දේ වුණත් එකපාරට කරන්න බැහැ. දැන් විදිමත් පිලිවෙලක් ඇතුලේ යන්න වෙන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහතත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමන්ලාට තාක්ෂණය මත පදනම් වෙලා ඉස්සරහාට යන්න ඒන නගර සභාව. අපි එතැන ඉන්නේ. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවට නිලධාරීන්ගේ කැමැත්ත අකමැත්ත විරෝධය ඉදිරිපත් වෙන්න ඕන. නමුත් තාක්ෂණය වෙනස කියන එක අමාරුයි. අපි වෙනස කියන එකත් එක්ක ගියොත් තමයි අපි වෙනස් වෙන්නේ.

**2025.09.16 දින පැවති ආයතන හා නීතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.09.16 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ජේ.එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යු.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
18. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය

**2025.09.16 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මෙම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් සභා ගැබෙහි නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය)

**06(4) 2025.09.17 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, 02(12) අපේ සුදේශ් මන්ත්‍රීතුමා දාලා තියෙන යෝජනාවක් මේක. මොරටුව බල ප්‍රදේශය තුල පැවති මහල් නිවාස සංකීර්ණ තුළ කසල එකතු කිරීම දැනට ක්‍රියාත්මක වන ආකාරයට ප්‍රමාණවත් නොවන බැවින් දිරන කසළ ඉඳුල් සතියකට තුන් වතාවක්වත් සහ නොදිරන කසළ පොලිතින්, ප්ලාස්ටික් සතියකට දෙවතාවක්වත් සහ අනෙක් ඒවා ක්‍රමවත් විදියට මොරටුව බල ප්‍රදේශය තුළ සකස් කරන්න කියලා තමයි මේක යෝජනා කරලා තියෙන්නේ. උක්ත කරුණ සලකා බැලූ කමිටුව මහල් නිවාස සංකීර්ණ වල කසළ එකතු කිරීමට අදාළ ක්‍රමවේදයන් සලසා ඇති බැවින් කමිටුවට වාර්තා ඇති බයැවින් එම කරුණ කමිටුවෙන් ඉවත්, ඒ කියන්නේ සුදේශ් මන්ත්‍රීතුමාගේ මේ බලාපොරොත්තු වෙච්ච එතුමාගේ සොයිසාපුර මහල් නිවාස වල කැලෑ කසළ එකතු වීම නිසියාකාරව ක්‍රමවත් විදියට කරන්න මේ වෙනකොටත් මේ දින වෙන් කරලා ඉවරයි. හැබැයි කමිටුවෙනුත් මේ කරුණ ඉවත් කරලා. ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට මොරටුවේ අනෙක් බල ප්‍රදේශ වලත් සමහරක් වෙලාවට සති දෙකකට තුනකට එන්නේ නැති අවස්ථාවනුත් තියෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි ඔබතුමාගේ අවධානය යොමු කරන්න මේ කරුන ඉවත් කරන්න ඉස්සෙල්ලා ඒ ප්‍රදේශ වලට විතරක් නෙවෙයි අනෙක් ප්‍රදේශ වලත් නිසියාකාරව කසළ බැහැර කිරීමේ ක්‍රමවේදයක් හදලා මේ කරුණ ඉවත් කළොත් හොඳයි කියන විශ්වාසය තමයි අපි තුළ තියෙන්නේ. නැතිනම් මේ කරුණ මේකෙන් ඉවත් වුනාට පස්සේ අනෙක් පැතිවල ක්‍රමවේදය මොන විදියට හැදෙයිද කියන එක දන්නේ නැහැ. ඔබතුමට මම සැරෙන් සැරේ කතා කරලා තියෙනවා. සභාවේ ගිය වතාවේ කතා කරලත් තියෙනවා. නමුත් සමහරක් අවස්ථා වල සමහරක් පාරවල් වලට සතියකට එක සැරයක්වත් යන්නේ නැති අවස්ථාවන් තියෙනවා මේ ඉදිබැද්දේ. මම අනෙක් ප්‍රදේශ ගැන කතා කරන්න යන්නේ නැහැ. මොකද ප්‍රදේශත් එහෙම වෙන්න ඇති කියලා මම විශ්වාස කරනවා. නමුත් ගරු නගරාධිපතිතුමනි, ඒ ප්‍රශ්ණයට විසඳුමක් ලැබුණ පමණින් මේක කමිටුවෙන් ඉවත් කරන්නේ නැතුව මේක මම හිතන්නේ අනෙක් ප්‍රදේශ වලටත් විසඳුමක් ලැබුණාට පස්සේ ඒ කරුණ කරන්න කියන පණිවිඩය මම දෙනවා.

ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමනි, ඔබෙත් ගරු සභාවෙත් අවධානයට යොමු කරනවා 02(13) මොරටුව මහා නගර සභා මන්ත්‍රී තුසිත් ද සිල්වා මහතා කමිටුවට ඉදිරිපත් කරන පහත සඳහන් යෝජනාව ලුනාව කලපුව ඇවිදින මංතීරුවට මේ වෙනකොට එතුමා පැහැදිලිව කියනවා මේක මේ වෙනකොට ලස්සනට ඔබතුමන්ලා කරගෙන යනවා. අපිත් සතුටු වෙනවා. මංතීරුව වටේ ඇති වැට කඩා සියලු නිවෙස් හිමියන් විසින් මේ ඇළට මේ කලපුවට කැලි කසළ දානවා කියන පණිවිඩය තමයි එතුමා දෙන්නේ. ගරු නගරාධිපතිතුමනිඥ, මේකටත් නාගරික ඉංජිනේරුතුමා විසින් වාර්තාවක් ලබා දීලා තියෙනවා. එම නිසා උක්ත කරුණ සම්බන්ධයෙන් නාගරික ඉංජිනේරු වාර්තාව ඉදිරිපත් කරමි. ලුනාව කලපුව ඇවිදින මංතීරුව කලපුව නඩත්තු මාර්ගයක් ප්‍රවේශ වීම සඳහා ගේට්ටු තබා ඇති නිවෙසියන් නම් ලැයිස්තුවක් පහත පරිදි ඇතැම් නිවෙස් හිමියන් මේ අවස්ථාවේ රැඳී නොසිටීම නිසා යම් කිසි පිරිසකගෙන් මේකට අරගෙන ඇවිල්ලා තියෙනවා ලිපින කිහිපයක්. නමුත් අනෙක් ඒවා ගන්න බැරිවෙලා තියෙනවා ඒගොල්ලන් හිටපු නැති නිසා. නැවත වෙන අංශයකට භාර කරලා තියෙනවා. ඒගොල්ලන්ගෙත් ලිපින අරගෙන ඒගොල්ලන්වත් සාකච්ඡාවට ගේන්න කියලා. ඒකත් සාකච්ඡාවට ගේන්න තියෙද්දි ඒකෙනුත් මේ කරුණ ඉවත් කරනවා කමිටුවෙන්. ඊටපස්සේ තීර්ණය කරලා තියෙනවා උක්ත කරුණ සලකා බැලූ කමිටුව ප්‍රවේශ වලින් ඇවිදින මංතීරුවට ඇතුළුවීම තහනම් ලෙස නාම පුවරුවක් සවි කිරීමටත්, ඉදිරි කටයුතු ගොනුවෙන් කිරීමටත් මේකත් ඉවත් කරලා තියෙනවා. නමුත් මේකට උත්තරයක් නොදි

තමයි ඉංජිනේරුතුමා දීලා තියෙනවා මේගොල්ලෝ ගෙනෙල්ලා සාකච්ඡා කරන්න. ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරන්න මේ මංතීරුවට මම හිතන්නේ මුල් වෙලා ඉන්න ඉඩම් හිමියන් අපිත් දැකලා තියෙනවා අඩි දෙකක් වගේ පොඩි කුවුළුවක් තියලා තියෙනවා ඒගොල්ලන්ට මංතීරුවට ඇතුළු වෙන්න. ගරු නගරාධිපතිතුමනි, සමහරක් අවස්ථා වල මම මේ දකින දේ ඒ අයටත් නැතිනම් කිලෝමීටර් එකහාමාරක් විතර ඇවිදගෙන හරි වාහනෙකින් හරි එන්න වෙනවා මංතීරුවට එන්න. හැබැයි මේ කමිටු වල මමත් හිටියා මීට පෙර. හැබැයි මේක නීත්‍යානුකූලව ලූනාව කලපු ව්‍යාපෘතියත් එක්ක කතා කරලා මම දන්න තරමට ඒ අඩි දෙකක වගේ කවුළුවක් ඒගොල්ලන්ට දුන්නා. ඒගොල්ලන්ට ඇවිදින මංතීරුවට එන්න. ඉතින් ඒක නිසා මේකේ නීත්‍යානුකූල තත්ත්වයත් බලලා ඉවර වෙලා හැබැයි ඒක ඇවිදින මංතීරුවට එන්නේ ප්‍රවේශ ලබා ගෙන ඉවර වෙලා හැබැයි කැලි කසළ දානවානම් ඒක ලොකු වරදක්. ඒකට අපි වෙනම ක්‍රියාමාර්ගයක් ගතයුතුයි. නමුත් මම කියන්නේ අර අවස්ථාව අහිමි කරන්න එපා ගරු නගරාධිපතිතුමනි. ඒ වගේම තමයි කමිටුවෙන් මේක ඉවත් කරන්නේ නැතුව මේක ඉදිරියට ගියාට පස්සේ මේක වැඩක් වුණාට පස්සේ ඉවත් කිරීම කිසි ප්‍රශ්ණයක් නැහැ. ඒ වගේම තමයි මේ කලපු ව්‍යාපෘතියෙන් ගරු නගරාධිපතිතුමනි, අපේ සභාවට ලැබුණ ඉඩම් තියෙනවා. ඔබතුමාගේ අවධානය යොමු කරන්න මේ නිලධාරීන් කියලා ඒ ඉඩම් වලට අද මොකද වෙන්නේ කියන තත්වයත් බලන්න කියන ගරු ඉල්ලීම කරනවා ගරු නගරාධිපතිතුමනි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ අයිතමයටම තමයි. තුසිත් මන්ත්‍රීතුමා කියපු යෝජනාවට දැන් මාත් මේ දවස් ටිකේම ඇවිදින්න යන නිසා මාත් දැක්කා. ගෙවල් තියෙන හැම ගෙයකටම එන්ට්‍රන්ස් එකක් තියෙනවා කලපුවට. දැන් තිලකසිරි මන්ත්‍රීතුමා කිවුවා අඩි දෙකක විතර එකක තියෙන්නේ කලපුවට යන්න එහෙම කියලා. ත්‍රීවීල් රථ පවා ගන්න පුලුවන්. වාහන ගන්නත් පුලුවන් වෙන විදියට ලොකු ගේට්ටු තියෙන්නේ දැන්. එතකොට ඒ ප්‍රයිවසි එක නැහැ ඇවිදින කට්ටියට. සමහර කට්ටිය පුට් නිදිගෙන ඉන්නවා. සමහර කට්ටිය අඩිය ගහනවා. දැන් අපි සමහර වෙලාවට ළමයි එක්ක යනවා ගරු නගරාධිපතිතුමා අපිට සමහර වෙලාවට ඒක මේවා වෙන්න බැහැ. තනිකරම ඒ එන්ට්‍රන්ස් දැන් අතිවිශාල වෙලා තියෙන්නේ. අපි නීතියක් තිබුණා ඒ නීතියත් එක්ක මේ නම් දහයක් පහළොවක් විතර දාලා. හැම එකටම බල්ලෝ ටික එන්නේ මේ කලපුවට. කුණු ටික දානවා. ඉතින් ඒක නිසා මේ ගැන ඔබතුමා කොහොමහරි විසඳුමක් දෙන්න ඕන. ඒ වගේම නගරාධිපතිතුමා මේක අයින් කරන්නෙපා මේකේ ඉතුරු ලැයිස්තු ටික ගමු. නගරාධිපතිතුමා, එදා ඔබතුමා ඉංජිනේරු මහත්තයාට කිවුවානේ මේක ක්‍රියාත්මක වෙන්න කියලා. ඒක කළේ නැහැ. මම තව පොඩි කාරණයක් අහන්න කැමති දිගරොල්ල අපේ දිනපොළේ ස්ලජ් එක තිබුණා අපේ හිටපු සී.පි.එච්.අයි මහත්තයා හිටපු සලජ් එක. ඒ සම්බන්ධව දැන් ස්ලජ් එක අරගෙන ගිහිල්ලා තියෙනවා මම දැක්කා. කොච්චර ප්‍රමාණයක් වියදම් වුනාද අපේ නගර සභාවේ මුදල් කොච්චර ප්‍රමාණයක් ගියාද ස්ලජ් එක මෙතනින් ඇදලා කුනු වත්තට දාන්න. කුණු වත්තට දාන්න සල්ලි කීයක් ගියාද ගරු නගරාධිපතිතුමා. ඒ ආයතනයෙන් සල්ලි දීලා තමයි මේ ස්ලජ් එක දිනපොළට බැවේ. ඔබතුමා පැහැදිලිවම දන්නවානේ. ඉතින් පොඩ්ඩක් මට සී.පි.එච්.අයි මහත්තයා ඉන්න නිසා මම අහන්න කැමති ස්ලජ් එක දැන් ඔක්කෝම ඇද්දාද? කොච්චර වියදමක් ගියාද? ඒ කුණු වත්තට කොච්චර වියදමක් කළාද? ඒ සල්ලි කාගෙන්ද ගන්නේ යසන්තගෙන් ගන්නවාද කියලා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒක අපි කසල වත්තට තමයි ඇද්දේ, මට මතක හැටියට මම ඒගොල්ලන්ට කතා කළා. බලමු දැන් දිරන පැත්තට තමයි ඒක දැම්මේ, ටොන් එකකට රුපියල් 1000ක් වගේ ටොන් අටක් වගේ තිබිලා තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කීයක් කමක් නෑ මේක ඇදපු එක නම් හොඳයි මොකද මේ ගඳට ඉන්න බැරුව හිටියේ. මාස ගානක් ගියා මේක කරන්න. ස්තූතිවන්ත වෙනවා සී.පි.එච්.අයි මහත්තයට මේ වැඩේ කරාට. ඉදිරියට මේ වගේ වැඩ නොවෙන්න නැවත වග බලා ගන්න ඕනේ ඒවගේම තමයි අර පටි ගැන ඉස්සරහ කැල්ල කියන්න බැහැ. ඒ නිසා ඒවත් දැන් අඩුයි එකත් පොඩ්ඩක් බලලා දෙන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(14) කරුණු සම්බන්ධයෙන් මම කතා කරන්න ඉන්නකොට ඔසඳ මන්ත්‍රීතුමා ඒ එක්කම වෙන කාරණාවක් ගැන කතා කරා. ඒ කලපුව මන්තීරුව වටේ මම සාමාන්‍යයෙන් හවස් වරුවේ යනවා. ඒ මන්තීරුවේ යනකොට ගේට්ටු දෙකක් ඇරෙන්න, සෙබස්තියන් එකේ ගේට්ටුවයි තව එකකුයි හැරෙන්න ලොකු විශාල ගේට්ටු වෙන නැහැ. ඒ ගේට්ටුවලින් එන්න කරන්නත් බැහැ කාණු තියෙන්නේ. කලපුව අවට ඉන්න අය කලපුවට කුණු දානවා කියන එක මම පිළිගන්නේ නැහැ නගරාධිපතිතුමනි, ඒ අයට උවමනාවක් නැහැ කලපුව ජරා කරන්න. ඒ අයටත් ඕනේ එතැන ලස්සනට තියාගෙන ඉන්න. ඉතින් මේ අයගේ කුණු ගෙනියන්න හතර වටෙන්ම අපේ ටැක්ටර් ටික එනවා.එහෙම තියෙද්දි කුණු දාන්න අපේ මිනිස්සුන්ට පිස්සු නෑ කලපුවට ගිහිල්ලා. මොකද ප්‍රදේශවාසියෙක් හැටියට මම කියන්නේ පිටින් එන පිටස්තර අය වෙන ඒවා දකිනවා ඇති. මුහුදෙ වතුර මෙහෙට එනකොට පල්ලෙහා කුණු ටික එනවා සෙබස්තියන් එක පැත්තටම. දූව පන්සල පැත්තේ තියෙන කුණු ටික එනවා. අපිට ඒක වෙලා තියෙන්නේ නගරාධිපතිතුමා කලපුවෙන් එහා පැත්ත උයන උතුර ලක්ෂපතිය ප්‍රදේශ වල කුනු ඉවත් කිරීමක් සිදුවෙන්නේ නැහැ. ඔබතුමා දැන් යන්න ඒ පැත්තට කුණු ටැක්ටර් දහයක් විතර එකතු කරගන්න පුළුවන්. ඒ වගේම කලපුව ඇතුලේ ප්ලාස්ටික් බෝතල් තියෙනවා ට්‍රැක්ටර් දෙක තුනක් විතර. ඉවත් කරන්න කවුරුවක්වත් නෑ, මේ වෙනකොට තණකොළ වැවිලා ජරා ජීර්ණ වෙලා තියෙනවා, තියෙන අකටයුතුකම් සියලුම දේවල් උයන උතුර ලක්ෂපතිය ප්‍රදේශවලට වෙලා තියෙන්නේ. ඒක හොයලා බලන්න නගර සභාවේ අයිතිය තමයි කුණු ඉවත් කිරීම. ඔබතුමා මැදිහත් වෙලා මේක කරන්න දැන් එක එක්කෙනාට බෝලෙ පාස් කරලා ලුනාව උතුර ලක්ෂපතිය ප්‍රදේශවල වලින් කුණු ඉවත් කිරීමක් සිදුවෙන්නේ නැහැ. ඒ පාරේ යන්න පුළුවන්කමක් නෑ කාණුවක් සුද්ද කරන්නේ නෑ. ලක්ෂපතිය පැත්තෙත් මම යනකොට ඒ වගේ තත්ත්වයක් තිබුණා. ඔබතුමාගේ මැදිහත්වීමෙන් මේකට විසඳුමක් දෙන්න. මේ කලපුවට කුණු දාන අය ජොකින් පාත් එක වටේ නැහැ. ඒක බොරු කතාවක් ඔබතුමා නිලධාරියෙක් ඉන්නවා අපේ කලපුවේ ඒ නිලධාරියාව ගෙන්නලා විමසලා බලන්න කවුරුත් කලපුවට කුණු දාන්නේ නැහැ.

<u>ගරු නගරාධිපති -කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි මේක ගැන සොයා බැලීමක් කරන්නම්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මහා සභා වාර්තාව සම්බන්ධයෙන් කතා කරනකොට ඔබතුමා කිව්වා අදාල තැනදී කතා කරන්න කියලා. මට ඇහුනා සුදේශ් මන්ත්‍රීතුමා කියනවා මේක සෞඛ්‍ය කමිටුවේ කතා කරානම් හරිනෙ කියලා. අගෝස්තු මාසයේ දොළොස්වෙනිදා මහා සභාව දවසේ අපි සභාවේ හිටපු ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක කරපු වංචාවක් සම්බන්ධයෙන් අපි හෙළිදරව්වක් කරා ඔබතුමා ඒකට පරීක්ෂණය පවත්වන්න කියලා මාස දෙකකට පස්සේ අදාල නිලධාරියාව මේ ස්ථානයෙන් මාරු කරන්න කටයුතු කරා. අපි නම් දකින්නේ මාරු කිරීමක් නෙමෙයි අපි දකින්නේ උසස් වීමක් දීලා යවලා කොළඹ මහා නගර සභාවට. එහෙම නැතුව සාමාන්‍යයෙන් හොරකම් කරාම අපි දකින්නේ එක්කෝ වැඩ තහනම් කිරීම. හැබැයි මූල්‍ය වංචාවක් කරොත් එහෙම කඩිනම් වැඩ තහනම් කිරීමකට තමයි ලක්වෙන්නේ. මෙතැනදී සුවිශේෂීතාවය තමයි මාලිමා ආණ්ඩුව යටතේ වංචාවක් කරාම මාරුවීමක් ලැබෙනවා උසස්වීමක් සමඟ ඒක තමයි ඇත්ත කතාව. ඒ නිසා අපි ඔබතුමාට එක සභාවක විතරක් නෙමෙයි. ඒ වංචාව සනාථ වෙන්න කට උත්තර ගණනාවක් ලැබුණා. හැබැයි ඒ කට උත්තර ගණනාවෙන් කිසිදු ප්‍රයෝජනයක් වුණේ නැහැ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න ඔබතුමා කතා කරන්නේ සෞඛ්‍ය කමිටුවේ මොන අයිතමය යටතේද, මොන කරුණ ගැනද කතා කරන්නේ. ඔබතුමා දීර්ඝ කාලයක් මේ සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් ඔබතුමා ඉදිරිපත් කරපු අදාළ කරුණු කාරණා පිළිබඳව අවශ්‍ය කටයුතු කරලා තියෙන්නේ. ඔබතුමා හැමතිස්සේම ඔබතුමාට කැමති දේම මෙතන කරන්න යන්න එපා. මේ සභාවේ හිටපු ඔබතුමන්ලා තියන් හිටපු ඔබතුමන්ලා එකට වැඩ කරපු ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා කරපු වරදට අපි නිශ්චිත විදියට ඒ වෙලාවේ කටයුතු කරා දැන් ඉල්ලනවා වැඩ තහනමක් මට ඕන ඕන විදිහට මේ රජයේ සේවකයන්ගේ වැඩ තහනම් කරන්න බැහැ. අවසානයේ සිළුල්ජීගේ තමයි මාරුවීම කරේ

එතුමියට අයිති වැඩක් ඒක. දැන් ඔබතුමාලා කියන කියන විදියට එහෙම දේවල් කරන්න බැහැ. හැබැයි කළ යුතු දේ කරලා තියෙනවා. නමුත් ඒකත් ඔබ පිළිනොගෙන වෙන වැරදි අදහසක් හැමතිස්සෙම දෙන්න හදනවා. මේ මාලිමාව ගැන, මාලිමාව කොහෙද වැරදි කරපු අයට උසස් වීම් දීලා තියෙන්නේ. ඔබ දැන් මෙතන කියන්නකො යසන්ත මහත්තයා මාරු කරපු එක උසස් වීමක්ද එතුමා දීර්ඝ කාලයක් මෙතන හිටපු ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා. මෙතන වැරදි අර්ථකථන දෙන්න එපා. ඔබ හොඳටම දන්නවා ඔබ කියපු දේට අනුව අනිත් පරීක්ෂණ කටයුතුත් යමින් තියෙනවා. සාක්ෂි කැඳවමින් තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කියපු නිසා මම නිශ්ශබ්දව හිටියේ. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ ප්‍රශ්නය සෞඛ්‍ය කමිටුවට දාන්නෙ නැතුව මට කියන්නේ වෙන මොකද්ද තියෙන කමිටුව කියලා මේ ප්‍රශ්නය කතා කරන්න.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේක ලිඛිතව ඉදිරිපත් කරන්නකෝ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නෑ එහෙම නැහැ. මේ සභාවේ කමිටුවේදී කතා කරන්න පුළුවන් අපිට මහා සභා වාර්තාවේ අපි කියපු දේවල් කිසි දෙයක් කරන්නේ නැතුව.

සභා සෝෂා

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පිරීස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි කිව්වනේ ඔබතුමාගේ හොඳ හොඳ සෙල්ලම් චිත්‍රපටි ටික අපි පෙන්නනවා කියලා.

සභා සෝෂා

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේ නගර සභාවට ඕන ඔබේ දැනුමනේ. ජනතාවට ඕන යම් සේවයක් කරගන්නෙ. හැබැයි මේ සභාවේ මෙහෙම දිගින් දිගටම බාධා කරනවනම් ඒක කරන්න බෑනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පිරීස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට කරපු බාධාව මොකක්ද අපි කිව්වේ එතුමා වරදක් කරලා තියෙනවා.

සභා සෝෂා

**<u>ගරු නගරාධිපති -කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අයිතියක් තියෙනවා ඒ අදාල අයිතිය ක්‍රියාත්මක කරා ඔබ ඉල්ලපු දේ දඬුවම දුන්නා. මේ සභාවේ හිටපු ප්‍රධාන නිලධාරියෙක් අදාළ කාල සීමාවේ ඔහුගේ තනතුරෙන් ඉවත් කරා. ඒක දඬුවමක්, ඊට පසුව ඔහුව මේ ආයතනයෙන් මාරු කරා දඬුවමක්, ඊළඟට කියපු කාරණාවට අදාල විමර්ශන යනවා මොකක්ද මේ කියන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කොහෙද විමර්ශන කෙරෙන්නේ කියලා ඔබතුමා කියන්න ඕන අපිට අපි සභාවට කරුණක් ඉදිරිපත් කලාම කරුණාකරලා අපිට කියන්න හරි මේකට විමර්ශන යනවා මෙන්න දැන් තියෙන තත්ත්වය විමර්ශනයේ කියලා කියන්න ඕනේ. ඒක නගරාධිපතිවරයාගේ වගකීම.

**<u>ගරු නගරාධිපති -කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාලා මම අහපු වෙලාවේ නොකිව්වට මම හැමදේම කියනවා. මට හන්හන්න දේකුත් නැහැ, රකින්න කෙනෙකුත් නෑ. මම මේ සභාවේ දිගින් දිගටම ඕන තරම් වංචා හොරකම් දූෂණ දිගින් දිගටම අහද්දි නොකියපු තැනක් කියන්න. මේ හෙට අනිද්දත් එක්කෙනෙක් යනවා අල්ලස් එකට.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>
ගරු නගරාධිපතිතුමනි, යනවා යනවා අල්ලස් එකට යන ගොඩක් කට්ටිය ඉන්නවා මේකේ. යනකන් බලන් ඉන්නේ කියලා අපි දන්නවා.

සභා ඝෝෂා

<u>**ගරු නගරාධිපති -කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමා, අපි බලාගෙන නැහැ මිනිහෙකුට හිංසනයක් කරනවාට අපි කැමති නැහැ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>
ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කිව්වා මේ අල්ලස් එකට යන කතාවක් සම්බන්ධයෙන් මම කියනවා ඔබතුමාලා දාපු පැමිණිලි නෙමෙයි අපි කරපු දේවල්.

සභා ඝෝෂා

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>
ගරු නගරාධිපතිතුමනි, තමුන්නාන්සේලා සතුටු වෙන්න ඕනෙ අපි මෙවට පිටුපසින් හිටපු එක ගැන. අපි විපක්ෂයේ ඉඳලත් ඒ මිනිස්සුන්ට විරුද්ධව මේවට පිටිපස්සෙන් හිටපු එක ගැන. තමුන්නාන්සේලා දැනගන්න ඕනේ ගිය සුමානෙත් අපි එතැනට ගිහිල්ලා සාක්ෂි දීලයි ආවේ. අපි කනගාටු වෙනවා එහෙම තත්ත්වය ඉන්නකොට ඔය විදිහට කතා කරන එක ගැන. අල්ලස් දූෂණ එකේ වෙන්නේ නැහැ අවුරුද්දෙ දෙකෙන්, අවුරුදු තුන හතරකට කලින් දාපු නඩු තවම තියෙනවා ඔයාලගේ වගකීමක් නෙමෙයි ඔයාලගේ දෙයක් නෙමෙයි මේ උනේ. පුළුවන්නම් ඔයාලා අල්ලස් එකට දාපු එක නඩුවක් කියන්න. කිසිම දෙයක් කරලා නෑ හැබැයි ලොකුවට අපි කරපු ඒවා ගැන කතා කරනවා.

සභා ඝෝෂා

**2025.09.17 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |

23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලීප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.09.17 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
18. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිළිනි නෙත්සරණි මෙනවිය

**2025.09.17 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මෙම අවස්ථාවේ දී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් සභා ගැබෙහි නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය)

**06(5) 2025.09.17 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුව ද සොයිසා ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු සඳහා මම යෝජනා කරනවා පක්ෂ විපක්ෂ දෙගොල්ලන්ගෙම සහභාගීත්වයෙන් අනුකමිටුවක් පත් කරන්න කියලා. මොකද ඒකේ නඩත්තු කරන්න ගොඩක් දේවල් තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,02(8) කරුණ, ක්‍රීඩා කමිටුවේදි තීරණය කරා කලපු ක්‍රීඩාංගණයට වාහන ඇතුල් කිරීම තහනම් කරන්න. සභාව වාර්තාවේදී පොඩි වැරදීමක් වෙලා තියෙනවා. සභාහපතිතුමා පොඩ්ඩක් මේ සම්බන්ධව පැහැදිලි කරන්න. එකේ ග්‍රවුන්ඩ් එකට එන වාහන වලට ඇතුල්වීම

තහනම් කරලා සභාපතිතුමාගේ දීර්ඝ සාකච්ඡාවෙන් පස්සේ ඒක තහනම් කරනවා කියලා අපි තීරණය කරා කමිටුව මගින්, මම කමිටුවේ සාමාජිකයෙක් නෙමෙයි. නමුත් මං එතන හිටියා අද මේ දිලිප් මන්ත්‍රීතුමාත් යෝජනා කරා වාහන ඇතුල් කිරීම තහනම් කරන්න කියලා. ඒ වගේම මම යෝජනාවක් විදියට ඉදිරිපත් කරල තියෙනවා වාහන ඇතුල් කිරීම තහනම් කළොත් කලපුව ඉදිරිපිට අපේ ඉන්ටලොක් ගල් අල්ලලා සංවර්ධනය කරලා දෙන්න කියලා. පොඩ්ඩක් ඒ ගැන සලකා බලා කමිටු තීරණය ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(8) කරුණ සම්බන්ධයෙන්මයි. මේ කරුණේ තියෙනවා මේ තණතිල්ලක් හදන්න කියලා ක්‍රීඩා කරන්න. නගරාධිපතිතුමා අපි කලපුවේ ක්‍රීඩා කරද්දී මැච් දෙකක් ගහනවා. එතකොට අපිට තණතිලි දෙකක් හදන්න ඕනද, මම කියන්නේ මේක ප්‍රායෝගික නැහැ එක පැත්තක විකට් සෙට් එකක් තියෙද්දි අනිත් පැත්තෙත් විකට් සෙට් එකක් සවි කරලා මැච් දෙකක් ගහන්නකොට කොහොමද කරන්නේ. ඒ නිසා මම හිතන්නේ මේකේ රියදුරු පුහුණු කටයුතු නතර කිරීම සඳහා තීන්දු කරා කියලා තියෙනවා. ඒක නගරාධිපතිතුමා මොරටුවේ බැලුවහම කාටවත් අලාභ හානියක් නෑ. ඒ මිනිස්සු ඇවිල්ලා මේක පොඩ්ඩක් කරලා යනවා. සංගීත සංදර්ශන තියෙනවා. අපි හොලිවුඩ් ෂෝ එකක් පැවැත්තුවා ඉතින් මේ තණතිල්ල හදනවා කියලා මේවා නවත්වනවා නම් ඉතින් මේක වැඩක් නැහැ. ඕන නම් ඉතින් අපි තණතිලි දෙකක් හදමු නැත්නම් තුනක් හදමු.

<u>ගරු නගරාධිපති -කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒකේ මම දන්න විදිහට වාහන පුහුණුවීම් කරනවා කියන එක නවත්තන්න ඕනනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එක ඉතින් ඔබතුමාලාගේ කැමැත්තක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේකේ මුලින්ම සම්බන්ධ උනේ ග්‍රවුන්ඩ් එකට තණකොළ අල්ලන්න ඉතින් ඒක දැනට ප්‍රායෝගික නැති නිසා, කරන්න මුදල් අඩුපාඩු තියෙන හින්දා මඩවලවල් තියෙනවා තැන තැන ඒබීසී දාලා එවා තලලා තියෙනවා. ඒ වලවල් වලට පස් පුරවලා හදල දෙන්නම් කියලා තමයි කමිටුව තීන්දු කරේ. තණතීරු දෙකක් තුනක් හදන්න නෙමෙයි තණතීරුව විධිමත්ව හදලා දෙන්නම් කියලා තමයි කමිටුව තීරණය කරේ. පස් දාලා පුරවලා කරලා ග්‍රවුන්ඩ් එක හරිගස්සලා දෙන්නම් කියලා කිව්වා. වාහන පුහුණුවීමයි වාහන ඇතුල් කිරීමයි නතර කරන්න යනකොට තමයි ග්‍රවුන්ඩ් එකේ වල් හැරෙන්නේ. එක නිසා තමයි ග්‍රවුන්ඩ් එකට වාහන ඇතුල් කිරීම තහනම් කරමු කියලා කිව්වේ. වෙන ප්‍රශ්නයක් නිසා නෙමෙයි. මොකද ලොරිඑනවා වාහන ට්‍රේරේනින් කරනවා. ඒ නිසා වාහන ඇතුල් කිරීම තහනම් කරලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි අදහසක් ඉදිරිපත් කිරීමට කැමතියි. ලූනාව කලපුව සම්බන්ධව ඇත්තටම පිච් එක හදලා දෙන්නම් කියලා කිව්වේ මොකුත් නෙමෙයි ටිරෝන් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේත් වැඩ යන අතරතුරේ නිකන් අපට මේක හදල දෙන්න කියලා කියපු නිසා තමයි. මේක කරේ පිච් දෙක තුනක් හදන්න අවශ්‍යතාවයක් නැහැ. මේ මන්ත්‍රීතුමා කියනවා වගේ මෙතන මේ පිච් එක පොඩ්ඩක් හදලා දුන්නනම් එතන සෙල්ලම් කරන්න පහසුවක් වෙනවා. ඒවගේම වලවල් තියෙනවා ඒකටත් ලොකු වියදමක් යන්නේ නැහැ. සභාවේ සේවකයන් යොදවලා ඒක කරන්න පුළුවන් ඒ වගේම මේ ස්ථානයට රියදුරු පුහුණු කිරීම් කටයුතු කරන්න දෙන්න එපා. මොකද මේකෙන් මුළු ග්‍රවුන්ඩ් එකටම හානියක් සිදුවෙනවා. ඒ වගේම වාහන ඇතුල් කරනකොට ව්‍යාපාරික මහතුන් ඇවිල්ලා වාහන ඇතුලත් ඇතුල් කරනවා. ඔවුන්ට වාහන දාන්න තැනක් නැති නිසා ඒ නිසා ඔවුන්ට අයිනටම ගන්න අවස්ථාවක් හදලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාලා කැමති විදියකට ඒක කරගන්න දැන් ඒ පිච් එක හදනවා වගේ නෙමෙයි ද සොයිසා ක්‍රීඩාංගනයේ පිච් එක අවුරුදු පහක් පරක්කු වෙලා ඉවරයි කැඩිලා ඉවරයි විකට් එක. ඒ සම්බන්ධව තීන්දුවක් අරන් තියෙනවා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය බස්නාහිර පළාත් ක්‍රිකට් සංගමයේ දැන් මේ අලුත් වැඩියා කටයුතු සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීමක් කරන්න. අවුරුදු පහක් ගිහිල්ලා ඉවරයි විකට් කැඩිලා විකට් එක ගන්න දෙයක් නෑ. කිසිම තරඟයක් මේ ග්‍රවුන්ඩ් එකට එන්නේ නැහැ නගරාධිපතිතුමනි. ඕන තැනක පිච් හදාගන්න ඕන තරමක්. අපේ හදවත බඳු ද සොයිසා ක්‍රිකට් ක්‍රීඩාංගණය ගැන පොඩ්ඩක් බලන්න ඔබතුමාලා.

**<u>ගරු නගරාධිපති -කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**
ගරු මන්ත්‍රීතුමා, ඊළඟ කමිටුවේදී ඒකට අනුකමිටුවක් පත් කරන්න. පක්ෂ විපක්ෂ දෙකෙන්ම පත් කරලා මේක ඉක්මනට පටන් ගන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, 02(6) කරුණ ඩික්සන් ජේ පීරිස් ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කරන්න දාලා තියෙනවා. ක්‍රීඩාංගන ප්‍රතිසංස්කරණයට අදාළව විධිමත් සංවර්ධන සැලැස්මක් සකස් කරමින් පවතින බව නාගරික ඉංජිනේරු විසින් කමිටුවට වාර්තා කරන ලදී. එකී සංවර්ධන සැලැස්ම මීළඟ කමිටුවේදී සලකා බැලීමට කමිටුව නිර්දේශ කරන ලදී. ඩික්සන් ජේ ක්‍රීඩාංගනය වල් බිහිවෙලා විල්රන්ස් පාක් එක කැඩී බිඳී ගිහිල්ලා. පාක් එකට උඩින් ගස් ඇවිල්ලා තියෙනවා එවා පොඩ්ඩක් බලන්න ඕනේ අපේ ක්‍රීඩා සභාපතිතුමා මේ ගැන බලන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, දවස් හතරකට කලින් අපි ඒක සුද්ද කරා අයිනේ තියෙන ගස් ටික ඉවත් කරන්න ජේසීබී යන්ත්‍රයේ අවශ්‍යතාවයක් තියෙනවා. ඒ ටිකත් කරලා ඉවර වෙලා අපි ඒ ටික සුද්ද පවිත්‍ර කරලා දානවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**
ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම කාණු අයිනට බැම්මක් ඉදි කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**2025.09.17 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |

16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.09.17 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂණී ප්‍රනාන්දු මෙනවිය
18. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය

**2025.09.17 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මෙම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් සභා ගැබෙහි නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය)

**06(6) 2025.09.17 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**2025.09.17 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2025.09.17 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය |

**2025.09.17 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මෙම අවස්ථාවේදී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභාවේ නොසිටියහ.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය) |

**06(7) 2025.09.18 දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**2025.09.18 දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |

22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.09.18 දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

01. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
07. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
08. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
09. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිළිනි නෙත්සරණී මෙනවිය

**2025.09.18 දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ සියලුම නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මෙම අවස්ථාවේදී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභාවේ නොසිටියහ.**

01. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය)

**06(8) 2025.09.18 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට සැලසුම් කමිටු ෆයිල් එකක් බලන්න අවශ්‍යයි E 207/ 2025 අපිට ආරංචි හැටියට විශාල වංචාවක් සිදු වෙලා තියෙනවා. ඒ නිසා අපිට දැන් සභාවට ගෙනල්ලා බලන්න අවශ්‍යයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු ලේකම්තුමා,එහෙම දැන් පුළුවන්ද ෆයිල් එකක් ගෙනත් බලන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටුවේදී සාකච්ඡා කිරීමේදී ඔබතුමාලගෙ යෝජනාවක් මම දන්නේ නැහැ කවුද දාලා තියෙන්නේ කියලා කර්මාන්ත අංශයේ ඒ සෙක්ෂන් එකෙම පාටිෂන් අයින් කරන්න කියලා ඔබතුමාලා යෝජනාවක් දාලා තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒහෙම යෝජනාවක් ආවේ නැහැ වැරදීමක් වෙන්න ඇති. පොඩි අදහසක් ආවා ඒක ආවේ මෙහෙමයි.අපෙ ලේකම්තුමා දවසක් ඒ පැත්තේ යනෙකාට දැකලා තියෙනවා අපේ කට්ටිය කෑම කන්නේ ඒතන මේස උඩ මේක මේ කලින් වුන එකක් මම ඒකයි මෙක පැහැදිලි කරන්න ගියේ ඒතනදි අවසානයේදී තීරණයක් අරන් ගත්තා මෙ කෑම කන කාමරය ටිකක් ලොකු කරගන්න මේ පාටිෂන් ටික හරියට හදාගන්න. එහිදී තීරනයක් ආවා TO ටික ඒක පැත්තකට ගන්නත් අනිත් කට්ටිය ඒක පැත්තක තියන්නත්. අපිට වුවමනාව තිබුණේ මේ පාටිෂන් ටික නිකන් ගලවලා ඔක්කොම තියෙන ඒක නෙමෙයි. ජනතාවට මේක විවෘත වෙන්න ඕන කියලා අපි විශ්වාස කරනවා.ඒ වගෙම මේ ස්ථානෙය් උපරීම පල ප්‍රයෝජනය ගන්න ඕන මේක මේ විදිහට තියද්දී තවත් මෙක ඇහිරෙන නිසා තමයි. එකෙදී TO පැත්තෙන් යම් අදහසක් ආවා අපි කිවුවේ ඔයාලාගේ අදහස අපිට කියන්න. අපිට ගැටළුවක් නැහැ අපිට අවශ්‍යව තිබුනේ ජනතාවට විනිවිද භාවෙයන් හා පහසු වැඩ කටයුතු කරගන්න අවස්ථාව සලසා දෙන්න මිසක් කිසිම කෙනෙක්වවත් අපහසුතාවයකට පත් කරන්න නෙමෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එතකොට ඒ පාටිෂන් ඒක ගලවන්නේ නැද්ද.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, තාම ඒකට නිශ්චිතව තීරණයක් අරන් නැහැ ඒක අපේ කමිටුට සංශෝධන සහිතව ඇවිල්ලා තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, සභාහපතිතුමාත් මාත් දෙදෙනාම දන්නවා මෙ ගැන සාකච්ඡාවට බඳුන් වුනා විතරයි ඒතනදි අපි ඇහුවේ කාගෙද මෙ යොජනාව කවුද ඇස්තමේන්තු කරන්න කිවුවේ කවුද බඩු ගෙනාවෙ මෙ බඩු ගෙන්න ඇස්තමේන්තු කරේ කවුද කියලා අපි ඇහුවේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, AO මිස්ගේ පැත්තෙන් ආවෙ අපි සමානය සහා ක්‍රමයෙන්නෙ කරන්නේ. ඒ ක්‍රමයට කරනකොට ඒකට කොටෙෂන් ඒකක් කැඳවලා තිබුණා ඊට පස්සෙ තමයි බඩු ටික ගෙනල්ලා තියෙන්නෙ. TO පැත්තෙන් මෙ ගැටළුව ආවට පස්සෙ තමයි මෙ ප්‍රශ්නෙ ආවෙ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කොටේෂන් ඒකක් කැඳවන්න කාගෙහරි ඉල්ලීමක් තියෙන්න ඕනනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, AO හරහා තමයි ඇවිල්ලා තියෙන්නෙ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේක ඇස්තමේන්තු කරලා සභාවෙන් අනුමත කරලා තියෙනවා බඩු ගෙන්න. ඉංජිනේරු දෙපාර්තමේන්තුව නව සැලැස්මකට වෙනම හදන්න ඔය TO රූම් ඒක ඉංජිනියර්ගෙ රූම් ඒක,කෑම කාමරය ඒ ඔක්කොම ඇවිල්ලනේ තියෙන්නෙ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කර්මාන්ත කමිටුවේ දිගින් දිගටම කතා කරා, අපි ඇහුවා බඩු ගෙනල්ලා තියෙනවා මේවාට ඇස්තමේන්තු දුන්නේ කවුද, ඇස්තමේන්තු කරන්න කියලා කිවුවේ කවුද.නගරාධිපතිතුමා දැන් කිවුවා මේක ඒතුමාගේ කාලේ වුනේ නැහැ කියලා. අපිට දැනගන්න අවශ්‍ය මේක කවුද අනුමත කරේ කියලා . සුදෙශ් මන්ත්‍රීතුමා ඔයයි මමයි මේක ගැන සාකච්ඡා කරේ මට දැනගන්න ඕන කවුද මේක කරේ කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේක ඇස්තමේනතු කරලා තිබුණෙත් නැහැ. මේක විටින් විටම ඇහුවා. ඒතකොට කොමසාරිස්තුමිය අපිට දුන්න උත්තරය තමයි ලක්ෂ 5ට අඩු මුදලක් නිසා ඒ දවස්වල, කරන්න කිවුවේ කවුද කියලා කිවුවෙත් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ඒක විමසමු. ඍජු ශ්‍රමිකව කරනකොට ටෙන්ඩර් කැඳවන්නේ නැහැනේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, සමාවෙන්න අපිට මෙහෙමයි සමහර කටයුතු පිළිබඳ ඔබට මට අවබෝධයක් තිබෙනවා දැන් මේ සභාවක්නේ අපි කරගෙන යන්නේ. සභාව කරගෙන යද්දි ප්‍රශ්න ඒනවා ඒවට අපි පක්ෂ විපක්ෂ වශයෙන් වාද විවාද කරගමු. හැබැයි සභාට නිශ්චිත කාල සීමාවක් ඇතුලේ ඒක ඉවර කර ගමු. ඉතින් මම කියන්නෙ ඒකට උදව් කරන්න.විරුද්ධ වුනාට කමක් නැහැ. මම හිටපු ඉතිහාසයෙ පළවෙනි වාතාවට තමයි ෆයිල් ඒකක් සභාට ගෙන්නන්නෙ. මන්ත්‍රීවරුන්ට බලය තිෙයනවා ඉල්ලීමක් කරලා ෆයිල් ඒක අරගෙන බලන්න. මන්ත්‍රීවරයෙකුට ලිඛිත ඉල්ලීමකින් ඒක කරන්න පුළුවන්, ඊට අමතරව ආයේ ඕනිනම් ස්ථාවර කමිටුවකදි ගෙන්නන්න පුළුවන් තොරතුරු පනත යටතේ තොරතුරු ගන්නත් පුළුවන් දැන් මෙවාගේ තියෙන ප්‍රමාදයන් වුනත් අදාල මන්ත්‍රීවරයට හිමි වරප්‍රසාද ඇතුලේ ඉල්ලන්න පුළුවන් සභාවට ෆයිල් ඒකක් ගෙන්නනවා නොගෙන්නුවොත් ඒහෙම විවිධ අපහසුතාවයන්ට මුහුණ දෙනවා. ඉතින් ෆයිල් ඒක ගෙනාවා මම කියන්නේ මේක ආපහු කරන්න ඒපා. ඔබ මෙහි තියෙන ඕනෑම ඒකක් චෙක් කරන්න අපි හැම තිස්සේම බොහොම විවෘත භාවයක් ඒක්ක කටයුතු කරන පිරිසක් කිසි ලෙසක මේකේ වංචාවක් හොරකමක් වෙන්න දෙන්නේ නැහැ, අපි නොදන්න ඔබ දන්න දෙයක් තියෙනවනම් ඒය ඉදිරිපත් කිරීම නරක නැහැ. ඒතකොට ඒය වලක්ව ගන්න පුළුවන් නමුත් සභාවක් පවත්වාගෙන යාමෙදී ෆයිල් ගෙනත් ගෙනත් මෙතන තියන් බලන්න ගියාම සභාවක් කරගෙන යන්න පුළුවන්

වෙයිද කියලා. ඔබට දැන් ෆයිල් ඒක බලන්න පුළුවන් මම කියන්නෙ ඉස්සරහට මෙහෙම කරන්න ඒපා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ෆයිල් ඒක ගෙන්වීමේ නිත්‍යානුකූල බලය අපිට දීලා තියන්නේ මහා නගර සභා ආඥා පනතෙන් ඒ නිසා මේක ඒපා කියන්න ඔබතුමාට බැහැ. අපිට ෆයිල් ඒක පෙන්නන්න ඒපා ඔබතුමා ෆයිල් ඒක බලලා අපි අහන ප්‍රශ්නයට උත්තර දෙන්නකෝ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේ වේලාවේ ඔබ අහන්න දැන් මගෙන් උත්තර බලාපොරොත්තුවෙන් නෙමෙයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ෆයිල් ඒක පෙරළපු ගමන් පළවෙනි පිටුවේ උත්තරෙ තියෙනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දැන් ෆයිල් ඒක ඉල්ලුවේ ඔබතුමාම බලලා කියන්න සභාවට.ඊට පස්සේ ඒකට අදාල ක්‍රියාමාර්ග මොනවද කියලා බලමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ගිය බදාදා ප්ලෑනින් කමිටුව තිබුණේ මෙ දක්වාම ඉංජිනියර් මහත්මයා අත්සන් කරලා නැහැ ඔබතුමාලා ගාවට එන. මිනිස්සු බැන බැන යනවා. ගිය බදාදා ප්ලෑනින් කමිටුව තිබුණම බ්‍රහස්පතින්දා වෙනකාටවත් නිලධාරින් ටික අත්සන් කෙර් නැත්නම් නිකන් හරි ඒදාට ඔඩිට් ඒකක් ආවොත් ඒක නීත්‍යානුකූල වෙන්නෙ නැහැ. ඒ නිසා අත්සන් කරලා ගියානම්. නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමාට ගියාම වැඩේ ඉවරයි. මිනිස්සු බැන බැන යනවා අන්න ඒන් පී පී කාරයෝ ඇවිල්ලා මෙහෙමයි කියලා. අපි කැමති නැහැ ඔබතුමාලට ඒහෙම බැනුම් අහන්න වෙනවට.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කියන ඒක හරි අද උදේ ආපු ගමන් ඔෆිස් ඒකෙන් ඇහුවෙ සැලසුම කමිටුවට එන ෆයිල් ටික කෝ කියලා. මම කියන්නෙ ඉතින් ඔහොම ප්‍රශ්නයක් තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටුවට ආදාල කරුණක් මම කතා කරන්නේ මම කර්මාන්ත කමිටුවට ජුලි මාසෙ යෝජනාවක් ඉදිරිපත් කරනවා ඒගොඩ උයන දකුණ ප්‍රධාන පාර සංවර්ධනය කරලා දෙන්න කියලා කාණුක් සහිත ඒක කමිටුවට ඉදිරිපත් කිරීම තුළ කමිටුවෙන් කියනවා ඉහත ඉල්ලීම මහා මාර්ග අ ාමාත්‍යංශයට සහ මහා මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කිරීමට නිර්දේශ කරන ලදි කියලා. ඊට පස්සේ මේ ඔක්තෝබර් මාසෙ අද වන තුරු පිළිතුරක් නැහැ මොකද්ද වෙන්නේ කියන ඒක. අපි දැන ගන්න කැමති මේ සම්බන්ධව ඉදිරියෙදී මොකද්ද වෙන්නෙ කියලා. මන්ත්‍රීරියක් හැටියට යො ජනාවක් දැම්මම කොහෙට හරි ඒක නිර්දේශ කරනවනම් අපිටත් දැනුවත් විමේ අයිතියක් තියෙනවා. ඒතකොට අපිටත් ෆාලෝඅප් ඒකක් තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, E 207/2025 කියන ෆයිල් ඒක සාමානයයෙන් ප්ලෑන් ඒකක් පාස් කරන්න අඩුම යන දින ප්‍රමාණය මන්ත්‍රීවරු හැම කෙනාම දන්නවා. දැන් මෙක සුවිශෙෂී ප්ලෑන් ඒකක්, මෙ

ප්ලැන් ඒක භාර දීලා තියෙන්නෙ 2025.09.24 වනදා ප්ලැන් ඒක තාක්ෂණ නිලධාරි වාර්තාව දාලා තියෙන්නෙ 2025.09.24 වනදා, සැලසුම් කමිටුවට ඉදිරිපත් කරලා තියෙන්නෙ 2025.09.24 වනදා, ගරු නගරාධිපතිතුමාගෙ අනුමැතිය ලැබිලා තියෙන්නෙ 2025.09.24 වනදා. මෙහෙම ප්ලැන් පාස් කරනවනම් ඔබතුමාට ගරු කරන්න ඕන මොකද මෙහෙම ප්ලැන් පාස් කිරීමක්, පුදුම දක්ෂතාවයක්නේ තියෙන්නේ මේ සඳහා ඔබතුමාගෙ අවධානය යොමු කරලා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ විදියේ ක්ෂනිකව ක්‍රියාත්මක වෙන අපේ ඉංජිනේරුතුමා මම ඔබතුමාට ගිය මාසේ ඉල්ලීමක් කරලා ලිපියක් දුන්නා. ලුනාව මහල් නිවාස ඒකකය ඉදිරිපිට ලුනාව හංදියේ ම බෝක්කුවක් තියෙනවා. ඒ බෝක්කුවේ ලොකු ස්ලැබ් එකක් දාලා තියෙනවා බාගෙට ඒ ස්ලැබ් එක විශාල නිසා කාණු සුද්ධ කරන්න එන අපේ ඉන්න කාණු කණ්ඩායමට ඒ ස්ලැබ් එක උස්සන්න බැහැ. ඒවගේම භාගෙට තියෙන්නේ. කොටසක් එළියේ. සම්පූර්ණයෙන්ම මුළු කාණුවම බ්ලෝක් වෙලා තියෙන්නේ. මොකද සුද්ධ කරන්න බැරි නිසා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලුවා සැහැල්ලු කොන්ක්‍රීට් තට්ටු දෙදකක් දාලා දෙන්න. ක්ෂනිකව ඒක ඉල්ලීම ඉටු කරන්න අපේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවට යොමු කළා. මම සෑහෙන කාලයක් බලන් හිටියා. නැහැ. ඊට පස්සේ මම ඔබතුමාගේ පුද්ගලික ලේකම්තුමාව හමුවුණාම එතුමා මට ඒ යවපු ලිපිය, දිනය, කවුද යැවුවේ ඒ ඔක්කෝම කිව්වා. ඊට පස්සෙ මම ගියා ටී.ඕ. මහත්තයා හම්බෙන්න එතකොට මම එතුමා එක්කම ආවා අපේ ඉංජිනේරුතුමා ළඟට ආවා. අපේ ඉංජිනේරුතුමා දුන්නා උත්තරයක් කොන්ක්‍රීට් ස්ලැබ් එකක් හදන්න කෙනෙක් නැහැ. කවුද එක්කෙනෙක්ගේ නමක් කිව්වා. එයා මේ වැඩේ කරන එකක් නැහැ කියලා. ඊට පස්සේ බැරිම තැන අපේ ඉංජිනේරුතුමා කිව්වා අපි මේක නගරාධිපතිතුමාට දන්වලා යවමු. සැලකිලිමත් වෙන්න ඕන ඔබතුමා මේ සම්බන්ධයෙන්. මට තියෙන ප්‍රශ්ණය ගරු නගරාධිපතිතුමනි, දැන් මේ සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා පෙන්වපු මේ ෆයිල් එක පැය 24 න් ඒ ප්ලැන් එක පාස් කරන්න එච්චර වේගවත්නම්, මේ කොන්ක්‍රීට් ස්ලැබ් එකක්, දැන් මේ මාසයකට වැඩියි. ගරු නගරාධිපතිතුමා හදන්න කෙනෙක් නැතිනම් මොකද්ද මේ මහා නගර සභාව? මොකද්ද ඒ දෙන උත්තර? ඔබතුමා සැලකිලිමත් වෙන්න. මෙහෙමයි සමහර ඒවා තියෙනවා අපි කියන්නේ නැහැ, අපි මන්ත්‍රීවරු අපිට සලකන්න ඕන, අපි ආවාම නැඟිටින්න ඕන, ඒ කැටයම් අපි කියන්නේ නැහැ. හැබැයි සමහර නිලධාරීන් ඉන්නවා. කොමසාරිස්තුමිය ළඟට ගියාම කොමසාරිස්තුමිය බොහෝම ඒ ගෞරවාන්විත විදියට එතුමිය ඒ ප්‍රතිචාර දක්වනවා. අපි තාරක මහත්තයා ළඟට ගියාම තාරක මහත්තයා බොහෝම ගෞරවනීය විදියට ප්‍රතිචාර දක්වනවා. හැබැයි මේකේ අනික් නිලධාරීන් දුල්සිරි මහත්තයා වෙන්න පුලුවන්, මේ අපේ ධර්මසේන මහත්තයා වෙන්න පුලුවන්, මේ කවුරුත්, මෙතුමා නෝ කතා නෝ සිනා අදාළ නැත වගේ හිටියේ. ඒ මට්ටමට වැටෙන්න එපා. කරුණාකරලා මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඉංජිනේරුතුමාට. කොමසාරිස්තුමියගේ ඉදලා කුණු අදින මනුස්සයා දක්වා ගරුකරන මනුස්සයෙක් මම. ඒ හින්දා එහෙම කරන්න එපා මගේ ඉල්ලීම ගරු නගරාධිපතිතුමා එතන ලොකු ප්‍රශ්ණයක් තියෙන තැනක්. ලොකු අනතුරක් වෙන්න පුලුවන්. ඒ වගේම තව කාරණාවක් මතක් කරනවා මම දැන් ටිකකට කලින් ගියා නගරාධිපතිතුමනි, සරප් අංශයට අර ඉන්ධන දීමනාව ගන්න. පොඩ්ඩක් බලන්න එතන මේ වතුර වැක්කෙරෙනවා. වතුර බිංදු බිංදු වැක්කෙරෙනවා. ස්රෙප් එක වගේ තැනක් තෙමෙන්න ඕන තැනක් නෙවෙයි. ඒ නිසා ඒ ගැන සැලකිලිමත් වෙන්න කියලා ඉල්ලනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම පොඩි යෝජනාවක් කරන්න කැමතියි. දැන් අපිට අනන්ත ප්‍රශ්ණ තියෙනවා ප්ලෑන් පාස් කරගන්න ආපු අයගෙන්. අපිට දිනපතා චෝදනා එනවා මාස දෙකයි තුනයි ගිහිල්ලා තවම බැහැ මේ පොඩි ප්‍රශ්ණ. දැන් අපිට හොඳ උදාහරණයක් තියෙනවා. මම කියන්නේ අපි වැඩිපුර ගාණක් අයකරලා වන්ඩේ සර්විස් එකක් දාලා පටන් අරන් අපිට සැහෙන ලාභයක් ලබන්න පුලුවන්. අපි ඒකට වැඩිපුර අය කිරීමක් කරමු. දැන් අපි දන්නවානේ වන්ඩේ වලින් කරන්න පුලුවන් කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී -අනුරසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත අංශයේ ඔය යන කරුණට අදාළ අනුමැතියක් අරගෙන තියෙනවා ආවරණ අනුමැතියට යටත්ව වැඩ කරන්න කියලා 06.23 වෙනිදා. ඊට පස්සේ මේකට මේ බඩු ගේනන කියලා 7.08 වෙනිදා නැවත අනුමැතියක් අරගෙන තියෙනවා. ඊට පස්සේ තමයි ඔය කරුණට අදාළව මම මේ කතා කළේ. ඉතින් මේ අනුමැති 02ක් අරගෙන තියෙනවා. දැන් මේ කොමසාරිස්තුමියත් මේකට කැමතියි. ලේකම්තුමත් කැමතියි. මේ පොදුවේ යන වැඩක් මේක. ඉතින් මම කියන්නේ අපි විරුද්ධ පක්ෂයේ වුණත් මමත් මේ වැඩේට කැමතියි. මේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ හරියට සැලැස්ම යනවට.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පිරීස්</u>**

ගරු නගරාධිපතිතුමනි, නිලධාරීන්ට ඔය ක්‍යුබිකල් ගහලා තියෙන්නේ මොකක්හරි ගෞරවාන්විත විදියට ඉන්නනේ. හැබැයි හෙට කිවුවොත් එහෙම මේකේ ඔපන් ස්පේස් එකේ වැඩ කරන එක හොඳයි කියලා අපිට කියන්න පුලුවන් එහෙනම් කොමසාරිස්තුමියට උණ පඳුර යටට ඇවිල්ලා මේසයක් තියාගෙන ඉන්න කියලා. මෙහි ගෞරවය රැකගන්න ඕන එක පැත්තක්. ඒ වගේම ගරු නගරාධිපතිතුමා මේ 24 වෙනිදා ෆයිල් එකට ඔබතුමාගේ පිළිතුරක් අපි බලාපොරොත්තු වෙනවා. ඒක එකම දවසේ තමයි අර මෙතුමා කිවුවා වගේ වන්ඩේ සර්විස් එකක් විදියට පාස්පෝර්ට් එකෙත් නැහැ මේ වගේ සර්විස් එකක් අයි ඩී. කාඩ් ඔෆිස් එකෙත් නැහැ වන්ඩේ සර්විස් මෙහෙම. ඒ නිසා ඒකට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා ඔබතුමාගෙන්. ඊළඟ අපේ සුරේෂ් මන්ත්‍රීතුමා කියපු කතාව මුදල් අංශයෙන්ම තමයි ඇත්තටම ඔය වතුර වැටෙන්නේ. ඒක වාස්තු විද්‍යාවට අනුවත් යා දෙන්නේ නැහැ සල්ලි නැතිවෙන්න හේතුවක්.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීන්නාදු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඔබට දැනෙනවා ඇති මේ සංවාදය මේ සාකච්ඡාව පක්ෂයක හෝ ආණ්ඩුවක දුර්වලතාවය ලෙස සලකන්නේ නැතුව විශාල වෙහෙස මහන්සියක් අරගෙන මේ අංශයේ තිබුණ දේවල් බොහෝ වෙනස් කළා ඔවුන්ටත් නොදැනෙන විදියට. නමුත් මට මේ සැකය දිගින් දිගටම තිබුණා. අද උදෙත් ඔෆිස් එකට ආව ගමන් විමසීම් කළේ කිහිප දෙනෙක්ගෙන් මේ කටයුත්තට පොඩි විමර්ෂණයක් කරන්න ඕන. ඉතාම පැහැදිලි මේක ඇතුලේ තවදුරටත් මේ වංචාවල් සිද්ධ වෙනවා. ඒ නිසා ඔබ මට ටික දවසක් දෙන්න මේ ස්ථානයේ මේ වෙමින් තියෙන දේ අනිවාර්යෙන් වෙනස් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා දරණ උත්සහාය සම්බන්ධයෙන් අපිට ගැටලුවක් නැහැ. හැබැයි අපි කියන්නේ දැන් අපි ඔප්පු කරලා පෙන්නුවා ඔබතුමාට මහා පරිමාණෙන් දෙයක් වෙලා තියෙනවා. අපි කියන්නේ ඒකට පරීක්ෂණයක් ආරම්භ කරන්න.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදින්නාදු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මහා පරිමාණයෙන් කියන්නේ මෙහෙමයි, දැන් මේගොල්ලන්ට බොහෝ වෙලාවට අත්වලට ආපු සමහරක් සමහරක් ගණන් අහිමි වෙලා තියෙන්නේ. එතකොට දැන් මේ අදාළ මිනිස්සු බලාගෙන ඉන්දැද්දි දීර්ඝ කාලයක් තමන්ගේ සැලසුම දීලා මේ වෙන එකක් උඩින් ගෙනෙල්ලා ඩොක් ගාලා අතහරිනවා. එතකොටත් මොකක්හරි ඇති. නැත්නම් එහෙම වෙන්න බැහැනේ. 24 ම මේ එක දිහට වැල යන්නේ. මේ දින වකවානු එන්නේ කොහොමද? මම සෑහෙන අසීරුතාවයකට පත්වෙලා තියෙන්නේ. මේක කොහොමද බේරන්නේ? ඒ නිසා ඔබ, මම හිතනවා මොන දේශපාලන විරුද්ධකම් මාත් එක්ක තිබුණත්, මම එක රුපියල් මේවායේ සාක්කුවේ දාගන්න ආපු මිනිහෙක් නොවන බව විශ්වාස කරනවා. ඒ නිසා මම නාගරික කොමසාරිස්ගෙන් ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා කරුණාකරලා මේ ෆයිල් එකේ මේ අනුමැතිය මේ 24 මේ සියල්ල සිද්ධ වෙච්ච විදිය වහාම නිවැරදි පරීක්ෂණයකින් අපිට ලබන සභාවට දෙන්න. මේ වගේ තව කීයක් කොහොම යනවාද කියලා හොයන්න. අපි සාකච්ඡාවක් කරලා මෙය වෙනස් කරමු. විශාල උත්සහයක් ගන්නවා මොරටුව හදන්න ඕන කියන හැඟීමක වැඩ කරන මිනිහෙක් නැහැ. තමන්ගේ දේ ලබා ගන්න උත්සහා කරනවා විනා තමන්ගේ රාමුව ඇතුලේ කොටු වෙලා ඉන්නවා විනා ඉතින් ඒ නිසා මට ඉස්සරහාට ගැටුම් ප්‍රමාණයක්, මම මේ ගැටුම් හදා නොගෙන යන්නේ. ඉතින් සෑහෙන ගැටුම් ප්‍රමාණයක් හදාගන්න වෙයි. මම වගකීම බැහැර කරන්නේ නැහැ. වගකීම මම නිවැරදි කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටුවේ 02(10) මගේ යෝජනාව මාසෙකට දෙකකට කලින් ඉදිරිපත් කළා සභාවට. 5,6,7 පටුමඟ වල් වල කාණු පද්ධතිය රේල්ල පාර යටින් මුහුදට බැසවීම සඳහා ඒ යෝජනාව 2025.09.18 තිබුණ කමිටුවට ඔබතුමා ඉදිරිපත් කළා. ඒ සභාවට ඉදිරිපත් කරපු අවස්ථාවේ දී මාලිමාවේ අපේ මන්ත්‍රීතුමත් ඒ මගේ යෝජනාවට අදහස් දැක්වූවා නගරාධිපතිතුමා. එතකොට මේක කමිටුවට ගියාම අපේ සුදේශ් මන්ත්‍රීතුමා මේක ඉදිරියට කරගෙන යාම සඳහා නිර්දේශ කළා. මම දන්නේ නැහැ ගරු නගරාධිපතිතුමා ඒකේම 22 අයිතිමය මේ වගේ අයිතිමයක් ඒ කමිටුවේ තිබුණේ නැහැ ඒ අවස්ථාවේ දී. මේක කතා කළේ නැහැ මේ කමිටුවේ. තිබ්බද නැද්ද කියන එක මම දන්නේ නැහැ. අපි ඉවර වෙනකන්ම හිටියා. සභාපතිතුමත් මමත් ටී.ඕ. මහත්තයත් තුන්දෙනාම එකට තමයි එළියට බැස්සේ එතකොට මේ අයිතමය තිබුණේ නැහැ. නගරාධිපතිතුමා මගේ යෝජනාව කමිටුවට දැම්මාට පස්සේ කමිටුවට දාන එක සදාචාර දෙයක් නෙවෙයි නගරාධිපතිතුමා. මොකද මේක දැන දැනම මම දාපු යෝජනාවම 22 යටතේත් කමිටුවට ඉදිරිපත් කරලා තියෙනවා. ඒ ඉදිරිපත් කළාම කමිටුවේදී කතා නොකර මේක සභා වාර්තාවටත් ඇවිල්ලා තියෙනවා. එහෙම කොහොමද නගරාධිපතිතුමා වෙන්නේ. මම මේක කර්මාන්ත කමිටුවෙන් උපුටා ගත්තාට මට බහුතික සම්පත් එකෙත් තිබුණා ඒවගේ ප්‍රශ්ණයක්. ඒක ඉදිරිපත් කිරීමටත් නොහැකි වුණා. දැන් මේක නගරාධිපතිතුමා දැක දැකම මම හිතන්නේ මේක සදාචාරාත්මක නැහැ. මේක කරුණාකරලා මේ අයිතිමය ඉවත් කරගන්න කියලා ඔබතුමාට යෝජනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේකේ නිවැරදි කිරීමක් කරන්න වෙනවා.මමත් දැක්කේ දැන්. නමුත් මේක මම ඉදිරිපත් කළේ. ඒ ලියුම ඇති සමහරවිට මේකේ. 7 වන පටුමගේ ගලියක් හදලා එතැනට වතුර බැස්සවීම සම්බන්ධයෙන්. මේ ලියුම තියෙනවා. ඇමුණුම 16. මේක නෙවෙයි මම ඉදිරිපත් කළේ. මට මේ ඔබතුමාගේ එකම ඉදිරිපත් කරන්න පිස්සුවක් නැහැ. 7 වන පටුමගේ පයිලට් ප්‍රොජෙක්ට්

එකක් විදියට. මේක ලොකු ප්‍රොජෙක්ට් එකක්. මේ මන්ත්‍රීතුමා කියන එක ඒක කරන්න පුලුවන්නම් හොඳයි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබේ ඒ අදාළ කටයුත්ත තමයි සිද්ධ වෙන්නේ එතුමා 7 වන පටුමගට අදාළ දැන් අපි කල්පනා කරමින් ඉන්නේ එතැන ජලය බැස්සවීම රේල් පාර යටින් බැස්සවීම ටිකක් දුෂ්කර කටයුත්තක්. නමුත් හැබැයි දීර්ඝ කාලීන විසඳුමක් විදියට අපිට යන්න වෙන්නේ එහෙම වැඩකින් තමයි. හැබැයි අපිට පුලුවන්නම් මැන් හෝල් කිහිපයක් හරහා පොලොවට වතුර ටික උරාගන්න බස්සන විදියට සංවර්ධන කටයුත්තක් කරන්න ඔය 7 වන පටුමහට වෙන විසඳුමක් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 7 වන පටුමගෙත් 6 වන පටුමගෙත් 5 වන පටුමගෙත් වතුර එක අයින දිගේ කාණුවකට අරගෙන මැදින් බස්සවන්න පුලුවන්. ඒක ඔබතුමාගේ උනන්දුව, කැපවීම මතයි මේක සිද්ධ වෙන්න්. ඔබතුමා පොඩ්ඩක් හරි මේකට අකමැතිනම් මේක සිද්ධ වෙන්නේ නැහැ නගරාධිපතිතුමා. ඔබතුමාගේ උත්සහාය මේක කිරීමටනම් මේ කාණුව දාන්නනම් ඒකට සම්පූර්ණ සහයෝගය ඔබතුමාට ලබා දෙනවා. ඒ අවශ්‍ය කටයුතු සියල්ලම සම්පාදනය කරගන්න පුලුවන් නගරාධිපතිතුමා ඉතින් ඒකට පොඩ්ඩක් උනන්දු වෙලා ස්ථිරසාර විසඳුමකට අපි යමු කියලා තමයි මගේ යෝජනාව. මොකද අර සිලින්ඩර් බැස්සවීම දැන් අත්හදා බලන්න කියලා එකක් බස්සනවා. ඔබතුමත් දන්නවා රේල් පාර අයිනේ ඉන්න නිසා, රේල් පාරේ අයිනේ සිලින්ඩරයක් බැස්සුවාම නගරාධිපතිතුමා ලොකු සිලින්ඩරයක් කියන්නේ අඩි 3ක් 4 ක් විෂ්කම්භයක් තියෙන ලොකු වළක්. ඕක අඩි ගානක් වැළලුවාම පාරේ කොහොමද මනුස්සයෙක් යන්නේ. අනික රේල් පාර කියන්නේ ලොකු ධාරිතාවක් තෙරපන තැනක්. ඒක කඩාගෙන එනවා සිලින්ඩර. ඒවා තියෙන්නේ නැහැ. ඉතින් ඒක එච්චර සාර්තක විසඳුමක් නෙවෙයි. බොරුවට මේ සිලින්ඩර බස්සලා නිකන් බොරුවට අපේ සභාවේ මුදල් වියදම් කරනවාට වැඩිය තව ටික දවසක් පහුවුණත් හරි මේ යෝජනාව පොඩ්ඩක් කතා කරලා සී.ජී.ආර් එකත් එක්ක කතා කරලා මොකද මාලන් කියන ඉංජිනියර් කතා කළා මේක කරමු කියලා සී.ජී.ආර් එකේ. එතුමාට පොඩ්ඩක් එන්න කියලා කතා කළානම් පුලුවන් මේ සභාවෙන් උදව් කරලා ඒ වැඩේ කරගන්න.

**06(8) 2025.09.19 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ සියලුම නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ වැය ශීර්ෂය 1501 පිටු අංක 9 ගර්භනී මව්වරුන්ට හිතනවා ඇති මොකද මම මේ හැම මාසෙම ගර්භනී මව්වරුන් පිළිබඳව සොයා බලන්නේ කියලා. දැන් මම මාස දෙකක් තිස්සේ මේ ගර්භනී මව්වරුන් පිලිබඳව සොයනවා. මොකද අපි පෙර පාසල් දරුවන්ට වර්ෂයකට මිලියන 7 ක් වියදම් කරනවා දිවා ආහාරය සඳහා. එතකොට අපේ ගැබනි මව්වරුන් අපේ සම්පතක්. අපිට පුලුවන් වෙන්න ඕන මේ කිරිපැකට් වලට එහාගිය යමක් දෙන්න පුලුවන්නම් ඒ නිසා මමත් මේ තොරතුරු හෙව්වා. හොයනවා. තවම මට හම්බවුණේ නැහැ. එතකොට මම කොමසාරිස්තුමියට තොරතුරු දැනගැනීමේ පනත යටතේ ලියලා එතුමියගේ කාර්යාලයේ ඒ නිලධාරියාව ගෙනෙල්ලා පරීක්ෂණය කරන ෆයිල් එක, එතකොට මම නීරීක්ෂණය කරනවා මාසිකව ඉල්ලන කිරිපැකට් ප්‍රමාණය ඒගොල්ලන් ගන්නේ අවුරුද්දට සැරයයි. ජනවාරි මාසේ ඉඳලා දෙසැම්බර් මාසේ දක්වා දෙන සංඛ්‍යා ලේඛන අනුව තමයි මේ මාසිකව ඉදිරිපත් කරන්නේ. ලොජිකලි අපි ගත්තොත් ගර්භනි මවක් මාස 9යි ඉන්නේ සායනයක. මාස 12ක් වෙන්නේ නැහැ.

එතකොට මාසෙන් මාසෙට වෙනස් වෙන්න ඉඩ තියෙනවා. ඒ නිසා අපිට මාසෙන් මාසෙට කොහොමද මේ වාර්තාව ගන්නේ. මේ අවුරුද්දට සැරයක් දෙන ලිඛිත වාර්තාවෙන් අපිට පුලුවන්ද මේ මාසෙට අදාළ කිරිපැකට් ටික ලබා දෙන්න. අපිට පුලුවන් වෙන්න ඕන මීන් එහාට දෙයක් දෙන්න පුලුවන්නම් ගර්භනී මව්වරුන්ට. එතකොට මම මේ දෙවනි වතාවටත් ඉල්ලනකොට මාව වටේට වටේට යවනවා තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඒ තොරතුරු දෙන්න බැහැ ඒක තර්ඩ් පාටි ඉන්ෆෝමේෂන්. ඉස්සෙල්ලාම මට කිවුවේ මට ඉල්ලන්න දන්නේ නැහැ මම වැරදි තැන තොරතුරු ඉල්ලුවේ කියලා. දෙවන මාසේ මම ඉල්ලනවා තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඊට පස්සේ ඒකේ කොපි එකක් ඉල්ලනවා ඒකත් කිවුවා ඒක දෙන්න බැහැ. ඒකත් ඔබතුමිය නැවත ඉල්ලන්න කියලා. ආයෙත් නැවත ලියුමක් දෙනවා. නැවත ලියුමක් දුන්නොත් දවස් 14යි. එතකොට මට ලැබෙන්නේ නැහැ. මේක මට අවශ්‍යතාවයක් නැහැ. නමුත් අපේ මේ ගැබනි මව්වරුන් කියන්නේ සම්පතක්නේ. අපිට කිරි පැකට් එකට වඩා වැඩි යමක් දෙන්න පුලුවන්නම් අපි කරමු. ඒ නිසා ඉදිරියටත් මම කියන්නේ, මම මෙයට එකඟ වෙන්නේ නැහැ කිරි පැකට් දෙන ප්‍රමාණය සම්බන්ධව. ඒ නිසා මේ සම්බන්ධව ටිකක් හොයලා බලන්න. හරි තොරතුරු ලබා දෙන්න. මේ වතාවේ මේ කිරිපැකට් වලට ගෙවපු මුදල කමිටු වාර්තාවේ නැහැ. නමුත් වැය ශීර්ෂයට යනවා. එහෙම කොහොමද යන්නේ? මුදල් කමිටුවට එන්නේ නැතුව වැය ශීර්ෂයට යන්නේ කොහොමද? අපි සාමාන්‍යයෙන් ආඥා පනත අනුව ඕනම වියදමක් අපි මුදල් කමටිවුට යොමු කරන්න ඕන. එතැනින් තමයි අපිට වැය ශීර්ෂයට යන්නේ ඕක. සභාවට එන්න ඕන. ඉතින් අපිට කමිටු වාර්තාවට එන්නේ නැතුව වැය ශීර්ෂයට යන්නේ කොහොමද මේ 51000/-. ගිය මාසෙ එනවා වාර්තාට මේ මාසේ එන්නේ නැහැ. නමුත් වැය ශීර්ෂයේ ගෙවීම් යනවා 51000/-ක්. පහුවෙලා හරි එන්න එපැයි කමිටුවට. ඒක ගැන ටිකක් සොයා බලන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, තවදුරටත් මම අධ්‍යනය කරන්නට ඕන. මට හිතෙනවා මේ මතුකරන තර්කය නිවැරදියි. අපි දැන් බලය ලබා දීලා තියෙනවානේ මූල්‍ය බලයත් තියෙනවා. එතකොට ලක්ෂ 5,10 සීමාවට යටත්ව ඒ දුන්නට පස්සේ ආපසු ඒ දීපු එක නැවත සභාවට ගන්න බැහැ. එතකොට අර වියදම් පෙන්නනවා වැය ශීර්ෂය ඇතුලේ. ආයේ මුදල් කමිටුවට ඇවිත් ඇවිත් යන්න ඕන නැහැ. හැම වියදමක්ම සභාවට එන්න ඕන නැති නිසා අපි ඒ නිශ්චිත විදියට බලය බෙදලානේ කරගන්න දෙන්නේ. එතකොට සභාව තමයි ඒක දෙන්නේ. හැබැයි අවසානයේ සභාවට අනිවාර්යෙන්ම වාර්තා කරන්න ඕන.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සිත්ති මසීනා මන්ත්‍රීතුමිය කියන්නේ ප්‍රෙග්නන්සි කාලේ මාස දහයයිනේ. දැන් ජනවාරි මාසේ එක්කෙනෙක් රෙජිස්ටර් වුණොත් දහවෙනි මාසෙන් එයාගේ වැඩේ ඉවර වෙන්න එපැයි. නමුත් දොළොස් වෙනි මාසේ දක්වාම එන්නේ ජනවාරි බිලම තමයි එන්නේ. ඒක වෙන්න බැහැනේ මාස 12ක් යන්නේ නැහැනේ බබෙක් හම්බවෙන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදින්නාදු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, එතකොට අතන සංඛ්‍යා වල වෙනස්කම් සිද්ධ වෙනවා ඇති නේද?

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඔව් ගැබනි මව්වරුන්ගේ සංඛ්‍යාවේ උච්චාවචනයක් තියෙනවා. අපි ඒක පිසිකලි ගමු ඒක. මොකද මේ අපේ සභාවේ සල්ලිනේ.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය, අපි සභා වාර්තා වලට එකතු කරන්න ගියොත් මහා ගොඩක් කොළ, අපිට සොයා බැලීම කරගන්න පුලුවන් ෆයිල් වලින්. ඒ කියන්නේ මේකේ සංඛ්‍යාව හරි කියනවානම් පුලුවන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, අපිට පුලුවන් වෙන්න ඕන මීට එහානින් යමක් දෙන්න අපේ ගැබනි මච්චරුන්ට. අනෙක් එක තමයි වැය ශීර්ෂයේ 1404 පිටු අංකය 7. තැපැල් හා මුද්දර ගාස්තු නැවත මට ගැටලුවක් තියෙනවා ගිය වාරයෙත් ඒ ගැටලුව ආවා. ලක්ෂයකින් 80000/-ක් වියදම් කරනවා 20000ක් ඉතුරු වෙනවා. අපි ඇත්තටම රීම්බස් කරන්න ඕන 80000ක්. නමුත් මේකේ වැය ශීර්ෂයේ නැවත ලක්ෂයක් ගෙවනවා. නමුත් ප්‍රතිපූර්ණය කරනවා ලක්ෂයක්.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය, එතනින් අඩු වෙනකොට අපි නිරන්තරයෙන් තියන්න ඕන නිශ්චිත මුදලක් තියෙනවා. ඒ මුදලින් පංගුවක් අඩු වුණාම ඔබ කියන්නේ අර ඉතුරු එකට හරියන මුදල තියන්නනේ. ලක්ෂයනම් විසිදාහක් ඉතුරුයිනේ දැන් මෙතන ආයේ දෙන්න ඕන 80000යි. දැන් අපි ලක්ෂයක් දෙනවා. ලක්ෂයක් දීපුවාම අපි වැඩිපුර ප්‍රමාණයක් එකයි විස්සක් තියෙනවා. නැහැ ඒක තමයි මුද්දර මැෂින් එකකනේ. ඒකේ බැලන්ස් එක අපිට තියෙනවානේ. ඔබ කියන තර්කය හරි. හැබැයි ඒකේ මුදල් වල මුකුත් අයථා දෙයක් සිද්ධ වෙන්නේ නැහැ.

**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ඔඩිට් පර්පස් එකකට මේක ඕන වෙනවානේ. අපිට කියන්න බැහැනේ මේක තමයි වෙන්නේ මෙහෙම තමයි වෙන්නේ කියලා. අපිට හිතන්න බැහැ. ඒ නිසා මේක ලිඛිතව තියෙන්න ඕන.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඔතන මෙහෙමයි දැන් අපි පොඩි කාලේ හදනවානේ සුළු මුදල් පොතක්. එතකොට එකවුන්ටන් දන්වානේ සුළු මුදල් අග්‍රිමය කියන එක. එතකොට දැන් මෙතනදි කොහොමද වෙන්නේ 20ක් ඉතුරු වෙලා තියෙද්දි 100ක් එන්නේ කොහොමද? එතකොට 120ක් එනවානේ. එතකොට අපිට වෙන් කරලා තියෙන ප්‍රමාණයට වඩා අපි ගිහිල්ලා තියෙනවානේ. එතකොට වැරදිනේ?

**නාගරික ලේකම් - එම්.කේ.ඩී.ටී. මුණසිංහ මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒකේ තත්ත්වය මේකයි. මගේ විශයක් ඒක. තැපැල් කන්තෝරුවෙන් මෙම සභාව වෙත නිකුත කර ඇති මුද්දර තැපැල් යන්ත්‍රයට එක් වරකදී ඇතුළත් කළ හැක්කේ රුපියල් ලක්ෂයක මුද්දර ගාස්තු වටිනාකමට සමාන මුදලක් එම රුපියල් ලක්ෂයක මුදල සම්පූර්ණයෙන් අවසන් වී නැවත රුපියල් ලක්ෂයක මුදලක් ගෙවීම සඳහා සභාවේ ගෙවීම් කාර්ය පටිපාටිය අනුව දිනක් හෝ දෙකක් හෝ ඇතැම්විට ඊට වඩා වැඩි කාලයක් වුවද ගත විය හැකියි. එම නිසා තැපැල අක්‍රිය නොවී පවත්වාගෙන යාම සඳහා තැපැල් මුද්‍රණ යන්ත්‍රයේ ශේෂය රු.80,000/- ඉක්මවන විට නැවත රුපිලයල් ලක්ෂයක් ගෙවීම සඳහා වවුචර සකස් කර ගෙවීම් ක්‍රියාවලිය ආරම්භ කරනවා. නමුත් තැපැල් මුද්‍රණ යන්ත්‍රයේ ශේෂය අවසන් වූ විට තමයි චෙක්පත තැපැල් දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන්නේ. අපිට අනුමත කරලා තියෙන්නේ එක වරකට රුපියල් ලක්ෂයක මුදලක්, ඒක

තැපැල් දෙපාර්තමේන්තුව එක්ක කරන ගනුදෙනුවක්. අපි ඒ ගැන හිතලා මේ ආයතනය පවත්වාගෙන යැමේ අවශ්‍යතාවය මත කරන දෙයක් නිසා එතැන වෙන වරදක් හෝ කාර්යයක් සිද්ධ වෙන්නේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක අපි කියන්නේ නැහැ වංචාවක් කියලා. මේක වංචාවක් කරන්න බැහැනේ. වංචාවක් කියන්නේ කාගේහරි සාක්කුවකට යනවානම්නේ. කාගේහරි සාක්කුවකට යන්නේ නැහැ. හැබැයි මේක ගිණුම් තැබීමේ නිවැරදිතාවය සම්බන්ධයෙන් තියෙන ප්‍රශ්ණයක්. ඒ නිසා මේක වැරදි ඒක පිලිගන්න. මේකේ එහෙම කරන්න බැහැ. අපේ ලක්ෂය දීලා තියෙන නිසා අපි ලක්ෂය ගන්නවා. එහෙම කරන්න බැහැ ඒක වැරදි. ඒ නිසා කරුණාකරලා අනික් දවසේ හරි මේක නිවැරදි කරගන්න. මාසෙට වියදම් කරන්නේ අපි රුපියල් 80000 නම්, අපිට 80000 විතරයි පෙන්නන්න පුලුවන්. අපිට ලක්ෂය පෙන්නන්න බැහැනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ නගර සභාවේ ලෙජර් එකවුන්ට් එකේ අප්ඩේට් එකක් තියෙයි නේද එතකොට. මම හිතුවේ නැහැ පොස්ටල් ඩිපාර්ට්මන්ට් එකේ එහෙම සංචිතයක් තියෙනවානම් අපේත් ලෙජර් එකවුන්ට් එකක් මේන්ටේන් වෙන්න ඕනනේ තැපැල් කාර්යාල වෙනුවෙන්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදින්නාදූ මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔව්, දැනට අපි පවත්වාගෙන යන පිළිවෙල තමයි මේ පැහැදිලි කිරීම කළේ. ඒකේ හරි තියෙයි වැරදි තියෙයි. අපි බලමු අර කිවුවා වගේ මේවා වල තියෙන අඩුපාඩුකම් නිවැරදි කරගන්න පුලුවන්ද කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, වැය ශීර්ෂයේ 1101 මන්ත්‍රී ගමන් වියදම් ගිය සභා වාරයේ දී මන්ත්‍රී ගමන් වියදම් සඳහා 49 දෙනාට තුන්ලක්ෂ දහඅටදහස් පන්සියය වෙනුවෙන් අපි වැය ශීර්ෂයේ පෙන්නුම් කරනවා තුන්ලක්ෂ දහඅටදහස් පන්සියයක්. ඒකට පිළිතුරක් ලැබුණේ නැහැ. ඒකේ වෙනස් කිරීමක් හරි ඒකේ පිළිතුරක් හරි අපිට දෙනවා කියලා කිවුවා. නමුත් ඒකට එජෙස්මන්ට් එකක්වත් නැහැ මුදල් කමිටුවේ. නමුත් මම දකිනවා වැය ශීර්ෂයේ ඒ ලක්ෂයක වෙනස ජූනි මාසේ සහ ජූලි මාසේ එකතුවට ඒකතු කරලා හත්ලක්ෂ තිස්හත්දාහක් දාලා තියෙනවා. එතන ලක්ෂයක් වැඩියි. මෙතනින් අඩු කරලා අතනට දැම්මා අතනින් අඩු කරලා මෙතනට දැම්මා. ඒ වැඩේ කරන්නනම් බැහැ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දූ මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, මන්ත්‍රීවරු ගියා වැඩමුළුවකට. ඒ වැඩමුළුවට මන්ත්‍රීවරුන්ට යන්න බස් එකට ගත්තා. ඒ බස් එකට ගිය වියදම තමයි මන්ත්‍රී ගමන් වියදම් වලට එකතු වුණේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ ගමන් වියදම මේ මාසිකව ගරු මන්ත්‍රීවරුන්ට දෙන දීමනාවට එකතු කරන්න පුලුවන්ද? මේක ඔඩිටර් ළඟට ගියානම් මේක අපිට කොහේහරි එකක් එනවා අවුරුද්දේ අන්තිමට. මොකද අපිට වැඩිපුර ගෙවලා කියලා ලක්ෂයක්. එතකොට අපි අධිභාරයට ලක්වෙනවා. මේ ලක්ෂය කොහේටද යනන ඕන වැය ශීර්ෂයේ. වෙනම ගන්න. විදේශීය දේශීය වියදම් කියලා තියෙනවානේ ගමන් වියදම්. ඒක වෙන්කරලා පෙන්නන්න. නැත්නම් අපි අධිභාරයට ලක්වෙනවා. වැය ශීර්ෂයේ 1004 මන්ත්‍රී කමිටු දීමනා අගෝස්තු මාසයට ගෙවලා නැද්ද කමිටු දීමනා. ගෙවීමක්

සිදු කරලා නැහැ වැය ශීර්ෂයේ අගෝස්තු මාසෙට. නමුත් මම දන්නවා කමිටු රැස්වීම් වලට අපේ මන්ත්‍රීවරු ආවා. පන්සියය ගානේ ගෙවන්න ඇති. වැය ශීර්ෂයේ ඒ ගෙවීම් සම්බන්ධව සඳහනක් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මුදල් කමිටු වාර්තාවේ 8(5) ඉඳලා තියෙනවා කාපාහැරීම් වරිපනම් බදු මුදල් කපා හැරීම් අපි අහන්න ඕන වෙනදට එනවා මේ මොකක් හරි බොරු වගන්තියක් හරි දාලා මෙන්න මේ වගන්තියට ප්‍රකාරව මෙන්න මේ බදු මුදල් කපා හරිනවා කියලා මේකෙ මොකුත්ම නෑ මං අහන්නේ මේක කපා හරින්නේ මොන වගන්තියට යටතේද කිසිම වගන්තියක් දාලා නැහැ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවේදී ප්‍රධාන නාගරික ගණකාධිකාරීතුමියට අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබාදෙනවා.

<u>ප්‍රධාන නාගරික ගණකාධිකාරී - එන්.ඩී.ටී. ප්‍රබෝධිනී මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, වරිපනම් අය කර ගැනීමේදී මේ වගේ ප්‍රායෝගික ගැටළු ඇවිල්ලා තියනවනේ. එතකොට අපි නිරන්තරයෙන්ම කියනව අර මුලින් කියපු වගන්තිය වැරදියි කියනකොට වෙන වගන්තියක් අපි දැනුවත්ව නැහැ. එතකොට මේවා කපා හරින්නේ නැතුවම තමයි තියන්න වෙන්නේ. එම නිසා නිලධාරීන් විදියට අපිට තියෙන්නෙ සභාවට ඉදිරිපත් කිරීම පමණයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉතින් වැරදිනේ, එතුමන්ලා වැරදියි කිව්වට එ වගන්තියෙන් තමයි අපිට අර කපා දැමීමට ප්‍රතිපාදන ලැබිලා තියෙන්නේ. එතකොට ඒ වගන්තිය ඇතුලත් කර නොසිටීම එතුමන්ලා පෙන්නලා දීපු එක වරදක් ලෙස පිළි අරගෙන දැන් ඊට වඩා වරදක් කරලා වගන්තියක් නැතුව යනවා. අපිට බදු මුදල් කපා හරින්න තියෙන එකම වගන්ති එච්චරයි නේ. එතකොට එතුමන්ලා ඒක ප්‍රශ්න කරා, හැබැයි ඒක ප්‍රශ්න කරාට දැන් අපි ඒකත් අයින් කරලා. එහෙම තමයි විපක්ෂය. මේකේ නීතිමය වගකීමක් තියෙනවා. එතුමන්ලා වැරදියි කිව්වට කමක් නැහැ අපිට මොකක් හරි කියාගන්න පදනමක් තියෙනවානේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා 11 කරුණට, එම කරුණේ නාගරික ගණකාධිකාරී ආදායම් විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සලකා බැලීම. කඩ කාමර කුලී තක්සේරු කිරීම අන්තර්ගත කරුණු දිගරොල්ල පාලම අසල නගර සභා භූමියේ පවතින දැනට කඩ කාමර කුලී ගෙවාගෙන යන කඩ කාමරවල ලැස්තුව මේ සමග අමුණා ඇත. ඒ අනුව, එම ස්ථානයේ කඩ කාමර  හයක් සඳහා කඩ කාමර කුලී ගෙවන බවට සඳහන් වේ. නමුත් නගර සභාවට අයත් භූමියේ භෞතිකව කඩ කාමර දහතුනක් පවතින බවට මා විසින් හඳුනාගෙන ඇත. එම කඩ කාමරවල තොරතුරු ඇමුණුම් අංක 03 මගින් දැක්වේ. හයකට ගෙවනවා කඩ කාමර දහතුනක් තියෙනවා. එම කඩ කාමර වලට අදාල දේපළ හිමිකම් ඔප්පුව මේ සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරී චූලරත්න මහතාගෙන් ඉල්ලා සිටි නමුත් මේ වන තෙක් එය ලැබී නොමැති බව පවසන ලදී. ඒ අනුව එම කඩ කාමර සඳහා ගතයුතු ක්‍රියාමාර්ගය සම්බන්ධව මුදල් කමිටුවේ නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ තියෙනවා ගරු නගරාධිපතිතුමා සභාවට අයත් ස්ථාන ගොඩනැගිලි වල අයිතිය මහ නගර සභාවට අයත් බවට තහවුරු කරගෙන වරහන් ඇතුලේ හිමිකම් සහතික ඔප්පු මගින් බදු දීම හෝ කුලියට දීම සුදුසු බව 2025.08.22 දින බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ lgd/6/ 2019 චක්‍රලේඛනයෙහි සංශෝධනය විය යුතු කරුණු සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවේ දී,පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී විසින් ප්‍රකාශ කරන ලද බවත්, ඒ පිළිබඳව අවධානය යොමු කර මෙම ස්ථානය සම්බන්ධයෙන් කටයුතු කිරීම සුදුසු බවත් සඳහන් කර ඉදිරිපත් කරමි. දැන් මේකෙ තියෙන්නේ ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ගිය පුහුණුවක එතන පුහුණු නිලධාරියා, ජොෂ්ඨ විමර්ශන නිලධාරිය කියපු කතාවක් මෙන්න මෙහෙම දෙයක් කිව්වා ඒ නිසා මෙන්න මේක මෙහෙම කරන්න ඕනේ කියලා කියනවා. එහෙම නැතුව ලිඛිත නීතියක් නැහැ. එහෙම ලිඛිත නීතියක් නැතුව වැඩ කරන්න බැහැ නිලධාරීන්ට. ඉතින් කොහොමද උක්ත කරුණු සලකා බැලූ කමිටුව ඉඩම් අයිතිය සනාථ කර ගැනීම සඳහා කඩිනමින් කියලා ඔබතුමාලා දාලා තියෙනවා. අපි අහන්නේ කඩ කාමර හයක කුලිය අපිට ගෙවනවනම් කඩ කාමර 13ක් තියෙනවනම් ඇයි අපි අනිත් කඩ කාමර වල කුලිය ගන්නේ නැත්තේ. ඒක අපිට ප්‍රශ්නයක් හයක අපිට ගෙවනවා නම් දහතුනෙන් ඉතුරු හතේ අපි ගන්නේ නැත්තේ ඇයි. ඒ නිසා අපිට ඒකට පිළිතුරු දැනගන්න අවශ්‍යයි.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මේ කියන කතාව සත්‍යක් තියෙනවා. නමුත් මම හිතන්නේ මේ කඩ කාමර දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන යනවා. ඒ අයගෙන් අය කරන මුදල, යම් ආයතනය මොකක් හරි කලින් අය කරපු එකක්නේ. ඉඩමේ අයිතිය බලලා නෙමෙයිනේ අය කිරීම් කරේ ඒ අය කිරීම් ඇතුලෙ තියෙන්නෙ තාම මාසෙකට රුපියල් 500ක වගේ ගානක් ඔය කඩ පේළියෙන්ම.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඔය ඉඩම මොරටුව සංවර්ධන සැලැස්මටත් අයිති ඉඩමක්.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ නිසා මම කියන්නේ ඉතුරු කඩ ටිකෙන් මාසික මුදලක් අය කළ යුතුයි. භූමියේ අයිතිය නිරවුල් කරගන්න එක ද පවත්වාගෙන ගිහිල්ලා ඒක කරගන්න ඕන. ඒක වෙනම කටයුත්තක්. මෙතන කඩ ටිකෙන් අය කරද්දි අර කඩ ටිකේ භූමිය නිරවුල් කරගෙනම අය කරගන්න වගේ එකක් මේ කියන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, 12(16) අපේ විපක්ෂ නායකතුමා මතුකලා වගේ මේකේ තියෙනවා තෙලවල කොට්ඨාශයේ ගාලු පාරේ වරිපනම් අංක 179 දරණ ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති හේයින් බදු නිදහස් කර දෙන්න ලෙස ඉදිරිපත් කර ඇති ඉල්ලීමද ඒ අනුව ස්ථානීය පරික්ෂාවක් කර තක්සේරු නිලධාරී විසින් ලබා දී ඇති වාර්තාව සලකා බැලූ බදු නිදහස් කිරීමේ කමිටුව 23/4 කාර්තුවේ සිට 25/2 කාර්තුව දක්වා වරිපනම් බදු නිදහස් කිරීමට නිර්දේශ කරන ලදී.ඒ අනුව මහා නගර සභාව අඬා පනතේ 240(1) අන්න එකට වගන්තිය දාලා තියෙනවා. වගන්තිය ප්‍රකාරව කපා හැරීය යුතු බදු මුදල රුපියල් හයලක්ෂ අසූනව දහස් එකසීය පනස් අටයි ශත අනූපහකි. හයලක්ෂ ගාණක් කපා හැරලා තියෙනවා අඩුම තරමේ මේකේ නමක්වත් නැහැ. අපි තෙලවල අපේ සමන් මන්ත්‍රීතුමත් තෙලවල දන්නවද මේ ව්‍යාපාරය කොහෙද කියලා. කරුණා කරලා අපිට මේ මොකද්ද ව්‍යාපාරය කියලා කියන්න. 12(16), 12(17). ඒ ව්‍යාපාර දෙකෙම ලොකු ගණන් කපා හැරලා තියෙන්නේ. එකක රුපියල් හයලක්ෂ අසූනව දහස් එකසීය පනස් අටයි ශත අනූපහක්, අනිත් එක තුන්ලක්ෂ තිස්අට දහස් හතලිස් තුනයි ශත අනූවයි.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, එවා නම් වලින් එකක්වත් ඇවිල්ලා නැහැ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මීට කලින් නම් වලින් තිබුණා, දැන් තමයි ඇවිල්ලා නැත්තේ. දැන් අපි අහන්නේ මේ ලක්ෂ 7ක වගේ අපි ගමේ ඉන්න මිනිස්සුත් දන්නේ නැති ව්‍යාපාරය මොකද්ද.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මේ කරුණු අංක 12(16) හා 12(17) අනුමත නොකර තියමු. මීට වඩා වැඩි ගණන් තියෙන සමහර තැන් තියෙනවා. තේරුමක් නැතුව දිර්ඝ කාලයක් පවත්වාගෙන යනවා අය

කරන්නත් බැහැ. කර්මාන්තෙකුත් නැහැ. එකතු වෙලා එකතු වෙලා ගොඩ ගැහෙනවා. ඔබ මේ කාරණාව කියනවනම් අපිට මේක නැවත විමර්ශනයකට යොමු කර ගන්න පුළුවන්නේ. තක්සේරු නිලධාරි වගකීම අරගෙන තියෙන්නේ. නමුත් මන්ත්‍රීවරු ඒ පිළිබඳව මතුකරනවනම් තවදුරටත් හොයලා බලලා කටයුතු කරමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, උස්වත්තේ දෙයක් තිබුණොත් ඔබතුමා උස්වත්තේ හැම තැනම ඇවිදින මනුස්සයෙක් නේ ද? එතකොට ඔබතුමා නොදන්න එකක් වෙන්න විදිහක් නැහැනේ. දැන් මමයි සමන් මන්ත්‍රීතුමයි දෙන්නම දන්නේ නැහැ මේ ගැන. ඇඩ්‍රස් එකකුත් නැහැනේ මේකේ. වරිපනම් අංක වලින් හොයන්න අපිට බැහැනේ. ඒ නිසා ව්‍යාපාරයේ නම තිබ්බනම් ඇති. ඔබතුමාට මතක ඇති. රාහුල මාවතේ කෙළවරේ මැග්ලයින් ආයතනය, එක ගැන අපි කිවුවා විතරයි දැන් ආයතනයේ නම් එන්නෙත් නැහැ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, තොරතුර හරියට දැන ගත්තම හරිනේ

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේකේ ඇත්තටම රාහුල මාවතේ ඉඳලා අඟුලාන හන්දිය දක්වා ව්‍යාපාරයක් කොහෙද වහලා තිබ්බේ කියලවත් අපි දන්නේ නැහැ. ගාලු පාරේනේ මේක වෙලා තියෙන්නේ. අනිත් එක සභා තීරණ සම්බන්ධව කරුණු අංක 13 මේකේ ඔබතුමාලා 2021.01.07 දිනැති සභා තීරණය අවලංගු කරන්න තීරණය කරලා තියෙනවා. ඇත්තටම රේස් ඔට්ටු ක්‍රීඩාවට විරුද්ධව ඔබතුමත් හිටපු සභාවේ ඒකමතිකව තීන්දුවක් අරගත්තා. මේ ක්‍රීඩාවන් මොරටුවෙන් තුරන් කරන්න ඕනේ කියලා තීන්දු කරලා තමයි අපි තීන්දුවක් ගත්තෙ. අපිට නගර සභාවට ලක්ෂයක් එකහමාරක් ලැබෙන්න පුළුවන් මාසෙට හැබැයි ඊට වඩා ප්‍රමාණයක් අපේ අහිංසක දරුවෝ බඩගින්නේ ඉන්නවා. මේ මිනිස්සු ගිහිල්ලා රේස් ඔට්ටු දැම්මහම. මොරටුවේ මෙය දැන් ශීඝ්‍රයෙන් පැවතීගෙන යනවා. ඉතිං ඒ නිසා මෙය මහජනතාවගේ නියෝජිතයෝ හැටියට අපි බැලුවේ. අපි උදේත් කතා කරා ළමයි ගැන. මහජන නියෝජිතයෝ හැටියට අපේ මේ අරමුණ වුණේ පැහැදිලිවම අපි හිටපු මන්ත්‍රීවරු හැටියට අපි ඔබතුමාලා හතර දෙනාත් ඉන්න සභාවේ තමයි මේක ඒකමතිකව සම්මත වුනේ. මේක වරිපනම් බදු අය කරන්නේ නැහැ, මේක අපි මොරටුවෙන් අයින් කරන්න අවශ්‍ය කටයුතු කරනවා කියලා. එවට අවශ්‍ය ලිපි ලේඛණත් අපි හදලා යැව්වා. හැබැයි ඉතින් දැන් ආපහු තීන්දු කරලා තියෙනවා සභා තීන්දුව අහෝසි කරලා ඒ බදු මුදල් ආපහු නැවත වරක් ලබා ගන්න ඒ කියන්නේ ඔබතුමාලා එකඟද මොරටුවේ සූදු ක්‍රීඩාව කරනවට. ඒකද මේකෙන් අදහස් කරන්නේ?

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගෙන් තමයි මට මේ ප්‍රශ්නය අහන්න වෙන්නේ ඔබතුමන්ලා සූදු, ඔට්ටුරේස් නවත්තන්න කියලා අරමුණින් තමයි මේක ගෙනාවේ. හැබැයි 2021 ට කරේ ඔට්ටුරේස් නවත්තන එක නෙමෙයි මේ සභාවෙන් වුනේ. ඒවයෙන් අය කරන බද්ධ නවත්තපු එක. ඔට්ටුරේස් නැවතුනේ නැහැ. ඔට්ටුරේස් යනවා බද්ද නැවතුනා. ඔට්ටුරේස්කාරයාට බදු සහනයක් දුන්නා. දැන් මේක පාලනයක් අණ්ඩුවක් විසින් ගතයුතු තීරණයක්. ඒ වෙලාවෙත් මට හොඳටම මතකයි මම කිව්වා බන්ඩාරගම ආසනේ ඒ වෙනකොට එක තැබෑරුමක්වත් තිබුණේ නැහැ. දැන් දාලා. එතකොට හරක් මස් විකුණන තැන් තිබුණෙ නැහැ. රත්නසිරි වික්‍රමනායක මහතා ඒක කරගත්තේ කොහොමද කියලා බලලා ඒ පදනමින් මොරටුවටත් කරමු කියලා. හැබැයි එහෙම කිසිම කටයුත්තක් සිදු වුණේ නෑ. මේ ආයතනයට ගෙවන බද්දත් නැතුව ඔට්ටුරේස් කරගෙන යන එක තමයි තියෙන විරෝධය එහෙනම් අපි ඒ බද්ද අය කරගන්න ඕනේ, ඔට්ටුරේස් නවත්තන

සාකච්ඡාවක් වෙනම ගන්න ඕනේ. දැන් තමන් කරපු වරදක්, වරදක් ලෙස පිළිගන්නවා වෙනුවට පෙරළා මේක දැන් අපි ඔට්ටුරේස්වලට අවසර දෙනවා වගේ විමසීමක් කරනවා. නෑ ඔට්ටුරේස් වලට අවසර දීමක් නෙමෙයි කරන්නේ. ඉතිහාසයේ වෙච්ච වරදක් නිවැරදි කරනවා. පුංචි කඩේකිනුත් බදු අය කරද්දී ඔට්ටුරේස්වලට බදු නිදහස දීලා. ඉතින් ඕක තමයි මට පැහැදිලි කිරීම කරන්න තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේක ඔබතුමා මගෙන් අහලා හරියන්නේ නෑ. ඒක ආණ්ඩු පක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන්ගෙන් අහන්න ඕනේ. ආණ්ඩු පක්ෂයෙන් යෝජනාවක් ගෙනාවම විපක්ෂයෙන් ඒක ස්ථිර කරනවා. ඒකෙන් කියවෙන්නෙ නෑ ස්ථිර කරන කෙනා මේ යෝජනාව ගේනවා කියලා. ඒ නිසා මේක හොඳ යෝජනාවක්නම් ස්ථිර කරනවා. ඉතින් රේස් බයි වලට අපි විරුද්ධ නිසා අපි ඒක ස්ථිර කරා. හැබැයි ප්‍රශ්නෙ තියෙන්නෙ වරිපනම් අය කරේ නෑ වගේම ඒ වෙනකොට තියෙන කිසිම දෙයක් සභාවෙන් දෙන සහයෝගයක් හෝ අනුග්‍රහයක් ලබා දෙන්න නගර සභාව මැදිහත් වුණේ නෑ. කුණු ටික අයින් කිරීම පවා ප්‍රතික්ෂේප කරා. ඒ නිසා අපි උත්සාහ කරේ අපි හිතුවා මේ යෝජනාව කරලා මේකට අවශ්‍ය කටයුතු සම්පාදනය කරාට පස්සේ මේ තියෙන විෂබීජ ටික අයින් කරගන්න පුළුවන් වෙයි කියලා. නමුත් ඒක කරන්න බැරි වුණා. ඔය දැන් ඔබතුමාලා කියනවා නම් මේක අය කරගන්න කියලා එක ඔබතුමාලගේ වැඩක්. ඒක අපිට ගැටළුවක් නැහැ. අපිට ඒ සම්බන්ධයෙන් විරෝධයක් නැහැ. අපි මතක් කරලා දුන්නේ ඔබතුමාලත් හිටපු සභාවේම තමයි මේක කරේ කියලා. ඊට පස්සේ 21. මේ සැපයුම්කරුවෝ සැරින් සැරේට ලියාපදිංචි කරනවා ගරු නගරාධිපතිතුමනි, දැන් මේ අවුරුද්දේ අන්තිම තාම සැපයුම්කරුවෝ ලියාපදිංචි කරනවා තව මාස දෙකයි තියෙන්නේ අවුරුද්ද ඉවර වෙන්න. ඒත් සැපයුම්කරුවෝ ලියාපදිංචි කරනවා මේ මොන හේතුවකටද මේ හදිසියේ සැපයුම්කරුවෝ ලියාපදිංචි කරන්නේ කියලා අපිට ප්‍රශ්නයක් තියෙනවා. අනිත් එක තමයි 22 (03) ඒකෙ තියෙනවා මේ සුදු රෙදි ගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටු වාර්තාව ඇවිල්ලා. ප්‍රසම්පාදන කමිටු වාර්තාව මුදල් කමිටුවට එනකොට රෙදි අරගෙන කොඩිත් මහලා කොඩි එල්ලලත් ඉවරයි. ඒ නිසා කොඩි ටික ඉක්මනට මහපු එක සම්බන්ධයෙන් අපි ඔබතුමාට අපේ ගෞරවය පිරිනමනවා. ඔබතුමා තමයි මැදිහත් වෙලා මැහුවෙත්. ඒක සම්බන්ධයෙන් අපේ ගෞරවය පිරිනමනවා. ප්‍රසම්පාදනයට එනකොට වැඩේ ඉවරයි. වැඩේ නරකයි කියලා කිව්වෙ නෑ වරදවා පිළිගන්න එපා. මහපු සල්ලි මේකට දාලත් නැහැ මං හිතන්නේ ඔබතුමා ගානේ තමයි මේක මහලා තියෙන්නේ. ඒවා අපිට ආරංචි වුණා. ඒවා අගය කරනවා. 25 කරුණේ තියෙනවා නාගරික ගබඩාව සඳහා කාබොලික් සබන් කෑට 3000ක් මිලදී ගැනීම වෙනුවෙන්, ඇනවුම් කිරීම සඳහා ආවරණ අනුමැතිය ලබා දුන් දිනය 2025.07.22 මේක අරගෙන තියෙනවද නැද්ද කියලා දාලා නැහැ. මේ සබන් කෑට අරගෙන තියෙන්නේ හාර ලක්ෂ විසිහතර දාහස් අටසීයක.

<u>නාගරික කොමසාරිස් - එල්.පී. මනෝජා එස්. පතිරණ මෙනවිය</u>

ගරු නගරාධිපතිතුමනී, මට මතකයි මේක මම මේ තුන්දාහක් නිසා මේක සලකා බැලුවා. මේකේ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරලා තිබුණා. සැපයුම් වශයෙන් තමයි මිලදී ගැනීම් සිදුකරේ ඒක ලැබිලද කියලා මට අවබෝධයක් නම් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, 31(1) සහ 31(2) තියෙනවා වාහන හදපුවා. නමුත් අඩුම තරමේ වාහනය මොකක්ද කියලවත් දාලා නැහැ. එතකොට අපි දන්නෑ එකම දේ දෙපාරක් එනවද කියලා අපිට ඒ ගැන කිසි අවබෝධයක් නැහැ. නිකන් ගනුදෙනු ටිකක් විතරයි ඇවිල්ලා තියෙන්නේ. මහා පරිමාණ

ගනුදෙනු ටිකක් විතරයි ඇවිල්ලා තියෙන්නේ. එකක් තියෙනවා අට ලක්ෂ දොළොස්දාස් පන්සීයක තව තියෙනවා දෙලක්ෂ ගණන් තුන් ලක්ෂ ගණන් අට ලක්ෂ ගණන්, විසි නව ලක්ෂයෙකුත් තියෙනවා ජේසීබී යන්ත්‍රයක් සඳහා. ඉතින් මේකේ කිසිම ඩීටේල් එකක් දාලා නැහැ අඩුම තරමේ මේකේ වාහනයේ අංකයවත් එන්න එපැයි මොකක්ද කියලවත්. මෙන්න මේ වාහනය තමයි අලුත්වැඩියා කරේ කියලා. මේක එහෙම කිසිම සඳහනක් නැහැ. මේවා මේ අසම්පූර්ණ වාර්තා. අනිත් එක මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා 32 ට රුපියල් ලක්ෂ දෙසීය පණහක තුන්සීයක අලාභයක් වන ගනුදෙනුව අපි ඒ ගැන කතා කරන්නේ නැහැ. හැබැයි අපිට ප්‍රශ්නයක් තියෙනවා නාගරික ගනකාධිකාරී ආදායම් දීලා තියෙන වාර්තාවේ. නිලධාරියෙක් වාර්තාවක් දානවා ඒක මේ අද වෙන්නත් පුළුවන් නිශාන්ත ප්‍රදීනාන්දු ගෙදර ගිය දවසක වෙන්නත් පුළුවන්. හැබැයි නිලධාරීන්ට මෙහෙම වාර්තා දාන්න බෑ. හැබැයි ඒකේ දානවා හිටපු ඇතැම් දේශපාලනඥයන්ගේ පටු අභිමාතාර්ථයන් ඉටු කර ගැනීමට අත්තනෝමතික ලෙස ප්‍රවේශ මුදලක් පනවා ඇති බවට එම කඩ හිමියන්ගෙන් කිහිපවරක්ම මොරටුව මහ නගර සභාව වෙත චෝදනා එල්ල වී ඇත. මෙහෙම එකක් දාන්න ඕනද නිලධාරියෙක් වාර්තාවකට මේකේ ප්‍රවේශ මුදල් අයකරගන්නවද නැද්ද කියන එක ඔබතුමාගේ පාලනය තීරණය කරන්න ඕනේ. ඒවා සම්බන්ධයෙන් අපි කතා කරන්නේ නැහැ. ඒක ඔබතුමාගේ වගකීමක්, ඒවට සර්වාජ් එයිද එවා ගැන අපි කතා කරන්නේ නැහැ මොකද ඔබතුමාලත් හොඳට අධ්‍යාපනය ලබපු කට්ටිය. එ නිසා එවා දන්නවා අපි එවට කතා කරන්නේ නැහැ. මේ දාලා තියෙන එක කරුණාකරලා ඉවත් කර ගන්න. මෙහෙම දාන්න බැහැ මොන දේශපාලඥයා ගැනවත්. ඒක මොනම පාලනයකදිවත් නොකළ යුතු දෙයක්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එක ගණකාධිකාරි දාන්නේ ඉතින් එතුමාට දැනිච්ච දේ තමයි එතුමා දාලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, එතකොට ඔබතුමා කියන්නේ ඒක දාපු එක හරිද.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, හරිද වැරදිද කියලා අපි තීරනය කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා හරි කියනවනම් ප්‍රශ්නයක් නැහැ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේක හරියට කියව ගත්තහම කලින් දේශපාලඥයෝ විශේෂයෙන් සජිත් මන්ත්‍රීතුමත් දන්නවා කටුබැද්ද සුපර් සිටි සම්බන්ධයෙන්. විශාල ගැටළු ප්‍රමාණයක් ඇති වෙලා තියෙන්නේ. මොන විදිහේ සර්වාජ් වෙනවා කිවුවත් මේ මුදල මම අයින් කරනවා. ලොකු ගාණක් එයි. මිනිස්සුන්ගේ කඩ විශාල ලෙස තක්සේරු කරලා ප්‍රවේශ ගස්තුවක් කියලා එකක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි ඒ ගැන විරුද්ධත්වයක් නැහැ. අපි ඒ ගැන කතා කරන්නේ නැහැ අපි කියන්නේ එක නෙමෙයි. අපි කියන්නේ මේ නිලධාරියා දාලා තියෙන එක ගැන. අපි කතා කරන්නේ මේ වගන්තිය ගැන. කරුණ ගැන නෙමෙයි. ඒක ඔබතුමාගේ කැමැත්ත. අනිත් එක 33 කරුණ මේ සතොස ගොඩනැඟිල්ල සම්බන්ධයෙන් තියෙන ගිවිසුම සංශෝධනය කිරීම සම්බන්ධයෙන්, ඒකේ අංක 06 සහ අංක31, 36 කොන්දේසි සංශෝධනය කරන්න කියන ඉල්ලීම

කරලා තියෙනවා සතොස ආයතනයෙන් සමානයයෙන් එහෙම කොන්දේසි සංශෝධනය කිරීමක් කරන්න පුළුවන්ද නැද්ද කියන එක සම්බන්ධයෙන් අපි දන්නේ නැහැ. අපි හිතන විදිහට එහෙම කරන්න බැහැ. මොකද හේතුව මේ සභාවට ආවාසි සහගත වෙන විදිහට තමයි මේ කොන්දේසි සංශෝධනය කරලා තියෙන්නේ. අංක 06 කොන්දේසිය ඔබතුමාගේ අවදානය යොමු කරනවා ඇමුණුම් අංක 34,35,36 කියලා තුනම තියෙනවා. එකේ අපේ ගිවිසුමේ තියෙන්නේ. එම ආරක්ෂක ඇප තැන්පත් මුදලින් බදු ගැණුම්කාර පක්ෂය වෙතින් ගිවිසුමට විෂයගත දේපලට අදාලව සාදාරණ ක්ෂයවීම් හැර සිදුව ඇති අලාභ හානි ඇතොත් එවාද බිල්පත් සඳහා වූ නොගෙවීම් හිඟ පවත්නා කුලී මුදල් හා ඊට ආදාල දඩ මුදල් ආදී වෙතොත් එවාද අය කර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන මුදලක් වෙනම් එම මුදල ගිවිසුම ගත කාලසීමාවන් අවසන් වී. මාස 03ක කාල සීමාවක් තුළ බදු දීමනා කරු විසින් බදු ගැනුම්කරු වෙත ගෙවීය යුතු අතර බදු දීමනාකාර පක්ෂයේ බලය පැවරූ නිලධාරියෙකු විසින් සිදුව ඇති ආලාභයක් තක්සේරු කිරීම සම්බන්ධව බදු ගැණුම්කාර පක්ෂය එකඟ වේ. කියලා තමයි මේ ඔරිජිනල් ගිවිසුමේ තියෙන්නේ. එතකොට ගරු නගරාධිපතිතුමා, එකේ සංශෝධිත ගිවිසුමේ තියෙනවා ගිවිසුම අවසන් කරන ඕනෑම අවස්ථාවක, ඒ කියන්නේ ගිවිසුමේ කාලසීමාව අවසන් වුනාට පස්සේ කියලා තමයි ඔරිජිනල් එකේ තියෙන්නේ. දැන් අපේ නිතිඥතුමිය හදපු එකේ තියෙන්නේ ගිවිසුම අවසන් කරන ඕනෑම මොහොතක ඒ කියන්නේ ඕනෑම වෙලාවක සතොස ගන්න පුළුවන්. අමතක කරන්න එපා කඩ 08, 09, 10,12,13,22,23 කියන කඩ ටික එකතු කරලා තමයි මේ සතොස ආයතනය මේක බදු අරගෙන තියෙන්නේ. එතකොට මේ ඔක්කෝම ටික එකතු කරලා භූමිය වශයෙන් වෙන් කරලා ඒවට අවශ්‍ය විදිහට හදලා ඔක්කොම කරලා ඉවර වෙලා අපේ ගිවිසුම අත්සන් වෙන්න ඉස්සර වෙලා යන්න පුළුවන් විදිහට අංක 06 සංශෝධනය කරලා තියෙනවා. ඕනෑම මොහොතක යන්න පුළුවන් විදිහට. 31 කරුණට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එකේ ඔරිජිනල් එකේ තියෙන්නේ මෙම ගිවිසුම ආරම්භ වි වසර 03ක් ගතවීමෙන් අනතුරුව ගිවිසුමේ කවර හෝ පාර්ශවයකට වුවද අනෙක් පාර්ශවයට මාස 03ක් පූර්ව ලිඛිත දැනුම් දීමක් මත මෙම බදු ගිවසුම අවසන් කළ හැකිය. අවුරුදු 03කට පසුව තමයි බදු ගිවසුම අවසන් කරන්න පුළුවන් මාස 03කට කලින් දැනුම් දීලා. හැබැයි අපේ නිතිඥතුමිය හදලා දීලා තියෙන එකේ තියෙන්නේ මෙම ගිවිසුම කවර පාර්ශවයකට වුවද අනෙක් පාර්ශවයට මාස 03ක පූර්ව ලිඛිත දැනුම් දීමක් මත මෙම බදු ගිවිසුම අවසන් කළ හැකිය. මාස 03කින් පස්සේ අවසන් කරන්න පුළුවන් අර වසර 03ක් ඉන්න ඕනේ කියන එක නැහැ. අපේ අච්චර කඩවල් එකතු කරලා. තියෙන ගොඩනැඟිල්ල භෞතිකව වෙනස් කරලා මාස 03කින් යන්න ඕන කියලා හිතුනොත් එහෙම අනිවාර්යෙන්ම යන්න පුළුවන්. එක ගැටළුවක් නැහැ. මේ නිතිඥතුමිය හදලා තියෙන එක සංශෝධනය කරලා තියෙන එක. ඊට පස්සේ 36 මම මේ ඔර්ජිනල් එක කියවන්නේ. බදු කාලසීමාව තුල දවසේ සාධාරණ වෙලාවකදී බදු දීමනා කරුගේ බලයලත් නියෝජිතයෙකු මෙම ගිවිසුමට අනුකූලව කටයුතු පවත්වාගෙන යන්නේද යන අරමුණින් පරිශ්‍රයට ඇතුළුවී පරික්ෂා කිරීමේ ආදි කටයුතු කිරීමට ඇති අයිතිය බදු ගැනුම්කරු පිලිගනී. ඕනෑම වේලාවක ගිහිල්ලා නගරාධිපතිවරයාගේ, නාගරික කොමසාරිස්වරියගේ නියෝජිතයෙකුට ගිහිල්ලා පුළුවන් මේක පරික්ෂා කරන්න. එක සංශෝධනය කරලා තියෙනවා මෙහෙම බදු කාලසීමාව තුළ පූර්ව ලිඛිත දැනුම් දීමකින් අනතුරුව. ඔර්ජිනල් එකේ කියන්නේ එයාලාගේ අවසරයකින් තොරව අපේ නියෝජිතයෙකුට ගිහිල්ලා පරික්ෂා කරන්න පුළුවන් කියලා. මෙයා ලියන්නේ පූර්ව ලිඛිත දැනුම් දීමකින් අනතුරුව ඒ කියන්නේ ලිඛිතව දැනුම් දීලා ඉන් පසුව අපේ කෙනෙකුට ගිහිල්ලා පරික්ෂා කරන්න පුළුවන්. ලිඛිතව දැනුම් දුන්නට පස්සේ ආයේ පරික්ෂා කරන්න දෙයක් නැහැනේ. ඔන්න ඔහොම සංශෝධනය වෙලා තියෙනවා මේ ගිවිසුම සම්බන්ධයෙන් ඔබතුමාගේ අවදානය යොමු කරනවා. එක ඒ විදිහට හොඳයි කියලා හිතෙනවනම් ඔබතුමාලාට වැඩි ඡන්ද තියෙනවා ඕන දේයක් කර ගන්න පුළුවන්. ගරු නගරාධිපතිතුමා, අනිත් එක දැන් මේ යන විදිහට මොරටුවේ මිනිස්සු

මැරෙන්නත් බය වෙනවා. මොකද හේතුව 2023 පාලන බලය භාර දෙනකොට රුපියල් 3000ක් ව තිබුණ ආදාහන ගාස්තුව 2023 කොමසාරිස් පාලනයේදී රුපියල් 6000ක් දක්වා වැඩි වුණා. දැන් 2026 දී නිශාන්ත ප්‍රදිනාන්දුගේ පාලනයේදී 6000ක මුදල 8000 කරලා තියෙනවා. ලස්සනයි වැඩේ නොමිලේ වළලපු එක රුපියල් 2000 කරලා තියෙනවා. මේක මොන අරමුණකින් කොහොම කරාද කියන එක අපිට ගැටළුවක් තියෙනවා. ඒ නිසා දැන් මොරටුවේ මිනිස්සු මැරෙන්නත් බයයි. 39 කරුණ ඇමුණුම 39. ඒ නිසා මේක සම්බන්ධයෙන් අවදානය යොමු කරනවා මිනිස්සුන්ගේ ආදාහනාගාර කුලිය වැඩි කරනවට අපේ දැඩි විරෝධය සහ භූමිදාන කුලිය වැඩි කරලා තියෙනවට දැඩි විරෝධය ප්‍රකාශ කරනවා. අනිත් එක ගරු නගරාධිපතිතුමා, 47 කරුණ ඉස්සර නගරාධිපති නියෝජ්‍ය නගරාධිපති ඉන්නකොට ගැහුවේ ඔය කැබ් දෙකටම සුදු ඩීසල් දැන් ගහන්නේ සුපර් ඩීසල් මන් දන්නේ නැහැ එක තාක්ෂණික ප්‍රශ්නයක්ද කියලා, කොහොම හරි දැන් ගහන්නේ සුපර් ඩීසල් නගරාධිපතිවරයා හිටපු නගරාධිපතිවරයාට අනුමත කරලා දුන්නේ මේ සභාව ලීටර් 350යි. හිටපු නියෝජ්‍ය නගරාධිපතිවරයාට අනුමත කරලා දුන්නේ ලීටර් 350යි. හැබැයි මේ නගරාධිපතිවරයාට සහ නියෝජ්‍ය නගරාධිපතිවරයාට අනුමැතිය සඳහා ලීටර් 500ක් දාලා තියෙනවා. ලීටර් 500කින් කොහේ යන්නද. ඒ නිසා ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරනවා.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, නගරාධිපති මෙතෙක් පාවිච්චි කරලා තියෙන?

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මෙතෙක් පාවිච්චි කරලා තියෙන එක හරි නමුත් අනුමැතිය සඳහා ලීටර් 500ක් ආවේ මොකටද කියන ප්‍රශ්නය තියෙනවා. 48(5) කරුණ නාගරික ඉංජිනේරු විසින් 2025.09.18 දිනැති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ කමිටුවට ඉදිරිපත් කරන ලදුව මුදල්කමිටුව වෙත යොමු කරන ලද පහත සඳහන් කරුන සලකා බැලීම. මීට හොරා කිහිපයකට උඩදී එහෙම නැත්නම් විනාඩි කිහිපයකට උඩදී තිබ්බ කර්මාන්ත කමිටුවේ තිබ්බ මේ අයිතමයන් මුදල් කමිටුවට ඇවිල්ලා තියෙනවා. පළවෙනියාටම කියන්නන ඕන මේක නිත්‍යානුකුල නැහැ කර්මාන්ත කමිටුව මහා සභාවේ අනුමත වුනාට පස්සේ තමයි එක මුදල් කමිටුවට යන්න ඕන නිත්‍යානුකූලව මේක කර්මාන්ත කමිටුව කෙලින්ම මුදල් කමිටවුට දාලා තියෙනවා. මෙක කාගේ උපදෙස් මත දැම්මද කියන එක ප්‍රශ්නයක් තියෙනවා කාගේ උපදෙස් තම දැම්මත් මේ කිසිදු අයිතමයක් නිත්‍යානුකූල නැති බව කරුනාවෙන් සලකන්න. ඒ වගේම මේ අයිතමයන් කිහිපයක් ඉදිරිපත් කරලා තියෙනවා ඔබතුමාගේ කමිටුවේ. ඒ ඉදිරිපත් කරලා තියෙන සමහර අයිතමයන් මෙ වෙනකොට වැඩනිම කරලා තියෙන්නේ. කර්මාන්ත කමිටුවට ඇස්තමේන්තුව එනකොටත් වැඩ නිම වෙලා තියෙන්නේ. එක මුදල් කමිටුවට එනකොටත් වැඩ ඉවරයි. ඒ නිසා එක නිත්‍යානුකූල නැහැ. ඉතින් ඒ නිසා හිටපු නගරාධිපතිවරයා ඊයේ පෙරේදා අල්ලස් කොමිසමේ අත්තඩංගුවට පත්වුනා එකෙත් බී වාර්තාවේ තියෙන ප්‍රධාන වරදක් තමයි ඕක. ඒ නිසා අපි ප්‍රාර්ථනා කරනවා නිශාන්ත ප්‍රදිනාන්දු අපේ ගරු නගරාධිපතිතුමාට එහෙම නොවේවා කියලා. මොකද අපිට වෛර කරාට අපි වෛර කරන්නේ නැහැ. ඒ නිසා අපි ඔබතුමාට මෛත්‍රී කරනවා. අපි බලාපොරොත්තු වෙනවා ඔබතුමාට එහෙම අකටයුත්තක් නෙවේවා කියලා. 48(6) නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ හරි හරි වැඩ වෙනවා. හැබැයි මන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉස්සරහම මම කිහිප වරක්ම දැකලා තියෙනවා නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ වෙ වැඩ සම්බන්ධයෙන්ම වැඩි ප්‍රසාදයක් ඔබතුමාට නැති බව, ඔබතුමාගේ යම් යම් ප්‍රකාශ තුලින් අපිට පේන්නට තිබුණා. හැබැයි ඔබතුමා මොනවා ප්‍රකාශ කරත් නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවට ඕන දේ ඒ අය කරමින් ඉන්නවා. මේක නාගරික ඉංජිනේරු විසින් 2025.09.18 දිනැති කර්මාන්ත හා ඉදිකිරීම් පිලිබඳ ස්ථාවර කමිටුවට ඉදිරිපත් කරනු ලදුව මුදල් කමිටුව වෙත යොමු කරන ලද පහත සඳහන් කරුණ සලකා

බැලීම. නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කාර්යාල පිරිසැකැස්ම. මම මේ පිරිසැකැස්ම කියන වචනය ඇහුවෙත් අර්ථය හොයා ගත්තෙත් මේ පාර තමයි. හොඳ සිංහල අපේ කට්ටිය. වඩාත් ඵලදායි හා විනිවිද භාවයෙන් යුතු සේවයක් සැපයීම සඳහා සුදුසු වන පරිදි සකස් කර ගැනීම සම්බන්ධවයි. නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ නිලධාරින් හා සේවකයින් සඳහා ආහාර ගැනීමට සුදුසු ස්ථානයක් කඩිනමින් පිලියෙල කර ගැනීම. ගරු නගරාධිපතිතුමා මම ඔබතුමාට ගෞරවයෙන් ආරාධනා කරනවා ඔබතුමා කරුණාකරලා අර විදුලි අංශයට ගිහිල්ලා බලන්න, දැන් හදලද දන්නේ නැහැ මම දැනුවත්වනම් තාම හදලා නැහැ. ඒ මිනිස්සු පැහැදිලිව ජීවිතයත් මරණයත් අතර සටනක් කරනවා. මොකද ලයිට් කණුවකට ගනින්නේ ජීවිත අවදානමක් විශාල වශයෙන් අරගෙන. ඉතින් ඒ මිනිස්සුන්ට ඇඳුම මාරු කරගන්න තාම තැනක් හදන්න කර්මාන්ත අංශයට බැරි වුනා. එකට කිසිම උනන්දුවක් නැහැ. හැබැයි වැඩේ තියෙන්නේ මේ වාර්තාව මුදල් කමිටුවට එන්නේ අද මේක කටින් පිට වුනා විතරයි ඔබතුමා දන්නෙත් නැහැ කර්මාන්ත කමිටු සභාපතිතුමා දන්නෙත් නැහැ, කවුරුවත් දන්නේ නැහැ නමුත් ගිහිල්ලා බඩුත් අරගෙන ඇවිල්ලා. මේකට කවුද අනුමැතිය දුන්නේ කියලා ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා මෙවාට බඩු ගෙනාවේ කවුද අනුමැතිය දුන්නේ කවුද? ගරු නගරාධිපතිතුමා දන්නේ නැතුව කොහොමද බඩු ගෙන්නේ. ඕක තමයි අපිට තියෙන ප්‍රශ්නය. ඒ නිසා මේ ජනතා සේවයට ආපු මිනිස්සු. මේ නිලධාරින්ට දැන් අමතක වෙලා කරන්නේ මොකද්ද කියලා. ඒ නිසා තමන් ගැන විතරක් හිතන නිලධාරින් බවට මේ නාගරික ඉංජිනේරු ඇතුළු කර්මාන්ත අංශයේ නිලධාරින් පත්වෙලා තියෙනවා. එම නිසා මේ සඳහා ඔබතුමාගේ අවදානය යොමු කරනවා. වහාම පරික්ෂණයක් කරන්න මේ බඩු ගෙනාවේ කොහොමද කියලා පරික්ෂා කරන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා. ඒ වෙනකොට ඔබතුමා අවරණ අනුමැතිය දීලා තිබුනෙත් නැහැ, පස්සේ ඔබතුමා දුන්නද දන්නේ නැහැ මේ අයව බේරගන්න ඕන නිසා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද සුපර්සිටි වෙළඳ සංකිර්ණය සම්බන්ධව මීට පෙර පැන නැගුණ කාරණය සම්බන්ධව ගත්ත තීරණය ඉතා වැදගත් කියලා මම හිතනවා. විශේෂයෙන් සුපර්සිටි වෙළඳ සංකීර්ණය හදද්දි ඔවුන්ට පොරොන්දුවක් වුනා.අපට නීත්‍යානුකූල හිමිකමක් නැහැ ඔවුන්ගෙන් ප්‍රවේශ මුදල් අයකරගන්න.විශේෂයෙන් ප්‍රවේශ මුදල් අයකරගැනීම සිද්ද වුනේ මෙවැනි ගොඩනැගිල්ලක් අනාගතයේ සකස් වෙද්දි ඒ මුදල් පාවිච්චි කරන්න පුලුවන් කියන ෆික්ස් ඩිපොසිට් එකක් තියන්න.නමුත් අපි දිගින් දිගටම එහි අමාත්‍යවරයා විදියටත් අපේ හිටපු අමාත්‍යතුමත් අපිත් නිතරම කිව්වා මේකෙ මැදිහත් වෙන පාර්ශව විදියට මේක වැරදියි කියලා.ඒ අනුව විශේෂයෙන් කඩ හිමියන්ට මුදල් ගෙවා ගන්න බැරිකමක් නිසා සමහර වෙලාවට කුලී විසිපන්දහයි තවත් ප්‍රවේශ ගාස්තු රුපියල් විසිපන්දහක් විතර එතකොට මේක දරාගන්න බැහැ.ඒ නිසා ඔවුන්ට සහනයක් සැලසිය යුතුයි.ඔවුන් අපෙනුත් දිගින් දිගටම ඉල්ලීමක් කරා.ඒ නිසා මම ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා නාගරික සංවර්ධන අධිකාරියේ ඉදිකරපු මුදල් වලින් අපට ප්‍රවේශ මුදලක් අරගෙන අනාගත අපේක්ෂනය සඳහා සත්භාවයෙන් මේක කරා වෙන්න පුලුවන් නමුත් මේ තුල පිරිහීමට ලක්වුනේ ව්‍යාපාරිකයො.ඒ නිසා ඔවුන්ට සහනයක් සලසා දෙන්න අපි යම් මැදිහත්වීමක් වුනා.ඔවුන්ට සහනයක් ලැබීම සම්බන්ධයෙන් මගේ ප්‍රසාදය මම පිරිනමනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එකපැත්තකින් ඔබතුමා ව්‍යාපාරිකයන්ට සහන දෙනවා. අනෙක් පැත්තෙන් අපි කණගාටුවෙනවා ඔබතුමා ආදාහනාගාර වෙන්කිරීම වෙනුවෙන් ගාස්තු වැඩිකරලා

තියනවා.ලක්ෂ ගාණක් බදු සහන දෙනකොට රුපියල් හයදාහේ තිබුන එක අටදාහ කරනවා ආදාහනය සඳහා බල ප්‍රදේශයේ අයට.බල ප්‍රදේශයෙන් පිට අයට ඊට වඩා ගානක් තියනවා.ඒක ගැනනම් අපි කතා කරන්න යන්නෙ නැහැ.මෙච්චර කාලයක් අපිට නොමිලේ ලබාදුන්නු භූමිදාන කටයුතු සඳහා අපි රුපියලක්වත් අයකරේ නැහැ.ඔබතුමා රුපියල් දෙදාහක් අයකරන්න මේ වෙනකොට තීරණය කරලා තියනවා.පොඩ්ඩක් මානුෂීය පැත්තෙන් හිතන්න.මොකද වසරකටම ආදාහන කටයුතු කරන්න අපේ ආදාහන කටයුතු සියල්ලටම මරණ හාරසියක් පන්සියයක් එයි.භූමිදාන කටයුතුත් එහෙමයි.ආගමික අය ඒගොල්ලන්ගෙ දේවස්ථාන වල තමයි අවසාන කටයුතු කරන්නෙ.ඒක අපේ සභාවල්වලට එන්නෙ නැහැ.ගොඩාක් දුරට බෞද්ධයන්ගෙ කටයුතු තමයි අපේ සුසාන භූමිවල සිදුකරන්නෙ.වසරටම මම හිතන්නෙ සියලුම ආදාහන වලට සහ භූමිදාන වලට වැඩි කරන මුදල් අපට ලැබෙන්නෙ ලක්ෂ පහලවක් දාහතක් විතර වෙයි. නගරාධිපතිතුමනි, ඔබතුමාගේ ආදායම වැඩිකරගන්න ඕනා කියන එක මම පිළිගන්නවා.සභාවක් හැටියට ඒක වැඩිකරගත්තෙ නැත්නම් අපිට ඒක ගෙනියන්න බැහැ.සභාවෙ මුදල් ආදායම් වැඩිකරගන්න වෙනත් ක්‍රම වේදයකට යනවනම් හොදයි කියන එක තමයි කියන්න වෙන්නෙ මොකද මරණයක් සිදු වෙනකොට සමහර දුප්පත් පවුල් වල අය රෝහල්ගත වෙලා අවුරුදු ගණන් ඉදලා සතපහ නැතිවෙලා තමයි මරණෙට පත්වෙන්නෙ.අවසාන කටයුතු කරගන්නකොට මේ වගේ ලොකු මුදලක් ගෙවන්න වෙනකොට අපහසුතාවයකට පත්වෙනවා.ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මේක තිබෙන ගාස්තුවේම තියන්න කියන ඉල්ලීම තමයි කරන්න තියෙන්නෙ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මෙම 39 කරුණ අද දින අනුමත වීමට ඇති මුදල් කමිටුවෙන් අයින් කරමු. වැඩිදුරට සාකච්ඡා කර තීන්දුවක් ගමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා,ඒ තීරණය අයවැය රැස්වීමේදී ගත්ත තීරණයක්. අඩුම අයකිරීමක් කරන්නෙ.පළමුවෙන්ම භූමිදානය ඩිස්කරේජ් කරන්න තමයි අයකිරීමක් කරන්නනෙ.දෙහිවල ගල්කිස්ස රුපියල් අටදාහක් ගන්නවා භූමිදානයට.එයාලගේ ආදාහන ගානට වඩා භූමිදාන ගාන වැඩියි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි,විශාල ගැටලුවක ඉන්නවා.සතොසෙ පරණ ගිවිසුමක ගැටලු ගොඩාක් තියනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා,සතොස ගිවිසුම මේ මුදල් කමිටුවේ නෙමෙයි මීට ඉස්සර මුදල් කමිටුවක ආවා.ඒකෙදි මතු කරපු ගැටලු තිබුනෙ නැහැ.මම හිතුවෙ ඒ ගිවිසුම් තියනවා කියලා.ඒක අරගෙන බලන්න පුලුවන් ඉස්සර වාර්තාවක් අරගෙන බලන්න පුලුවන් ඒ ගිවිසුමෙ එහෙම නැහැ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි,මුල් ගිවිසුමේ දින ගණනාවක් තියනවා.අවුරුදු 2021, 2023, 2024 තියනවා. ගිවිසුම පටන් ගත්ත වර්ෂය විදියට 2021 ක්වු දෙසැම්බර් මස 02 වන දින.

<u>මහා නගර සභා මන්ත්‍රී -මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා,මේ ගිවිසුම් සම්බන්දයෙන් අපේ ප්‍රොපටි එකනෙ දෙන්නෙ.සතොස වගේ තැනකට දුන්නම පාවිච්චි කරාම වෙනවා.ගොඩනැගිල්ල ක්ෂය වීමට ලක්වෙනවා.එතකොට ඒවා සම්බන්ධයෙන් කොහොමද අයකිරීම් කරගන්නෙ.ඒගොල්ලන් වැකේට් කරනවානම් ගොඩනැගිල්ල යලි පිළිසකර කරදෙනවාද.ඒවගේ කරුණු ගණනාවක් ව්‍යාපාරික ස්ථාන සමඟ ගිවිසුමකට එළඹෙනවානම් අපි ඊට වැඩිය ටයිට් ඇග්‍රිමන්ස් තියෙන්න ඕනා. ඇග්රිමන්ට් මම හිතන්නෙ රී ඩ්‍රාෆ් කරලා අපි නැවත බැලුවනාම හොදයි කියලා හිතෙනවා.කෝපරේට් කන්ට්‍රෙක්ස්

කරනකොට ඕනෑම නගර සභාවට මීට වැඩිය සාමාන්‍ය බදු ගිවිසුම් වලින් ඔබ්බට ගිහිල්ලා මීට වැඩිය ස්ට්‍රොං ඇග්‍රිමන්ට් ගැහුවනම් හොඳයි කියලා යෝජනා කරනවා.අවශ්‍යනම් මේ ගිවිසුම් නැවත සකස් කිරීමට අපිට සහයෝගය දීමේ හැකියාව තියනවා.හේතුව නීතිඥයන් විදියට අපි කෝපරේට් ඇග්‍රිමන්ට් කරන හින්දා.ඉංග්‍රීසියෙන් ඕනනම් ඇග්‍රිමන්ට් එකක් කරලා දෙන්න පුලුවන්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මුදල් කමිටු වාර්තාවේ අංක 12(16) හා 12(17), අංක 33, අංක 39 යන කරුණු වාර්තාවෙන් ඉවත් කිරීමට යටත්ව ඡන්ද විමසීම සිදු කරනවා.

**2025.09.19 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 12(16) හා 12(17), අංක 33, අංක 39 යන කරුණු හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2025.09.19 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 12(16) හා 12(17), අංක 33, අංක 39 යන කරුණු හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |

7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂණී ප්‍රනාන්දු මෙනවිය
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

**2025.09.19 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 12(16) හා 12(17), අංක 33, අංක 39 යන කරුණු හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මේ අවස්ථාවේදී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභාවේ නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය)

## 07. ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව :-

නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 2025.09.19 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 35 යටතේ 2025 අගෝස්තු මාසයට අදාළ මූල්‍ය වාර්තාව **ඇමුණුම - 37** ලෙස ඉදිරිපත් කර ඇත.

## 08. පුද්ගලික ස්වභාවයේ කරුණු :- නැත

## 09. වෙනත් කරුණු :- නැත

අ.කලේ කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු,
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2025.10.07 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.